311 වන කාණ්ඩය - 12 වන කලාපය
தொகுதி 311 - இல. 12
Volume 311 - No. 12

2024 මාර්තු 21වන බ්‍රහස්පතින්දා
2024 மார்ச் 21, வியாழக்கிழமை
Thursday, 21st March, 2024

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය [තීරුව 1775]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 1776]

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා** [තීරුව 1778]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 1778]

**වරප්‍රසාද:**
නොගෙවූ විදුලි බිල්පත් පිළිබඳ රංජන් ජයලාල් මහතා විසින් කළ අසත්‍ය ප්‍රකාශය [තීරුව 1793]

**බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 1797]

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) - [ගරු ඩී. වීරසිංහ මහතා] පළමුවන වර කියවන ලදී [තීරුව 1798 ]

**කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට එරෙහි විශ්වාස භංග යෝජනාව:**
නිෂ්ප්‍රභ විය [තීරු 1799 – 1978]

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
சபாநாயகரது சான்றுரை [ப:1775]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப:1776]

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்** [ப:1778]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப:1778]

**சிறப்புரிமை:**
செலுத்தப்படாத மின் கட்டணப் பட்டியல் தொடர்பான திரு. ரஞ்சன் ஜயலாலினது தவறான கூற்று [ப: 1793]

**வங்கிகளால் வழங்கப்பட்ட கடன்கள் அறவிடுதல் (விசேட ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப:1797]

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
இலங்கை வசதிகள் முகாமைத்துவ நிறுவகம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு டீ. வீரசிங்க] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப:1798]

**சபாநாயகர் மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன அவர்களுக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணை:**
நிராகரிக்கப்பட்டது [ப:1799 - 1978]

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate [Col. 1775]

AUDITOR-GENERAL'S REPORT [Col. 1776]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 1778]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 1778]

PRIVILEGE:
False Statement Made by Mr. Ranjan Jayalal Regarding Unpaid Electricity Bills [Col. 1793]

RECOVERY OF LOANS BY BANKS (SPECIAL PROVISIONS) (AMENDMENT) BILL:
Read the First time [Col. 1797]

PRIVATE MEMBERS' BILLS:
Institute of Facilities Management Sri Lanka (Incorporation) – [The. Hon. D. Weerasingha] – Read the First time [Col. 1798]

VOTE OF NO CONFIDENCE AGAINST HON. MAHINDA YAPA ABEYWARDANA, SPEAKER:
Negatived [Cols. 1799 - 1978]

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2024 මාර්තු 21වන බ්‍රහස්පතින්දා***
*2024 மார்ச் 21, வியாழக்கிழமை*
*Thursday, 21st March, 2024*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] in the Chair.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සියලුදෙනාටම සුබ උදෑසනක් වේවා!

විශේෂයෙන්ම අද දවස ගරු කථානායකතුමාට එරෙහිව ගෙන එන ලද විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදයේ අවසාන දිනය වන බැවින්, ඊට ප්‍රමුඛතාව ලබා දිය යුතුයි. අනවශ්‍ය බාධා කිරීම් නොකර ඒ සඳහා අවශ්‍ය වේලාව ලබා ගැනීමට සහයෝගය ලබා දෙන ලෙස බොහොම ගෞරවයෙන් ගරු මන්ත්‍රීවරුන් සියලුදෙනාගෙන් ඉල්ලා සිටිනවා.

# නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, ගරු කථානායකතුමා විසින් 2024 මාර්තු 20 දින "සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන)" සහ "එකතු කළ අගය මත බදු )සංශෝධන) "නමැති පනත් කෙටුම්පත්හි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.



**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ළමුන් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ මූලිකත්වයෙන් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සහභාගිත්වයෙන් ලිංගිකත්ව අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීමේ අරමුණින් සකස් කරන ලද ග්‍රන්ථ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2024 මාර්තු 21වන බ්‍රහස්පතින්දා, එනම් අද දින පූර්ව භාග 10.00ට කාරක සභා කාමර අංක 01 හිදී පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර, ඒ සඳහා සහභාගි වන ලෙස සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට කාරුණිකව ආරාධනය කරනු කැමැත්තෙමි.

# විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව,

- 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LIV කොටස;
- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XLI කොටස;
- 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XXXIX කොටස; සහ
- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLIII කොටස සහ නවවැනි කාණ්ඩයේ XXVII කොටස ගරු කථානායකතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා**
(மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட)
(The Hon. Nalaka Bandara Kottegoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ පත් කරන ලද කමිටුවේ උපදෙස් සහ නිර්දේශ මත එම පනතේ 5 සහ 6 වගන්ති සමඟ කියවිය යුතු 7 වගන්තිය යටතේ ඛනිජතෙල් නිෂ්පාදන බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජූලි 10 දිනැති අංක 2340/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (ආචාර්ය) වී. රාධාකෘෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

Hon. Deputy Speaker, I present the Report of the Sectoral Oversight Committee on Education on -

(i) Annual Report of the Postgraduate Institute of Pali and Buddhist Studies of the University of Kelaniya for the year 2021;

(ii) Annual Report and Accounts of the South Eastern University of Sri Lanka for the year 2021;

(iii) Annual Report of the National Science Foundation for the year 2021;

(iv) Annual Report and Accounts of the Sabaragamuwa University of Sri Lanka for the year 2021;

(v) Annual Report and Accounts of the University of Jaffna for the year 2021; and

(vi) Annual Performance Report of the Department of Manpower and Employment for the year 2022,

which were referred to the said Committee.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු අධ්‍යාපන ඇමතිතුමාටත්, මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමාටත්, පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මේනක හේරත් මැතිතුමාටත් මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා.

ඉතිරි 126දෙනාටත් හෙට ගුරු පත්වීම් දෙන්න සූදානම් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් ලැබුණු සහයෝගය නිසා තමයි අපට එය කරන්න අවස්ථාව ලැබුණේ. ඔබතුමාටත් එතුමන්ලා දෙදෙනාටත් මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කරනවා.

ඒ එක්කම මම කියන්න කැමැතියි, National Colleges of Educationහි සිංහල, දෙමළ සිසුන් කිහිපදෙනෙක් ඉන්නවා refer වුණු. ඒගොල්ලන්ට exam එකක් තියලා තිබෙනවා. නමුත්, තවම ඒ ප්‍රශ්න පත්‍ර correctionවලට යවලා නැහැ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔය කියන්නේ මධ්‍යම පළාතේ 166දෙනා ගැනද? Are you referring to the "*guru sahayakas*" of the මධ්‍යම පළාත?

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
ඔව්, මධ්‍යම පළාතේ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
They have been given -

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
Yes, tomorrow they will be given appointments.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Ah, yes.

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
That is why I wanted to thank you, the Governor and the Secretary to the Ministry. But, the other matter I am referring to is about referred students in the National Colleges of Education. සිසුන් 300 ගණනක් ඉන්නවා ලු.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
Yes. Next week, we have fixed a date and time.

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
The exam had already been conducted. But, the exam papers have not been corrected.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
They are a referred batch. Everything has been done and they will be given their postings within the next couple of days.

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
Thank you.

Also, අපේ කමිටුව educational reforms සම්බන්ධව පස්වන වතාවටත් රැස්වෙලා සාකච්ඡා කරන්න ලැස්ති කරලා තිබෙනවා. අද කමිටුව කැඳවලා අපි එය finalize කරන්න බලාපොරොත්තු වනවා. අපි ගරු මන්ත්‍රීවරු සියලුදෙනාටම ආරාධනා කරනවා ඒ සාකච්ඡාවට සහභාගි වෙලා ඔබතුමන්ලාගේ අදහස් ඉදිරිපත් කරන ලෙස.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කිරීම, ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මැතිතුමා.

**ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා**
(மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட)
(The Hon. Nalaka Bandara Kottegoda)
Hon. Deputy Speaker, I present the Report of the Sectoral Oversight Committee on Energy and Transport on -

(i) Performance Report of the Sri Lanka Railway Department for the year 2022; and

(ii) Annual Report of the National Transport Medical Institute for the year 2022,

which were referred to the Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගම්පහ, ඉහලගම, අංක 155 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඒ.පී.කේ. දයානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හය පිළිගන්වමි.

(1) මාතලේ, තැන්න, මුවගල හන්දිය, අංක 26 දරන ස්ථානයෙහි පදිංචි ඒ.ජී. නන්දා සෝමලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) උකුවෙල, නාගොල්ල, අංක 200/3 දරන ස්ථානයෙහි පදිංචි අනුර උපතිස්ස මල්තුංග මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මාතලේ, කිවුල, අංක 8 දරන ස්ථානයෙහි පදිංචි ජී.ජී. සනත් චන්ද්‍රකුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) බෙලිගමුව, වළකඹුර, අංක 142 දරන ස්ථානයෙහි පදිංචි එම්.ජී.සී. හර්ෂන් විජේරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) මාතලේ, මැටිහක්ක, රංමුතුගම දරන ස්ථානයෙහි පදිංචි පී.කේ.ජී. විජේරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(6) නාලන්ද, හෝමාපොල, පී 204 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. කුඩාමැණිකේ මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා**
(மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட)
(The Hon. Nalaka Bandara Kottegoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාතලේ, මඩවල උල්පත, මැදිරොද, අංක 95/7 දරන ස්ථානයෙහි පදිංචි බී.ජී. චන්ද්‍රවංශ බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා**
(மாண்புமிகு ஷான் விஜயலால் த சில்வா)
(The Hon. Shan Vijayalal De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) කරන්දෙණිය, බාන්වැල්ගොඩ යන ලිපිනයෙහි පදිංචි එච්.ජී. මෛත්‍රීසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) හික්කඩුව, පතන, සමර් සිටි, අංක 17 දරන ස්ථානයේ පදිංචි අයි.ජී.එස්.ඩබ්ලිව්. රවීන්ද්‍ර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) අම්බලන්ගොඩ, තිලකපුර, ජන උදාන ගම්මානය, අංක 101 ඒ දරන ස්ථානයේ පදිංචි සුදත් ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේත් අවසරය ඇතිව මම පොඩි ප්‍රශ්නයක් මතු කරන්නට අවස්ථාව ඉල්ලා සිටිනවා. ගරු සභානායකතුමනි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, ඔබතුමා දන්නවා විශ්වවිද්‍යාල විද්‍යායතන සිසුන්ගේ උසස් ජාතික ඩිප්ලෝමා සහතිකය පිළිබඳව. ඒ අයට - 2015, 2016 සහ 2017 batches තුනටම - HND හා NVQ 6 කියන සහතික දෙකම ලබා දුන්නා. ඒ විධියට ලබා දෙනවා කියලා තමයි මේ ඩිප්ලෝමාව market කරලා තිබෙන්නේ; ප්‍රචාරණය කරලා තිබෙන්නේ. හැබැයි, ගරු අමාත්‍යතුමනි, Higher National Diploma සහතිකය ලබා නොදී NVQ සහතිකය පමණක් ලබා දෙන්නට අලුතින් පියවර ගන්න යනවාය කියන ආරංචිය අපට ලැබිලා තිබෙනවා. මම ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. රත්මලාන, කුලියාපිටිය, බටන්ගල, අනුරාධපුරය, මාතර සහ යාපනය යන විශ්වවිද්‍යාල විද්‍යායතනවල දූ දරුවන් 2,500ක් පමණ මේ ක්‍රියාවලියේ නියැළෙනවා. Courses 24ක් කරනවා. මේ දරුවෝ ඇත්ත වශයෙන්ම HND සහ NVQ qualifications අරගෙන, top-up degree එකක් කරලා degree සහතිකය බලාපොරොත්තු වෙන දූ දරුවන්.

මම මේ අවස්ථාවේදී ඔබතුමාට පෙන්වන්න කැමතියි, මේක ප්‍රචාරණය කර තිබෙන ආකාරය. එහි තිබෙන්නේ HND සහ NVQ කියන සහතික දෙකම එකට. "Higher National Diploma Courses (HND with NVQ 5 & 6)" යනුවෙන් තමයි 2019දීත්, ඉන් පසුව 2022දීත් මේක market කරලා තිබෙන්නේ, ගරු අමාත්‍යතුමනි. 2015, 2016, 2017 සිසුන්ට මේ විධියටම එය ක්‍රියාත්මක කරලා 2018 ඉඳලා සිසුන්ට කියන්න බැහැ නේ මේක කප්පාදු කරනවා, HND සහතිකය දෙන්නේ නැහැ NVQ Level 5 and 6 සහතිකය විතරක් දෙන්නම් කියලා. ඒ සම්බන්ධව ප්‍රචාරණය කළ ලේඛන මම **සභාගත*** කරනවා.

ඒ වාගේම, ඔබතුමාගේ දැනගැනීම සඳහා මම **සභාගත*** කරනවා විභාග ප්‍රතිඵලවල - examination results වල - academic transcripts. මම මේ ඔබතුමාට දෙන්නේ අනුරාධපුරය, මාතර සහ යාපනයේ ප්‍රතිඵල. මේ academic transcriptsවලත් බොහොම පැහැදිලිව තිබෙනවා නේ, "Higher National Diploma" කියලා. එතකොට academic transcriptsවල HND කියලා කොහොමද එක පාරටම 2018 ඉඳලා මේ කප්පාදුව කරන්නේ?

මෙන්න මේ කාරණයත් මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි. 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පනත සහ 2014 ඔක්තෝබර් 03 දින නිකුත් කර තිබෙන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව පිරිනැමිය යුතු සහතික පිළිබඳව බලය තිබෙනවා. කොහොමද ඒක කප්පාදු කරන්න එක පාරටම තීන්දුවක් ගන්නේ? මේ බලන්න, මම මේ ඔබතුමාට පෙන්වන්න හදන්නේ 2017 වෙනකම් දීලා තිබෙන සහතික ටික.

2017 වෙනකම් ඔක්කෝම සහතික ටික එහෙම තමයි දීලා තිබෙන්නේ. මෙන්න බලන්න, 2018 දී සිදු කර තිබෙන කප්පාදුව. ගරු ඇමතිතුමනි, මේකත් මම ඔබතුමාට පෙන්වන්න කැමැතියි. මේ ලේඛනයේ පෙන්වා තිබෙන ආකාරයට, 2022දීත් දීලා තිබෙන්නේ Higher National Diploma Courses (HND with

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

NVQ 5 & 6). ගරු ඇමතිතුමනි, මට ඔබතුමාට මේකත් පෙන්වන්න පුළුවන්. මේ විධියටම මේ සහතික දෙකම ලබා දෙනවා Ocean University එකෙන්. ගරු ඇමතිතුමනි, මම මේ කරුණු කාරණා සියල්ලක්ම ඉදිරිපත් කරලා ඔබතුමාට කියන්නේ මේකයි. මේ කාරණාව නිසා දූ දරුවන් 2,500ක් විතර දැඩි අසරණභාවයට පත් වෙලා සිටිනවා. 2015, 2016, 2017 සිසුන්ට HND සහ NVQ Level 5 and 6 කියන සහතික දෙකම ලබා දීලා එක පාරටම HND සහතිකය දෙන එක නතර කරලා NVQ සහතිකය විතරක් ලබා දෙන්න කටයුතු කිරීම එක කප්පාදුවක්. ඒ කප්පාදුව කරන්නට එපා. මොකද, මේ විශ්වවිද්‍යාල විද්‍යායතන වැඩසටහන බොහොම වැදගත් වැඩසටහනක්, හොඳ දෙයක්. ගරු ඇමතිතුමනි, ඒක එලෙසම ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චරිත හේරත් මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
ගරු විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නයට උත්තර දුන්නාට පස්සේ මගේ ප්‍රශ්නය මතු කරන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැහැ, ඔබතුමා ප්‍රශ්නය මතු කරන්නකෝ.

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 121 යටතේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ඊයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ මහ බැංකුවේ වැටුප් සංශෝධනය පිළිබඳ වාර්තාව අනුව මේ පාර්ලිමේන්තුවේ අනාගත කටයුතු සම්බන්ධව වැරදි precedent එකක්, වැරදි තීරණයක් ක්‍රියාත්මක වෙයි කියන මතය නිසා, for record purposes, මම මේ point of Order එක මතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා ඉදිරිපත් කරපු එම වාර්තාවේ සඳහන් 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ ස්වාධීනත්වය පිළිබඳ ප්‍රශ්නය මට තේරෙන විධියට එම Report එකේ වැරදි තැනක තමයි ස්ථාපිත කරලා තිබෙන්නේ.

පාර්ලිමේන්තුව විධියට මේ සම්බන්ධයෙන් නීතිපතිවරයාගෙන් එකඟතාවක් ලබා ගත යුතුයි කියලා මම හිතනවා. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය මුදල්වලට - public financeවලට - අයිති වෙන්නේ ඒකාබද්ධ අරමුදල පමණයි කියන මතය තමයි මහ බැංකුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. මෙය ඉතාම සාවද්‍ය මතයක්. මේ සම්බන්ධවත් නිසි අර්ථකථනයක් ලබා ගත්තේ නැත්නම්, ඉදිරියේදී, මේක record වෙන නිසා, ගැටලුවක් ඇති වෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නව ශ්‍රී ලංකා මහ බැංකු පනතේ ස්වාධීනත්වය පිළිබඳ වගන්තිය කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එම පනතේ 5 (2) යටතේ, මහ බැංකුව ස්වාධීන හා වගවීමෙන් යුක්ත විය යුතුය කියලා එය සංස්ථාපනය කර තිබෙනවා. ඊළඟට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153වන ව්‍යවස්ථාව කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ඒ අනුව එම වගවීම විගණකාධිපතිවරයා සමඟ සම්බන්ධ කර තිබෙනවා. ඊට පස්සේ පෙරළා පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුව තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නයට අදාළව ඊයේ ඉදිරිපත් කරපු වාර්තාව වෙනුවෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට අපි ස්තුතිවන්ත වෙනවා. හැබැයි, මෙහි සැක සහිත කටයුතු ගණනාවක් තිබෙනවා. මේක මේ විධියටම, without being touched, process වුණොත්, වැරදි precedent එකක් යන්න පුළුවන්. ඒ නිසා මම යෝජනා කරන්න කැමැතියි, කථානායකවරයාගේ බලතල යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාවට මහ බැංකු පනතේ ස්වාධීනත්වය සම්බන්ධ වන්නේ කෙසේද, 153වන ව්‍යවස්ථාව අනුව විගණකාධිපතිවරයාගේ වාර්තාව පාර්ලිමේන්තුව ලබා ගන්නා විට මහ බැංකුවේ මුදල් සම්බන්ධව අපි වග කියන්නේ කෙසේද කියන එක ගැන අර්ථ නිරූපණයක් ලබා ගත යුතුයි කියලා. මම දන්නේ නැහැ ඒකේ technicality එක. ඒක senior Membersලා කියන්න ඕනෑ.

අර්ථ නිරූපණයක් ලබා ගැනීම ඉතාම නිවැරදියි. එහෙම නැතුව මේක මේ විධියට ගමන් කිරීම තුළ අනාගතයේදී පාර්ලිමේන්තුව මහ බැංකුව එක්ක කරන ගනුදෙනුවලට ප්‍රශ්නයක් ඇති විය හැකියි කියලා මම විශ්වාස කරනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුව ගරු විපක්ෂ නායකතුමා මතු කරපු ප්‍රශ්නයට මම උත්තරයක් දෙන්නම්. HND සහ NVQ 6 සම්බන්ධව කිව්වොත්, NVQ 6 වෙනකොට HND - Higher National Diploma - එකම තමයි වෙන්නේ. NVQ 3, O/Lවලට equivalent. NVQ 4, A/Lවලට equivalent. NVQ 5 සාමාන්‍ය ඩිප්ලෝමා එකට සමානයි. Higher National Diploma එක NVQ 6වලට සමානයි. ඇත්ත වශයෙන්ම HND කියන එක වෙනස් කරන්න මගේ නම් අදහසක් නැහැ, එහෙම කරන්න අවශ්‍යත් නැහැ. ඒ ළමයින් ගත්තේ Higher National Diploma එකට. කොහොමත් Higher National Diploma වෙනුවට NVQ 6 එක ලැබෙනවා. ඒ නිසා මේක වෙනස් කරන්න අවශ්‍ය නැහැ. මම මේ සම්බන්ධව අදාළ ආයතනයට දන්වා Council එකට තීන්දුවක් ගන්න කියන්නම්.

ගරු විපක්ෂ නායකතුමාගේ දැනගැනීම සඳහා මම මේ කාරණයත් කියන්න ඕනෑ. HND එකයි, SLIATE එකේ පාඨමාලාවයි, ඊළඟට රත්මලානේ NAITA එක යටතේ තිබෙන අවුරුදු තුනේ ඩිප්ලෝමා පාඨමාලාව කියන මේ තුනම අරගෙන ඒ ගොල්ලන්ට top-up degree එකක් දෙන්න අපට අවශ්‍යයි. ඒකට හේතුව, අපේ අය Higher National Diploma කියලා මේ සහතිකය අරගෙන අවුරුදු තුනේ course එකකට යෑම. වෙනත් රටවලින් අවුරුදු දෙකෙන් උපාධියකුත් අරගෙන එනවා. මැද පෙරදිග ගියාම අපේ අය දක්ෂයි. Civil, mechanical කියන මේ හැම ක්ෂේත්‍රයකින්ම ඉංජිනේරුවකුගේ දක්ෂතාව අපේ අයට තිබෙනවා. නමුත්, ඔවුන්ට ලැබෙන්නේ අඩු වැටුපක්. මොකද, "Degree" කියන එක ඔවුන්ට නැහැ. ඒ නිසා අපි මෙතැනදී IESL - Institute of Engineers, Sri Lanka - එක, ඊළඟට තාක්ෂණ ශිල්පීන්ගේ ආයතනය වැනි ආයතන සියල්ල ඒකාබද්ධ වෙලා සාකච්ඡා වට කිහිපයක් පවත්වා දැන් එක මතයකට ඇවිල්ලා තිබෙනවා. මේ අය මෙතැනින් එහාට ගියත්, ඉදිරි කාලය තුළදී බඳවා ගන්න අයට උපාධිය දක්වා යන්න පුළුවන්කම තිබෙනවා.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

මොකද, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. Sydney Accord එක අනුව එය ඉංජිනේරු උපාධි සුදුසුකමක්. එතකොට, Washington Accord එක අනුව එය chartered සුදුසුකමක්. ඒ මට්ටමට යනවා. ඒ නිසා මේ අය එකඟයි, Sydney Accord එකේ මට්ටමට ගෙනෙන්න. අපි ඒ මට්ටමටත් යනවා. ඔබතුමා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළ එක හොඳයි. මම UNIVOTEC එකටත්, SLIATE එකටත් දැනුම් දෙනවා, ඒ ගොල්ලන් එකඟ වෙච්ච ආකාරයට HND එකත් එක්ක NVQ Level 6 එක දෙන්න කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අධ්‍යාපන අමාත්‍යතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. රත්මලාන, කුලියාපිටිය, බටන්ගල, අනුරාධපුරය, මාතර, යාපනය කියන ප්‍රදේශවල තිබෙන මේ විශ්වවිද්‍යාල විද්‍යායතනවල ඔබතුමා කියපු ආකාරයට HND සහ NVQ Level 6 පාඨමාලා 2015දී, 2016දී සහ 2017දී ඒ සිසුන්ට ලබා දුන් ආකාරයටම ඉදිරියටත් ක්‍රියාත්මක කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. මොකද, අනාගතයේ දී දූ දරුවන්ට මේ තුළින් උපාධිය දක්වාම යන්න හැකි වෙනවා. අපි මේ ගරු සභාවේ බොහෝ විවේචන කරනවා. නමුත්, හොඳ දේ කළාම අපි ස්තුති කිරීම මඟ හරින්නේත් නැහැ. ඒ නිසා ඔබතුමාට බොහොම ස්තුතියි. එම ශිෂ්‍යයන් කිහිප දෙනෙකුත් අද මේ ගැලරියට ඇවිල්ලා ඉන්නවා. ඔබතුමා ලබා දුන්නේ බොහොම ධනාත්මක පණිවුඩයක්, ගරු ඇමතිතුමනි. ඒ නිසා ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි. අපි ඒ ආකාරයටම ඉදිරියටත් කරගෙන යමු.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 සහ 153 කියන ව්‍යවස්ථාවලට අවධානය යොමු කරමින් මහාචාර්ය චරිත හේරත් මැතිතුමා වැදගත් ප්‍රශ්නයක් මතු කළා, විශේෂයෙන්ම මහ බැංකුවේ සේවක වැටුප් වැඩි කර ගැනීම සම්බන්ධව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා විසින් ඊයේ දින ඉදිරිපත් කරලා සභාගත කරන ලද වාර්තාව ගැනත් සඳහන් කරමින්.

මා හිතන විධියට මේ සම්බන්ධයෙන් ගරු අධිකරණ අමාත්‍යතුමාත් මීට පෙර දිනයකදී ඉතාම පැහැදිලිව සඳහන් කළා. අපේ රටේ ප්‍රධානම නීතිය වෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි; that is the supreme law of the country. එහි XVII වන පරිච්ඡේදයේ තිබෙනවා මූල්‍යය පිළිබඳව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව යටතේ කෙටි සටහනෙහි ඉතාම පැහැදිලිව තිබෙනවා, "රාජ්‍ය මූල්‍යය පිළිබඳ පාලනය පාර්ලිමේන්තුව සතු බව" කියලා. ඒ අර්ථ නිරූපණය ගත්තාම, මහ බැංකුව ස්වාධීන කළේ මේ කියන කාරණයට නොවෙයි. මහ බැංකුවට ස්වාධීනව තීන්දු ගන්න පුළුවන්. ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය කියන දෙගොල්ලන්ම එකතු වෙලා ඒ සංශෝධනයට ඉඩ දුන්නා. ඒකට හේතුව, මුදල් අච්චු ගැසීම වැනි කරුණු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයෙන් බලපෑම් ඇති වීමයි. ඒක හේතු වුණා, උද්ධමනය ඇති වීම, බංකොලොත්භාවය ඇති වීම ආදී සියලු කරුණුවලට. ඒක සලකා බලා තමයි ශ්‍රී ලංකා මහ බැංකු පනත ගෙනැල්ලා මහ බැංකුව ස්වාධීන කළේ. එහෙම නැතිව ඔවුන්ගේ වැටුප් වැඩිකර ගන්න නොවෙයි ඒක කළේ. මහ බැංකුව ස්වාධීන කළේ දේශපාලන බලපෑමකින් තොරව, මහා භාණ්ඩාගාරයේ බලපෑමකින් තොරව ස්වාධීනව මූල්‍ය කටයුතු කරගෙන යන්නයි.

හැබැයි චරිත හේරත් මන්ත්‍රීතුමා අවධානය යොමු කළා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව කෙරෙහි. එහි කියන්නේ විගණකාධිපතිවරයා ගැන. විගණකාධිපතිවරයාට තමයි රාජ්‍ය මූල්‍ය කටයුතු කිරීමේදී ප්‍රධානම වගකීම පැවරෙන්නේ. COPE සහ COPA කියන කමිටු දෙකට විගණන විමසුම් එවලා, විගණන කටයුතු පිළිබඳ සම්පූර්ණ වගකීම තිබෙන්නේ විගණකාධිපතිවරයාට. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී විගණන කොමිසමකුත් පත් කරන්න අපි යෝජනා කරලා තිබෙනවා. ඒ කටයුතුත් දැන් සිදුවෙමින යනවා. ඒ අනුව එතුමා ඉතාම වැදගත් කාරණයකටයි අවධානය යොමු කළේ.

මමත් විශ්වාස කරනවා, මේක precedent එකක් හැටියට ගෙන යා යුතු නැහැ කියලා. මේකෙදි ව්‍යවස්ථානුකූලව තිබෙන ප්‍රතිපාදනත් එක්ක අපි යන්න ඕනෑ. චරිත හේරත් මැතිතුමනි, ඒක තමයි ඔබතුමාගේ මතය වුණේ. මම හිතනවා, ඒක වැදගත් කියලා.

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන ගරු සභානායකතුමාගේ මැදිහත්වීම සම්බන්ධයෙන් මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 5 (1) වගන්තිය යටතේ සඳහන් වෙන්නේ, මහ බැංකුව පාර්ලිමේන්තුවෙන් ස්වාධීන කළා කියායි. මේක වැරදි අදහසක්. මහ බැංකුව ස්වාධීන කළේ විධායකයෙන්. Central Bank එක ස්වාධීන කරලා තිබෙන්නේ Executive එකෙන් මිසක පාර්ලිමේන්තුවෙන් නොවෙයි. අන්න ඒ කාරණය නිසායි මම ප්‍රශ්නය මතු කළේ. ඇමතිතුමා ඉතා නිවැරදිව මේ ප්‍රශ්නයට ආමන්ත්‍රණය කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අනාගතයේදීත් රාජ්‍ය මුදල් කියන එකට ඒකාබද්ධ අරමුදල සහ අනෙකුත් අරමුදල් සියල්ල ඇතුළත්. දැන් පළාත් සභාවල අරමුදල් ඒකාබද්ධ අරමුදලෙන් නොවෙයි යන්නේ. නමුත්, ඒවාත් රාජ්‍ය මුදල්. ඒ නිසා මහ බැංකුවේ මුදල් සියල්ල රාජ්‍ය මුදල් - public finance - වන නිසා ඒ සියලුම මුදල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාවට අදාළයි කියන එක ස්ථාපිත විය යුතුව තිබෙනවා. මොකද, මේ debate එක එවැනි පැත්තකටත් ගමන් කරමින් තිබෙන නිසා මා මේ ගැන කිව යුතුයි. මේ සම්බන්ධයෙන් කථා කළාට ගරු සභානායකතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිශීලනය කළොත් බලාගන්න පුළුවන්, තමන්ට ඕනෑ විධියට පඩි වැඩිකර ගන්න පුළුවන් කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම සඳහන්ව තිබෙන්නේ එකම ආයතනයයි කියන එක. ඒ, Election Commission එක විතරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ Central Bank එක ගැන සඳහනක් නැහැ. Central Bank එකට තමන්ට ඕනෑ විධියට පඩි වැඩි කර ගන්න අරමුණක් තිබුණා නම්, ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කරනවා. නමුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එහෙම සඳහන් කරලා නැහැ. තමන්ට ඕනෑ විධියට පඩි වැඩිකර ගන්න පුළුවන් කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන්ව තිබෙන එකම ආයතනය Election Commission එක විතරයි. මම හිතන විධියට අපේ ගරු විපක්ෂ නායකතුමාත් ඒ බව පසුගිය විවාදයකදී මතු කළා. වැඩිදුර යන්න ඕනෑ නැහැ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේත් එක ආයතනයක් ගැන විතරයි එවැනි ආකාරයට තිබෙන්නේ. අනෙක් සියලු ආයතන පාර්ලිමේන්තුවට යටත්.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට වැදගත් කාරණයක් කියන්න තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමාත් සභාවේ සිටින වෙලාවේ ගරු සභානායකතුමා හරහා මුදල් අමාත්‍යතුමා වෙත මම මේ කරුණ යොමු කරනවා. දැන් සුරාබදු දෙපාර්තමේන්තුව බොහොම වේගයෙන් - ශීඝ්‍රයෙන් - දිගින් දිගටම ර.බී.4 වර්ගයේ නව සුරාසැල් ආරම්භ කිරීම සඳහා බලපත්‍ර නිකුත් කරමින් සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔය කාරණය ඊයෙත් කථා කරලා එයට පැහැදිලි උත්තරයක් දුන්නා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
ඔව්. මට මේ ගැන කියන්න අවස්ථාව දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක ඉතා වැදගත් කාරණයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අද වැදගත් විවාදයක අවසාන දවස.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
ගරු සභානායකතුමනි, පානදුරේ අනගාරික ධර්මපාල පිළිරුව අබියස, නොම්මර 297, ගාලු පාර, පානදුර යන ලිපිනයේ නව සුරාසැලක් විවෘත කිරීම සඳහා බලපත්‍රයක් ලබා දීලා තිබෙනවා. අනගාරික ධර්මපාලතුමා කියන්නේ මේ රටේ අමද්‍යප සටනේ පුරෝගාමියා. ඉතින්, මේ සම්බන්ධව විශාල මහජන විරෝධයක් තිබෙනවා. මේ සම්බන්ධයෙන් ස්වාමීන් වහන්සේලා දිගින් දිගටම වීථියට බැහැලා උද්ඝෝෂණය කරනවා. පොලිස් වාර්තාවේත් සඳහන් වෙලා තිබෙනවා, මේක අනගාරික ධර්මපාලතුමාගේ පිළිරුව අබියස තිබෙන්නේ කියලා. ඒ දෙක අතර මීටර් 10ක වෙනසක් තිබෙන්නේ. ඒ නිසා මම ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ඉතාම ඕනෑකමින් ඉල්ලනවා, මේ ස්ථානයේ මේ සුරාසැල විවෘත කිරීමට ලබා දී තිබෙන බලපත්‍රය වහාම අත්හිටුවීමට කටයුතු කරලා, එය ලබා දීමට කටයුතු කරපු ඒ මුග්ධ නිලධාරින් පිළිබඳව සොයා බලන්න කියලා. අනගාරික ධර්මපාලතුමාගේ පිළිරුව අබියස සුරාසැල් ආරම්භ කිරීම නරක පූර්වාදර්ශයක්.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
පසුගිය මාසයේ ගෙලිඔය ප්‍රදේශයේ බාර් එකක් විවෘත කළා. මම ඒ ගැන හොයා බැලුවා. මම ඒ මන්ත්‍රීවරයාගේ නම කියන්න කැමති නැහැ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ අනුග්‍රහයෙන් තමයි ඒ බාර් එක විවෘත කරලා තිබෙන්නේ. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ඊයේ පාර්ලිමේන්තුවේදී මේ කාරණය මතු කෙරුවා. මේ වැඩේ හරිම අශෝභනයි. මොකද, හැම තැනම බාර්.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය මුදල් අමාත්‍යාංශයට යොමු කරලා, මුදල් රාජ්‍ය ඇමතිතුමාගෙන් පිළිතුරක් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නැවත නැවතත් කියන්න කැමැතියි, මහ බැංකුව ස්වාධීන කිරීම ඇත්තවශයෙන්ම කිහිපදෙනෙකුගේ ඕනෑ එපාකම් මත, මුදල් අච්චු ගැසීමේ ක්‍රියාවලිය තුළ, රටේ උද්ධමනය ප්‍රවර්ධනය වීමත් සමඟ සිද්ධ කරන්න බැහැ කියන එක. වඩාත් ප්‍රශස්ත රාජ්‍ය පාලනයක් තුළ Federal Reserve එක වාගේ, Bank of England වාගේ යම් ස්වාධීනත්වයක් තුළ තමයි මහ බැංකුව ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. හැබැයි, දේශපාලන ඇඟිලි ගැසීම්වලින්, එහෙම නැත්නම් බලවතුන්ගෙන් වන බලපෑම්වලින් බැහැර වන්නට මහ බැංකුව ස්වාධීන කළා හැර ඒ අයට ස්වාධීනත්වයක් ලබා දුන්නේ නැහැ, සියයට 70ක් පඩි වැඩි කරගෙන රටේ සෙසු රාජ්‍ය නිලධාරින්ටයි, රටේ පොදු ජනතාවටයි බඩ පටි තද කරගන්න - belt එක tighten කරගන්න - කියන්න. අද සිද්ධ වෙලා තිබෙන්නේ ස්වාධීනත්වය කියන නාමය වැරදි විධියට උපයෝගී කරගෙන, පාලනය කරන්නට බැරි ආකාරයට ඔවුන් තමතමන්ගේ හිතුමතයට පඩි වැඩි කර ගත්ත එකයි. ඒ නිසා මේ කාරණා දෙක අපි හොඳින් අවබෝධ කර ගන්නට ඕනෑ. එක පැත්තකින්, මහ බැංකුව ස්වාධීන කළේ දේශපාලන ඇඟිලි ගැසීම්වලින් තොරව රටේ මූල්‍ය පාලනය ක්‍රියාත්මක කරන්නයි. ඒක මුවාවෙන් මහ බැංකුවේ නිලධාරින්ට පඩි වැඩි කර ගන්නට කිසිසේත්ම අයිතියක් නැහැ. මම එක දෙයක් කියන්න කැමැතියි. ඇත්ත වශයෙන්ම ටෲමන් ජනාධිපතිතුමා කිව්වා, "The buck stops here" කියලා. ඒ කියන්නේ, වගකීම නතර වෙන්නේ මගේ මේසය උඩ, මගේ ළඟ කියලා. President Truman එහෙමයි කිව්වේ.

දැන් බෝලය පාස් කරන්නේ නැතුව, කරුණාකරලා කොන්ද පණ තිබෙන තීන්දුවක් අරගෙන මේ පඩි වැඩි කිරීම සම්පූර්ණයෙන්ම අහෝසි කරන්න කියා මම ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. සම්පූර්ණයෙන්ම ඒක කරන්න. ඇයි ඒ තීන්දුව ගන්නේ නැත්තේ? ඒක ගන්න කොන්දක් නැද්ද? කශේරුකාවක් නැද්ද? පෞරුෂත්වයක් නැද්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කෙටියෙන් අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඊළඟ කාරණය, ජයන්ත සමරවීර මැතිතුමා මතු කළ ප්‍රශ්නය. ගරු අගමැතිතුමනි, ඒ කාරණය හරිම අශෝභනයි. මත්පැන් බලපත්‍ර 200ක් ලබා දී තිබෙනවා. මම මේ ප්‍රශ්නය මතු කළා. කෝටි ගණනක් ගන්නවා ලු කප්පම, මැතිවරණවලටය කියලා.

අපේ ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමා මතු කළ කාරණයට අදාළ මන්ත්‍රීවරයාගේ නම කිව්වේ නැහැ නේ. ඒ, COPE එකේදී හස්ත සංඥා කරපු මන්ත්‍රීවරයා. එතුමා තමයි ඒ බාර් එක ඇරලා තිබෙන්නේ. ඒ වාගේ මත්පැන් බලපත්‍ර 200ක් බෙදා දෙන්න කටයුතු කරලා තිබෙනවා. අපි කියනවා, බුද්ධ ශාසනය ආරක්ෂා කරන්න අපි බැඳී සිටිනවා කියලා. මත්පැන් බලපත්‍ර බෙදා දීලාද බුද්ධ ශාසනය ආරක්ෂා කරන්නේ? කරුණාකරලා මේකට පියවර ගන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

[ගරු නියෝජ්‍ය කථානායකතුමා]

2024 මාර්තු 19 දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණය කළ පරිදි අද දිනට නියමිත වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වෙනත් දිනයකට යොමු කරනු ලැබේ. -*[බාධා කිරීමක්]*

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, අදවත් න්‍යාය පත්‍රයට අනුව කටයුතු කරන්න ඉඩ දෙන්න.*[බාධා කිරීමක්]* ගරු නලින් බණ්ඩාර මැතිතුමා, ඔබතුමා ඊයේ මතු කරපු ප්‍රශ්නයම ද අදත් අහන්නේ? *[බාධා කිරීමක්]* ඔබතුමා ස්ථාවර නියෝග අංකය කියන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 87 බලන්න, කාරක සභා යටතේ. COPE එකේ සාමාජිකයන් දැන් භාගෙට භාගයක් අයින් වෙලා. නමුත් ඔබතුමන්ලා තවමත් ඒ ගැන තීන්දුවක් ගත්තේ නැහැ. මම අයින් වුණේ නැහැ. නමුත් ඔබතුමන්ලා උත්තරයක් දෙන්න. මොකද, මේ සභාපතිවරයා සම්බන්ධයෙන් වලංගුභාවයක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ස්ථාවර නියෝග 87හි එහෙම එකක් නැහැ. ඔබතුමා හරියට ස්ථාවර නියෝග අංකය කියන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අංකය වරදින්න ඇති. ඔබතුමා උත්තරයක් දෙන්න. ඊයේත් උත්තරයක් දුන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා ඊයේ මතු කළ ප්‍රශ්නයට පැහැදිලි පිළිතුරක් - *[බාධා කිරීමක්]* ගෙවිඳු කුමාරතුංග මැතිතුමා, ඔබතුමාගේ ප්‍රශ්නයත් කියන්න. *[බාධා කිරීමක්]* ඔහොම බොරු කරලා සභාව අසීරුතාවට පත් කරන්න එපා.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහ බැංකුව සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන සාකච්ඡාවේදී ගරු විපක්ෂ නායකතුමාත් කිව්වා, අලුත් පනතින් බලාපොරොත්තු වුණේ දේශපාලනඥයාගෙන් මහ බැංකුව නිදහස් කිරීම - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හරි, හරි. ඒ ගැන කථා කළා නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
මට තත්පරයක් දෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඇති දැන්. ඇති, ඇති. *[බාධා කිරීම්]* - සභානායකතුමා, ඔබතුමා උත්තරයක් දෙන්න.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු නලින් බණ්ඩාර මැතිතුමා සඳහන් කළ ස්ථාවර නියෝග 87හි සඳහන් වන්නේ මෙයයි:

> "යම් යෝජනාවක් හෝ සංශෝධනයක් ඉදිරිපත් කරනු ලබන මන්ත්‍රීවරයකුට එය සනාථ කරමින් කථා කරනු ලැබිය හැකි ය. එසේ වුවද, එම යෝජනාව හෝ සංශෝධනය නිසි ලෙස ස්ථිර කරනු ලබන තෙක් ඒ පිළිබඳ වැඩිදුර විවාදයකට ඉඩ දෙනු නොලැබිය යුතු අතර...."

ඒ අනුව ගරු මන්ත්‍රීතුමා මතු කරපු ස්ථාවර නියෝගය ඔය කියන ප්‍රශ්නයට අදාළ නැහැ. *[බාධා කිරීමක්]* ඉන්න, මම උත්තර දෙන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 120 සහ 121 යටතේ තමයි COPE එක සහ - *[බාධා කිරීමක්]* ඉන්න, මම ඒකත් පැහැදිලි කර දෙන්නම්. මොකද, මේ සම්බන්ධව විවිධ වැරදි මත සමාජය තුළ සංසරණය වෙනවා. ඒ නිසා මම කල්පනා කළා මේ ගැන පැහැදිලි කරන්න. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ගැන ස්ථාවර නියෝග 119 යටතේ සඳහන් කර තිබෙනවා. ඊළඟට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සම්බන්ධයෙන් සඳහන් කර තිබෙන්නේ ස්ථාවර නියෝග 120 යටතේයි. ස්ථාවර නියෝග 120 (1) යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් නොවන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් සමන්විත පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව..."

මෙම මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාවේ පොඩි සංශෝධනයක් වෙලා තිබෙනවා. අපි Party Leaders' Meeting එකේදී සාකච්ඡා කළ විධියට ඒ අනුපාතය එනවා. හැබැයි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා පත් කරන්නේ ජනාධිපති හෝ අගමැති හෝ කථානායකතුමා නොවෙයි.

ඒක මේ ස්ථාවර නියෝගවල ඉතා පැහැදිලිව සඳහන්ව තිබෙනවා. යම් පාර්ලිමේන්තු සැසි වාරයක් ආරම්භ වුණාට පසුව ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරුන් යෝජනා කරන නම් තේරීම් කාරක සභාවේදී ස්ථිර කරලා ඒ අය COPE එකේ සාමාජිකයන් හැටියට ගරු කථානායකතුමා විසින් නිවේදනය කරනු ලබනවා. ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත COPE එකේ ප්‍රථම රැස්වීමේදී තමයි එහි සභාපතිවරයා තෝරාගනු ලබන්නේ. මම අවධානය යොමු කරන්නේ ඊට අදාළ ස්ථාවර නියෝගය කෙරෙහියි. දැන් COPE එක හරියාකාරව ස්ථාපනය වෙලා නැත්නම් මොකක්ද කළ යුත්තේ? ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කරන ප්‍රශ්නය ඒකයි. මේ වන කොට COPE එක රැස් වෙලා තිබෙනවා,

සභාපතිවරයෙක් පත් කරගෙන තිබෙනවා, ඊට පස්සේ දවසින් දවස සාමාජිකයෝ අස් වෙවී යනවා, එතකොට COPE එකේ සිටිය යුතු නියමිත සාමාජික සංඛ්‍යාව නැහැ කියන පදනම මතයි දැන් ඔය ප්‍රශ්නය මතු කර තිබෙන්නේ. තමන්ගේ ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ඒ ඇතැම් මන්ත්‍රීවරු විටින් විට දැනුම් දීම් කරනවා. ඒ නිසා ඒ ඉල්ලා අස්වීමේ සම්පූර්ණ ලිපි ටික බලා, අස් වෙලා තිබෙන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් නම්, වෙනත් අය පත් කරන්න කියලා විපක්ෂයට දැනුම් දෙන්න ගරු කථානායකතුමාට පුළුවන්. එහෙම පත් කිරීමක් සිදු වෙන්නේ නැත්නම් ඊට පස්සේ ඒ පිළිබඳව තීන්දුවක් ගන්න පුළුවන්. දැන් පැහැදිලියි නේ, COPE එකේ සභාපතිවරයා පත් කරන්නේ ජනාධිපතිවරයා හෝ ආණ්ඩුව හෝ නොවන බව. එය එම කමිටුවේ සාමාජිකයන් විසින් කරනු ලබන පත් කිරීමක්.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාට කියනවා, දැන් හතළිස් ඇඳිරිය තිබෙන නිසා මටත් කණ්ණාඩි දෙකක් පාවිච්චි කරන්න වෙයි කියලා. ස්ථාවර නියෝග අංකය මට පොඩ්ඩක් එහෙ මෙහේ වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමාගේ පැහැදිලි කිරීම හරි. මෙතැන දැන් තිබෙන්නේ සම්ප්‍රදායයන් පිළිබඳ ප්‍රශ්නයක් සහ විශ්වසනීයභාවය පිළිබඳ ප්‍රශ්නයක්. මේ පාර්ලිමේන්තුවේ කවදාවත් COPE එකට පත් කරපු සාමාජිකයන් අයින් වෙලා නැහැ. හැබැයි දැන් ඒ එක්කෙනා, දෙන්නා, තුන්දෙනා, හතරදෙනා COPE එකෙන් අයින් වෙනවා. මම විතරද දන්නේ නැහැ ඉතිරි වෙලා ඉන්නේ. මම තවම අයින් වුණේ නැත්තේ යම්කිසි හේතුවක් හින්දා; තාක්ෂණික හේතුවක් හින්දා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය අපේ සමස්ත පාර්ලිමේන්තුවට හොඳ දෙයක් නොවෙයි. *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මට අවස්ථාව දෙන්න. විශේෂයෙන්, විගණකාධිපතිවරයාත් එක්ක එකට ඉඳගෙනයි ඒ සභාපතිවරයා වැඩ කරන්න ඕනෑ. හැබැයි, මේ විධියට විශ්වසනීයභාවය කඩ වුණාම ඒ නිලධාරින්ටත් වැඩ කරන්න බැරි වෙනවා. ඒ නිසා කරුණාකර ආණ්ඩු පක්ෂයෙන් තීන්දුවක් අරගෙන, ඒ පත් වුණු සභාපතිවරයා ඉල්ලා අස් වෙලා එම කාරක සභාවේ සභාපතිකම විපක්ෂයට දෙන්න බැරි නම් පිළිගත හැකි - අවම පිළිගැනීමක් හරි තිබෙන- පුද්ගලයෙකු සභාපති ලෙස පත් කරන්න. මම කියනවා, "යනවා නම් අනේ මං අරන් - යන තැනකට යන්න රත්තරන්" කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, කෙටියෙන් අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු සභානායකතුමනි, මම පොඩි නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. ඔබතුමා කිව්වා එම කාරක සභාවලට පත් කරන ක්‍රමවේදය ගැන; select කරන Committee එකෙන් කරන කටයුත්ත ද ඇතුළුව එම ක්‍රියාවලිය ගැන. අපි ඇත්ත කථා කරමුකෝ.

හර්ෂ ද සිල්වා මැතිතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති තනතුරට පත් වුණේ එහෙම නොවෙයි නේ. හර්ෂ ද සිල්වා මැතිතුමා එම තනතුරට පත් කළේ ජනාධිපතිතුමාම ඇවිල්ලායි. ඒක නැහැ කියනවා ද? *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. තත්පරයක් ඉන්න. එහෙම නොවෙයිද? ඔබතුමා ඉදිරිපත් කරන න්‍යාය, ඔය ස්ථාවර නියෝග, ඔය ක්‍රියා පටිපාටිය ආදිය නිකම් එළියට සෙල්ලම් නේ. හර්ෂ ද සිල්වා මැතිතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති කළේ වෙනත් කවුරුවත් නොව, තමා බව ජනාධිපතිතුමාම කියනවා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

He came for the meeting.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

එතුමාම රැස්වීමට ආවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඉතින් ඒක හොඳයි නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

හොඳ නරක නොවෙයි මම කියන්නේ. ඒක බොහොම හොඳයි. ඒක කරන්න තිබුණේ අපි කියපු වෙලාවේ මුලදීම. වර්තමාන කථානායකවරයා අරගළය කාලයේ ඒක කරන්නම් කියලා පොරොන්දු වෙලා ඊට පස්සේ ඒක අමතක කළා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඉක්මනින් අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඒක නොවෙයි මම මේ කියන්නේ. පොතේ තිබෙන්නේ ඔහොම තමයි. පොතේ ඔහොම තිබුණාට, ඇත්ත කථා කරමුකෝ. නායකයා තීන්දු කළොත් මේක විපක්ෂයට දෙනවා කියලා, විපක්ෂයට දෙනවා. නායකයා තීන්දු කළොත් අහවලාට දෙනවා කියලා, අහවලාට දෙනවා. මේ පාරත් COPE එකේ සභාපතිවරයා පත් වුණේ ජනාධිපතිතුමා ප්‍රමුඛ ඔබතුමන්ලාගේ ආශිර්වාදයෙන්. ඒක තමයි ඇත්ත. ඒක තමයි තිත්ත ඇත්ත.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ඒක සම්පූර්ණයෙන් වැරැදියි. එවැනි සම්බන්ධතාවක්, මැදිහත් වීමක් වුණේ නැහැ.

**ගරු ජානක වක්කුඹුර මහතා (පළාත් සභා, පළාත් පාලන සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜானக வக்கும்புர - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் சுற்றாடல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura - State Minister of Provincial Councils, Local Government and Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා පත් කළේ අපේ ඡන්දයෙන්. ඡන්දයට ඉදිරිපත් වුණා, දෙදෙනෙක්. ඒ කමිටුවේ හිටපු සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් තමයි එතුමාව පත් කළේ.

[ගරු ජානක වක්කුඹුර මහතා]

එම ධුරයට දෙදෙනෙක් ඉදිරිපත් වුණා. අපි ඒ වෙලාවේ ඡන්දයක් ඉල්ලුවා. ඒ දෙදෙනාගෙන් එක්කෙනෙක් පත් කළා. පත් කරන, පත් කරන කෙනා හොඳ නැහැ කිව්වොත්, එහෙම කියන කියන පාරට ඒ අය අයින් කරනවාද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ගෙවිඳු කුමාරතුංග මැතිතුමා. ඔබතුමාට පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි කියලා ඉල්ලීමක් කරලා තිබෙනවා. විනාඩියකින් කියලා අවසන් කරන්න.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)

මහ බැංකුව පිළිබඳව ඇති වෙච්ච සංවාදය ගැනයි මං කියන්නේ. අලුත් පනතින්, මහ බැංකුවට දේශපාලනඥයාගේ මැදිහත් වීමයි අයින් කරනවා කියන්නේ. හැබැයි, මහ බැංකුවේ අධිපතිතුමාගේ නම යෝජනා කරන්න තිබෙන්නේ මුදල් ඇමතිතුමාටයි. පත් කරන්න තිබෙන්නේ ජනාධිපතිතුමාටයි. අද ඒ දෙදෙනාම එක්කෙනෙක්. ඒ ගැන කිව්වාම ගරු අගමැතිතුමාටත් එදා හිනා ගියා. මුදල් ඇමතිතුමා වන එතුමා එක පැත්තකින් යෝජනාව කරලා එතුමාම ගිහිල්ලා අනෙක් පැත්තේ වාඩි වෙලා පත්වීම දෙනවා. ඒ වෙනුවට කරලා තිබෙන්නේ මුදල් අමාත්‍යාංශයේ ලේකම් ඉවත් කිරීමයි. රාජ්‍ය වගකීම එතැනින් අයින් කිරීමයි කරලා තිබෙන්නේ. ඒ නිසායි මේ විකාරයක් කරන්නේ, දේශපාලනඥයාගේ බලපෑම අයින් කළා කියලා. එහෙම දෙයක් වෙලා නැහැ අලුත් පනතින්වත්. ඒ නිසා තමයි අප කියන්නේ, ශ්‍රී ලංකා මහ බැංකු පනතේ මූලික දෝෂයක් තිබෙනවා, කරුණාකර ඒ ගැන අවධානය යොමු කරන්න කියලා. අවධානය යොමු කරලා ඒක නිවැරැදි කරන්න කටයුතු කරන්න කියන එකයි අපේ ඉල්ලීම. ඔබතුමාට බොහොම ස්තුතියි, මට අවස්ථාව දුන්නාට.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය, ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමා.

## නොගෙවූ විදුලි බිල්පත් පිළිබඳ රංජන් ජයලාල් මහතා විසින් කළ අසත්‍ය ප්‍රකාශය
## செலுத்தப்படாத மின் கட்டணப் பட்டியல் தொடர்பான திரு. ரஞ்சன் ஜயலாலினது தவறான கூற்று
## FALSE STATEMENT MADE BY MR. RANJAN JAYALAL REGARDING UNPAID ELECTRICITY BILLS

**ගරු නීතිඥ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி டபிள்யு.டி.ஜே. செனவிரத்ன)
(The Hon. W.D.J. Seneviratne, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය ජනවාරි 21වන දින "හිරු" රූපවාහිනී නාළිකාවේ සවස 6.55 ප්‍රවෘත්ති විකාශනයේදී විදුලිබල මණ්ඩලයේ හිටපු නුපුහුණු සේවකයෙකු වන රංජන් ජයලාල් යන අය, මා විසින් විදුලිබල මණ්ඩලයට රුපියල් ලක්ෂ 18ක මුදලක බිලක් නොගෙවා ඇති බව රත්නපුර ප්‍රදේශයේදී පවත්වන ලද සාකච්ඡාවකදී ප්‍රකාශ කළ බව විකාශනය විය.

මෙම ප්‍රකාශය අසා මා පුදුමයට පත් වූ අතර, වහාම විදුලිබල මණ්ඩලයට කථා කර මගේ නමින් විදුලි බිල් නොගෙවා එවන් විශාල මුදලක හිඟයක් ඇති දැයි සොයා බලා වාර්තා කරන ලෙස ඉල්ලා සිටියෙමි. එහි දී මා ඇමතිවරයෙකු වශයෙන් පදිංචිව සිටි නිවස අයත් ප්‍රදේශය භාර ප්‍රධාන විදුලි ඉංජිනේරු (කොළඹ දකුණ) දිසානායක මහතා විසින් ප්‍රකාශ කරන ලද්දේ 1997.11.27 දින සිට 2002.04.20 දින දක්වා කොළඹ 05, කැප්පෙටිපොල මාවතේ පිහිටි අංක C44 දරන නිවසේ කම්කරු ඇමති වශයෙන් හා සෞඛ්‍ය ඇමති වශයෙන් කටයුතු කළ කාලය තුළ ගෙවිය යුතු සියලු විදුලි බිල්පත් මේ වන විට ගෙවා අවසන් කර ඇති බවයි.

කෙසේ නමුත්, මා සෞඛ්‍ය අමාත්‍ය ධුරය දරමින් එම නිවසේ සිටි අවසන් මාසය සඳහා එම අමාත්‍යාංශය විසින් රුපියල් 25,393.16ක මුදලක් පමණක් ගෙවීමට ඇති බව ප්‍රකාශ කරන ලදී. එය මා වෙත දැන්වීමෙන් පසු එම රුපියල් 25,400.00ක හිඟ මුදල මා විසින් ගෙවා අවසන් කරන ලදී. එම රිසිට්පත සභාගත කිරීමට හැකි ය.

නමුත්, 2002.04.20 දින සිට - මං එම නිවසින් ඉවත් වූ පසු - එම්.කේ. සිවාජිලිංගම් නම් මන්ත්‍රීවරයා එම නිවසේ පදිංචියට පැමිණි අතර, 2006.10.08 දක්වා - ඒ කියන්නේ අවුරුදු 4 1/2ක් - ඔහු අඛණ්ඩව එම නිවසේ පදිංචිව සිට ඇත. එම කාලය තුළ ඔහු විසින් පරිභෝජනය කරන ලද විදුලිය සඳහා විදුලි බිල වශයෙන් රුපියල් 1,603,129.91ක මුදලක් විදුලිබල මණ්ඩලයට හිඟ තබා ගොස් ඇත. එය ගෙවීම මට අයත් වගකීමක් නොවේ. තවද මෙම කරුණු මා වෙත දන්වා ඇති 2024.02.20 දිනැති ප්‍රධාන විදුලි ඉංජිනේරු (කොළඹ දකුණ) ඩී.එම්.ඒ.කේ. දිසානායක මහතා විසින් එවන ලද ලිපියේ, එම නිවසින් මා ඉවත්ව ගිය පසු එහි පදිංචියට පැමිණි එම්.කේ. සිවාජිලිංගම් මන්ත්‍රීවරයා පදිංචිව සිටි කාල සීමාවට නිකුත් කරන ලද විදුලි බිල්පත් සඳහා රුපියල් 1,603,129.91ක හිඟ මුදලක් ගෙවීමට ඇති බව ප්‍රකාශ කර ඇත. එම විදුලි බිල ද රංජන් ජයලාල් මහතා විසින් මගේ නමින් ඇතුළත් කර මෙම ප්‍රකාශය කර ඇති බව පැහැදිලි ය.

කෙසේ වෙතත්, රජයේ එම නිල නිවසේ 2002.04.20 සිට 2006.10.08 කාල වකවානුවේ සැබෑ ලෙසම පදිංචිකරු වන එම්.කේ. සිවාජිලිංගම් හිටපු මන්ත්‍රීවරයාගෙන් රුපියල් 1,603,129.91ක හිඟ මුදල අය කර ගැනීම සඳහා දන්වා ප්‍රධාන විදුලි ඉංජිනේරු (කොළඹ දකුණ) ඩී.එම්.ඒ.කේ. දිසානායක මහතා විසින් 2024.02.26 දාතමින් ලිපියක් නැවතත් යවා ඇත. එම ලිපියේ පිටපතක් මාගේ ඉල්ලීම පරිදි මා වෙත එවා ඇත. එය මා ඉදිරිපත් කරමි.

මෙම ප්‍රකාශය කළ විදුලිබල මණ්ඩලයේ හිටපු සේවකයෙකු වන රංජන් ජයලාල් යන අය විසින් නිසි සොයා බැලීමකින් තොරව එම හිඟ මුදල ද මා විසින් ගෙවිය යුතු මුදලක් යැයි රටට හැඟෙන පරිදි ද්වේශසහගතව ප්‍රකාශ කළ බව මම සඳහන් කරමි.

එමෙන්ම රංජන් ජයලාල් යන පුද්ගලයා ඊට මාස කිහිපයකට පෙර ද "හිරු" නාළිකාවේ වමුදිත සමරවික්‍රම මහතා විසින් පවත්වාගෙන යන සමාජ මාධ්‍ය නාළිකාවේ ද මා විසින් විදුලිබල මණ්ඩලයට රුපියල් 2,300,000.00ක හිඟ විදුලි බිලක් ගෙවල්

දෙකක් සඳහා ගෙවීමට ඇති බව ප්‍රකාශ කරන ලදි. එහිදී වෙනත් ඇමතිවරුන් රාශියකගේ නම් ද ප්‍රකාශ කරමින් එවැනි හිඟ මුදල් ගෙවීමට ඇති බව ද ප්‍රකාශ කරන ලදී.

ඔහු එම ප්‍රකාශ කිරීමෙන් පසුව ද මා ඒ පිළිබඳව සොයා බැලුවෙමි. මා 2004.08.06වන දින සිට 2015.05.18වන දින දක්වා කොළඹ 07, විජේරාම මාවතේ අංක 119 (109) නිවසේ පළමුව අධිකරණ අමාත්‍යවරයා ලෙස ද, ඉන්පසු විදුලිබල අමාත්‍යවරයා වශයෙන් ද, අවසාන වශයෙන් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා වශයෙන් ද කටයුතු කර ඇති අතර, එම වකවානුව තුළ මා පදිංචිව සිටි නිවස සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු හිඟ විදුලි බිල් ඇද්දැයි එවකට එම නිවස අයත්ව සිටි රාජ්‍ය සේවා හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් හා ලංකා විදුලිබල මණ්ඩලයේ එම නිවස පිහිටි ප්‍රදේශය භාර කොළඹ දකුණ ප්‍රධාන විදුලි ඉංජිනේරු ඒ.ඒ. විතානගේ මහතාගෙන් ද ලිඛිතව විමසුවෙමි.

එම ලිපියට පිළිතුරු වශයෙන් මා වෙත "කොළඹ 07, විජේරාම මාවත, අංක B 109 දරන රජයේ නිල නිවසේ හිඟ විදුලි බිල්පත් නිරවුල් කිරීම" යනුවෙන් ලිපියක් රාජ්‍ය සේවා හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (නිවාස හා සංවර්ධන) පී.යූ.ටී. වරුසවිතාන මහතා විසින් 2022.03.02 දාතමින් මා වෙත යොමු කරන ලදි. එම ලිපියේ සඳහන් පරිදි එකී නිල නිවසේ මා අමාත්‍යවරයකු වශයෙන් රැඳී සිටි කාලය තුළදී ගෙවිය යුතු සියලු විදුලි බිල්පත් නිසි පරිදි නිරවුල් කර ඇති බවත්, 2015 වර්ෂයේ මැයි මස බිල්පත වන -මා ඇමති ධුරයෙන් ඉවත් වී එහි රැඳී සිටි අවසාන කාල වකවානුව- රුපියල් 63,310.95ක බිල්පත පමණක් නිරවුල් වී නොමැති බව විස්තරාත්මක බිල්පත් වාර්තාව නිරීක්ෂණය කිරීමේදී හඳුනාගත් බවත් මා වෙත දන්වනු ලැබීය. එම ලිපිය මඟින් දන්වා ඇත්තේ මා එම නිවසේ පදිංචි වී සිටි අවසාන කාලය වෙනුවෙන් ගෙවිය යුතු හිඟ මුදලයි. එම හිඟ මුදල ද මා විසින් ගෙවා දමන ලදි.

කෙසේ නමුත්, රජයේ නිවාස දෙකක පදිංචි වී සිටි මා විසින් ගෙවිය යුතු සියලු විදුලි බිල්පත් මුදල් ගෙවා ඇති බව මෙයින් තහවුරු වේ. එම නිලධාරින් විසින් මා වෙත වරින් වර එවන ලද එම ලිපිවල - ලිපි 4ක - පිටපත් ද මම මේ අවස්ථාවේ **සභාගත*** කරමි.

රංජන් ජයලාල් නැමැති අය රූපවාහිනී නාළිකා ඔස්සේ වරින් වර අසත්‍ය ප්‍රකාශ කරමින් ජනතා අප්‍රසාදයක් මා වෙත ඇති කිරීමට බලාපොරොත්තු වන බව පැහැදිලි ය. මා විසින් ලංකා විදුලිබල මණ්ඩලයට රුපියල් 2,300,000.00ක හිඟ විදුලි බිලක් ගෙවීමට ඇති බව පළමුව ද, රුපියල් 1,800,000.00ක් ගෙවිය යුතු බව දෙවනුව ද ප්‍රසිද්ධ රූපවාහිනී නාළිකා තුළ ප්‍රකාශ කිරීම ද්වේශසහගතව සිදු කරන්නක් බව පැහැදිලි ය.

මා විදුලිබල ඇමතිවරයා වශයෙන් සිටි කාලය තුළ මොහුගේ ක්‍රියාකලාපය සම්බන්ධව මා විරුද්ධත්වය පළ කළ හෙයින් මා කෙරෙහි වෛර සහගත සිතුවිල්ලකින් මෙලෙස කටයුතු කරනවා විය හැක. මෙසේ රුපියල් ලක්ෂ ගණනින් මා විදුලි බිල්පත් නොගෙවා ඇති බව කියා සිටීම තුළ මා දේශපාලනඥයෙකු හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් ජනතාව අතර අප්‍රසාදයට පත් කිරීමේ හා මා වෙතින් ද්වේෂ සහගතව පළි ගැනීමේ අරමුණෙන් ක්‍රියාත්මක කරන සැලසුම්සහගත වැඩ පිළිවෙළක් ඇති බව මට හැඟේ; එය මට ඔප්පු කළ හැක. මේ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මාගේ වරප්‍රසාද කඩ වී ඇති බව පැහැදිලිය. ඒ නිසා මෙම කරුණු සම්බන්ධව විශේෂ අවධානය යොමු කර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව වෙත මෙම ගැටලුව යොමු කිරීමට කටයුතු කරන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමා, අපේ පැත්ත බලන්න. ඔබතුමා කථානායකතුමා වාගේ වෙන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හර්ෂ ද සිල්වා මැතිතුමා දැන් නේ ආවේ. මම දැක්කේ නැහැ. *[බාධා කිරීමක්]* ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඒ ගැන සමාවෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ නම සඳහන් කරලා, අපේ කමිටුවේ වාර්තාව පිළිබඳව චරිත හේරත් මන්ත්‍රීවරයා කලින් අදහසක් ඉදිරිපත් කරලා තිබුණා. එතුමා සමඟ සාකච්ඡා කරලා මම එතුමාගේ අදහස ලබා ගත්තා. මහ බැංකුවේ ස්වාධීනත්වය පිළිබඳව අපි නීතිපතිවරයාගෙන් නිර්දේශයක්, අර්ථ කථනයක් ලබා ගත්තොත් හොඳයි කියලායි එතුමා කියන්නේ. මම එතුමාට කියන්න කැමැතියි, අපි ඒ දේ කළ බව. ඒ සම්බන්ධයෙන් පිටු දහයක විතර අර්ථ කථනයක් අපට ලැබී තිබෙනවා. ඒක මේ වාර්තාවට ඇතුළත් කළේ නැති වුණාට අර්ථ කථනයක් ලබාගෙන තිබෙනවා. රජයේ මුදල් පිළිබඳ අර්ථ කථනය ඒකේ සඳහන් වෙනවා. ඒ නිසා එතැන කිසිම ගැටලුවක් නැහැ.

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
ගරු හර්ෂ ද සිල්වා මැතිතුමනි, ඒ definition එක table කළොත් වැදගත් වෙයි. මොකද, අනාගතයේදී වෙනත් විවාදවලදීත්, Committeesවලදීත් මේ ප්‍රශ්නය මතු වෙන්න ඉඩ තිබෙනවා. ඔබතුමා ඒ interpretation එක අරගෙන තිබෙනවා නම්, ඒක පුළුවන් නම් table කරන්න. ඒක ඉතා වැදගත්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත
### வங்கிகளால் வழங்கப்பட்ட கடன்கள் அறவிடுதல் (விசேட ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்
### RECOVERY OF LOANS BY BANKS (SPECIAL PROVISIONS) (AMENDMENT) BILL

"1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසිනි.***

***2024 අප්‍රේල් 09වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சர் சார்பாக மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2024 ஏப்பிரல் 09, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Susil Premajayantha on behalf of the Minister of Finance, Economic Stabilization and National Policies; to be read a Second time upon Tuesday, 09th April, 2024 and to be printed; and to be referred to the Committee on Public Finance.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.00 දක්වා ද විය යුතු ය. අ.භා. 5.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2024 අප්‍රේල් 01 සඳුදා සහ අප්‍රේල් 02 අඟහරුවාදා යන දිනයන්හි පාර්ලිමේන්තුව රැස්වන දිනයන් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### III

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2024 අප්‍රේල් 01 සඳුදා සහ අප්‍රේල් 02 අඟහරුවාදා දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8 (5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 05, ගරු ඩී. වීරසිංහ මන්ත්‍රීතුමා.

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### இலங்கை வசதிகள் முகாமைத்துவ நிறுவகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### INSTITUTE OF FACILITIES MANAGEMENT SRI LANKA (INCORPORATION) BILL

**ගරු ඩී. වීරසිංහ මහතා**
(மாண்புமிகு டி. வீரசிங்க)
(The Hon. D. Weerasingha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

**ගරු කුමාරසිරි රත්නායක මහතා**
(மாண்புமிகு குமாரசிறி ரத்னாயக்க)
(The Hon. Kumarasiri Rathnayaka)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Urban Development and Housing for report.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

දිනට නියමිත කටයුතු. න්‍යාය පත්‍රයේ විෂය අංක 01, කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට එරෙහි විශ්වාස භංග යෝජනාව පිළිබඳ කල් තබන ලද විවාදය තවදුරටත් පැවැත්වීම.

විවාදය ආරම්භ කිරීම, ගරු විපක්ෂ නායකතුමා.

## කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට එරෙහි විශ්වාස භංග යෝජනාව
## சபாநாயகர் மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன அவர்களுக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணை
## VOTE OF NO CONFIDENCE AGAINST HON. MAHINDA YAPA ABEYWARDANA, SPEAKER

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***
***ඊට අදාළ ප්‍රශ්නය - [2024 මාර්තු 19]***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [2024 மார்ச் 19]*

*Order read for resuming Adjourned Debate on Question - [19th March, 2024]*

"ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු හේෂා විතානගේ මහතා
ගරු දිලිප් වෙදආරච්චි මහතා
ගරු මනෝ ගනේසන් මහතා
ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
ගරු නයන වාසලතිලක මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු දයාසිරි ජයසේකර මහතා
ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා
ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා
ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
ගරු තිස්ස අත්තනායක මහතා
ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
ගරු එස්.එම්. මරික්කාර් මහතා
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු මයන්ත දිසානායක මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු අශෝක් අබේසිංහ මහතා
ගරු රෝහණ බණ්ඩාර මහතා
ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු ජේ.සී. අලවතුවල මහතා
ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය
ගරු සෙයියිඩ් අලි සාහිර් මව්ලානා මහතා
ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු වේලු කුමාර් මහතා
ගරු ජයරත්න හේරත් මහතා
ගරු අබ්දුල් හලීම් මහතා
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා
ගරු විජිත හේරත් මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,- කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට එරෙහි විශ්වාස භංගත්වය,- මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ දී එම පනත් කෙටුම්පතේ ඇතැම් වගන්තීන් එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීරණයට පටහැනි ලෙස සම්මත කර ගන්නා බවට විපක්ෂයේ මන්ත්‍රීවරුන් දැඩි විරෝධතා ඉදිරිපත් කර සිටිය දී එම විරෝධතා නොසලකා හරිමින් එකී ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට පටහැනි ලෙස ආණ්ඩු පක්ෂයට එම පනත් කෙටුම්පතේ යම් වගන්තීන් සම්මත කරවා ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

විශේෂයෙන්ම,

(අ) එම පනත් කෙටුම්පතේ 13 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට අනනුකූල බවත්, ඒ අනුව එම වගන්තිය විශේෂ බහුතරයකින් සම්මත කර ගත යුතු බවත්, සරල බහුතරයකින් සම්මත කරවා ගැනීමට නම් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ සඳහන් සංශෝධන සිදු කළ යුතු බවත්, ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබිය දී එම සංශෝධන සිදු නොකර සරල බහුතරයකින් එම වගන්තිය සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

[ගරු නියෝජ්‍ය කථානායකතුමා]

(ආ) එම පනත් කෙටුම්පතේ 17 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, එය විශේෂ බහුතරයකින් සම්මත කරගත යුතු බවත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදීත්, එම වගන්තිය පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ දී ඉවත් කර දමන බවට නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දී තිබියදීත් එම වගන්තිය ඒ ආකාරයෙන්ම සරල බහුතරයකින් සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ඇ) එම පනත් කෙටුම්පතේ 20, 33(6), 34(1), 35(1) වගන්තීන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, ඒ අනුව විශේෂ බහුතරයකින් සම්මත කර ගත යුතු බවත්, සරල බහුතරයකින් සම්මත කර ගැනීමට නම්, ශ්‍රේෂ්ඨාධිකරණය සිදු කළ සංශෝධන සිදු කළ යුතු බවත්, ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදීත්, එම නිර්දේශ කරන ලද සංශෝධන නොකර සරල බහුතරයකින් එම වගන්තීන් සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ඈ) එම පනත් කෙටුම්පතේ 21 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, එය විශේෂ බහුතරයකින් සම්මත කරගත යුතු බවටත්, ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදීත් සහ එම වගන්තිය සරල බහුතරයකින් සම්මත කර ගැනීම සඳහා අවශ්‍ය සංශෝධන පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ දී ඉදිරිපත් කරන බවට නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දී තිබියදීත් ඒ ආකාරයෙන් කටයුතු නොකර එම වගන්තිය සරල බහුතරයකින් සම්මත කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ඉ) එම පනත් කෙටුම්පතේ 22 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, ඒ අනුව විශේෂ බහුතරයකින් සම්මත කර ගත යුතු බවටත්, සරල බහුතරයකින් සම්මත කර ගැනීමට නම් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ප්‍රකාරව සංශෝධන සිදු කළ යුතු බවත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදී, එම සංශෝධන සිදු නොකර සරල බහුතරයකින් එම වගන්තිය සංශෝධනය කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

(ඊ) එම පනත් කෙටුම්පතේ 31 වැනි වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල බවත්, ඒ අනුව විශේෂ බහුතරයකින් සම්මත කර ගත යුතු බවටත්, සරල බහුතරයකින් සම්මත කර ගැනීමට නම් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව පරිදි සංශෝධන සිදු කළ යුතු බවටත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබියදී, එම සංශෝධන සිදු නොකර සරල බහුතරයකින් එම වගන්තිය සංශෝධනය කර ගැනීමට ඉඩ ලබා දීමෙන් ද;

මේ බව තහවුරු කරමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ද එම පනත් කෙටුම්පතේ ඇතැම් වගන්තීන් සම්මත කර ගැනීමේ දී ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අනුව කටයුතු කර නොමැති බවත්, එසේ කටයුතු නොකිරීම නිසා දැනට එම පනත පවතින ආකාරයට එය සම්මත කර ගැනීම සඳහා අවශ්‍ය ඡන්ද ප්‍රමාණය පාර්ලිමේන්තුවේදී ලැබී ඇත් ද යන්න පිළිබඳව බලවත් ප්‍රශ්නයක් පැන නැඟී ඇති බවත් කථානායකවරයාට එම කොමිෂන් සභාව විසින් යොමු කරන ලද 2024 පෙබරවාරි 08 දිනැති ලිපියේ දක්වා ඇති හෙයින් ද;

එසේම, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පතෙහි තුන්වැනිවර කියැවීමේ දී විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා විසින් පැහැදිලිවම බෙදීමක් ඉල්ලා සිටිය දී එම ඉල්ලීම නොසලකා බෙදීමක් ලබා නොදී එම පනත් කෙටුම්පතෙහි තුන්වැනිවර කියවීම බෙදීමකින් තොරව සම්මත කර ගැනීමට ඉඩ හැරීමෙන් ද;

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පතෙහි පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ දී එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීරණයට පටහැනි ආකාරයට ඇතැම් වගන්තීන් ආණ්ඩු පක්ෂය විසින් සම්මත කර ගෙන ඇති හෙයින් ඒ සම්බන්ධයෙන් ගැඹුරින් සලකා බලන තෙක් එම පනත් කෙටුම්පත නීතියක් බවට පත් කිරීම සඳහා සහතිකය සටහන් නොකරන ලෙසට 2024 පෙබරවාරි 01 වැනි දින පැවති පක්ෂ නායකවරුන්ගේ විශේෂ රැස්වීමේදී විපක්ෂයේ මන්ත්‍රීවරයන් පිරිසක් කථානායක වරයාගෙන් ඉල්ලා තිබියදීත් එම ඉල්ලීම සැලකිල්ලට නොගෙන එම පනත් කෙටුම්පත නීතිගත කිරීම සඳහා සහතිකය සටහන් කිරීමෙන් ද;

2024 පෙබරවාරි 26 දින පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා රැස්වීමේ දී පොලිස්පති ධුරය සඳහා ජනාධිපතිවරයා විසින් නිර්දේශ කර තිබූ නම සලකා බැලූ අවස්ථාවේ දී එසේ නිර්දේශ කරන ලද පුද්ගලයා එම ධුරයට පත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයින් සිව් දෙනෙකු පක්ෂව ද, දෙදෙනෙකු විපක්ෂව ද ඡන්දය දී තිබිය දී සහ සාමාජිකයින් දෙදෙනෙකු ඡන්දය දීමෙන් වැළකී සිටිය දී සහ ඒ අනුව එකී නිර්දේශිත නාමය පොලිස්පති ධුරය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව අනුමත කර නොතිබිය දී ජනාධිපතිවරයාට ඒ සම්බන්ධයෙන් දැනුම් දෙන ලද 2024 පෙබරවාරි 26 දිනැති ලිපියේ 4 වන ඡේදයේ,

"කෙසේ වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ඉ) ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා රැස්වීමක දී ඡන්දය දීමෙන් වැළකී සිටීමක් සම්බන්ධයෙන් ප්‍රතිපාදන සලසා නොමැති බැවින් නීතිය ඉදිරියේ ඡන්දය දීමෙන් වැළකී සිටීම විපක්ෂවීමක් ලෙස සලකනු ලබන්නේ නම් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ඉ)(5) ව්‍යවස්ථාව අනුව උක්ත ප්‍රශ්නය සම්බන්ධයෙන් සම සමව ඡන්දය ලැබුණා සේ සලකන්නේ නම් සභාපතිවරයා වශයෙන් මාගේ තීරක ඡන්දය ද පක්ෂව ලබා දෙන බව කාරුණිකව දන්වමි."

යනුවෙන් සඳහන් කරමින් එසේ ජනාධිපතිවරයා විසින් නිර්දේශ කරන ලද පුද්ගලයා නීති විරෝධී ලෙසත්, ව්‍යවස්ථා විරෝධී ලෙසත් පොලිස්පති ධුරයට පත් කිරීම සඳහා ජනාධිපතිවරයාට ව්‍යවස්ථා විරෝධී ලෙසත් නීති විරෝධී ලෙසත් අනුබල දීමෙන් ද, සහාය දැක්වීමෙන් ද, අනුග්‍රහය දැක්වීමෙන් ද;

කථානායකවරයා විසින් පාර්ලිමේන්තු කටයුතුවලදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බරපතළ ලෙස උල්ලංඝනය වන අයුරින් කටයුතු කර ඇති හෙයින් ද;

පාර්ලිමේන්තුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යන උත්තරීතර ආයතන පිළිබඳව මහජන විශ්වාසය කඩවන ලෙස කථානායකවරයා කටයුතු කර ඇති හෙයින් ද;

කථානායකවරයා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග බරපතළ ලෙස උල්ලංඝනය කර ඇති හෙයින් ද;

කථානායකවරයා පක්ෂග්‍රාහීව කටයුතු කරන බව පැහැදිලිවම ප්‍රදර්ශනය කරමින් කථානායක ධුරයේ ස්වාධීනත්වය ද, ගෞරවය ද බරපතළ ලෙස උල්ලංඝනය කර ඇති හෙයින් ද;

අපක්ෂපාතීව පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරයන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද ආරක්ෂා කිරීමට බැඳී සිටින කථානායකවරයා විසින්ම මන්ත්‍රීවරයන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද කඩ කර ඇති හෙයින් ද; සහ

කථානායක ධුරයේ කාර්යයන් හා වගකීම් ඉටු කිරීම පැහැර හැර ඇති හෙයින්;

කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා කෙරෙහි තවදුරටත් විශ්වාසයක් නොමැති බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි."

"மாண்புமிகு  சஜித் பிரேமதாஸ
மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல
மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்
மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன
மாண்புமிகு ஹேசா விதானகே
மாண்புமிகு  திலிப் வெதஆரச்சி
மாண்புமிகு மனோ கணேசன்
மாண்புமிகு மைத்திரிபால சிறிசேன
மாண்புமிகு றிஸாட் பதியுதீன்
மாண்புமிகு நிரோஷன் பெரேரா
மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா
மாண்புமிகு அஜித் மான்னப்பெரும
மாண்புமிகு நயன வாசலதிலக
மாண்புமிகு புத்திக பத்திரண
மாண்புமிகு தயாசிறி ஜயசேகர
மாண்புமிகு ஷான் விஜயலால் த சில்வா
மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி
மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்
மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க
மாண்புமிகு நலின் பண்டார ஜயமஹ
மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி
மாண்புமிகு எஸ்.எம். மரிக்கார்

மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார
மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்
மாண்புமிகு கயந்த கருணாதிலக்க
மாண்புமிகு கிங்ஸ் நெல்சன்
மாண்புமிகு மயந்த திசாநாயக்க
மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா
மாண்புமிகு அசோக் அபேசிங்க
மாண்புமிகு ரோஹண பண்டார
மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி
மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி
மாண்புமிகு ஜே.சீ. அலவத்துவல
மாண்புமிகு சட்டத்தரணி (திருமதி) தலதா அத்துகோரல
மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா
மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார
மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன
மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன
மாண்புமிகு வேலு குமார்
மாண்புமிகு ஜயரத்ன ஹேரத்
மாண்புமிகு அப்துல் ஹலீம்
மாண்புமிகு துஷார இந்துனில் அமரசேன
மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்
மாண்புமிகு விஜித ஹேரத்

மாண்புமிகு இரான் விக்கிரமரத்ன,- சபாநாயகர் மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன அவர்களுக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணை,- நிகழ்நிலைக் காப்புச் சட்டமூலம் மீதான முழுப் பாராளுமன்றக் குழுவில், அச்சட்டமூலம் தொடர்பாக உயர் நீதிமன்றம் வழங்கிய தீர்மானத்துக்கு முரணாக அச்சட்டமூலத்தின் சில வாசகங்கள் நிறைவேற்றப்படுகின்றதென மாண்புமிகு எதிர்க்கட்சி உறுப்பினர்களால் பலத்த எதிர்ப்பு முன்வைக்கப்பட்ட நிலையிலும், அத்தகைய எதிர்ப்பைப் பொருட்படுத்தாமல், மேற்படி உயர் நீதிமன்றத்தின் தீர்மானத்துக்கு முரணாக அச்சட்டமூலத்தின் சில வாசகங்களை நிறைவேற்றிக் கொள்வதற்கு ஆளும் கட்சிக்கு இடமளித்தமை ஊடாகவும்;

குறிப்பாக,

(அ) மேற்படி சட்டமூலத்தின் 13ஆம் வாசகம் அரசியலமைப்பின் 12(1)ஆம் உறுப்புரைக்கு முரணானதெனவும் அதற்கமைவாக அவ்வாசகம் விசேட பெரும்பான்மையுடன் நிறைவேற்றிக் கொள்ளப்பட வேண்டுமெனவும் சாதாரண பெரும்பான்மையுடன் நிறைவேற்றிக்கொள்ள வேண்டுமாயின், உயர் நீதிமன்றத் தீர்மானத்தில் குறிப்பிடப்பட்டுள்ள திருத்தங்களை மேற்கொள்ள வேண்டுமெனவும் உயர் நீதிமன்றம் தீர்மானித்துள்ள நிலையில் அதற்கமைவாக மேற்படி திருத்தங்களை மேற்கொள்ளாமல் சாதாரண பெரும்பான்மையுடன் மேற்படி வாசகத்தை நிறைவேற்றிக் கொள்வதற்கு இடமளித்தமை ஊடாகவும்;

(ஆ) மேற்படி சட்டமூலத்தின் 17ஆம் வாசகம் அரசியலமைப்புக்கு முரணானதெனவும், அது விசேட பெரும்பான்மையுடன் நிறைவேற்றிக் கொள்ளப்பட வேண்டுமெனவும் உயர் நீதிமன்றம் தீர்மானித்துள்ள நிலையில், அவ்வாசகத்தை முழுப் பாராளுமன்றக் குழுவில் நீக்குவதாகச் சட்டத்துறைத் தலைமை அதிபதி உயர் நீதிமன்றத்துக்கு அறிவித்திருந்தபோதும், அவ்வாசகத்தை எவ்வித மாற்றமுமின்றி அவ்வாறாகவே சாதாரண பெரும்பான்மையுடன் நிறைவேற்றிக்கொள்வதற்கு இடமளித்தமை ஊடாகவும்;

(இ) மேற்படி சட்டமூலத்தின் 20, 33(6), 34(1), 35(1)ஆம் வாசகங்கள் அரசியலமைப்புக்கு முரணானதெனவும் அதற்கமைவாக விசேட பெரும்பான்மையுடன் அவ்வாசகங்களை நிறைவேற்றிக்கொள்ள வேண்டுமெனவும் சாதாரண பெரும்பான்மையுடன் நிறைவேற்றிக்கொள்ள வேண்டுமாயின் உயர் நீதிமன்றம் முன்வைத்த திருத்தங்களை மேற்கொள்ள வேண்டுமெனவும் உயர் நீதிமன்றம் தீர்மானித்துள்ள நிலையில், அவ்வாறு விதந்துரைக்கப்பட்ட திருத்தங்களை மேற்கொள்ளாமல் சாதாரண பெரும்பான்மையுடன் அவ்வாசகங்களை நிறைவேற்றிக்கொள்வதற்கு இடமளித்தமை ஊடாகவும்;

(ஈ) மேற்படி சட்டமூலத்தின் 21ஆம் வாசகம் அரசியலமைப்புக்கு முரணானதெனவும் அதற்கமைவாக அதனை விசேட பெரும்பான்மையுடன் நிறைவேற்றிக்கொள்ள வேண்டுமெனவும் உயர் நீதிமன்றம் தீர்மானித்துள்ள நிலையில் மற்றும் அவ்வாசகத்தைச் சாதாரண பெரும்பான்மையுடன் நிறைவேற்றிக் கொள்வதற்குத் தேவையான திருத்தங்களை முழுப் பாராளுமன்றக் குழுவில் முன்வைப்பதாகச் சட்டத் துறைத் தலைமை அதிபதி உயர் நீதிமன்றத்துக்கு அறிவித்திருந்த போதும், அவ்வாறாகச் செயற்படாமல் அவ்வாசகத்தைச் சாதாரண பெரும்பான்மையுடன் நிறைவேற்றிக் கொள்வதற்கு இடமளித்தமை ஊடாகவும்;

(உ) மேற்படி சட்டமூலத்தின் 22ஆம் வாசகம் அரசியலமைப்புக்கு முரணானதெனவும், அதன்படி விசேட பெரும்பான்மையுடன் அதனை நிறைவேற்றக்கொள்ள வேண்டுமெனவும், சாதாரண பெரும்பான்மையுடன் நிறைவேற்றிக்கொள்ள வேண்டுமாயின் உயர் நீதிமன்றத்தின் தீர்மானத்தின்படி திருத்தங்களை மேற்கொள்ள வேண்டுமெனவும் உயர் நீதிமன்றம் தீர்மானித்துள்ள நிலையில், அத்தகைய திருத்தங்களை மேற்கொள்ளாது சாதாரண பெரும்பான்மையுடன் அவ்வாசகத்தைத் திருத்தம் செய்வதற்கு இடமளித்தமை ஊடாகவும்;

(ஊ) மேற்படி சட்டமூலத்தின் 31ஆம் பிரிவு அரசியலமைப்புக்கு முரணானதெனவும், அதன்படி விசேட பெரும்பான்மையுடன் அதனை நிறைவேற்றிக்கொள்ள வேண்டுமெனவும், சாதாரண பெரும்பான்மையுடன் நிறைவேற்றிக்கொள்ள வேண்டுமாயின் உயர் நீதிமன்றத்தின் தீர்மானத்தின்படி திருத்தங்களை மேற்கொள்ள வேண்டுமெனவும் உயர் நீதிமன்றம் தீர்மானித்துள்ள நிலையில், அத்தகைய திருத்தங்களை மேற்கொள்ளாது சாதாரண பெரும்பான்மையுடன் அவ்வாசகத்தைத் திருத்தம் செய்வதற்கு இடமளித்தமை ஊடாகவும்;

இதனை உறுதிப்படுத்தி இலங்கை மனித உரிமைகள் ஆணைக் குழுவாலும், மேற்படி சட்டமூலத்தின் சில வாசகங்களை நிறைவேற்றிக்கொள்வதில் உயர் நீதிமன்றத்தின் தீர்மானத்துக்கு இணங்கச் செயற்படவில்லை எனவும் அவ்வாறு செயற்படத் தவறியுள்ளதால், ஏலவே அச்சட்டமூலத்தை உள்ளவாறே நிறைவேற்றிக் கொள்வதற்கு அவசியமான வாக்குகள் பாராளுமன்றத்தில் கிடைத்துள்ளனவா என்பது தொடர்பில் பாரிய சிக்கல் எழுந்துள்ளதாகவும், சபாநாயகருக்கு அந்த ஆணைக்குழுவால் ஆற்றுப்படுத்தப்பட்டுள்ள 2024 பெப்ருவரி 08ஆம் திகதிய கடிதத்தில் தெரிவிக்கப்பட்டுள்ளதாலும்;

அத்துடன், நிகழ்நிலைக் காப்புச் சட்டமூலம் மீதான மூன்றாவது மதிப்பீட்டின்போது, எதிர்க்கட்சியின் முதற்கோலாசான் மிகத் தெளிவாக வாக்கெடுப்பைக் கோரியிருந்தபோதும், அக்கோரிக்கையைக் கவனத்தில்கொள்ளாமலும், வாக்கெடுப்பு ஒன்றை வழங்காமலும் அச்சட்டமூலம் மீதான மூன்றாவது மதிப்பீட்டை வாக்கெடுப்பின்றி நிறைவேற்றிக்கொள்ள இடமளித்தமை ஊடாகவும்;

நிகழ்நிலைக் காப்புச் சட்டமூலம் மீதான முழுப் பாராளுமன்றக் குழுவில், அச்சட்டமூலம் தொடர்பாக உயர் நீதிமன்றத்தால் வழங்கப்பட்ட தீர்மானத்துக்கு முரணாகச் சில வாசகங்களை ஆளும் கட்சி நிறைவேற்றிக்கொண்டுள்ளதால் அது தொடர்பில் ஆழமாக ஆராயும் வரை அச்சட்டமூலத்தைச் சட்டமாக்குவதற்கான சான்றுரையை அளிக்க வேண்டாமென எதிர்க்கட்சியின் உறுப்பினர்கள் சிலர் சபாநாயகரிடம் 2024 பெப்ருவரி 01ஆம் திகதி நடைபெற்ற கட்சித் தலைவர்களின் விசேட கூட்டத்தின்போது கோரிக்கை விடுத்திருந்த நிலையில், அக்கோரிக்கையைக் கவனத்தில்கொள்ளாது அச்சட்டமூலத்தைச் சட்டமாக்குவதற்குச் சான்றுரை அளித்துள்ளதன் ஊடாகவும்;

2024 பெப்ருவரி 26ஆம் திகதி நடைபெற்ற அரசியலமைப்புப் பேரவைக் கூட்டத்தின்போது, பொலிஸ் பரிசோதகர் தலைமை அதிபதி பதவிக்கு சனாதிபதியால் சிபாரிசு செய்யப்பட்டிருந்த பெயர் பரிசீலிக்கப்பட்டபோது, அவ்வாறு சிபாரிசு செய்யப்பட்டிருந்த நபரை அந்தப் பதவிக்கு நியமனம் செய்வதற்காக அரசியலமைப்புப் பேரவை அங்கத்தவர்களில் நான்கு பேர் ஆதரவாகவும் இரண்டு பேர் எதிராகவும் வாக்களித்திருந்த நிலையிலும், இரண்டு அங்கத்தவர்கள் வாக்களிப்பதிலிருந்து விலகியிருந்த நிலையிலும், அவ்வாறு சிபாரிசு செய்யப்பட்டிருந்த பெயரை பொலிஸ் பரிசோதகர் தலைமை அதிபதி பதவிக்கு அரசியலமைப்புப் பேரவையால் அரசியலமைப்பின் ஏற்பாடுகளுக்கு

[ගරු නියෝජ්‍ය කථානායකතුමා]

இணங்க அங்கீகரித்திராத நிலையிலும், சனாதிபதி அவர்களுக்கு அது சம்பந்தமாகத் தெரியப்படுத்தியிருந்த 2024 பெப்ருவரி 26ஆம் திகதிய கடிதத்தின் 4ஆம் பந்தியில்,

> "எவ்வாறாயினும், அரசியலமைப்பின் 41(உ) உறுப்புரையின் பிரகாரம் அரசியலமைப்புப் பேரவைக் கூட்டமொன்றில் வாக்களிப்பதிலிருந்து விலகியிருப்பதற்கான ஏற்பாடுகள் வழங்கப்படவில்லை என்பதால், வாக்களிப்பதிலிருந்து விலகியிருப்பதானது சட்டத்தின் முன் உரிய விடயத்தை எதிர்ப்பதாகக் கருதப்படும் பட்சத்தில் மற்றும் அரசியலமைப்பின் 41(உ)(5)ஆம் உறுப்புரையின் பிரகாரம் குறிப்பிட்ட பிரச்சினைமீது சம எண்ணிக்கையிலான வாக்குகள் கிடைத்துள்ளதாகக் கருதப்படும் பட்சத்தில் தவிசாளர் என்ற வகையில் எனது அறுதியிடும் வாக்கையும் ஆதரவாக அளிப்பதாகத் தயவுடன் அறியத் தருகின்றேன்."
>
> எனக் குறிப்பிட்டு அவ்வாறு சனாதிபதியால் சிபாரிசு செய்யப்பட்ட நபரைச் சட்டவிரோதமாகவும், அரசியலமைப்புக்கு விரோதமாகவும் பொலிஸ் பரிசோதகர் தலைமை அதிபதி பதவிக்கு நியமிப்பதற்கு அரசியலமைப்புக்கு விரோதமான முறையிலும் சட்டவிரோதமான முறையிலும் சனாதிபதிக்கு உடந்தையாகவும், உறுதுணையாகவும், துணையாதரவாகவும் இருந்ததன் ஊடாகவும்;

பாராளுமன்ற நடவடிக்கைகளின்போது அரசியலமைப்பை அப்பட்டமாக மீறும் வகையில் சபாநாயகர் செயற்பட்டுள்ளதாலும்;

பாராளுமன்றம் மற்றும் அரசியலமைப்புப் பேரவை ஆகிய மீயுயர் நிறுவனங்கள்மீது மக்கள் கொண்டுள்ள நம்பிக்கை இழக்கப்படும் வகையில் சபாநாயகர் செயற்பட்டுள்ளதாலும்;

சபாநாயகர் பாராளுமன்ற நிலையியற் கட்டளைகளை அப்பட்டமாக மீறியுள்ளதாலும்;

சபாநாயகர் பக்கச்சார்பாகச் செயற்படுகின்றார் என்பதைத் தெளிவாக வெளிப்படுத்தி, சபாநாயகர் பதவியின் சுயாதீனத்துக்கும் மாண்புக்கும் அப்பட்டமாகக் களங்கம் ஏற்படுத்தியுள்ளதாலும்;

பக்கச்சார்பின்றி சகல பாராளுமன்ற உறுப்பினர்களினதும் உரிமைகளையும் சிறப்புரிமைகளையும் பாதுகாக்கும் பொறுப்பிலுள்ள சபாநாயகரே பாராளுமன்ற உறுப்பினர்களின் உரிமைகளையும் சிறப்புரிமைகளையும் மீறியுள்ளதாலும்; மற்றும்

சபாநாயகர் பதவியின் கடமைகளையும் பொறுப்புக்களையும் நிறைவேற்றத் தவறியுள்ளதாலும்;

சபாநாயகர் மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன அவர்கள்மீது மேற்கொண்டும் நம்பிக்கை இல்லையென இப்பாராளுமன்றம் தீர்மானம் நிறைவேற்றுமாக."

"Hon. Sajith Premadasa
Hon. Lakshman Kiriella, Attorney at Law
Hon. (Prof.) G. L. Peiris
Hon. (Mrs.) Rohini Kumari Wijerathna
Hon. Hesha Withanage
Hon. Dilip Wedaarachchi
Hon. Mano Ganesan
Hon. Maithreepala Sirisena
Hon. Rishad Bathiudeen
Hon. Niroshan Perera
Hon. (Dr.) Harsha de Silva
Hon. Ajith Mannapperuma
Hon. Nayana Wasalathilake
Hon. Buddhika Pathirana
Hon. Dayasiri Jayasekara
Hon. Shan Vijayalal De Silva
Hon. Chandima Weerakkody, Attorney at Law
Hon. M. A. Sumanthiran
Hon. Tissa Attanayake
Hon. Nalin Bandara Jayamaha
Hon. Hector Appuhamy
Hon. S. M. Marikkar
Hon. R. M. Ranjith Madduma Bandara
Hon. (Dr.) V. Radhakrishnan
Hon. Gayantha Karunatilleka
Hon. Kins Nelson
Hon. Mayantha Dissanayake
Hon. K. Sujith Sanjaya Perera
Hon. Ashok Abeysinghe
Hon. Rohana Bandara
Hon. K. P. S. Kumarasiri
Hon. (Dr.) Upul Galappaththi
Hon. J. C. Alawathuwala
Hon. (Mrs.) Thalatha Athukorala, Attorney at Law
Hon. Seyed Ali Zahir Moulana
Hon. Wasantha Yapabandara, Attorney at Law
Hon. W. H. M. Dharmasena
Hon. (Dr.) Kavinda Heshan Jayawardhana
Hon. Velu Kumar
Hon. Jayarathna Herath
Hon. Abdul Haleem
Hon. Thushara Indunil Amarasena
Hon. (Prof.) Charitha Herath
Hon. Vijitha Herath

Hon. Eran Wickramaratne,- Vote of No Confidence against Hon. Mahinda Yapa Abeywardana, the Speaker,- Whereas, by allowing the government to adopt certain Clauses of the Bill titled Online Safety during the Committee of the whole Parliament of the said Bill contrary to the determination of the Supreme Court in respect of that Bill disregarding the strong objections raised by Members of Parliament of the Opposition to the effect that some Clauses of the Bill concerned were being passed in contravention of the determination of the Supreme Court regarding the Bill;

Particularly,

(a) And whereas by allowing the passage of Clause 13 of the aforesaid Bill with a simple majority without incorporating the amendments specified in the determination of the Supreme Court, which had determined that the said Clause was inconsistent with Article 12 (1) of the Constitution and as such, should be passed with a special majority, and if it were to be passed with a simple majority, the amendments so specified should be effected;

(b) And whereas by allowing the passage of Clause 17 of the aforesaid Bill as it was with a simple majority while the Supreme Court had determined that the said Clause was inconsistent with the Constitution and hence should be passed with a special majority and while the Attorney-General had informed the Supreme Court that the Clause concerned would be removed during the Committee of the whole Parliament;

(c) And whereas by allowing the passage of Clauses 20, 33(6), 34 (1) and 35(1) of the aforesaid Bill with a simple majority without incorporating the amendments specified in the determination of the Supreme Court, which had determined that the Clauses concerned were inconsistent with the Constitution and as such, should be passed with a special majority, and if they were to be passed with a simple majority, the amendments so specified should be effected;

(d) And whereas by allowing the passage of Clause 21 of the aforesaid Bill as it was with a simple majority without acting in pursuance of the assurance given by the Attorney-General to the Supreme Court that the amendments necessary to pass the Clause concerned with a simple majority would be moved during the Committee of the whole Parliament when the Supreme Court determined that the said Clause was inconsistent with the Constitution and hence should be passed with a special majority;

(e) And whereas by allowing the passage of Clause 22 of the Bill as it was with a simple majority, without incorporating the amendments specified in the determination of the Supreme Court, which had determined that the Clause concerned was inconsistent with the Constitution and as such, should be passed with a special majority, and if it was to be passed with a simple majority, the amendments so specified should be effected;

(f) And whereas by allowing the passage of Clause 31 of the Bill as it was with a simple majority, without incorporating the amendments specified in the determination of the Supreme Court, which had determined that the Clause concerned was inconsistent with the Constitution and as such, should be passed with a special majority, and if it was to be passed with a simple majority, the amendments so specified should be effected;

And whereas it has been stated in the letter dated 08th February 2024, sent to the Speaker of Parliament by the Human Rights Commission of Sri Lanka, confirming this, and pointing out that the Supreme Court determination has not been followed with pertinence to passing certain Clauses of the said Bill and therefore, that there are serious concerns regarding the fact whether the number of votes required to pass the Bill as it is, has been received in Parliament;

And whereas at the same time, whereas by allowing the Bill to be passed at the third reading without calling for a Division, despite the request made by the Chief Opposition Whip calling for a Division, at the third reading of the Online Safety Bill;

And whereas and by endorsing the certificate on the said Bill, ignoring the request made by a group of Opposition Members from the Speaker at the special meeting of the Party Leaders which was held on the 01st of February 2024, not to endorse the Bill until it is seriously scrutinized, as certain Clauses have been passed by the government contravening the determination issued by the Supreme Court at the Committee of the whole Parliament of the Online Safety Bill;

And whereas, when the name for the post of Inspector-General of Police, recommended by the Hon. President was considered at the meeting of the Constitutional Council held on the 26th of February 2024, 4 members of the Constitutional Council voted for the appointment of that recommended person for the said post and 2 members voted against while 2 members abstained from voting and as such while the said recommended name for the post of Inspector-General of Police remained unapproved as per the provisions of the Constitution, the Speaker has unlawfully aided and abetted and sponsored the President to appoint the person recommended by the President to the post of Inspector-General of Police in an illegal and unconstitutional manner by stating in paragraph 4 of the letter dated 26th February 2024 that intimated to the President that:-

> "However, as there are no provisions with regard to abstaining from voting at a meeting of the Constitutional Council as per Article 41(e) of the Constitution and if abstaining from voting is deemed as being opposed to, before the law and in relation to the aforementioned issue if it is deemed as a tie in voting as per Article 41(e)(5) of the Constitution, I hereby inform that I exercise my casting vote as the Chair."

And whereas, the Speaker has acted in a manner in blatant violation of the Constitution in handling the affairs of Parliament;

And whereas, the Speaker has acted in a manner that public confidence in the supreme institutions of Parliament and the Constitutional Council would be eroded;

And whereas, the Speaker has blatantly violated the Standing Orders of Parliament;

And whereas, the Speaker has blatantly desecrated the independence and dignity of the office of the Speaker by clearly exhibiting that he acts partially;

And whereas, the Speaker who is bound to protect the rights and privileges of the Members of Parliament impartially, has himself violated the rights and privileges of Members of Parliament;

And whereas, the Speaker has neglected to perform the functions and responsibilities of the office of the Speaker.

That this Parliament resolves that it has no confidence in Hon. Mahinda Yapa Abeywardana, the Speaker any longer."

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*
*Question again proposed.*

[පූ.භා. 10.23]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ආරම්භයේදීම මට මේ අවස්ථාව ලබාදීම ගැන ගරු අග්‍රාමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මේ සභාවේ විවාදය තුළත්, ඊට පෙරත් බොහෝ විට මේ පාර්ලිමේන්තුවේ කාලය භාවිතය පිළිබඳව සඳහන් වුණා. සමහරු ඒ පිළිබඳව මා වෙත ඇඟිල්ල දිගු කළා. 2020 ජනවාරි මස 08වැනි දා ඉඳලා මම මේ පාර්ලිමේන්තුවේදී ස්ථාවර නියෝග 27 (2) යටතේ ඉදිරිපත් කරපු ප්‍රශ්න සියල්ලක්ම ගැන කරුණු ඇතුළත් ලේඛනයක් තිබෙනවා. සියලුදෙනාගේ දැන ගැනීම පිණිස මම ඒ කරුණු ඇතුළත් ලේඛනය **සභාගත*** කරනවා.

මම බොහොම පැහැදිලිව කියන්න ඕනෑ මේ පාර්ලිමේන්තුවේ කාලය අපි මිඩංගු කළේ පෞද්ගලික අවශ්‍යතා සම්පූර්ණ කර ගන්නවත්, අපේ වැටුප්, දීමනා, වරදාන, වරප්‍රසාද, ප්‍රතිලාභ වැඩි කර ගන්නවත් නොව මේ රටේ මහ ජනතාව මුහුණ දෙන බරපතළ ගැටලු පිළිබඳව පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරලා නිද්‍රාශීලීව සිටිනවා නම් ඒ අය අවදි කරන්නටත්, විසඳුමක් ලබා ගන්න පුළුවන් නම් විසඳුම් ලබා ගන්නටත් බව.

දැන් අද බොහොම කදිම නිදසුනක් තිබුණා. ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නයක් නොවෙයි මම ඉදිරිපත් කළේ. සභානායකතුමාගේ අවසරය මත මම ඉදිරිපත් කළේ, මේ රටේ විශ්වවිද්‍යාල විද්‍යායතනවල දූ දරුවන් 2,500ක් 3,000ක් පමණ මුහුණ දුන් ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නයට දූ දරුවන්ගේ පැත්තෙන් සාධනීය විසඳුමක් ලැබුණා. කෝටි ප්‍රකෝටි ගණන් මුදල් වැය කරලා පාර්ලිමේන්තු සභාවක් පවත්වාගෙන යනකොට ඒ සභාව තිබෙන්නට ඕනෑ ඇත්ත වශයෙන්ම මේ රටේ පොදු ජනතාවගේ ප්‍රශ්න පිළිබඳව කථා කරන්න. ප්‍රශ්න පිළිබඳව කථා කරනවා පමණක් නොවෙයි ඒ ප්‍රශ්නවලට විසඳුම් ලබා ගන්න.

මම විශේෂයෙන්ම කියන්න කැමතියි, මේ මොහොත වෙනකොට මම විපක්ෂ නායකවරයා හැටියට ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න 144ක් ඉදිරිපත් කර තිබෙන බව. කාලයක් තිබුණා, අපට සීමාවක් තිබුණේ නැහැ පාර්ලිමේන්තුව රැස් වෙන සතියක අහන්න පුළුවන් උපරිම ප්‍රශ්න සංඛ්‍යාව ගැන. අපට දින හතරේම වුණත් ප්‍රශ්න අහන්න පුළුවන්. ඊට පස්සේ ඒක දෙකකට සීමා කළා. ඉතින් පක්ෂ නායකයෙක් හැටියට මා සතුව තිබෙන අවස්ථාව මම උපයෝගී කර ගත්තා. මම පුළුවන් තරම්, හැම දාම පාර්ලිමේන්තුවට ආවා. පාර්ලිමේන්තුවට ඇවිල්ලා මහ ජනතාවගේ ප්‍රශ්න ඉදිරිපත් කළා. දැන් පක්ෂ නායකයෙකුට පාර්ලිමේන්තුව රැස් වෙන සතියකට අහන්න පුළුවන් ප්‍රශ්න දෙකයි කියලා සීමා කරලා තිබෙනවා. පොඩ්ඩක් ගණන් හදලා බලන්නකෝ, පක්ෂ නායකයෝ කීදෙනෙක් මේ රටේ ජනතාවගේ ප්‍රශ්න මේ අවස්ථාව හරහා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා

***** පුස්තකාලයේ තබා ඇත.**
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

තිබෙනවාද කියලා. මම ලෝකය වටේ රවුම් ගහන්න ගියේ නැහැ. මම මගේ පෞද්ගලික සුඛවිහරණය උදෙසා නිවාඩු ගමන් ගියේ නැහැ, විනෝද චාරිකා ගියේ නැහැ. මම ජනතා ප්‍රශ්න ඉදිරිපත් කරනවා. ඒ නිසා මම ආඩම්බර වෙනවා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න 144ක් ඉදිරිපත් කරලා තිබීම ගැන. ඊයේ දවසේත් එක එක්කෙනා කිය කියා ගියා මම පැය ගාණක් පාර්ලිමේන්තුවේ කාලය මිඩංගු කළා කියලා. ඒ කවුරු වෙනුවෙන්ද? මම වෙනුවෙන්ද, මගේ පවුලේ සාමාජිකයෝ වෙනුවෙන්ද? නැහැ, මේ රටේ ලක්ෂ 220ක් වූ ජනතාව වෙනුවෙන්.

එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී කළ පළමුවැනි කථාව මේ අවස්ථාවේ මා උපුටා දක්වන්න කැමැතියි. පොඩ්ඩක් අහගන්නකෝ මේ වචන ටික. "අප මෙහි පෙනී සිටින්නේ මහජන නියෝජිතයන් වශයෙන් බව මුලින් මතක තබා ගත යුතුය. අප මෙහි පැමිණියේ අපේ පුළුවන්කාරකමට නොවේ. දැන් තත්ත්වය කුමක්ද? අප මෙහි පෙනී සිටින්නේ සියයට 75කට වඩා දෙවේලක් නොව එක වේලක්වත් කන්නට නැති කොටසක්ද ඇතුළු මහජනයා වෙනුවෙනි. මා හිතවත් පුවත්පත් නියෝජිතයෙක් ශ්‍රී ලංකාවට පැමිණ කොළඹ මුඩුක්කුවක් බැලීමට ඕනෑ කියලා මට කීය. මම ඔහු සමඟ දොරටුවක් ඇති, එක අඳුරු කාමරයක් ඇති නිවසකට ගියෙමි. පසෙක ගඳ ගහන කානුවකි. පැය භාගයකටවත් මනුස්සයෙකුට ඒ ගඳ උසුලන්නට පුළුවන් යැයි සිතීමත් පුදුමයකි. මේ එකම කාමරයේ මහල්ලෙක් හා දරුවෙක් ඇතුළු හයදෙනෙක් ජීවත් වෙති. ඒ දවස්වල ගිනි පෙට්ටියක් මිලදී ගැනීමට පොල් ගෙඩි කීයක් විකිණිය යුතු දැයි ඔබ දන්නෙහිය. මේ කොස් වාරයයි. මේ මිනිසුන්ට අසල් වැසියෙකුගේ කොස් ගහකට බඩගා භාගෙට තම්බා කන්නට සිදු වේ. මේවා, සම්පූර්ණ පැහැදිලි කරුණුය. කථානායකතුමනි, මා මෙහි මුලින්ම පැමිණි දා අලංකාර ශාලාවක තේ බී කථා කරමින් සිටින විට මේ ගොඩනැඟිල්ල කොතරම් දර්ශනීයද? ගම්වල මිනිසුන් දසදහස් ගණනින් පැමිණ මේ ගොඩනැඟිල්ල බිමට සමතලා කරන දවසක් එතැයි මට සිතෙයි." කවුද මේ කථාව කරන්නේ? මේ කථාව කර තිබෙන්නේ දිවංගත එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයා. මේක එතුමා 1931 ජූලි මාසයේ 28වැනි දා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කළ පළමුවැනි කථාව, his first speech in the State Council. මහජන නියෝජිතයන් හැටියට අපේ කාර්යභාරය කුමක්ද, අපි මේ සභා ගර්භය තුළ කළ යුතු දේ කුමක්ද කියන එක ගැන සමහරෙකුට නොතේරෙනවා නම්, සමහරෙකුට එය තේරුම් ගන්නට ප්‍රමාණවත් සාක්ෂරතාවක් නොමැති නම්, කරුණාකරලා මේ රටේ හිටපු ශ්‍රේෂ්ඨ නායකයෙකු වන එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගෙන්ම මේක ඉගෙන ගන්න කියලා නොදැනුවත්කම තුළින්, නූගත්කම තුළින් මේ සභාව තුළ වහසි බස් දොඩවන ඒ අයට මම ආරාධනා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි හැමෝම දන්නා විධියට ප්‍රශස්ත, ප්‍රබුද්ධ කථානායකවරයෙකු සතු ගුණාංග පිළිබඳව ලොව පිළිගත් සම්ප්‍රදායක් තිබෙනවා.

විශේෂයෙන්ම මම මේ කාරණය උපුටා දක්වන්න කැමැතියි. "Erskine May: Parliamentary Practice" හි සඳහන් වෙනවා, පාර්ලිමේන්තුවේ කථානායක ධුරයට අවශ්‍ය වන ප්‍රධාන ලක්ෂණ වන්නේ, බලාධිකාරිය සහ අපක්ෂපාතිත්වය කියලා. ඒ වාගේම, M.N. Kaul and S.L. Shakdher විසින් රචිත "Practice and Procedure of Parliament"හි සඳහන් වෙනවා, කථානායක ධුරයේ ප්‍රධාන ලක්ෂණය හා එහි පැවැත්මේ නීතිය වන කථානායකවරයාගේ නිරපේක්ෂ සහ වෙනස් නොවන අපක්ෂපාතිත්වය මත පදනම් වන කරුණු කාරණා පිළිබඳව. කථානායකවරයෙකු අනුගමනය කරපු, අනුගමනය කළ යුතු ගුණාංග පිළිබඳව Erskine Mayහි මෙලෙස සඳහන් වෙනවා:

> "The chief characteristics attaching to the office of the Speaker in the House of Commons are authority and impartiality."

In "Practice and Procedure of Parliament" M.N. Kaul and S.L. Shakdher mention, I quote:

> "This authority is based on the Speaker's absolute and unvarying impartiality - "

ඉතින්, අපි බලන්නට ඕනෑ වර්තමානයේ අපේ කථානායකවරයා Erskine May සහ Kaul and Shakdher සඳහන් කරන ආකාරයට සහ ජාත්‍යන්තරයෙහි අඩංගු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේද තුළ අනුගමනය කළ යුතු ප්‍රමිති හා ගුණාංග ඇත්ත වශයෙන්ම ක්‍රියාත්මක කර තිබෙනවාද කියලා. ඒ ප්‍රබුද්ධ, ප්‍රශස්ත ගුණාංග කවරේද කියන එක ගැන කවුරු හරි නොදන්නවා නම්, වැදගත්ම දේ තමයි පුස්තකාලයට ගිහිල්ලා "Erskine May: Parliamentary Practice" සහ "Practice and Procedure of Parliament" written by M.N. Kaul and S.L. Shakdher කියවන එක. නූගත්කමට හොඳම බෙහෙත තමයි පුස්තකාලය. ඒ නිසා ඒවා කියෙව්වොත් කථානායකවරයෙකු අනුගමනය කළ යුතු ක්‍රියාකලාපය සහ වැඩ පිළිවෙළ පිළිබඳව බොහොම පැහැදිලි වෙයි.

අර, ප්‍රශස්ත ගුණාංග මුදුන්පත් කරගෙන වර්තමාන කථානායකවරයා කටයුතු කර තිබෙනවාද නැද්ද කියන කාරණාව පිළිබඳව අපි දැන් බලමු. මම කැමැතියි, වැදගත් කාරණාවක් ගෙනහැර දක්වන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පොලිස්පතිවරයා පත් කිරීමේ ක්‍රියාවලියේ දී ඔහු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා හැටියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කියාත්මක වුණාද, නැද්ද කියන කාරණාව මම ගෙනහැර දක්වන්නම්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඉ. (4) ව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව මෙසේ සඳහන් වෙනවා:

> "සභාවේ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් පස් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් සනාථ කළහොත් මිස, සභාව විසින් කරන ලද යම් නිර්දේශයක් හෝ අනුමත කිරීමක් හෝ ගනු ලැබූ යම් තීරණයක් හෝ බල සහිත නොවිය යුත්තේ ය"

ඒ කියන්නේ අනුමත කරන්නටත් පස්දෙනෙක් ඉන්නට ඕනෑ, ප්‍රතික්ෂේප කරන්නටත් පස්දෙනෙක් ඉන්නට ඕනෑ.

ඊළඟට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඉ. (5) ව්‍යවස්ථාවේ මෙහෙම කියනවා:

> "සභාපතිවරයාට හෝ රැස්වීමේ මූලාසනය දරන වෙනත් සාමාජිකයාට මුල් ඡන්දයක් නොමැති නමුත්, ...

එතකොට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා වෙන්නේ කථානායකවරයා. ඔහුට මුල් ඡන්දයක් නැහැ.

> "... සභාවේ යම් රැස්වීමකදී තීරණය කරනු ලැබිය යුතු යම් ප්‍රශ්නයක් සඳහා සම සමව ඡන්දය ලැබුණු අවස්ථාවක දී සභාපතිවරයාට හෝ රැස්වීමේ මූලාසනය දරන වෙනත් සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුත්තේ ය."

මේ අනුව බොහොම පැහැදිලියි, තීරක ඡන්දයක් නිර්මාණය වෙන්නේත් හතර, හතර තත්ත්වයක් ආවොත් විතරයි කියන එක. දැන් මම පැහැදිලිව කියන්නට ඕනෑ, පොලිස්පතිවරයාගේ පත්වීම

තීරණය කරන අවස්ථාවේ හතර, හතර ඡන්දයක් තිබුණේ නැහැ කියන එක. හතරදෙනෙක් අනුමැතිය දුන්නා, දෙදෙනෙක් ප්‍රතික්ෂේප කළා, දෙදෙනෙක් ඡන්දය දීමෙන් වැළකී සිටියා; abstain වුණා. ඒකයි වුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කියවන සියලුම ලිපි ලේඛන සභාගත කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ඇත්ත වශයෙන්ම මම කිසිම දවසක බලාපොරොත්තු වුණේ නැහැ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ Minutes මේ සභාව ඇතුළේ කියවන්න. නමුත් මේ කාරණාව මත මට 2024.02.26 දිනැති Minutes කියවන්න සිද්ධ වෙනවා. මොකක්ද, මේ කාර්ය සටහන්වල - Minutesවල - තිබෙන්නේ? It states, I quote:

> "...Senior Deputy Inspector-General of Police was approved by four (04) members, ..."

මේ තමයි කාර්ය සටහන.

> "... disapproved by two (02) members and two (02) members abstained from making any decision. The Secretary-General brought to the notice of the Council of the requirement stipulated in the Article 41E(4) of the Constitution and, the Council noted that the approval or the disapproval of the recommendation of the Hon. President has not been supported by at least five (05) members ..."

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මහ ලේකම්වරයා සහ එහි නිලධාරීන් සත්‍ය වශයෙන් සටහන් කරලා තිබෙන්නේ මොකක්ද? පොලිස්පතිවරයාගේ පත් කිරීම හතරදෙනෙක් අනුමත කළා, දෙදෙනෙක් ප්‍රතික්ෂේප කළා, දෙදෙනෙක් ඡන්දය දීමෙන් වැළකුණා, abstain වුණා. එලෙසම එතුමා කාර්ය සටහනේ සඳහන් කර තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අවධානය යොමු කළා කියලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඉ.(4) ව්‍යවස්ථාවට අනුව මෙය අනුමත වෙලාත් නැහැ, ප්‍රතික්ෂේප වෙලාත් නැහැ කියලා. මා ළඟ තිබෙන එම කාර්ය සටහන මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

එතකොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පස්දෙනෙකුගේ අනුමත කිරීමක් සහ ප්‍රතික්ෂේප කිරීමක් නොතිබුණු අවස්ථාවේ, හතරදෙනෙක් අනුමත කරලා, දෙදෙනෙක් ප්‍රතික්ෂේප කරලා, දෙදෙනෙක් ඡන්දය දීමෙන් වැළකී සිටියා වශයෙන් ඡන්දය තීරණය වුණු අවස්ථාවේ, රැස්වීම අවසන් වුණායින් පස්සේ ගරු කථානායකතුමා විසින් වෙනමම ලිපියක් ජනාධිපතිවරයාට යොමු කර තිබෙනවා.

ඒ ලිපියේ සඳහන් කරනවා, නිර්දේශය අනුමත කරමින් හතරදෙනෙක්, නිර්දේශය අනුමත නොකරමින් දෙදෙනෙක්, තවත් සාමාජිකයන් දෙදෙනෙක් ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියා කියලා. එතැනට වෙනතෙක් එතුමා නිවැරැදියි.

එම ලිපියේම ගරු කථානායකවරයා මෙසේ සඳහන් කර තිබෙනවා:

> "... ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා රැස්වීමක දී ඡන්දය දීමෙන් වැළකී සිටීමක් සම්බන්ධයෙන් ප්‍රතිපාදන සලසා නොමැති බැවින් නීතිය ඉදිරියේ ඡන්දය දීමෙන් වැළකී සිටීම විපක්ෂ වීමක් ලෙස සලකනු ලබන්නේ නම් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ඉ) (5) ව්‍යවස්ථාව අනුව උක්ත ප්‍රශ්නය සම්බන්ධයෙන් සම සමව ඡන්දය ලැබුණා සේ සලකන්නේ නම් සභාපතිවරයා වශයෙන් මාගේ තීරක ඡන්දය ද පක්ෂව ලබා දෙන බව කාරුණිකව දන්වමි"

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

පෙර පාසල් දරුවෙකුට වුවත් තේරෙනවා, මේ ලිපිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝනය කිරීමේ අරමුණින් චේතනාන්විතව ලියපු එකක් බව.

කොනක් හදලා තැබුවා, ජනාධිපතිවරයාට -විධායකයට- එම කොන අල්ලාගෙන අනීතිකව, ව්‍යවස්ථා විරෝධීව පොලිස්පතිවරයාව පත් කරන්න. මේක තමයි තිත්ත ඇත්ත. මේක තමයි සත්‍ය කථාව. මම දැක්කා, ප්‍රවීණ යැයි සලකන ජනාධිපති නීතිඥවරු මේ සභාව තුළ අමුතු අමුතු කථා කියනවා. කථානායකවරයා සඳහන් කරනවා, "වැළකී සිටීම විපක්ෂ වීමක් ලෙස සලකනු ලබන්නේ නම්" කියලා. එතකොට කථානායකවරයාට හැකියාවක් තිබෙනවාද, වැළකී සිටි අයගේ ඔළුව ඇතුළට රිංගලා, හදවත ඇතුළට රිංගලා ඇත්තටම මේ වැළකී සිටීම කියන්නේ විපක්ෂ වීමක් කියලා තීන්දුවක් ගන්න? කොහොමද එහෙම කරන්නේ? මොන විහිළුවක්ද මේක?

අනෙක් කාරණය මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම අද උදේ පොඩ්ඩක් වේලාසන පාර්ලිමේන්තුවට ආවා. ඒ වෙලාවේ නිලධාරීන් ඡන්ද ප්‍රතිඵල දැක්වෙන ඩිජිටල් පුවරුව check කරනවා. මම එහි colour photograph එකක් ගත්තා. ඔක්කෝම checking කළේ. එහි තිබෙනවා නේ, "Yes", "No", "Abstain" කියලා. මම මේ ඡායාරූපය **සභාගත*** කරනවා, ප්‍රවීණ ජනාධිපති නීතිඥවරුන්ට බලන්න.

කවුරු හරි කියනවා නම්, මේ ඩිජිටල් පුවරුවේ "Yes", "No", "Abstain" කියලා සඳහන් වෙන්නේ නැහැ කියලා, ඔබගේ මේසයේ මොකක්ද තිබෙන්නේ කියලා බලන්නකෝ. කොළ පාට බොත්තමක් තිබෙනවා, "Yes" කියලා. රතු පාට බොත්තමක් තිබෙනවා, "No" කියලා. ඒ දෙක විතරක් නොවෙයි තිබෙන්නේ. කහ පාට බොත්තමකුත් තිබෙනවා, "Abstain" කියලා. දැන් මේ කොළ පාට බොත්තමයි, රතු පාට බොත්තමයි, කහ පාට බොත්තමයි දන්නේ නැති කථානායකවරයෙක් තමයි ඉන්නේ. "Yes" එක දන්නේත් නැහැ; "No" එක දන්නේත් නැහැ; "Abstention" එක දන්නේත් නැහැ. පුස්තකාලයට ගිහිල්ලා මම ඉදිරිපත් කරන කරුණු-කාරණා පිළිබඳව කියවලා ඉගෙන ගන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඔබගේ මේසයේ කොළ පාට බොත්තමක්, රතු පාට බොත්තමක්, කහ පාට බොත්තමක් නැද්ද? තිබෙනවා නේ. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නැහැයි කියලා දෙයක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේත් නැහැ, මේ පාර්ලිමේන්තු සභා ගර්භය තුළ "Abstain" කියලා එකක් නැහැ කියලා. *[බාධා කිරීමක්]* කොහේද තිබෙන්නේ? *[බාධා කිරීමක්]* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොතැනද එහෙම තිබෙන්නේ? නොදන්නා දේවල් කථා කරන්න එන්න එපා. Abstention එකක් කියන්නේ right එකක්. හොඳයි, ඔබතුමන්ලාට Abstention එක කියන්නේ මොකක්ද කියලා මේ කියන විධියට තේරෙන්නේ නැත්නම්, මම කියන්නම්කෝ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව Abstention එක අර්ථ දක්වන ආකාරය පිළිබඳව. එය මෙසේයි: "To abstain is to refuse to vote either for or against a motion." බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව abstain වෙනවා කියන්නේ, තමන් ප්‍රතික්ෂේප කරනවා, "Yes" කියලා හෝ "No" කියලා ඡන්දයක් දීම. අවස්ථා 3ක් තිබෙනවා. "Yes" එක තිබෙනවා; "No" එක තිබෙනවා; "Abstain" එක තිබෙනවා. ඒකත් තේරෙන්නේ නැත්නම් මේ අපේ විශාරදයින්ට මම කියන්නම්, අපේ International Criminal Court එකේ ඡන්දය දීමෙන් වැළකී සිටීම ගැන කොහොමද කියන්නේ කියලා. It states, I quote:

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදා මහතා]

"Rule 66 - Meaning of the phrase 'States Parties present and voting'

'States Parties present and voting' means States Parties present and casting an affirmative or negative vote...."

That is, "Yes" or "No".

"..States Parties which abstain from the voting..."

ඡන්දය දීම වැළකීමෙන් සිටින අය.

"..shall be considered as not voting."

Abstain කරනවා කියන්නේ ඡන්දයක් ලබා නොදුන්නා කියන කාරණාවයි. මේක තේරෙන්නේ නැද්ද? මේකත් තේරෙන්නේ නැත්නම්, United Nations General Assembly එකේ සහ යම් යම් අවස්ථාවල අපේ රට UN Security Council එකේ non-permanent member කෙනෙක් වුණු අවස්ථා දෙස බලන්න. එතැනදී අපි හැමදාම "Yes", හැමදාම "No" කියලා තිබෙනවා ද? අපි abstain කරලා තිබෙනවා නේ. අග්‍රාමාත්‍යතුමා ඒක දන්නවා. ඉතින් ඇත්ත වශයෙන්ම මේ කථානායකවරයාට මේ පාර්ලිමේන්තුව තුළ ඡන්දය දෙන ආකාරය පිළිබඳව කිසිම අවබෝධයක් නැහැ. ඒක එකක්. එක්කෝ අවබෝධයක් නැහැ; එහෙම නැත්නම් එතුමා හිතාමතාම විධායකයත් එක්ක මේ ව්‍යවස්ථාදායකයේ බලය පලුදු කරන්නට කටයුතු කරන කුමන්ත්‍රණයක හවුල්කරුවෙක් බව කියන්න සිද්ධ වෙනවා. ඒ දෙකෙන් එකක්. එක්කෝ කථානායකවරයා මේක ගැන දන්නේ නැහැ. එතුමා "Yes" දන්නේත් නැහැ; "No" දන්නේත් නැහැ; "Abstain" එක දන්නේත් නැහැ. එතුමා, විද්‍යුත් ඡන්ද ක්‍රමයේදී පාවිච්චි කරන කොළ බොත්තම දන්නේත් නැහැ; රතු බොත්තම දන්නේත් නැහැ; කහ බොත්තම දන්නේත් නැහැ. ඒක එකක්.

අනෙක් අර්ථ කථනය මෙයයි. *[බාධා කිරීමක්]*

**ගරු ලොහාන් රත්වත්තේ මහතා (වැවිලි කර්මාන්ත හා මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லொஹான் ரத்வத்தே - பெருந்தோட்டக் கைத்தொழில் மற்றும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Lohan Ratwatte - State Minister of Plantation Industries and Mahaweli Development)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
රීති ප්‍රශ්නයක්ද, ගරු රාජ්‍ය ඇමතිතුමා?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ කථාවට බාධා කරන්න එපා. ඕනෑ ප්‍රශ්නයක් අහගන්න, මගේ කථාවෙන් පසුව. *[බාධා කිරීමක්]* කරුණාකරලා මට බාධා කරන්න එපා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ඉඩ දෙන්නේ නැහැ නේ, අගමැතිතුමාට බාධා කරන්න. මගේ කථාවෙන් පසුව ඕනෑ දෙයක් කියාගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්කෝ කථානායකවරයා ඒක දන්නේ නැහැ. එහෙම නැත්නම් විධායක ජනාධිපතිවරයා එක්ක එකට එකතු වෙලා මේ බලය බෙදී යෑම, separation of powers of the tripartite system of government or among the three branches of government - විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය කියන තුන්කට්ටුව - ක්‍රියාත්මක වන වැඩසටහනේදී හිතාමතාම සංවරණ සහ තුලන - checks and balances - ක්‍රමවේදය සම්පූර්ණයෙන්ම උල්ලංඝනය කරලා විධායකය අතට තනි බලය ලබා දෙන කුමන්ත්‍රණයක හවුල්කරුවෙකු හැටියට කථානායකවරයා අද කටයුතු කරනවා කියන එක බොහොම කනගාටුවෙන් හෝ කියන්නට සිදු වෙනවා. මේ දෙකෙන් එකක් තමයි වෙන්නේ.

දැන් මෙතැනදී කථා වුණා, පාර්ලිමේන්තුව තුළ ක්‍රියාකාරීත්වය කොහොමද කියලා. පාර්ලිමේන්තුව තුළ ඡන්දය දීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 72(2) ව්‍යවස්ථාවේ පැහැදිලිව මෙසේ සඳහන් වෙනවා:

"පළමුකොට ඡන්ද විමසීමේ දී, රැස්වීමේ මූලසුන දරන තැනැත්තා ඡන්දය නොදිය යුතු නමුත් යම්කිසි ඡන්ද විමසීමක දී පක්ෂ ඡන්ද සංඛ්‍යාව හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සම වුවහොත් මූලසුන දරන තැනැත්තාට තීරණ ඡන්දයක් හිමි වන්නේ ය. ..."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ සභාව තුළත් සම සමව ඡන්ද ආවොත් කථානායකවරයා මූලසුනේ ඉන්නවා නම්, එහෙම නැත්නම් මූලසුනේ වෙනත් කවුරු හෝ මන්ත්‍රීවරයෙකු ඉන්නවා නම් තීරක ඡන්දය දෙන්න පුළුවන්.

මම කියන්න කැමැතියි, මෙන්න මේ වාගේ අංක ගණිත ටිකක්. අගමැතිතුමා පොඩ්ඩක් ඒක අහගන්නකෝ. ඇත්ත වශයෙන්ම දැන් මේ පාර්ලිමේන්තුවේ කථානායකතුමාත් ඇතුළුව මන්ත්‍රීවරු 225දෙනෙක් ඉන්නවා. අපි හිතමු, යම්කිසි යෝජනාවකට පක්ෂව අසූපස්දෙනෙක් ඡන්දය දුන්නා, එම යෝජනාවට විපක්ෂව හැටපස්දෙනෙක් ඡන්දය දුන්නා, විසිදෙනෙක් ඡන්දය දීමෙන් වැළකී සිටියා කියලා. ඒ වාගේ වෙලාවක කථානායකවරයාට කියන්න පුළුවන්ද, අර ඡන්දය දීමෙන් වැළකී සිටි විසිදෙනාත් ඇත්ත වශයෙන්ම එම යෝජනාවට විපක්ෂව සිටියා කියලා, අර විපක්ෂව ඡන්දය දුන් හැටපස්දෙනාට ඒ විසිදෙනාත් එකතු කරලා, දැන් සම සමව ඡන්ද තිබෙනවා කියලා? හැබැයි, ඒකට බලපාන පොඩි කාරණාවකුත් තිබෙනවා. ඡන්ද විමසීම සඳහා නොපැමිණි මන්ත්‍රීවරුනුත් පණස් හතරදෙනෙකු ඉන්නවා.

මම ආපහු ඒ කාරණය පැහැදිලි කරන්නම්. යෝජනාවට පක්ෂව අසූපස්දෙනෙක් ඡන්දය දුන්නා; යෝජනාවට විපක්ෂව හැටපස්දෙනෙක් ඡන්දය දුන්නා; ඡන්දය විමසීම සඳහා නොපැමිණි අය පණස් හතරදෙනායි; වැළකී හිටපු අය විසිදෙනායි. ඒ වාගේ තත්ත්වයක් තුළ, අර ඡන්දය දීමෙන් වැළකී හිටපු විසිදෙනා, - වැළකී හිටියා නොවෙයි, ඇත්තටම ඒගොල්ලන් විපක්ෂයි කියලා- විපක්ෂව හිටපු හැටපස්දෙනාට එකතු කළාම අසූපස්දෙනායි සහ පක්ෂව අසූපස්දෙනෙක් ඡන්දය දුන්නා කියලා කථානායකවරයාට තීරක ඡන්දයක් දෙන්න පුළුවන්ද? දෙන්නකෝ බලන්න උත්තරය? දෙන්නකෝ බලන්න උත්තරය?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
දෙන්න, උත්තර?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

පුළුවන්ද? කටඋත්තර නැහැ නේ. මේ මොන විහිළුවක්ද? යෝජනාවට පක්ෂව අසූපස්දෙනෙක් ඡන්දය දුන්නොත්, විපක්ෂව හැටපස්දෙනෙක් ඡන්දය දුන්නොත්, පණස් හතරදෙනෙකු නොපැමිණ හිටියොත්, විසිදෙනෙකු ඇවිල්ලා Abstain කළොත් "Yes", "No" ප්‍රතික්ෂේප කරලා "Abstain" කළොත්, එතකොට "Abstain" කරපු විසිදෙනා විපක්ෂ වුණා සේ සලකා කථානායකවරයාට පුළුවන්ද මේ සභාවේ තීරක ඡන්දය දෙන්න? ඇත්ත වශයෙන්ම බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙන කියන්න දෙයක් නැහැ. The case is closed; case එක ඉවරයි. වෙන කියන්න දෙයක් නැහැ. එක්කෝ කථානායකවරයා "Yes", "No", "Abstain" කියන එක දන්නේ නැහැ. එහෙම නැත්නම් විධායකයත් එක්ක හවුල් වෙලා කූට ආකාරයෙන් ව්‍යවස්ථාදායක කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක කරලා ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය කියන ත්‍රිත්වය තුළ - in the tripartite system of government - තිබෙන සංවරණ සහ තුලන පද්ධතියේ බලය බෙදී යෑම සම්පූර්ණයෙන්ම විනාශ කිරීමේ කුමන්ත්‍රණයේ මහ මොළකරු හැටියටයි කථානායකවරයා ගැන අපට කියන්න වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රාර්ථනා කරනවා ඔබතුමාට ඒ පුරුද්ද එන්න එපා කියලා. අද පොඩ්ඩක් එහෙම කරන්න පටන් ගත්තා. එහෙම කරන්න එපා. කථානායකතුමාගේ ගතියක් තිබෙනවා, headphones දමාගෙන එක දිසාවක් - තමන්ගේ දකුණු අත පැත්ත - විතරක් බලන. ඔබතුමා එහෙම කරන්න යන්න එපා. ඒක හරි වැරදියි.

ක්‍රිකට් ආයතනය සම්බන්ධයෙන් ගෙනාපු Resolution එකේදී අපි රටට පණිවුඩයක් දෙන්න ඡන්දයක් ඉල්ලුවා. මොකද, 225දෙනාම එකයි කියලා පෙන්වන්න. නමුත්, මොකක්ද කථානායකවරයා කළේ? ඒකෙදි බෙදීමක් -ඡන්දයක්- ඉල්ලුවාම ඒක දුන්නේ නැහැ. අපේ අයිතිය කප්පාදු කළා. මගේ මතකයෙන් මම මේ කියන්නේ. දූෂිත ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙහි සභාපති ඇතුළු නිලධාරි මණ්ඩලය ඉවත් කිරීම සම්බන්ධයෙන් වූ යෝජනා සම්මතය මම ඉදිරිපත් කළා. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා එය ස්ථිර කළා. මන්ත්‍රීවරු 224දෙනාම ඡන්දය ලබා දීම තුළින් තමන්ගේ මතය එක හඬින් කිව්වා නම්, බලවත් පණිවුඩයක් රටට යනවා. නමුත්, ඒ අවස්ථාව පැහැර හැරියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට Online Safety Act එක ගැන බලන්න. අධිකරණ ඇමතිතුමාම පිළිගෙන තිබෙනවා, ඒකට දැන් අලුත් සංශෝධන හතරක් ගේන්නට ඕනෑ කියන කාරණය. ඇයි, මොනවාටද? ඒ අණපනත් නිසි විධියට අනුමත වීමේ ක්‍රියාවලියේදී කථානායකවරයා හිතාමතාම ඒ සංශෝධන පැහැර හැරියා. නිවැරදිව ඒක ක්‍රියාත්මක කළේ නැහැ. අපි ඇවිල්ලා ඒක කියනකොට, "නැහැ, නැහැ, ඔක්කොම හරි; ඔක්කොම හරි; අන්න නීතිපතිතුමා ඉන්නවා එතුමාගෙන් අහන්න, එතුමාගෙන් අහන්න" කිව්වා; මං මුළා කළා. ඒ වාගේම රන්ජන් රාමනායක මැතිතුමාට ඒ සාධාරණ අවස්ථාව ලබා දුන්නේ නැහැ, මේ පාර්ලිමේන්තුවේදී එතුමාගේ හඬ ඉදිරිපත් කරන්න. ඒ වාගේම තවත් අවස්ථා ගණනාවකදී මේ කථානායකවරයා ඉතාම නිර්ලජ්ජිත ආකාරයට ස්ථාවර නියෝග - Standing Orders - සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන - provisions of the Constitution - උල්ලංඝනය කරමින් කටයුතු කළා. මේ වාගේ කටයුතු කිරීම ගැන ඇත්ත වශයෙන්ම එතුමා ලජ්ජා වෙන්නට ඕනෑ. නමුත් මම පුදුම වෙන්නේ නැහැ, මේ සභාව මේ විශ්වාස හංග යෝජනාවට කොයි ආකාරයට අවසානයේදී ඡන්දය දෙයිද කියන එක ගැන. විපක්ෂයේ අපි නම් බොහොම පැහැදිලි ස්ථාවරයක ඉන්නවා. වෙන මොන කථාද ඉතින්? මේ ගරු සභාවේ ඉන්නවා නේ, 113දෙනෙක් කෙහෙළිය රඹුක්වැල්ල වෙනුවෙන් අත උස්සපු; මේ සභාවේ ඉන්නවා නේ, එහෙම 113දෙනෙක්. ඒ නිසා අද සවස් භාගයේ මොන වාගේ ඡන්ද තීන්දුවක් එයිද කියන එක අපට කියන්නට බැහැ. ඖෂධ වංචාව, ඖෂධ මාෆියාවට පක්ෂව, ඖෂධ හොරකම වෙනුවෙන් බංකොලොත් රටේ ක්‍රියාත්මක වුණු ඒ හොර මගඩි වෙනුවෙන් හිට ගත්ත 113දෙනෙක් ඉන්න මේ සභාවේ අනීතිකව, ව්‍යවස්ථා විරෝධීව කටයුතු කරපු කථානායකවරයා රකින්නටත් බහුතරයක් නැඟිට්ටොත්, මම ඒ ගැන පුදුම වෙන්නේ නැහැ. කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිවරයාට පක්ෂව නැඟිට්ට එකේ කථානායකවරයා වෙනුවෙන් නැඟිටින එක ගැන මම පුදුම වෙන්නේ නැහැ. හැබැයි, එක දෙයක් මම පැහැදිලිවම කියන්නට ඕනෑ. අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝනය වෙලා තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඒ අදාළ ප්‍රතිපාදන අනුගමනය කරන්නේ නැතුව අනීතිකව, ව්‍යවස්ථා විරෝධීව කටයුතු කිරීමේ ඒ වරදට සියයට ලක්ෂ වාරයක් කථානායකවරයා වගකිව යුතුයි කියලා මම ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අදහස් ඉදිරිපත් කරන්නට අවස්ථාව ලබා දුන්නු අපේ අග්‍රාමාත්‍යතුමාට විශේෂයෙන්ම මම නැවත වරක් ස්තුතිවන්ත වෙනවා.

[පූ.භා. 10.53]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரும்)
(The Hon. Dinesh Gunawardena - Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි එළඹ සිටින්නේ දවස් තුනක් වෙන් කරගෙන මේ පාර්ලිමේන්තුවේ සිදු කරන විවාදයේ අවසාන දවසටයි. එය, ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාට එරෙහි විශ්වාස භංග යෝජනාව ලෙස න්‍යාය පත්‍රයේ අන්තර්ගතව තිබෙනවා. මෙහි සඳහන් කරන ගරු කථානායකතුමා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨයෙක්. මම හිතන විධියට එතුමා පාර්ලිමේන්තුවේ සිටින ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීවරුන් කිහිපදෙනාගෙන් එක්කෙනෙක්.

මම එතුමාට ගෞරවයක් වශයෙන් පළමුව මතක් කරන්න කැමැතියි, 1983දී අතුරු මැතිවරණ 18ක් පැවැත් වූ අවස්ථාවේදී එතුමා හක්මණ කොට්ඨාසයේ මන්ත්‍රීවරයා ලෙස පාර්ලිමේන්තුවට තේරී පත් වුණු බව. ඒ දවසේම මමත් පාර්ලිමේන්තුවට පත් වුණා, මහරගම ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරයා හැටියට. අපේ ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා කැස්බෑව ආසනය නියෝජනය කරන මන්ත්‍රීතුමා හැටියට පත් වුණා. අද අපි ජීවතුන් අතර සිටිමින් මේ සභා ගර්භය තුළ කටයුතු කරනවා. මේ කාල පරිච්ඡේදය තුළ කිසිම අවස්ථාවකදී ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සැකයක් උපදින ක්‍රියාවලියකට හවුල් වෙලා නැති බවට පාර්ලිමේන්තු ඉතිහාසයම සාක්ෂි දරනවා. එතුමා එකම පක්ෂයක හිටියේත් නැහැ. යම් යම් ජාතික තීරණ ගන්නා අවස්ථාවලදී එතුමා තම පක්ෂයට වඩා රට මුලට තබා ප්‍රතිපත්තිමය වශයෙන් තීරණ ගත්තා. එතුමා විවිධ ආයතනවල නායකයෙක් හැටියටත් කටයුතු කළා. එතුමා දක්ෂිණ පළාත් සභාවේ මහ ඇමති හැටියටත් කටයුතු

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

කළා. මම මේ කාරණා පළමුවෙන් මතක් කරන්නේ මෙවැනි කෙනෙක් පිළිබඳ විශ්වාසය නොමැති බව කියාපාන්නට යම් යම් අය නැඟී සිටිනවා නම්, -ඒකයි මෙම යෝජනාව තුළ පළමුවෙන්ම සටහන් වෙන්නේ- ඒක ඉතා දුර්වල අදහසක් සම්මත කර ගැනීමට දරන උත්සාහයක් නිසායි.

කථානායකතුමා කෙරෙහි පූර්ණ විශ්වාසය අපට තිබෙන බව මා පළමුව සඳහන් කරන්න කැමැතියි. එතුමා, පාර්ලිමේන්තුවේ සැම කෙනෙකුම නියෝජනය කළ යුතුයි කියැවෙන හඬ නියෝජනය කරපු කථානායකවරයෙක්. එතුමා කථානායකවරයා හැටියට කවදාවත් ආණ්ඩුවට පමණක් ඉඩ දීලා මේ සභාවේ කටයුතු කරලා නැහැ, කුමන විවේචනයක් ආවත්. එලෙස සාධාරණත්වයෙන් තමන්ට ගත හැකි උපරිම තීරණ එතුමා විරුද්ධ පක්ෂයේ විවිධ කොටස් වෙනුවෙන් අනුගමනය කර තිබෙන බව සිහිපත් කිරීම අපේ යුතුකමක්. විරුද්ධ පක්ෂය එතුමා පක්ෂපාතී කථානායකවරයෙක් යැයි ප්‍රකාශ කරන්න පසුගිය දවස් දෙකේදීම උත්සාහ දැරුවා. එවැනි තත්ත්වයක් නැති බව මම යළිත් පාර්ලිමේන්තුවට සිහිපත් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාවේ කොටස් දෙකක් තිබෙනවා. එහි පළමු කොටසින්, අපේ රටේ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය නමැති පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අපට එවන ලද තීරණ ප්‍රකාරව කටයුතු කිරීම සම්බන්ධයෙන් ඇති වී තිබෙන ප්‍රශ්නයක් ඉදිරිපත් කර තිබෙනවා. දෙවැනි කොටසින්, පොලිස්පතිවරයා පත් කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කටයුතු කරපු ආකාරය ගැන වැරදි අර්ථ නිරූපණයක් දුන්නා කියලා එතුමාට චෝදනාවක් එල්ල කරනවා. මේ කාරණා දෙක මුල් කරගෙන තමයි විරුද්ධ පක්ෂය මේ උත්සාහයට යොමු වෙලා තිබෙන්නේ. මේ කාරණා දෙක අතර සම්බන්ධයකුත් නැහැ. පොලිස්පතිතුමාගේ ප්‍රශ්නය විපක්ෂය දේශපාලන ප්‍රශ්නයක් බවට පත් කරගෙන මීට ප්‍රථම කිහිප වතාවක්ම -මේ පත්වීම දෙන්නට පෙරද- ඒ පිළිබඳව ප්‍රශ්න නඟා රටට ප්‍රකාශ කළා. ඒ අය ස්වාධීනත්වයෙන් හිතනවා කියලා, එහෙම නැත්නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව එසේ හිතනවා කියලා කිසි ලෙසකින් කියාපාන්නට බැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හැටියට අපි පැමිණි එකඟතා සම්බන්ධවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අනුගමනය කළ යුතු පිළිවෙත සම්බන්ධවත් මේ පාර්ලිමේන්තුව ඇතුළේ මා ඉතා පැහැදිලිව කියා තිබෙනවා. එහි විශ්වාසය රැකීම සඳහා පාර්ලිමේන්තු සභා ගර්භයට හෝ ප්‍රසිද්ධියට පත් වන ප්‍රකාශයන්ගෙන් අපි වැළකී සිටිනවා කියලා එකඟතාවකට අපි ඇවිල්ලා හිටියා. මේ එකඟතාව සම්පූර්ණයෙන් කඩලා තමයි මේ විශ්වාස භංග යෝජනාව සකස් කරලා තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම මේ විශ්වාස භංග යෝජනාවේ ඇතුළත් මේ වගන්ති මත මෙම යෝජනාව "not in order" කියලා ප්‍රතික්ෂේප කරන්න තිබුණා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කියන්නේ පාර්ලිමේන්තුව නොවෙයි. පාර්ලිමේන්තුවේ තිබෙන යම් යම් ස්ථාවර නියෝග ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ ක්‍රියාත්මක වෙනවා කියන්නත් බැහැ. අපි එතැන ඉඳලා හිතුවොත්, විරුද්ධ පක්ෂයේ මේ උත්සාහය සම්පූර්ණයෙන් වැරදි උත්සාහයක් බව කියන්නට ඕනෑ. විපක්ෂ නායකතුමා දැනුත් කිව්වා, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව කියලා. නැහැ, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග come under the Constitution. Constitution එකේ තිබෙනවා, "පාර්ලිමේන්තුව විසින් තම ස්ථාවර නියෝග කෙටුම්පත් කරනු ඇත, කිරීමට හැකිය" කියලා. ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවටත් තිබෙනවා, තමන් අනුගමනය කරන පිළිවෙත් එම ව්‍යවස්ථා සභාව විසින් කෙටුම්පත් කළ හැකියි කියලා. එයයි විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන්නේ. ඒ නිසා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ගෙනහැර දක්වමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කටයුතු පිළිබඳව මම හිතන විධියට විරුද්ධ පක්ෂය අල්ලාගෙන තිබෙන්නේ වැරදි තර්කයක්. ඒ නිසා මම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිළිබඳ කාරණයට යන්නට මත්තෙන් ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තුවේ මේ ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාව ගැන කථා කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2021 වසරේ මේ පාර්ලිමේන්තුව ආරක්ෂා කරන්න කටයුතු කළ කථානායකතුමා මේ විශ්වාස භංග යෝජනාවෙන් කියන විධියට අවිශ්වාසවන්ත කථානායකවරයෙක් කියලා කියන්න පුළුවන්ද? අද තිබෙන මේ පාර්ලිමේන්තුව ආරක්ෂා කිරීමට එතුමා තමන්ගේ ජීවිතය පරදුවට තියලා කටයුතු කළා. ඒක කිසිම මන්ත්‍රීවරයෙකුට හෝ ලංකා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන කිසිවෙකුට අමතක කරන්න බැහැ. මුළු රටම කඩාගෙන වැටිලා, ජනාධිපතිතුමා රට හැර ගිහිල්ලා, අග්‍රාමාත්‍යතුමා අගමැතිකමෙන් අස් වෙලා, ඒ දවසේ තිබුණු අරාජික තත්ත්වය ගරු නියෝජ්‍ය කථානායකතුමාට සිහිපත් වෙනවා ඇති. විවිධ තර්ජන මැද්දේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා විවිධ පාර්ශ්ව සමඟ කථා කරලා එතුමා නිල නිවසට ගිහිල්ලා ඉන්න කොට තමයි පාර්ලිමේන්තුවට එහා මංසන්ධියේ පාර්ලිමේන්තු ප්‍රහාරයකට පිරිස් රැස් වෙලා සිටියේ. මම දීර්ඝ වශයෙන් ඒ සිදුවීම් සිහිපත් කරන්නේ නැහැ. නමුත් අපේ ආරක්ෂක බලකායන් එදා ඒ අයට පාර්ලිමේන්තුව දෙසට ගමන් කිරීමේ ක්‍රියාවලියට ඉඩ දුන්නා නම්, සිදු විය හැක්කේ කුමක්ද කියලා ඔබතුමා දන්නවා. එය වළක්වා ගන්න ගරු කථානායකතුමා වැඩබලන අග්‍රාමාත්‍යවරයා හැටියට හිටපු ගරු ජනාධිපතිතුමා සමඟ එක්ව ආරක්ෂක බලකායන්ට උපදෙස් දෙමින් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ කේන්ද්‍රස්ථානය වූ පාර්ලිමේන්තුව ආරක්ෂා කරලා දුන්නා. එවැනි කථානායකවරයෙකු සම්බන්ධයෙන් තමයි මේ පාර්ලිමේන්තුවේම ඇතුළේ ඉඳලා විශ්වාසයක් නැහැයි කියලා කථා කරන්නේ. එතුමා උල්ලංඝනය කරපු දෙයක් නැහැ. ඒ විශ්වාසය එතුමා ආරක්ෂා කළා, විපක්ෂය වෙනුවෙන්; ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු වෙනුවෙන්. එදා තිබුණේ ආණ්ඩුවක ප්‍රශ්නයක් නොවෙයි, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමයි. මහින්ද යාපා අබේවර්ධන මැතිතුමාට ඒ තීරණය ගන්න පුළුවන්කම තිබුණේ එතුමා තුළ තිබුණු ජොෂ්ඨත්වය සහ එතුමා එකතු කරගත් අත්දැකීම් සම්භාරය නිසායි. ඒ නිසා මම පුදුම වෙනවා, විරුද්ධ පක්ෂය මේ විධියට ගරු කථානායකතුමාට විශ්වාසයක් නැති බව ප්‍රකාශ කරන එක ගැන.

පාර්ලිමේන්තුව ආරක්ෂා කරන්න, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න, හිංසාවාදයේ ජයග්‍රහණය පරාජය කරන්න, අවිහිංසාවාදයේ ජයග්‍රහණය ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ආරක්ෂා කර දෙන්න කථානායකතුමාට පුළුවන්කම ලැබුණු එක ගැන මා හිතන විධියට විපක්ෂයේ කිසිවකු ප්‍රශ්න කරන එකක් නැහැ. එසේ නම් එතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරන්නේ කුමකටද කියලා ඉතා ඕනෑකමින් අපි අහන්න ඕනෑ. ඔවුන් කරන චෝදනාවේ එක කොටසක් අනෙක් කොටසට සම්බන්ධ නැහැ. ඒ යෝජනාවෙන් ඉදිරිපත් කරලා තිබෙන්නේ, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පතේ සංශෝධන සම්මත කරන අවස්ථාවේදී එම සංශෝධනවලට ඉඩකඩ නොදෙමින් කටයුතු කළා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත්, රටත්, අපත්, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුනුත් දැක්කා, එදින පාර්ලිමේන්තුවේ සිදුවුණු දේ. එදින පාර්ලිමේන්තුවේ ඡන්දය කැඳවලා අපි ඡන්දය දුන් ආකාරය සටහන් වෙලා තිබෙනවා. විරුද්ධ පක්ෂ නායකතුමා

කියපු දේ සම්බන්ධයෙන් මම එතුමාට ඉතා ඕනෑකමින් මේ කාරණය සිහිපත් කරනවා. ඡන්ද විමසීමේදී පක්ෂයි, විපක්ෂයි, ඡන්දය දුන්නේ නැහැ කියලා සටහන් වෙනවා. එදා වුණේත් ඒක තේ. එදා විරුද්ධ පක්ෂයේ සජබ මන්ත්‍රීවරුන් හා ඔවුන් සමඟ අද මේ විශ්වාස භංග යෝජනාවට අත්සන් තබා තිබෙන 44දෙනාගේ කණ්ඩායම සභාවෙන් නැඟිටලා ගියා. සභානායකතුමාට ඒක මතක ඇති. ඒ අය ඡන්දය දෙන්න හිටියේ නැහැ. නමුත් පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ අපේ උතුරේ මන්ත්‍රීවරු, විපක්ෂයේ ඉඳගන්න අපේ දකුණේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් ඡන්දය පාවිච්චි කළා. ඒ අයට ඡන්දය පාවිච්චි කරන්න ඉඩකඩ ලැබීමත් අනෙක් අය සභා ගර්භයෙන් ඉවත්ව ඡන්දය පාවිච්චි නොකර සිටීමෙනුත් ඔප්පු කරන්නේ තමන්ගේ වගකීම විපක්ෂය ඉෂ්ට කරලා නැහැ කියන එකයි.

එය පිළිගන්නවා වෙනුවට අද කථානායකතුමාට චෝදනා කරනවා, කථානායකතුමා තමනට ඡන්දය පාවිච්චි කරන්න ඉඩ දුන්නේ නැහැ කියලා. මේ විශ්වාස භංග යෝජනාවේ කියන ප්‍රධාන කාරණයක්, ඒක. මම හිතනවා, එය සම්පූර්ණයෙන් අසත්‍යයක් කියලා. That is a total lie presented in this Vote of No Confidence. If the Opposition wanted to vote, they could have voted and some Members of the Opposition voted against it. The SJB Parliamentary Group and the joint signatories of this Motion walked away from Parliament. එදා ඡන්දය නොදී සභාවෙන් නැඟිටලා ගිහින් අද ඇවිල්ලා කියනවා, ඡන්දය දෙන්න ඉඩ දුන්නේ නැහැ කියලා. ඉතින්, විරුද්ධ පක්ෂයේ අරමුණ ඉතා පැහැදිලියි. එය තමයි, පාර්ලිමේන්තුව සහ රජය කරගෙන යන වැඩ කටයුතු සම්බන්ධයෙන් අසත්‍ය චෝදනා එල්ල කිරීම. පාර්ලිමේන්තුව ප්‍රජාතන්ත්‍රවාදීව යළි ශක්තිමත් කර වැඩ කරගෙන යන අවස්ථාවේ විපක්ෂයට ඕනෑ, ඔවුන්ගේ පාර්ලිමේන්තු අයිතිවාසිකම් ලැබෙන්නේ නැහැ කියා රටට පෙන්වන්නයි; පුළුවන් නම් ලොවටත් කියන්නයි. පාර්ලිමේන්තුව තුළ විවාදවලට, ඡන්ද විමසීම්වලට, විවිධ ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ අවස්ථා සියල්ලට ඉඩ කඩ තිබියදී මේ කරන චෝදනාව සම්පූර්ණයෙන් පදනම් විරහිතයි, අසත්‍යයි කියන එක මම සඳහන් කරන්න ඕනෑ. ඒ කාලයටත් වඩා මේ කාලයේ පාර්ලිමේන්තුවේ ඒ හැම මොහොතක්ම පටිගත කරන ලද වීඩියෝ තිබෙනවා. ඒ අවස්ථාව යළි බැලුවොත් ඔබතුමන්ලා මේ කියන කථාව සම්පූර්ණයෙන් අසත්‍යයක් කියලා ඔප්පු වෙනවා. මම ඒ කාරණය ගැන විරුද්ධ පක්ෂයට ඊට වඩා කියන්න යන්නේ නැහැ.

මේ විශ්වාස භංග යෝජනාවේ සඳහන්, ඔබතුමන්ලා අද කියන්න උත්සාහ දරන, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පතට ඡන්දය දෙන්න ඉඩ දුන්නේ නැහැ, කාරක සභා අවස්ථාවේදී ඉඩ දුන්නේ නැහැ කියන දේ ගැන යළි යළිත් සිහිපත් කර බලන්න. එහිදී පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ අනෙක් මන්ත්‍රීවරුන් තම අයිතිවාසිකම් පාවිච්චි කළ හැටි බලන්න. අපක්ෂපාතිත්වයෙන් යුතුව එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව හමුවට ඉදිරිපත් කරලා පාර්ලිමේන්තුවේදී සම්මත වුණු හැටි අපි දන්නවා. එදින අපේ ගරු ටිරාන් අලස් ඇමතිතුමා නැඟිටලා කිව්වා, එයට යම් යම් සංශෝධන ඉදිරි දිනයකදී වෙනම ඉදිරිපත් කරන බව. එය පැහැදිලිව සඳහන්ව තිබෙනවා, හැන්සාඩ් වාර්තාවේ.

ඊට පසුව කියනවා, කථානායකතුමා නීති විරෝධී ලෙස ඒ පනත් කෙටුම්පතේ සහතිකය සටහන් කළා කියලා. කථානායකතුමා නීති විරෝධී ලෙස පනත් කෙටුම්පතක සහතිකය සටහන් කරන්නේ නැහැ. එසේ කළා කියලා කරුණු ඉදිරිපත් කිරීමට විරුද්ධ පක්ෂය අසාර්ථක වී තිබෙනවා කියලායි මා හිතන්නේ.

කථානායකතුමා එම පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කිරීමෙන් පසුව මොකද වෙන්නේ? මා මිත්‍ර ගරු සුමන්තිරන් මැතිතුමා ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා ඒ කාරණය ගැන තර්ක කළා. එතුමා මේ වෙලාවේ මේ සභාවේ නැති වුණත් මම ඒ ගැන කියන්න ඕනෑ. ගරු සුමන්තිරන් මැතිතුමා තර්ක කළා, කථානායකතුමා මේ පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කර තිබෙනවා, ඒක නීති විරෝධියි, එය අවලංගු කරන්න කියලා. නමුත්, ශ්‍රේෂ්ඨාධිකරණය ඒ පෙත්සම සලකා බැලුවේ නැහැ. සලකා බලන්නේ නැතිවම එය ප්‍රතික්ෂේප කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා පාර්ලිමේන්තුවේ පනතක් සම්මත කළාට පස්සේ එය අවලංගු කරන්න බැහැ කියලා. එහි අඩු පාඩුකම් තිබෙනවා නම් ඒවා නිවැරදි කිරීමට ප්‍රවිෂ්ට විය හැක්කේ ඒ සඳහා සංශෝධන ගෙනෙන තවත් පනත් කෙටුම්පතකින් පමණයි. ඒක තමයි පාර්ලිමේන්තු සම්ප්‍රදාය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අප කටයුතු කරන ක්‍රමවේදය.

මට මතකයි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගෙනාපු දවස. මම සුමන්තිරන් මන්ත්‍රීතුමාටත් ඒ ගැන කිව්වා. එදා පාර්ලිමේන්තුවේ විපක්ෂය පැත්තේ හිටියේ අප ටික දෙනකු -අට දෙනෙකු- පමණයි. එය සම්මත කරපු ආකාරය පිළිබඳව ගැටලු තිබුණා. එය හරියාකාරව සම්මත කිරීම සිදු නොවුණු නිසා ශ්‍රේෂ්ඨාධිකරණයට විශේෂ පෙත්සමක් ඉදිරිපත් කරන්න ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය තීරණය කළා. ගරු බණ්ඩාරනායක මැතිනිය එක පෙත්සමකුත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට මම තවත් පෙත්සමකුත් ඉදිරිපත් කළා. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය විනාඩි කිහිපයකින් කිව්වා, "මේකට මැදිහත් වෙන්නේ නැහැ" කියලා. අභියාචනාධිකරණය කිව්වා, "මේකට මැදිහත් වෙන්නේ නැහැ. පනතක් සම්මත වෙලා තිබෙනවා නම් එතැනින් ඒ කටයුතු හමාරයි" කියලා. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා අපේ රටේ ඉන්න දක්ෂ නීතිඥවරයෙක්. පාර්ලිමේන්තුවේ දක්ෂ ලෙස විවාද කරන කථිකයෙක්. හැබැයි, මම එතුමාට සිහිපත් කරන්න කැමතියි, පාර්ලිමේන්තුව පනත් කෙටුම්පතක් සම්මත කළාට පසුව, එහි සහතිකය කථානායකතුමා සටහන් කළාට පසුව එය නීතියක් බවට පත් වන බව. විවිධ සංවිධාන සමඟ පැමිණි එකඟතා අනුව යම් යම් සංශෝධන අවශ්‍ය නම් ඒ සංශෝධන ගෙනෙන බවට ගරු ඇමතිතුමා එකඟතාවට පැමිණියා.

පොලිස්පතිතුමා පත් කිරීම පිළිබඳව ගරු විපක්ෂ නායකතුමා ඇතුළු විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරපු කරුණු මම එකින් එකට කථා කරන්න යන්නේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභිකයෙකු හැටියට සහ අග්‍රාමාත්‍යවරයා හැටියට මම කලිනුත් කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එදිනෙදා වන කටයුතු ගැන මේ යෝජනාවෙන් ඉදිරිපත් කරලා තිබෙන කාරණාව පිළිගන්නට පුළුවන්කමක් ගරු කථානායකතුමාටවත් නැහැ කියලා. ඇයි ඒ? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඇතුළේ තිබෙන කාරණා -ඡන්දය පක්ෂව දෙනවා ද, විපක්ෂව දෙනවා ද, එහෙම නැත්නම් ඡන්දය දීමෙන් වැළකී සිටිනවාද යනාදිය- මෙලෙස ප්‍රසිද්ධියට පත් කිරීමේ අයිතියක් එහි කිසිම සභිකයෙකුට නැහැ. වාචිකව හෝ ලිඛිතව අප පැමිණ තිබෙන එකඟතාව කියන්නේ සභාව කටයුතු කරන ආකාරය පිළිබඳව පැමිණ තිබෙන එකඟතාවයි.

දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කළ දා සිට මේ දක්වා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පවතිනවා නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ හැම සංශෝධනයකදීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ආරක්ෂා වුණා. එහි අභ්‍යන්තරයේ කටයුතු පාර්ලිමේන්තුවේ විවාදයකට ලක් කරලා නැහැ, මොන

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

මතභේද තිබුණත්. වත්මන් විරුද්ධ පක්ෂය කොහෙත්ම විශ්වාසයක් නැහැ කියලා කථානායකතුමාට කියමින්, තමන් පිළිබඳ අවිශ්වාසය ප්‍රදර්ශනය කර තිබෙනවා. තමන් පිළිබඳ අවිශ්වාසය ප්‍රදර්ශනය කර තිබෙනවා වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කටයුතු කරන ආකාරය පිළිබඳ විශ්වාසයත් කඩලා තිබෙනවා. අග්‍රාමාත්‍යවරයා හැටියට මම එය කනගාටුවෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ. එහි අභ්‍යන්තරයේ දේවල් මම ඊට වඩා කථා කරන්නේ නැහැ. කලින් තිබුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවලත් අභ්‍යන්තරයේ මතභේද තිබිලා තියෙනවා; අභ්‍යන්තරයේ ඡන්ද විමසීම් තිබිලා තියෙනවා. ඒ මන්ත්‍රීවරු අද ඒ සභාවේ නැති වුණත්, අද දක්වා ඒ සාකච්ඡා ප්‍රසිද්ධියට පත් කරලා නැහැ. එහෙම නම්, මේ විපක්ෂය එසේ කිරීමේ අරමුණ මොකක්ද? විපක්ෂයේ ඔබතුමන්ලාට ඕනෑ වුණා, පොලිස්පතිවරයාගේ පත්වීම නවත්වන්න; ඔබතුමන්ලාට ඕනෑ වුණා රට අරාජික කරන්න. වත්මන් පොලිස්පතිවරයා මුලින්ම වැඩ බලන පොලිස්පතිවරයා හැටියට පත් වෙලා ජාතික ආරක්ෂාවේ යහපත පිණිස යම්කිසි වැඩ කොටසක් ඉතා පැහැදිලිව ඉටු කරමින් සිටිනවා. ඒ වැඩ කටයුතු අවුල් කරන්නට, නවත්වන්නට, ඒ වාගේම අනෙක් පැත්තෙන්, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විශ්වාස කරන්න බැරි තත්ත්වයට පත් කරන්නට විපක්ෂය උත්සාහ කරනවා.

අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා, කථානායකතුමායි. එතුමා එහි සභාපති වන්නේ, නිල බලයෙන්. මා ද එහි සාමාජිකයෙකු වන්නේ නිල බලයෙන්. විපක්ෂ නායකතුමා ද එහි සාමාජිකයෙකු වන්නේ නිල බලයෙන්. ජනාධිපතිතුමාට බලය තිබෙනවා, ඒ සඳහා එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පත් කරන්න. ඒ අනුව එතුමා කෙනෙකු පත් කරනවා. අග්‍රාමාත්‍යතුමාට බලය තිබෙනවා එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පත් කරන්න. ඒ අනුව කෙනෙකු පත් කරනවා. තවත් තුන්දෙනෙකු ජනතාවගේ අදහස් නියෝජනය කරන සිවිල් සමාජයේ නියෝජිතයන් හැටියට පත් කරනවා.

මෙය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ රහස්‍යභාවය සහ උත්තරීතරභාවය ආරක්ෂා කරන ක්‍රියාදාමය සම්පූර්ණයෙන් කඩාකප්පල් කිරීමකට යොමු කරන විශ්වාස භංග යෝජනාවක්. මේ තුළින් ආණ්ඩුවේ කටයුතු අවුලකට පත් කිරීම, කඩාකප්පල් කිරීම තමයි විරුද්ධ පක්ෂය මේ කාල සීමාව තුළ කරන එකම කටයුත්ත වෙන්නේ. අනෙක් පැත්තෙන්, රට වැටී තිබුණු අරාජික තත්ත්වයෙන් ගොඩ අරගෙන, නීතිය හා සාමය පිහිටුවලා, ආර්ථිකය යළි හිස ඔසවන තත්ත්වයකට, වර්ධනයකට පරිවර්තනය කරලා තිබෙන මේ ආණ්ඩුවේ කටයුතු අවුල් කිරීමේ එකම උත්සාහය තමයි මේ විශ්වාස භංග යෝජනාවේව තුළින් කරන්න හදන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මීට වඩා කාල වේලාව ගන්නේ නැහැ. නීතිමය වශයෙන් අපට බලපාන තව ප්‍රධාන නීති, නඩු තීන්දු ගණනාවක් ඉන්දියානු අධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. මම ඒවා කියවන්නට යන්නේ නැහැ. අපේ රටේ හදිසි, කල් දැමිය නොහැකි තත්ත්වයක් ඇති වෙනකොට යම් යම් ආයතනවල ප්‍රධානීන් ඒ ගත යුතු තීරණ ගැනීමේ අවශ්‍යතාව අපි පිළිගන්නවා. මා මිත්‍ර රවුෆ් හකීම් මැතිතුමා කථා කරනවා මම අහගෙන හිටියා, සභා ගර්භයේ හිටියේ නැති වුණාට. රවුෆ් හකීම් මැතිතුමනි, ඔබතුමාට මතක ඇති, මම සිහිපත් කරන්නේ නැහැ, අපි කථා වුණු දේ. ඔබතුමාට මතක ඇති අන්තිම සාකච්ඡාව; ජනාධිපති ගිහිල්ලා, අගමැති අස්වෙලා, කථානායකතුමාගේ මූලාසනයෙන් පැවැති අන්තිම සාකච්ඡාව, පාර්ලිමේන්තු කාමරයක. එදා ජනාධිපතිතුමා ආවේ, ජනාධිපතිතුමා හැටියට නොවෙයි. ඔබතුමාත් මමත් එතැනට සහභාගි වුණේ, අපි පාර්ලිමේන්තුවේ දරන තනතුරු නිසායි. ඒ අවස්ථාවේදී භයානක තත්ත්වයක් එළියේ මතු වෙමින් තිබුණා. ඒ තත්ත්වය තුළත් ගරු කථානායකතුමා අපව රැස් කළා. මේ සුළු සුළු ප්‍රශ්නවලට, අරයාව පත් කළේ නැහැ, මෙයාව පත් කළේ නැහැ කියලා කථානායකවරයෙකුට විශ්වාස භංග යෝජනා ගෙනෙන්නේ නැහැ; ගරු රවුෆ් හකීම් මැතිතුමා හොඳින් දන්නවා. Then, we would have had to bring No-Confidence Motions to every Speaker who had been in the Parliament. Those are issues that we must settle among ourselves. ඒ වෙනුවට අද වැඩියෙන් කථා කළේ මොනවාද? එක මන්ත්‍රීවරයෙක් නැගිටලා කියනවා, කෝප් එක ගැන. තව මන්ත්‍රීවරයෙක් නැගිටලා කියනවා, තවත් කමිටුවක් ගැන. මේවාට නොවෙයි විශ්වාස භංග යෝජනාවක් වැනි දෙයක් පාවිච්චි කළ යුත්තේ, ඊට වඩා උත්තරීතර කාරණා සඳහායි. ඒ නිසා මම මේ ගැන කනගාටු වෙනවා.

එදා, ඒ අවස්ථාවේ අපි සාකච්ඡා කරලා මොකක්ද කළේ? ඉතිහාසයේ කොටසක් නිසා මම ඒක කියලා ඉවර කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ දවසේ ගරු අග්‍රාමාත්‍යතුමා හැටියට පත් වෙලා ඒ ධුරය භාර අරගෙන කටයුතු කරපු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒ සාකච්ඡාවෙන් පිට වෙලා ගිහින් වැඩි වෙලාවක් යන්නට කලින් එතුමාගේ ගේ -පදිංචි වෙලා හිටපු ගෙදර- සම්පූර්ණයෙන් ගිනිබත් කරනු ලැබුවා. රවුෆ් හකීම් මැතිතුමා දන්නවා, එදා ඇතුළේ සිදු වුණු උණුසුම් කරුණු හුවමාරු කර ගැනීම ගැන. නමුත් අපි කිසි කෙනෙක් ඒ කාමරයේ හිටපු කිසිවෙකුට හෝ තර්ජනයක් කළේ නැහැ. රනිල් වික්‍රමසිංහ මැතිතුමා දිවුරුම් දීලා කටයුතු කිරීමට පටන් ගත්ත නිසා මේ සාකච්ඡාව පිළිබඳ වැරදි ප්‍රවෘත්ති ලබා දීම හේතුවෙන් එතුමාගේ නිවස සම්පූර්ණයෙන් ගිනිබත්කොට පොළොවට සමතලා කරනු ලැබුවා. මම මේ එක සිද්ධියක් කියන්නේ. අපේ මන්ත්‍රීවරයෙක් ජීවිතක්ෂයට පත් වුණා, අත්තනගල්ලේදී. ඒ වෙලාවේදී අපි කිසිවෙකු එය අනුමත කළේ නැහැ. ඒ නිසා රටක් අවුලකට පත් වෙන මෙවැනි යෝජනාවක් අද විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් 44දෙනෙකු අත්සන් කරලා ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ එහි පදනමක් නැති කරුණු තමයි මේ ආකාරයෙන් මම විස්තර කරන්නේ.

පාර්ලිමේන්තුව -අපි- යන දවසකට ඡන්දයට යමු. නියමිත දින ඡන්දය තියනවා. අපේ රට මුහුණ දුන්නු unprecedented economic crisis එකෙන් - මෙවැනි ආර්ථික අර්බුදයකට අපේ රට මුහුණ දීලා නැහැ; යුද්ධ කාලයේවත් මුහුණ දීලා නැහැ - ගොඩ එන එක පිළිබඳව රටවැසියා විශ්වාසය තබමින් සිටින වෙලාවේ මොකක්ද මේ කරන්නේ? අමාරුකම් තිබෙනවා. ඒ අමාරුකම් අඩු කරමින් අපි ඉදිරියට යන වෙලාවේදී අසත්‍ය මුල් කර ගත්, සත්‍යය සම්පූර්ණයෙන් වසන් කොට ඉදිරිපත් කරපු මෙම විශ්වාස භංග යෝජනාව අද දිනයේ පරාජයට පත් කිරීමයි අපේ පාර්ලිමේන්තු සම්ප්‍රදායටත්, ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු ක්‍රමයටත් ඉටු කළ හැකි සාධාරණය වන්නේ. ස්තුතියි.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අගමැතිතුමා කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සිද්ධ වෙන දේවල් පාර්ලිමේන්තුව තුළවත්, එළියේවත් කථා කරන්න හොඳ නැහැ කියලා. නමුත්, එතුමාට අමතක වෙලා තිබෙනවා, පොලිස්පති පත් කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සිද්ධ වෙච්ච දේ ඉස්සෙල්ලාම

එළියට දුන්නේ කථානායකතුමා බව. කථානායකතුමා ජනාධිපතිතුමාට ලියුමක් ලිව්වා. කථානායකතුමා ජනාධිපතිතුමාට ලියුමක් ලිව්වා, "ඡන්ද හතරයි ලැබුණේ, මම මොකක්ද මේකට කරන්නේ?" කියලා අහලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ ප්‍රශ්නය ඇහුව එක හොඳයි. ගත්ත තීරණය තමයි කථානායකතුමා එතුමාට දන්වා යැව්වේ. පොලිස්පතිතුමාව පත් කරන්න හතරදෙනෙක් ඡන්දය දුන්නා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ නේ. කථානායකතුමා අසත්‍යයක් ලියලා නැහැ නේ. එතුමා ලියලා තිබෙන අසත්‍ය මොකක්ද?

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
හැම පත්තරයකටම ඒ ලියුම යැව්වා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පත්තරේට දෙන්නේ නැහැ. පක්ෂව ඡන්ද හතරක් ලැබුණා. එතුමා අර නිහඬව හිටපු දෙදෙනාගේ ඡන්දත් විපක්ෂයි කියලා, විරුද්ධ පක්ෂයට දුන්නා. එතකොට සම සමයි. ඒ අනුව එතුමා එහි සාමාජිකයෙක් හැටියට තමන්ගේ ඡන්දය ප්‍රකාශ කරලා, ඡන්ද පහක් වැටී ඇති බව ප්‍රකාශ කළා. ඉතින්, එතුමාට ඊට වඩා කරන්න රාජකාරියක් නැහැ නේ. එතුමාගේ රාජකාරිය තමයි ඉෂ්ට කළේ.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
කථානායකතුමා ජනාධිපතිතුමාගෙන් උපදෙස් ඉල්ලුවා, මොකක්ද කරන්නේ කියලා. එතුමා ඒක ප්‍රසිද්ධ කෙරුවා. හැම පත්තරේම ලියුම පළ වුණා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලැබී ඇති බලය අනුව ජනාධිපතිතුමා තමයි පත් කිරීමේ බලධාරියා. ඒ නිසා එතුමාට දැනුම්දීමට අනිවාර්යයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව බැඳී සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ගෝවින්දන් කරුණාකරම් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු අටක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු අංගජන් රාමනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] took the Chair.*

[மு.ப. 11.24]

**ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා**
(மாண்புமிகு கோவிந்தன் கருணாகரம்)
(The Hon. Govindan Karunakaram)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நாடு சுதந்திரமடைந்த காலம் முதல் இன்றுவரை எமது பாராளுமன்ற வரலாற்றில் இடம்பெறாத பிரேரணையொன்றின் மீதான விவாதத்தில் நான் உரையாற்றுகின்றேன். எமது நாட்டின் பதவித் தரநிலையின் அடிப்படையில் சனாதிபதி, பிரதமர் ஆகிய பதவிகளுக்கு அடுத்து மூன்றாவது தர நிலையிலுள்ள பதவி சபாநாயகர் பதவியாகும். சபாநாயகர் பதவியென்பது, 'வெஸ்ட் மினிஸ்டர்' பாராளுமன்ற சம்பிரதாயத்தின் அடிப் படையில் உருவான பதவியாகும். இது பாராளுமன்றத்தின் அதியுயர் கௌரவ பதவியும்கூட.

பாராளுமன்ற உறுப்பினர் ஒருவர் பாராளுமன்றத்தின் சபாநாயகராகத் தெரிவு செய்யப்பட்டால், அவர் தான் தெரிவு செய்யப்பட்ட கட்சியிலிருந்து விலகியவராகவே கருதப்பட்டு, தனது கடமையைப் பொறுப்பேற்பார். சபாநாயகர் பதவியின் இன்னுமோர் உயர் கௌரவம் என்னவெனில், பிரித்தானிய 'வெஸ்ட் மினிஸ்டர்' சம்பிரதாயத்தில் சபாநாயகராகத் தெரிவு செய்யப்பட்ட ஒருவர், அடுத்த தேர்தலில் போட்டியிட்டால், அவர் போட்டியிடும் தொகுதியில் அவரை எதிர்த்து எந்தக் கட்சியும் தனது வேட்பாளரை நிறுத்துவதில்லை என்பதுதான். இத்தகைய ஓர் உயர் பண்புமிக்கதும் மாண்புமிக்கதுமானது தான் சபாநாயகர் பதவி. அத்தகைய 'வெஸ்ட் மினிஸ்டர்' சம்பிரதாயத்தை அவ்வாறே பின்பற்றும் எமது பாராளுமன்றத் தில், அத்தகைய பெருமைகொண்ட சபாநாயகருக்கு எதிராக நம்பிக்கையில்லாப் பிரேரணையொன்று கொண்டுவரப்பட்டு இருப்பதென்பது, எமது நாட்டின் பாராளுமன்ற வரலாற்றில் வெட்கப்படவேண்டிய விடயமே தவிர, எதிர்க்கட்சியினர் கொண்டுவந்த இந்த நம்பிக்கையில்லாப் பிரேரணையைப் பெரும்பான்மை வாக்குகளால் தோற்கடித்து விட்டோமென ஆளும் தரப்பு பெருமைகொள்ளக்கூடிய விடயமல்ல.

சபாநாயகருக்கு எதிராக நம்பிக்கையில்லாப் பிரேரணை கொண்டுவரப்பட்டதற்கான உடனடிக் காரணம், அண்மையில் நிறைவேற்றப்பட்ட நிகழ்நிலைக் காப்புச் சட்டமூலமாகும். அண்மையில் அவசர கோலத்தில் சட்டவரைவு மேற்கொள்ளப் பட்டு, அதே அவசரத்தில் வர்த்தமானியில் வெளியிடப்பட்டு, பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்ட இச்சட்டமூலம் தொடர் பில் ஆளும் கட்சி உறுப்பினர்கள் தவிர, ஏனைய அனைத்து அரசியல் கட்சியினரும், சமூக ஆர்வலர்களும், தன்னார்வத் தொண்டர்களும், தன்னார்வத் தொண்டு நிறுவனங்களும், சர்வதேச மனித உரிமை ஆர்வலர்களும், சர்வதேச மனித உரிமை நிறுவனங்களும் தமது கவலையையும் கரிசனையை யும் வெளியிட்ட போதும்கூட, அத்தனையையும் புறக்கணித்து அவசர கோலத்திலே இச்சட்டமூலம் நிறைவேற்றப்பட்டது.

ஐக்கிய அமெரிக்கா, பிரித்தானியா போன்ற நாடுகள் உட்பட பெயரளவில் ஜனநாயகம் நிலவும் நாடுகளிலும் இத்தகைய சட்டம் இயற்றப்பட்டுள்ளது. ஐக்கிய அமெரிக்கா, பிரித்தானியா போன்ற நாடுகளில் இத்தகைய சட்டமூலம் தொடர்பில் பல வருடங்கள் - மூன்று, நான்கு வருடங்கள் - சமூகத்தின் அடிமட்டத்திலிருந்து உயர்மட்டம் வரை பல்வேறு தரப்பினருடனும் நிறுவனங்களுடனும் முறையான கலந்துரை யாடல்கள் மேற்கொள்ளப்பட்ட பின்னரே அது சட்டமாக நிறைவேற்றப்பட்டது.

எமது நாட்டின் நிகழ்நிலைக் காப்புச் சட்டம் ஓரளவுக்குச் சிங்கப்பூரின் நிகழ்நிலைக் காப்புச் சட்டத்தை ஒத்தது என்றே

[ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා]

நான் கருதுகின்றேன். சிங்கப்பூரின் ஜனநாயகத் தன்மை பற்றி இச்சபையில் நான் உரையாற்ற விரும்பவில்லை. இச்சட்ட மூலத்தில் அரசியலமைப்புக்கு முரணாகப் பல வாசகங்கள் உள்ளன எனவும் அவை சீர்செய்யப்பட வேண்டுமெனவும் உச்ச நீதிமன்றம் கூறியது. அவை சீர்செய்யப்படாதவிடத்து அரசியலமைப்புக்கு முரணானதாகவே இச்சட்டமூலம் கருதப் படும் என்றும் சாதாரண பெரும்பான்மைமூலம் இச்சட்ட மூலத்தை நிறைவேற்ற முடியாதெனவும் உச்ச நீதிமன்றம் கூறியது. இவையெல்லாம் முற்றாகப் புறக்கணிக்கப்பட்ட நிலையில், அரசியலமைப்புக்கு முரணாக சபாநாயகர் அவர்கள் தனது ஒப்புதலை வழங்கி இச்சட்டமூலத்தைச் சட்டமாக்கி யுள்ளார்.

உச்ச நீதிமன்றத்தின் விதப்புரைகளைப் புறக்கணித்து, அரசியலமைப்புக்கு முரணாக எமது சபாநாயகர் நிகழ்நிலைக் காப்புச் சட்டமூலத்தில் தனது ஒப்பத்தை இட்டதன்மூலம் அவர் கூறும் செய்தி என்ன? 'வெஸ்ட் மினிஸ்டர்' சம்பிரதாயத்தை இதன்மூலம் எமது சபாநாயகர் அவமதித்துள்ளதுடன், அதனை முற்றாக மீறியுமுள்ளார். தென்கிழக்கு ஆசியாவில் பெருமை மிகு பாராளுமன்றச் சம்பிரதாயம்கொண்ட எமது நாட்டில் இதுவரையில் இருந்து வந்த சம்பிரதாயம் இதன்மூலம் முற்றாக மீறப்பட்டுள்ளது. எல்லாவற்றுக்கும் மேலாக ஜனநாயக நாட்டில் சட்டத்துறை, நிருவாகத்துறை, நீதித்துறை சமமான தும் ஒன்றுடனொன்று ஒப்புவமை இல்லாததுமாக இருக்க வேண்டு மென்ற வலுவேறாக்கல் தத்துவத்தைத் தன் காலின்கீழ் போட்டு மிதித்துள்ளார். இது எமது பாராளுமன்றச் சம்பிரதாயத்துக்குப் பெருமையா? எமது சபாநாயகருக்குப் பெருமையா?

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! மாண்புமிகு ஜனாதிபதி அவர்களோ, கௌரவ பிரதமர் அவர்களோ பாராளுமன்றத்தில் உரையாற்றும்போது, கௌரவ சபாநாயகர் அவர்களை நோக்கி, "கௌரவ சபாநாயகர் அவர்களே!" என்றே விளிப்பார்கள். ஆளும் கட்சி, எதிர்க்கட்சி, சிறுபான்மையினர், பெரும்பான்மையினர் என்ற பேதமின்றிச் சபையை நடுநிலைமைத் தன்மையுடனும் நீதி நெறிமுறையுட னும் சபாநாயகர் சபையை வழிநடத்தவேண்டிய கடப்பாட்டுக் குரியவர். இத்தகைய சபாநாயகர் பதவியைச் சீராக வகித்தவர்கள் எமது நாட்டிலும் இருந்துள்ளார்கள். ஆனால், இது போன்ற சம்பவம் எந்தச் சபாநாயகருக்கும் எமது நாட்டில் நடைபெறவில்லை.

எமது பாராளுமன்றத்தின் செங்கோல் எமது சபாநாயகரின் பொறுப்பிலேயே உள்ளது. செங்கோல் என்பது பக்கச்சார்பற்ற நடுநிலை வகிக்கின்ற பதவிக்குரிய சின்னமாகும். ஆனால், எமது பாராளுமன்ற வரலாற்றில் அண்மைக்காலமாக சபாநாயகர் இத்தகைய நடுநிலைமைத் தன்மை வகிப்பதை நான் காணவில்லை. இச்சபையில் விவாதங்களின்போதும் உறுப்பினர்கள் தமது எதிர்ப்பை வெளிக்காட்டும்போதும் ஆளும் கட்சியை ஒரு விதமாகவும் எதிர்க்கட்சியை இன்னொரு விதமாகவும் நடத்திச் செல்கின்ற நிலைமையையே நாம் காண முடிகின்றது. பாராளுமன்ற உறுப்பினர்களது சிறப்புரிமைகள் மீறப்படுகின்றபோது, குறிப்பாக, சிறுபான்மைத் தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்களது சிறப்புரிமைகள் மீறப்படும் போது, நாம் அவற்றைப் பாராளுமன்றத்தில் எடுத்துரைத்தா லும் அவை முறையான கவனத்துக்கு உட்படுவதில்லை. அதுமாத்திரமன்றி, அவர்களுக்குரிய நீதியும் முறையாகக் கிடைப்பதில்லை என்பதை நான் இந்தச் சந்தர்ப்பத்தில் எடுத்துரைக்க விரும்புகின்றேன்.

ஆளும் கட்சியினரின் அடாவடிகளையும் அக்கிரமங்களை யும் எதிர்க்கட்சியினர் எடுத்துரைக்கும்போதும், சிறுபான்மை யினப் பாராளுமன்ற உறுப்பினர்கள் தமது உரிமைக் கோரிக்கைகளை எடுத்துரைக்கும்போதும், அவற்றைச் சில்லறையாக நினைக்காது, அவர்களது கோரிக்கைகளைச் செவிமடுத்து, ஆளும் தரப்பின் அடாவடித்தனத்தைக் கண்டி த்து, அவர்களுக்குரிய நியாயத்தை வழங்கும் தற்றுணிவும் திறமையும்கொண்டதுதான் சபாநாயகர் பதவி. இந்தப் பாராளுமன்றத்தினுள் ஆளும் கட்சி, எதிர்க்கட்சி வரிசையி லிருக்கும் புத்திஜீவிகளைக்கொண்ட, 'வெஸ்ட் மினிஸ்டர்' சம்பிரதாயங்களை அறிந்த உறுப்பினர்கள் உள்ளார்களெனில், அவர்கள் தமது இதயத்தில் கையை வைத்து, எமது சபாநாயகர் அவ்வாறு நடந்துள்ளாரா? என்ற கேள்விக்கு விடை காணட்டும்! எல்லாவற்றுக்கும் மேலாக எமது ஜனாதிபதி அவர்கள் 'வெஸ்ட் மினிஸ்டர்' சம்பிரதாயத்தை முழுதாக அறிந்தவர் என்பதை நான் அறிவேன். எமது சபாநாயகர் அவர்களது நடவடிக்கைகள் குறித்து மாண்புமிகு ஜனாதிபதி அவர்களது நிலைப்பாடு என்ன?

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இத னோடு தொடர்புடையதாக ஓரிரு விடயங்களைக் கூறலாமென நினைக்கின்றேன். அண்மையில் எமது ஜனாதிபதி அவர்கள் பொலிஸ் அதிகாரமற்ற அரசியலமைப்புக்கான 13ஆவது திருத்தச் சட்ட அமுலாக்கம் பற்றி எடுத்துரைத்திருந்தார். காலத்துக்குக் காலம் எமது ஜனாதிபதி அவர்கள் அரசிய லமைப்புக்கான 13ஆவது திருத்தச் சட்டம் தொடர்பாகவும் இனப் பிரச்சினைக்கான தீர்வு தொடர்பாகவும் ஏதேதோ கூறுவதும், பின்னர் அவற்றை மறந்துவிடுவதையும் நாம் 2015ஆம் ஆண்டு 'நல்லாட்சி' அரசாங்க காலத்திலிருந்து அவதானித்து வருகின்றோம்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා**
(மாண்புமிகு கோவிந்தன் கருணாகரம்)
(The Hon. Govindan Karunakaram)
Sir, please give me one more minute.

இதனைவிட, முக்கியமான கருத்தொன்றை எமது வெளி நாட்டு அலுவல்கள் அமைச்சர் அவர்கள் அண்மையில் கூறியிருந்தார். அதாவது, தமிழர்கள் சமஷ்டி கோருவதற்கு உரித்துடையவர்கள் என்றும் சமஷ்டியானது பிரிவினைக்கு அத்திவாரமாக இருக்காது என்றும் அது ஒற்றுமைக்கான அத்திவாரமாகவே இருக்கும் என்றும் கூறி, இது தொடர்பாகப் பல நாடுகளிலுள்ள சமஷ்டி அரசியலமைப்பின் தன்மைகளை யும் அவர் எடுத்துக் காட்டியிருந்தார். இது கௌரவ அமைச்சரது தனிப்பட்ட கருத்தா? அல்லது அமைச்சரவையின் கருத்தா? என்பது ஒருபுறமிருக்க, அரசாங்கத்திலுள்ள சக்திவாய்ந்த அமைச்சர் ஒருவர் இத்தகைய கருத்தொன்றைக் கூறியிருப்பதை நான் வரவேற்கின்றேன்; பாராட்டுகின்றேன். அவ்வாறு கூறுவதுடன் மாத்திரம் அவர் நின்றுவிடாது, அதனைச் செயற்படுத்துவதற்கான நடவடிக்கையையும் மேற்கொள்ள வேண்டும். அவ்வாறு அவர் செயற்பட்டால், இந்த நாட்டை இன, மத பேதமற்ற ஒரு நாடாக முன்னோக்கிக் கொண்டுசெல்ல முடியுமெனக் கூறி, மீண்டும் அவரைப் பாராட்டி அமர்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. M.U.M. Ali Sabry. You have 13 minutes.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி - வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry, PC - Minister of Foreign Affairs)
Sir, I suggest that we continue the Debate without suspending the Sitting for lunch.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

[පූ.භා. 11.33]

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුලින්ම අපි බලන්නට ඕනෑ මේ විශ්වාස භංග යෝජනාව තුළ තිබෙන කරුණු පිළිබඳව. මෙහි කාරණා දෙකක් සඳහන් කරලා තිබෙනවා. ඊයේ සහ පෙරේදා කියන දවස් දෙකේම විපක්ෂයේ සමහර අය හරියට මැරිලා ඉපදිලා වාගේ නීතිය ක්‍රියාත්මක කිරීම සහ නීතිය හැදීම ගැන මේ සභාවේ කථා කරනවා අපි අහගෙන සිටියා. ඔබට මතක ඇති, 2017 වර්ෂයේ දී පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කළ අවස්ථාව. ඒකට විරුද්ධව මමත් Supreme Court එකට ගියා. එතකොට මම පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. ඒ කෙටුම්පතට වගන්ති තුනයි තිබුණේ. ඒකෙන් බලාපොරොත්තු වුණේ කාන්තා නියෝජනය වැඩි කර ගැනීම. ඒ පනත සම්මත කළ දවසේ සවස හයහමාරට නවත්වන්නට තිබුණු විවාදය රාත්‍රි නවයහමාර වෙනකම් අරගෙන ගිහිල්ලා, වගන්ති 3ක් තිබුණු කෙටුම්පතට කාරක සභා අවස්ථාවේදී වගන්ති 132ක් ඇතුළත් කරලා මේ රටේ පළාත් සභා ක්‍රමය සම්පූර්ණයෙන් නවත්වා දමන්නට අඩිතාලම දැම්මේ එතුමන්ලා. මෙතුමන්ලා පාර්ලිමේන්තු සම්ප්‍රදාය පිළිබඳව, නීතිය පිළිබඳව දැන් අපට කියනවා. එක එක්කෙනා ඇවිල්ලා අපට යෝජනා ඉදිරිපත් කරනවා, lecturers දෙනවා. එහෙම කළ අයට තිබෙන සදාචාරාත්මක අයිතිය මොකක්ද අපට lecturers දෙන්න? ඒ අයට මේවා කියන්න කිසිම සදාචාරාත්මක අයිතියක් නැහැ.

මම අධිකරණ ඇමතිවරයා හැටියට සිටියදී, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී අපි ව්‍යවස්ථාවක් ගෙනාවා මුල් - principal - එකට විරුද්ධව මිසක Committee Stage එකේදී සංශෝධන ගෙනෙන්න බැහැ කියලා. ඉස්සර ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමා කියපු කථාවක් දැන් මට මතක් වෙනවා. ඒ, "මොළය තිබෙනකොට බලය නැහැ, බලය තිබෙනකොට මොළය නැහැ" කියන එක. දැන් විපක්ෂය කථා කරන්නේ හරියට මැරිලා ඉපදිලා වාගෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂය මුලින්ම රුපියල කඩා වැටිලා ඩොලර් එක රුපියල් 700ට, 1,000ට යනකම් බලාගෙන හිටියා. ඒක සාර්ථක වුණේ නැහැ. පස්සේ බැංකු කඩා වැටෙනකම් බලාගෙන හිටියා. ඒක සාර්ථක වුණෙත් නැහැ. ඊට පස්සේ උද්ධමනය වැඩියි කිව්වා. උද්ධමනය වැඩියි කියලා, අපි ඒක පාලනය කරනකොට interest rate එක සියයට 30යි කිව්වා. දැන් ඒක සියයට 10ට පහත වැටිලා තිබෙනවා. ඔක්කෝම බලාපොරොත්තු වෙලා තිබෙන්නේ රට හදන්න නොවෙයි රට විනාශ කරන්න, රට වට්ටන්න, රට නැති කරලා දාන්න. අපි දැන් ඒ එක එක ප්‍රශ්නයට විසඳුම් සොයනකොට අහිංසක කථානායකවරයෙකුව අල්ලාගෙන එතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා.

මොකක්ද මේ විශ්වාස භංග යෝජනාවේ තිබෙන කාරණා දෙක? පළමුවෙනි එක තමයි ඉතාම වැදගත්. ඒ තමයි Online Safety Bill එක සම්මත කර ගැනීමේ දී එතුමා දුන් endorsement එක වැරදියි කියන එක. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නීති හදන සම්ප්‍රදායට අනුව ඒ බලය සම්පූර්ණයෙන් තිබෙන්නේ පාර්ලිමේන්තුවට. පාර්ලිමේන්තුව ඇතුළේදි එහි ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් සම්පූර්ණ බලය තිබෙන්නේ කථානායකතුමාට. කථානායකවරයාට පාලනය කළ හැක්කේ ඒ ක්‍රියා පටිපාටිය තමයි. මේ නීතිය හදනකොට එම කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියෝගයට ලක් වුණා. එසේ අභියෝගයට ලක් වුණාට පස්සේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ සඳහා යෝජනා රාශියක් ඉදිරිපත් කළා; සමහර වගන්ති සංශෝධනය නොකර තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යන්න බැහැ කියලා කිව්වා. ඔවුන් කිව්වා සමහර වගන්ති සම්බන්ධයෙන්, "We recommend" කියලා. ඊට පස්සේ ඒ සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කරලා, කමිටු අවස්ථාවේදී ඒ සියලු සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා. කමිටු අවස්ථාවේදී සංශෝධන ඉදිරිපත් කළාට පසුව කථානායකවරයා ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා ගන්නවා. කාගෙන්ද උපදෙස් ලබා ගන්නේ? නීතිය අනුවම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවම ඒ උපදෙස් ලැබිය යුත්තේ නීතිපතිතුමාගෙන්. මෙම කරුණේදී නීතිපතිතුමා විසින් කථානායකතුමාට එවා ඇති 2024.01.24 දිනැති ලිපිය මම **සභාගත*** කරනවා.

එම ලිපිය මඟින් නීතිපතිතුමා කියලා තිබෙනවා, නීතියට අනුව ඒ සංශෝධන සිද්ධ වෙලා තිබෙනවා කියලා. නීතිපතිතුමා වෙනුවෙන් අත්සන් කරලා එම ලිපිය ඉදිරිපත් කර තිබෙනවා. It states, I quote:

> "I have to advise that the provisions of the Bill including the amendments proposed at the committee stage are not inconsistent with the Constitution and are not subject to any prohibition or restriction imposed by the 13th Amendment to the Constitution."

ඒ වාගේ දෙයක් ලැබුණාට පස්සේ කථානායකතුමාට හැකියාවක් නැහැ, නීතියට අනුව සම්මත වුණේ නැහැයි කියන්න. මොකද, පනතට අනුවම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාවේ පැහැදිලිවම මෙසේ සඳහන් කර තිබෙනවා:

> "The Speaker shall endorse on every Bill passed by Parliament a certificate in the following form:-"

එතුමාට අභිමතයක් නැහැ. එතුමා අනිවාර්යයෙන්ම - it states "shall" - ප්‍රකාශයට පත් කරන්න ඕනෑ, නීතියට අනුව මේක ක්‍රියාත්මක වුණා කියලා. ඒකෙදි එතුමා රැඳිලා තිබෙන්නේ නීතිපතිතුමාගේ උපදෙස් මත. නීතිපතිතුමාගේ උපදෙස් වැරදියි

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

කියනවා නම් එතුමාට පුළුවන්ද, නීතිපතිතුමාට වැඩිය ඉහළ කෙනෙක් විධියට වාඩි වෙලා නීතිපතිතුමා කියන එක වැරදියි, එම නිසා මම නීතිපතිට එහා ගිහිල්ලා මගේ opinion එක දානවා කියලා මේ කටයුත්ත කරන්න. සමහර අය එහෙම කියනවා මම බලාගෙන හිටියා. නමුත්, එහෙම කරන්න පුළුවන්ද? නීතිපතිතුමාගේ උපදෙස්වලට වඩා එහාට යන්න නම් Chief Justice ඇවිල්ලා වාඩි වෙන්න ඕනෑ, කථානායක පුටුවේ. ප්‍රායෝගිකව ඒක කරන්න බැහැ නේ. එම නිසා නීතිපතිතුමාගේ උපදෙස් අනුව කථානායකතුමා කටයුතු කර තිබෙනවා. නීතිපතිතුමා කියලා තිබෙනවා, ඒකට අනුගතව මේ සියලු සංශෝධන සිද්ධ වෙලා තිබෙනවා කියලා.

ශ්‍රේෂ්ඨාධිකරණයෙනුත්, අනෙක් අයගෙනුත් මේ සම්බන්ධව සමහර යෝජනා ඉදිරිපත් වෙලා තිබුණා. අපි කල්පනා කර බලා තිබෙනවා, ඒවා කාරක සභා අවස්ථාවේ සංශෝධනවලින් කරන්න බැරි හින්දා අලුත් පනත් කෙටුම්පතක් ගෙනැල්ලා එම සංශෝධන සම්මත කර ගන්නවා කියලා. දැනටමත් එය කෙටුම්පත් කිරීම සඳහා කැබිනට් මණ්ඩලය අවස්ථාව ලබා දීලා තිබෙනවා. එහෙමනම් කථානායකවරයා ඒ කරලා තිබෙන්නේ තමන්ගේ කාර්යය ඉෂ්ට කිරීම. එම නිසා තමයි සුමන්තිරන් මැතිතුමා මීට විරුද්ධව Supreme Court එකට ගිහිල්ලා නඩුවක් දැම්මේ. ඒ නඩුව අහලා ඉතා වැදගත් නඩු තීන්දුවක් ලබා දී තිබෙනවා, ප්‍රියන්ත ජයවර්ධන, ශිරාන් ගුණරත්න, අචල වෙංගප්පුලි කියන විනිශ්චයකාරවරු තුන්දෙනෙකුගෙන් යුතු විනිසුරු මඬුල්ලක් විසින්. ඔවුන් මෙහෙම කියලා තිබෙනවා. Sir, they are quoting Erskine May.

> "… A law might be unjust or contrary to sound principles of government; but Parliament was not controlled in its discretion, and when it erred, its errors could be corrected only by itself …"

වරදක් වෙලා තිබෙනවා වුණත්, කථානායකතුමාට විරුද්ධව විශ්වාස භංගයක් ගෙනාවා කියලා ඒකට පිළිතුරක් ලැබෙන්නේ නැහැ. එහෙනම් මේ වරද තිබෙන්නේ කොහේද කියලා සොයා බලා අලුත් පනත් කෙටුම්පතක් ගේන්න ඕනෑ. විපක්ෂය ඒ වගකීම පැහැර හැරපු හින්දා ආණ්ඩුවෙන්ම ඒ පනත් කෙටුම්පත ගේන්න අපි කටයුතු කර තිබෙනවා. මෙතැනදී කිසි වරදක් වෙලා නැහැ. නමුත්, වඩා හොඳ සුරක්ෂිත මාර්ගගත නීතියක් ස්ථාපිත කිරීම සඳහා ඒ stakeholdersලා එක්ක කථා කිරීමෙන් පස්සේ ඔවුන්ගෙන් ලැබුණු යෝජනා අනුව ටිරාන් අලස් මැතිතුමා අලුත් පනතක් කෙටුම්පත් කිරීම සඳහා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙනවා. මම හිතනවා, එය සම්මත වුණාට පස්සේ මේ සියලු දේවල් ආවරණය වෙලා මේ ප්‍රශ්නයට දීර්ඝ කාලීන විසඳුමක් හම්බ වෙයි කියලා. ඒ හැරුණාම කථානායකතුමා පිටුපස ගියා කියලා ඒකෙන් කිසිම දෙයක් සිද්ධ වෙන්නේ නැහැ.

ඊට වඩා වැදගත් කරුණක් වන දෙවැනි කරුණ ගැන මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ කරුණ තමයි, පොලිස්පති පත් කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කටයුතු කළ ආකාරය පිළිබඳ කාරණය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සඳහා සාමාජිකයන් දහදෙනෙකු පත් කරගන්න ඕනෑ. දැන් නවදෙනෙකු පත් කරගෙන තිබෙනවා. තවත් එක්කෙනෙකු පත් කරගන්න තවමත් බැරි වෙලා තිබෙනවා.

පොලිස්පතිවරයා පත් කර ගැනීම පිළිබඳ කාරණය ගත්තාම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින්ම 2023 දෙසැම්බර් මාසයේ 31වැනි දා සම්මත කර ගන්නා ලද ඔවුන්ගේ රීතිවල - අදාළ ගැසට් පත්‍රය කෙරෙහි මම අවධානය යොමු කරවනවා - කොතැනකවත් තිබෙනවාද, යම්කිසි යෝජනාවකට ඡන්දය නොදී වැළකී සිටීම සුදුසුයි කියලා? එහෙම කරන්නට ඔවුන්ට කිසිදු හැකියාවක් නැහැ. ඔවුන්ට කළ හැක්කේ එකම දෙයයි. එක්කෝ පක්ෂව ඡන්දය දෙන්න ඕනෑ, එහෙම නැත්නම් විරුද්ධව ඡන්දය දෙන්න ඕනෑ. Sir, may I invite your attention to Section 4(b) under "Functions of the Council" in the Rules they themselves have made, which states, I quote:

> "(b) consider the recommendations made by the president in respect of persons to be appointed to any office specified in the Schedule to Article 41C of the Constitution, and approve or disapprove such recommendation;…"

එතකොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඉන්න අයට කළ හැක්කේ, යම්කිසි යෝජනාවකට පක්ෂව ඡන්දය දීම හෝ විපක්ෂව ඡන්දය දීම පමණයි. ඡන්දය නොදී වැළකී සිටීමේ හැකියාවක් නැහැ. එහෙම කරලා තිබෙනවා නම්, ඒකට හේතුව මොකක්ද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ක්‍රියාපටිපාටිය එහෙම පිටින්ම අඩාළ කිරීම. ඔවුන්ට ඕනෑ මේක අරාජිකත්වයට පත් කරන්න; වැඩ කරන්න බැරි සංස්කෘතියකට මේක අරගෙන යන්න; රජයයි, ව්‍යවස්ථාදායකයයි අතර ගැටුමක් ඇති කරන්න; විධායකයයි, අධිකරණයයි අතර ගැටුමක් ඇති කරන්න. එම නිසා මෙහිදී කථානායකවරයා ඉතාම නිවැරැදියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උසාවියේ නඩුවකට ඉදිරිපත් කර තිබෙනවා, 2024 ජනවාරි මාසයේ 19වැනි දා පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ Minutes. ඒ Minutes අනුව ඔය ඡන්දය දීමෙන් වැළකී සිටිය යුතුයි කියන අයම කියා තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඡන්දය දීමේදී කළ හැක්කේ එක්කෝ පක්ෂව ඡන්දය දීම, එහෙම නැත්නම් විපක්ෂව ඡන්දය දීම බව. ඡන්දය දීමෙන් වැළකී සිටීමෙන් අදහස් කරන්නේ මොකක්ද? ඔවුන්ගේ ස්වාධීන බුද්ධිය පාවිච්චි කරලා නොවෙයි, කවුරු හරි නීතිඥ මහත්තයෙක් ඔවුන්ට උපදෙස් දෙන්න ඇති, මේ වෙලාවේ හොඳම දේ තමයි මේක අර්බුදයකට යැවීම, අපි හතරදෙනාම විරුද්ධව ඡන්දය දුන්නොත්, හතර-හතර සම වෙනවා, කථානායකවරයාට තීරක ඡන්දයක් තිබෙන නිසා හොඳම දේ තමයි අපේම රෙගුලාසිත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් උල්ලංඝනය කරන එක, අපි මීට පෙර ඉදිරිපත් කළ කරුණුත් උල්ලංඝනය කරලා ඡන්දය දීමෙන් වැළකී සිටින්න කියලා. ඒ විධියට මේ අය අමුතුම ක්‍රමයක් හොයාගෙන තිබෙනවා. ඒකෙන් බලාපොරොත්තු වුණේ මොකක්ද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ක්‍රියාපටිපාටිය සම්පූර්ණයෙන්ම අවුල් ජාලාවකට පත් කිරීම. ඒකයි මම කිව්වේ, මේ ගොල්ලන්ට ඕනෑ ප්‍රශ්න මතු කරන්න කියලා. ඩොලරයේ වටිනාකම අඩු වෙන එකට කැමැතිත් නැහැ. උද්ධමනය පහළට එනවාට කැමැතිත් නැහැ. Interest එක යට වෙනවාට කැමැතිත් නැහැ. Queues නැතිවෙනවාට කැමැතිත් නැහැ. සංචාරකයෝ එනවාට කැමැතිත් නැහැ. හැම එකකම අඩුපාඩු හොයනවා. ඕනෑම පුද්ගලයෙකුට පුළුවන්, විවේචනය කරන්න. ඕනෑම පුද්ගලයෙකුට පුළුවන්, කටින් බතල හිටවන්න. නමුත් වැදගත් වෙන්නේ මෙයයි. පසුගිය අවුරුදු දෙකේ තිබුණු අරාජිකත්වයෙන් මේ රට බේරා ගැනීම සඳහා අපි කර තිබෙන ක්‍රියාපටිපාටිවල ප්‍රතිඵලය අද පොදු ජනතාවට අත්විඳින්න තිබෙනවා. ඒකට මුහුණ දෙන්න බැරි වුණාම මෙතැනට හැමදාම ඇවිල්ලා විපක්ෂයෙන් මොනවා හෝ ප්‍රශ්නයක් මතු කරනවා.

විපක්ෂ නායකතුමා කිව්වා, ආණ්ඩු පක්ෂය තුළ කථානායකතුමා පිළිබඳව යම් අප්‍රසාදයක් තිබෙන බව, අපට කථා කරන්න දෙන කාල වේලාව අඩුයි, විපක්ෂයට වැඩියෙන් දෙනවා කියලා. අනෙක් මන්ත්‍රීවරු කියපු ආකාරයට මම හිතුවා, මේ විශ්වාස භංගය ආණ්ඩුවෙන් එයිද කියලා. විපක්ෂ නායකතුමා කිව්වා, එතුමා කථා කරන්නේ මිනිස්සුන්ගේ ප්‍රශ්න ලු. එතකොට

අපි ඇවිල්ලා කථා කරන්නේ අපේ ප්‍රශ්නද? මේ පාර්ලිමේන්තුවේ හැමදෙනාම කථා කරන්නේ මිනිස්සුන්ගේ ප්‍රශ්න තමයි. යම් විධියකට විපක්ෂ නායකතුමාට වැඩි කාල වේලාවක් ලබා දෙන්න ඕනෑ. පසුගිය අවුරුදු තුන තුළ එතුමා විපක්ෂ නායකවරයා හැටියට කටයුතු කරද්දී එතුමා විතරයි කථා කරලා තිබෙන්නේ. අනෙක් අයට කථා කරන්න අවස්ථාව දුන්නේ නැහැ. ඉතිහාසයේවත් නැහැ. ඒත් මදියි කියලා කියනවා. ඒත් විරෝධතා ගේනවා.

විපක්ෂයේ වෙන අයට කථා කරන්නත් නැහැ; ආණ්ඩු පක්ෂයේ අයට කථා කරන්නත් නැහැ. ඊයේ විවාදය උදේ 9.30ට පටන් ගන්න තිබුණත්, පටන් ගත්තේ 11.30ට. අද විවාදය උදේ 9.30ට පටන් ගන්න තිබුණත්, පටන් ගත්තේ 10.45ට. Minutes අරගෙන බැලුවොත් පෙනෙනවා, එම කාලයෙන් සියයට 60ක් විතර අරගෙන තිබෙන්නේ විපක්ෂ නායකතුමා බව. එතුමා කථා කළ යුතුයි. නමුත්, මේක සාධාරණ වෙන්න එපා යැ. 225දෙනෙකු වෙනුවෙන් තිබෙන කාලයෙන් disproportionately සියයට 30ක විතර කාලයක් එතුමා කථා කළාම, අනික් 224දෙනාට මොකක්ද කරන්න තිබෙන්නේ? එම නිසා ගරු කථානායකතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. විශේෂයෙන් මම ගරු කථානායකතුමාට ස්තුති කරන්නට ඕනෑ. මම දන්නවා, එතුමා මගේ කාලයත් සීමා කරනවා කියලා. නමුත්, මේ පාර්ලිමේන්තුව මෙහෙයවන අයගෙන් මගේ පාර්ලිමේන්තු කාලය තුළ ඉතාම නිවැරදිව සහ කාලය කළමනාකරණය කරගෙන දක්ෂ ලෙස මේ සභාව මෙහෙයවූයේ කවුද කියලා කිව්වොත්, ඒ සඳහා ගරු කථානායකතුමා හොඳ උදාහරණයක්. මොකද, හැමදෙනාටම ඒ අවස්ථාව තිබෙන්නට ඕනෑ. අපි හැමෝම මේ ගරු සභාවට ඇවිල්ලා අපේ පෞද්ගලික දේවල් කථා කරන්නේ නැහැ. පොදුවේ මන්ත්‍රීවරු 225දෙනාම කථා කරන්නේ රටේ තිබෙන ප්‍රශ්න පිළිබඳවයි. ඒ ප්‍රශ්න ඉදිරිපත් කරන්න හැමදෙනාටම එක හා සමානව අවස්ථාව දෙන්න ඕනෑ. ඒක, එතුමා විතරක් ඒ විධියට කථා කරනවා, අනික් අය කථා කරන්නේ නැහැ වාගේ එකක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම විශේෂයෙන් කිව යුතු කාරණයක් තිබෙනවා. මෙතැනදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා තිබෙන්නේ කවුද කියන එක ඉතාම වැදගත්. ඇත්ත වශයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේදී ඡන්දය දීමෙන් වැළකී සිටි නිර්පාක්ෂිකයි කියන, ස්වාධීනයි කියන සාමාජිකයෝ දෙදෙනා. ඔවුන් ඕනෑකමින්ම, දැන දැනම, ඔවුන්ගේ ස්ථාවරයට විරුද්ධව, ඔවුන් විසින් හදපු රෙගුලාසිවලට විරුද්ධව ගිහිල්ලා මෙතැන Constitutional crisis එකක් ඇති කිරීම සඳහා ඡන්දය දීමෙන් වැළකී සිටියා. ඔවුන්ගේ වගකීම විය යුත්තේ ඒක නොවෙයි. ඔවුන් ආණ්ඩුවේ ඉත්තන් වෙන්නත් ඕනෑ නැහැ; විපක්ෂයේ ඉත්තන් වෙන්නත් ඕනෑ නැහැ. අවසානයේ අදාළ පුද්ගලයා අදාළ තනතුරට පත් කරයිද, නැද්ද කියන එක ගැන කථා කරන්න ඔවුන්ට අයිතියක් නැහැ. කාගේ හෝ උපදෙස් මත තමයි, ඔවුන් මේ සම්පූර්ණ ක්‍රියාවලියම කළේ. එම යෝජනාවට හතරදෙනෙක් පක්ෂයි, දෙදෙනෙක් විරුද්ධයි, දෙදෙනෙක් ඡන්දය දීමෙන් වැළකී සිටියා. මේගොල්ලන්ගේ තර්කය තමයි, හතරදෙනාම විපක්ෂ වුණාට ප්‍රශ්නයක් නැහැ කියන එක. ඒ කියන්නේ, හතරදෙනෙක් පක්ෂයි, හතරදෙනෙක් විපක්ෂයි, එතකොට කථානායකතුමාට තීරක ඡන්දය දීලා අදාළ පුද්ගලයා පත් කරන්න පුළුවන්. හැබැයි, හතරදෙනෙක් පක්ෂයි, දෙදෙනෙක් විපක්ෂයි, දෙදෙනෙක් ඡන්දය දීමෙන් වැළකී සිටි නම් පත් කරන්න බැහැ කියන එක මොන තර්කයක්ද? අංක ගණිතයට අනුව බැලුවත් ඒක වැරැදියි. හතරදෙනෙක් කැමති නම්, දෙදෙනෙක් අකැමති නම්, තවත් දෙදෙනෙක් ඡන්දය නොදී වැළකී ඉන්නවා නම්, ඒකද වඩා හොඳ? එහෙම නැත්නම් හතරදෙනෙක් විරුද්ධ නම්, ඒකද වඩා හොඳ? එම නිසා ගරු කථානායකතුමා ඒ සම්බන්ධයෙන් ඉතාම නිවැරදිව කටයුතු කරලා තිබෙනවා. හතරදෙනෙක් පක්ෂවත්, දෙදෙනෙක් විපක්ෂවත්, තවත් දෙදෙනෙක් ඡන්දය දීමෙන් වැළකී සිටිනවා නම් ගන්න පුළුවන් එකම ආරෝපණය තමයි, ඒ දෙදෙනාත් එම පත්වීමට විරුද්ධයි කියන එක. එහෙම නැත්නම් පත් කිරීමක් නොකර නිකම් ඉන්න ඕනෑ. හතරදෙනෙක් පක්ෂයි, අනෙක් හතරදෙනාත් විරුද්ධයි, එම නිසා තමන්ට තීරක ඡන්දය පාවිච්චි කරන්න පුළුවන් කියලා තීරණය කරලා එතුමා නිවැරදි ආකාරයට එම පත් කිරීම කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම නිසා මම ඔබතුමාට ගෞරවයෙන් ප්‍රකාශ කර සිටින්නේ, this whole exercise of bringing in a No-Confidence Motion against the Speaker is politically motivated. The Speaker had nothing to do with it; he had acted within the law. You cannot expect the Speaker to overrule the opinion of the Attorney-General without reasonable cause. When the Attorney-General says that the Committee Stage Amendments to that Bill had been brought in terms of the law, how do you expect the Speaker, a layman, to override him? Then, the Chief Justice must sit in the Chair of the Speaker to overrule him. Therefore, this entire exercise is without any merit whatsoever.

Secondly, as far as the Constitutional Council is concerned, there is no provision in terms of the Constitution, their own Rules nor in terms of the previous practices of the Council to abstain from voting; they must vote either for or against something. So, the manner in which those two Members had acted has brought the Constitutional Council into disrepute, which warrants a No-Confidence Motion against them for acting against their own Rules, not against the Speaker. Therefore, Sir, with great respect, I would say that this No-Confidence Motion is not worth the paper it is printed on. It is politically motivated; it does not have any merit. Actually, if you want to bring in a No-Confidence Motion on the appointment of the IGP or on the passing of the Online Safety Bill, you must bring it against the Minister concerned and who brought in the Bill. But, the Minister has been spared. Why? You are scared of him. That is the truth.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
I will wind up, Sir.

With respect, finally I would say that we all will vote to defeat this No-Confidence Motion and that we have full confidence in the Hon. Speaker. Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Hon. (Dr.) Nalaka Godahewa. You have seven minutes.

[පූ.භා. 11.53]

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා**
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කථානායකවරයෙකුට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒම මම හිතන විධියට අපිට ආඩම්බර වෙන්න පුළුවන් තත්ත්වයක් නොවෙයි. ඒක කනගාටුදායක තත්ත්වයක්. මොකද, මේ රටේ තිබෙන උත්තරීතර ආයතනය වන පාර්ලිමේන්තුවේ ප්‍රධානියා තමයි කථානායකවරයා කියන්නේ. එතකොට ඒ කථානායකවරයා කෙරෙහි තිබෙන විශ්වසනීයත්වය පලුදු වෙලා කියලා පාර්ලිමේන්තුවේ අද වෙනකොට ඉන්න මේ සමස්ත විපක්ෂයම එකතු වෙලා තමයි මේ විශ්වාස භංග යෝජනාවට අත්සන් කරලා තිබෙන්නේ. මේ සියලුදෙනාම එහෙම කියනවා නම් ඒක කනගාටුවට කාරණයක්. මේ විශ්වාස භංග යෝජනාව ගෙන ඒම විශේෂයෙන්ම වැදගත් වෙන්නේ අපි මේ වෙලාවේ ඉන්න තත්ත්වය දිහා බැලුවාමයි. අපි දන්නවා, අපේ රට විශාල ආර්ථික අර්බුදයකට වැටිලා ඉන්නවා කියන එක. ඒ ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්න උත්සාහ කරමින් ඉන්න වෙලාවක රජයටත් ඉතාම වැදගත් කාරණාවක් තමයි රජය කරන වැඩවලට, රජයේ ප්‍රතිපත්තිවලට, රජයේ ක්‍රියාදාමයන්ට ජනතාවගේ විශ්වාසය දිනා ගන්න එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දන්නවා, මේ වෙලාවේ සමස්ත පාර්ලිමේන්තුව ගැන පමණක් නොවෙයි, සමස්ත රාජ්‍ය යන්ත්‍රණය ගැනම ජනතාවගේ විශ්වාසය බරපතළ ලෙස පිරිහිලා තිබෙන බව. එහෙම වෙන්න කරුණු-කාරණා රාශියක් පසුගිය කාලයේ බලපෑවා. අපි එවැනි කරුණු-කාරණා කිහිපයක් මතක් කර බලමු. හැටනවලක්ෂයක් ජනතාවගේ ජන වරමින්, ජනතාවගේ විශ්වාසය දිනාගෙන පත් වෙච්ච ජනාධිපතිවරයෙක් සම්බන්ධයෙන් වූ විශ්වාසය බිඳ වැටිලා, මේ රටේ අරගළයක් ඇති වෙලා, ඒ ජනාධිපතිවරයාට ජනාධිපතිකම පවා අත්හැරලා යන්නට සිදු වුණු තත්ත්වයක් ඇති වුණු බව අපි දුටුවා. ඒක විශ්වසනීයත්වය පිළිබඳ ප්‍රශ්නයක්. ඊළඟට, මොකද වුණේ? එතැනින් පස්සේ මහා විශාල කලබලයක් ඇති වුණා. මේ රටේ ගෙවල් ගිනි තියලා මහා අර්බුදයක් ඇති වුණා. ඊට පස්සේ අලුත් ජනාධිපතිවරයෙක් පත් කරන්න සිදු වුණා. ඒ අලුත් ජනාධිපතිවරයා පත් කරන වෙලාවේ හැටනවලක්ෂයක් ජනතාවගේ ඡන්දය අරගෙන පත් වෙච්ච ආණ්ඩුව ඔවුන් වසර ගණනාවක් තිස්සේ ප්‍රතික්ෂේප කරමින් සිටි පුද්ගලයෙක්ව - විශේෂයෙන්ම අවසාන මැතිවරණයේදී ජනතාව විසින් ප්‍රතික්ෂේප කරලා ගෙදර යවා තිබුණු පුද්ගලයෙක්ව - මේ රටේ ජනාධිපතිවරයා වශයෙන් පත් කර ගත්තා, මේ පාර්ලිමේන්තුව තුළ ඡන්ද 114කින්. එතකොට එවැනි තත්ත්වයක් තුළ පාර්ලිමේන්තුව ගැන මේ රටේ ජනතාවට ඇති වෙන විශ්වාසය මොකක්ද? හැටනවලක්ෂයක් ජනතාව ප්‍රතික්ෂේප කරපු පුද්ගලයෙක්ව ඒ ජනතා වරමින් ආපු මන්ත්‍රීවරු පිරිසක් - 114දෙනෙක්- එකතු වෙලා මේ රටේ නායකයා වශයෙන් පත් කර ගත්තා. නැවතත් විශ්වාසය බිඳ වැටීමේ තත්ත්වයක් ඇති වුණා. ඒකත් කමක් නැහැ කියමු. මේගොල්ලන්ට තිබුණු ප්‍රශ්නය නිසා - බිය නිසා; පැවැති අර්බුදය නිසා- ඒ තීන්දුව ගත්තා කියලා අපි හිතමු. ඊට පස්සේ වුණේ මොකක්ද?

ඒ ජනාධිපතිවරයා යටතේ දිගින් දිගටම අපි පනත් ආදිය සම්බන්ධයෙන් ඡන්ද පවත්වනකොට, ඒ ප්‍රතිපත්තිවලට විරුද්ධව ජනාධිපතිවරයා ක්‍රියා කරනකොට, ආණ්ඩු පක්ෂය අත උස්සනවා. එතකොට මමත් ආණ්ඩුව පැත්තේ නේ හිටියේ. කිසිම ඇහිල්ලක් බැලිල්ලක් නැතිව, ගෙනෙන්නේ මොන සංශෝධනයන්ද කියලා බලන්නේ නැතිව හැම පනතකටම අත උස්සනවා. ඕනෑ ප්‍රතිපත්තියකට එකඟයි; ඕනෑ රාජාසන කථාවකට එකඟයි. හැම දාම සම්පත් විකිණීමකට එරෙහිව කථා කරපු අපි මෙතැනදී රාජ්‍ය සම්පත් විකිණීමට සහාය දෙනවා. එවැනි තත්ත්වයක් තුළ පාර්ලිමේන්තුව ගැන ජනතාවගේ විශ්වාසය ඉතිරි වෙන්නේ කොහොමද? පාර්ලිමේන්තුව පමණක් නොවෙයි, පසුගිය කාලයේ රාජ්‍ය නිලධාරින් ක්‍රියා කරපු ආකාරය බලන්න. සමස්ත රාජ්‍ය යන්ත්‍රණය ගැනම විශ්වාසය බිඳ වැටෙන විධියට ඔවුන් ක්‍රියා කළා.

පසුගිය කාලයේ මහ බැංකු නිලධාරින්ගේ ක්‍රියා කලාපය දෙස බලන්න. මේ රටේ හුඟක් මිනිස්සු මහ බැංකුව ගැන විශ්වාසයෙන් හිටියා. මේ රට ආර්ථික අර්බුදයෙන් ගොඩ ගන්න ලොකු වගකීමක් මහ බැංකුවට තිබෙනවා. ඒ සඳහා මහ බැංකුව ස්වාධීන කරනු ලැබුවා. එය ස්වාධීන කරන වෙලාවේ අපි ප්‍රශ්නය පෙන්වලා දුන්නා. නමුත්, ආණ්ඩුව ශ්‍රී ලංකා මහ බැංකු පනත් කෙටුම්පත සම්මත කරලා මහ බැංකුවට ස්වාධීනත්වය ලබා දුන්නා. ඒ පනත පාවිච්චි කරලා මහ බැංකුවේ නිලධාරින් හැසිරිච්ච විධිය බලන්න. ඔවුන් ඉස්සෙල්ලාම තමන්ට හැන්දෙන් බෙදා ගන්න පටන් ගත්තා. එතකොට වෙන්නේ මොකක්ද? ජනතාවගේ විශ්වාසය තවදුරටත් බිඳ වැටුණා.

කථානායකතුමා ගැනත් මම කථා කරන්න ඕනෑ. කථානායකතුමා පසුගිය කාලයේ ක්‍රියා කරපු ආකාරය පිළිබඳව දිගින් දිගටම මේ පාර්ලිමේන්තුව තුළ ප්‍රශ්නයක් ඇති වුණා. ආණ්ඩු පක්ෂයේ අයත් කියනවා නේ, ඒගොල්ලනුත් විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න හිටියා, ඒගොල්ලන් ගෙනෙන්න හිටපු විශ්වාස භංග යෝජනාව තමයි විපක්ෂයෙන් ඉදිරිපත් කළේ කියලා. එහෙනම් දෙපැත්තම පිළිගන්නවා, එතුමාට විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන තත්ත්වයක් තිබුණා කියලා. ඇත්තවශයෙන්ම කියනවා නම්, මේ විවාදයවත් පවත්වන්නේ නැතිව කථානායකතුමා ඉල්ලා අස් වෙන්න ඕනෑ. මොකද, දෙපැත්තෙන්ම කියනවා නේ එතුමාට විශ්වාස භංග යෝජනාවක් ගෙන ආ යුතුව තිබුණා කියලා. ආණ්ඩු පක්ෂයේ අය කියන්නේ ඒගොල්ලන් විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න කලින් අපි විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා කියායි. විශ්වාස භංගය ගෙනෙන්න හේතු කාරක වුණු කරුණු රාශියක් පසුගිය කාලයේදී සිදු වුණා. විශේෂයෙන්ම කථානායකතුමා කියන්නේ මේ පාර්ලිමේන්තුවේ ලොක්කා; පාර්ලිමේන්තුවේ ප්‍රධානියා. මේ රටේ තුන්වැනි පුරවැසියා වශයෙන් පාර්ලිමේන්තුවේ සියලු කටයුතුවලදී අවසාන තීන්දුව දෙන්නේ කථානායකතුමා.

නමුත් එතුමා මේ පාර්ලිමේන්තුව, පාර්ලිමේන්තුවේ කාරක සභා හරියාකාරව මෙහෙයවූවාද? අපි එක සරල උදාහරණයක් මතක් කරලා බලමු. මේ පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා පත් කිරීමේදී ඒ සඳහා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් පත් කරන්න ඕනෑ කියලා පැහැදිලි එකඟතාවක් තිබියදී, ඒක වළක්වා ගැනීම සඳහා වාර ගණනාවක්ම වැඩබලන සභාපතිවරයෙක් යටතේ එම කමිටුව පවත්වාගෙන ගියා. එය වැළැක්වීම සඳහා බලපෑම් කිරීමේ හැකියාව තිබෙන්නේ කථානායකවරයාට. අන්තිමට කවුද ඒ තීන්දුව ගන්නේ? ජනාධිපතිවරයා. ජනාධිපතිවරයා මේ සභාවේදී කියනවා, අපි එම කමිටුවේ සභාපතිකම අහවල් කෙනාට දෙමු කියලා. ජනාධිපතිවරයා කිව්වාට පස්සේ තමයි ඒ පත් කිරීම කළේ. ඒක පක්ෂග්‍රාහීකම නොවෙයිද? ඒ වාගේ පක්ෂග්‍රාහී වෙනවා නම්, කොහොමද අපි විපක්ෂයක් වශයෙන් ඒ කථානායකවරයා ගැන විශ්වාසය තබා ගන්නේ? ඊට පස්සේ වාර ගණනාවක එවැනි දේවල් වුණා.

එක් අවස්ථාවක -විපක්ෂ නායකතුමාත් ඒ ගැන පැහැදිලි කළා- මේ පාර්ලිමේන්තුවේ දෙපැත්තම එකතු වෙලා යෝජනාවක්

සම්මත කළා, Sri Lanka Cricket එකට විරුද්ධව. ඒ වෙලාවේ රටේ විශාල ජනමතයක් ඇති වෙලා තිබුණා Sri Lanka Cricket එකට විරුද්ධව. ඒකට විවාදයක් තිබුණා. ඒ විවාදය අවසානයේ බෙදීමක් -ඡන්දයක්- ඉල්ලුවාම, ඒක දෙන්න තිබුණා. ඒක දුන්නා නම් අපට බලාගන්න තිබුණා, මේ අය ඇත්තටම, හදවතින්ම මේකට එකඟද, විරුද්ධද කියලා. නමුත් ඒ බෙදීම ලැබුණේ නැහැ. ඇයි එහෙම කරන්නේ? ඒ තවත් හැසිරීමක්.

ඊළඟට, මෙතැන අපි දිගින් දිගටම කථා කරපු කරුණු දෙකක් තිබුණා. එනම්, Online Safety Bill එක ගැන හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පොලිස්පතිවරයා පත් කිරීම සම්බන්ධයෙන් ගත්ත තීන්දුව ගැන. ඒ පිළිබඳ නීති තර්ක ගණනාවක් තිබුණා. Online Safety Bill එක ගැන මම මොහොතකට කථා නොකර ඉන්නම්කෝ. නමුත් දෙවැනි කාරණය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තීන්දුව සම්බන්ධයෙන් කථානායකවරයා ජනාධිපතිවරයාට යැවූ ලිපිය පිළිගන්න පුළුවන්ද? කාටද ඒක පිළිගන්න පුළුවන්? මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන්නේ මොකක්ද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන්නේ මේ රටේ උත්තරීතර නීතිය. ව්‍යවස්ථාවේ පැහැදිලිව ලියලා තිබෙනවා, කියලා තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තීරක ඡන්දයක් දෙන්නේ කොහොමද කියලා. මට පුදුමයි, හිටපු අධිකරණ ඇමතිතුමා, වර්තමාන විදේශ කටයුතු ඇමතිතුමා අද ඇවිල්ලා මේක අර්ථකථනය කරන්න උත්සාහ කරනවා. මේවා අර්ථකථනය කරන්න බැහැ. ව්‍යවස්ථාවේ ලියලා තිබෙනවා. අර්ථකථනය කරනවා නම් අර්ථකථනය කරන්න පුළුවන් ශ්‍රේෂ්ඨාධිකරණයට විතරයි කියලා. පාර්ලිමේන්තුවට ඒක අර්ථකථනය කරන්න බැහැ. ව්‍යවස්ථාවේ ඉතාම පැහැදිලිව ලියලා තිබෙනවා තීරක ඡන්දය ගන්න පුළුවන් සම සම අවස්ථාවේ විතරයි කියලා. මේකේ හරි විධිය මොකක්ද කියලා අර්ථකථනය කරන්න මෙතැනදී බැහැ. ඒක එකක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට කියන්න තිබෙන අවසාන කාරණය මේකයි. කථානායකවරයා ගැන පමණක් නොවෙයි, අපේ රටේ පාර්ලිමේන්තුව ගැන විශ්වාසය බිඳ වැටිලා තිබෙන අවස්ථාවක මේ පාර්ලිමේන්තුවේ හැසිරීමත් ඒ විශ්වසනීයත්වය නැවත නැවත පලුදු කරන්න හේතු වෙනවා. බලන්න, මේ විවාදය තුළ සභානායකතුමාගෙන් පටන් අරගෙන අනෙක් අය කථා කරපු භාෂාව ගැන. සමහරු පෞද්ගලික වශයෙන් අපහාස කරමින් ඉතාම නරක විධියට අනෙක් අයට පෞද්ගලිකව චෝදනා ඉදිරිපත් කළා. මෙහෙම හැසිරෙනකොට, ඒවා TV එකේ යනකොට මේ රටේ මිනිසුන්ට පාර්ලිමේන්තුව ගැන විශ්වාසයක් ඉතිරි වෙනවාද? මේ රටේ පාර්ලිමේන්තුව ගැන විශ්වාසයක් නැත්නම් මේ රටේ සමස්ත රාජ්‍ය යන්ත්‍රණය ගැනම විශ්වාසයක් ඉතිරි වෙනවාද? කරුණාකරලා මේක වෙනස් කරන්න ඕනෑ. දැන්වත් මේ තත්ත්වය වෙනස් කරන්න බලමු. මම අවසාන වශයෙන් කියන්නේ මේකයි. කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයත් කියනවා ඔබතුමාට විරුද්ධව විශ්වාස භංගයක් ගෙනෙන්න තිබුණා කියලා. ඉතින් විපක්ෂය දැනටමත් විශ්වාස භංග යෝජනාවක් ගෙනැත් තිබෙනවා. ඉතින්, මෙතැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ඔබගේ තීන්දුව ඔබම ගන්න කියා මම ඉල්ලා සිටිනවා. අපි නම් මේ යෝජනාවට පක්ෂව ඡන්දය ලබා දෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Next, the Hon. Mahinda Amaraweera. You have 12 minutes.

[පූ.භා. 12.01]

**ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் மற்றும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera- Minister of Agriculture and Plantation Industries)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ පාර්ලිමේන්තුවේ කථානායකතුමාට විරුද්ධව විපක්ෂ නායකතුමා ඇතුළු කණ්ඩායම ඉදිරිපත් කළ විශ්වාස භංග යෝජනාව පිළිබඳව තමයි අදත් සාකච්ඡා වෙන්නේ. නාලක ගොඩහේවා මැතිතුමා කියූ එක් කාරණයකට යම් එකතු කිරීමක් කළ යුතුව තිබෙනවා. මේ පාර්ලිමේන්තුව පිළිබඳ අද රටේ ජනතාවගේ විශ්වාසය කඩ වෙලා තිබෙන්නේ. මමත් ඒ කාරණයට එකඟයි. ඒකට ප්‍රධාන හේතුවක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ ගොඩක් දෙනෙක් කථා කරන්නේ පාර්ලිමේන්තුවට අවශ්‍ය දේවත්, රටේ ජනතාවගේ ප්‍රශ්න පිළිබඳවවත් නොවෙයි. ඒ අය වැඩිපුරම කථා කරන්නේ රූපවාහිනී නාළිකාවල රාත්‍රි ප්‍රවෘත්තිවලට තමන් කියන දේවල්වල කෑල්ලක් දමාගන්නේ කොහොමද කියලා හිතලායි. ඒක තමයි ප්‍රධානම ඉලක්කය වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි අද පාර්ලිමේන්තුව මේ තරම් හැල්ලු වෙලා තිබෙන්නේ.

මම 1994 ඉඳලා පාර්ලිමේන්තුවේ ඉන්නවා. මම හිතන විධියට පාර්ලිමේන්තු රැස්වීම් සජීවීව දෙන්න පටන් ගත්ත දවසේ ඉඳලා තමයි මේ හැල්ලුවීම, මේ තත්ත්වය වර්ධනය වුණේ. මම ඒකෙන් කියන්නේ නැහැ, නතාවට මේවා දැන ගැනීමේ අයිතිය කප්පාදු වෙන්න ඕනෑ කියලා. ඒ පිළිබඳ තීන්දු ගන්න අවස්ථාවේ මමත් හිටියා. මගෙත් මතය වුණේ "පාර්ලිමේන්තුවේ කරන කථා ජනතාව දැන ගත්තාම හොඳයි. ඒකේ ප්‍රශ්නයක් නැහැ. එයින් ජනතාවටත් අවබෝධයක් ලබා ගන්න පුළුවන්" කියන එකයි. ඒ වාගේම ඒ වෙනකොට යම් අසුබවාදී දේවල් සිද්ධ වුණා නම් ඒවා නතර වෙයි, මේ ජනතා නියෝජිතයන්ගේ කථා ඡන්ද දායකයෝ අහන නිසා පාර්ලිමේන්තුව එදාට වැඩිය විනීත වෙයි, සංවර වෙයි, පාර්ලිමේන්තුව හොඳින් තියෙයි කියලා බලාපොරොත්තුවක් අපේ තිබුණා. නමුත් ඒක නොවෙයි, අවසානයට සිද්ධ වුණේ. මේක සම්පූර්ණයෙන් අනෙක් පැත්තටයි ගියේ. මේක ඉතාම අසංවර පාර්ලිමේන්තුවක් බවට ක්‍රමානුකූලව පත් වෙන්න පටන් ගත්තා. දැන් පාර්ලිමේන්තු කථාවලදී වැඩි වශයෙන් පාසල් දරුවෝ ඉවත් කරන්න වෙනවා. හැම දාම පාසල් දරුවෝ එනවා, පාර්ලිමේන්තුව නරඹන්න. ඒ අය ගැලරියේ ඉන්නවා. මේ පාර්ලිමේන්තුවේ හැසිරීම අනුව ඒ ළමයින්ව ඉවත් කරන්න කථානායකතුමාට සිද්ධ වෙනවා. මොකද, ඒ තරම් අසංවර විධියට මේ පාර්ලිමේන්තුවේ කථා ඇති වෙන්න පටන් ගත්තා. කවදාවත් මෙවැනි තත්ත්වයක් තිබුණේ නැහැ. මේ තත්ත්වය එන්න එන්න වර්ධනය වීමක් තමයි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ වැය වන කාලය දිහා බැලුවාම, කථානායකතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ආණ්ඩුව පැත්තෙන් ඉදිරිපත් වෙයිද කියන සැකය මටත් තිබුණා.

මොකද, එවැනි සැකයක් ඇති වන තරමටම මේ පාර්ලිමේන්තුවේ හැම වෙලාවේම වාගේ වැඩි ප්‍රමාණයක් කථා දුන්නේ සහ points of Orderවලට ඉඩ දුන්නේ විපක්ෂයටයි. විපක්ෂ නායකතුමා හැමදාම උදේට මේ පාර්ලිමේන්තුවේ කාලයෙන් පැයක්, දෙකක් ගන්නවා. අත්‍යවශ්‍ය දේවලට කාලය ගැනීමේ යුතුකමකුත් තිබෙනවා; අයිතියකුත් තිබෙනවා. විපක්ෂ නායකතුමාට, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට ඒ අයිතිය තිබෙනවා. යම් වෙලාවක රටේ තිබෙන දැවැන්ත අර්බුදයක් පිළිබඳව ප්‍රශ්න කිරීමේ අයිතිය එතුමන්ලාට තිබෙනවා. නමුත්,

[ගරු මහින්ද අමරවීර මහතා]

විපක්ෂ නායකතුමා මේ සභාවේදී හැමදාම කථාවක් කරනවා. මේ පාර්ලිමේන්තුවේ හැමදාම කථා කරපු කෙනෙක් ඉන්නවා නම්, ඒ විපක්ෂ නායකතුමා. මගේ දේශපාලන ඉතිහාසය තුළ -මා දේශපාලනයේ ඉඳපු කාලය තුළ- විපක්ෂ නායකවරයෙකු මේ වාගේ හැමදාම කථා කරනවා මට නම් අහන්න ලැබුණේ නැහැ. එක පැත්තකින් බැලුවාම ඒකෙන් අනෙක් මන්ත්‍රීවරුන්ගේ, විශේෂයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වෙනවා. මොකද, ඒ අයට මේ ගරු සභාවේ කථා කරන්න වෙලාවක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා තමයි ඒ අයත් පැන පැන points of Order ඉල්ලන්නේ. මොකද, ඒ අය දන්නවා ඒ අයට කථා කරන්න වෙන්නේ නැහැ කියලා. ඒ මන්ත්‍රීවරුන්ට කථාවකට වෙලාව වෙන් කර ගන්න බැරි වෙනවා. ඒ මන්ත්‍රීවරුත් ගමේ ඉඳලා කොළඹට ඇවිල්ලා පාර්ලිමේන්තුවට එන්නේ මේ සභාවේ කථා කරන්න. එහෙම නැත්නම් ඒක එතුමන්ලාටත් ප්‍රශ්නයක්. මොකද, ගම්වල ඡන්ද දායකයෝ බලාගෙන ඉන්නවා, "අපේ මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවට ගියා. එතුමා විපක්ෂයේ ඉන්නේ. එතුමා හොඳ හඬක් නඟන්න පුළුවන් කෙනෙක්. එතුමා පාර්ලිමේන්තුවට ගිහිල්ලා අපේ ප්‍රශ්න ගැන කථා කරයි" කියලා. ඒ මන්ත්‍රීවරුන්ට කථා කරන්න අවස්ථාවක් නැති වන කොට උදේට එක එක්කෙනා තරගෙට වාගේ නැඟිට නැඟිට රීති ප්‍රශ්න මතු කරන නිසා කාලය විශාල ප්‍රමාණයක් නාස්ති වෙනවා. උදේට කාලය පැය දෙකක් විතර නාස්ති වෙනවා. ඒ නාස්ති වන කාලයෙන් මොනවා හරි ප්‍රතිඵලයක් ලැබී තිබෙනවාද කියලා බලන්න. මේ අහන ප්‍රශ්න ප්‍රමාණයේ හැටියට දැන් ඇත්තටම ජාතික වැදගත්කමක් තිබෙන ප්‍රශ්නය මොකක්ද කියලාවත් හිතාගන්න බැහැ.

මේ කාරණයේදී ගරු කථානායකතුමාට අපේ සහයෝගය ලබා දෙන බව මම පැහැදිලිව කියන්න ඕනෑ. හැබැයි, එතුමා මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කළාට පසුවවත් මේ පාර්ලිමේන්තුව පාලනය කරන්න ඕනෑ. එතැනදී ආණ්ඩු පක්ෂය ද, විපක්ෂය ද කියන එක නොවෙයි බලන්න ඕනෑ. උදය කාලයේ ඉතාම කෙටි වෙලාවක් ඇතුළත ප්‍රශ්න අහලා අවසන් කරලා, විවාදය ගෙන යන්න ඉඩ දෙන්න ඕනෑ. 1994 ඉඳලාම මම කවදාවත් දැක්කේ නැහැ, මේ තරම් රීති ප්‍රශ්න මතු කරන පාර්ලිමේන්තුවක්. අවශ්‍ය කාරණයටත් රීති ප්‍රශ්න; අනවශ්‍ය කාරණයටත් රීති ප්‍රශ්න.

මේ සභා ගර්භයේ ඡන්දය ප්‍රකාශ කරද්දී ඒ අදාළ ස්විච් එක ඔබාගන්නත් බැහැ, ඇතැම් මන්ත්‍රීවරුන්ට. ඒ අයගෙන් සමහර මන්ත්‍රීවරුන්ට නම් ඇත්තටම එවැනි ප්‍රශ්න ඇති වනවා වෙන්න පුළුවන්. හැබැයි එහෙම නොවෙයි, සමහරු හිතලාම ඒ ස්විච් එක ඔබන්නේ නැතිව ඉඳලා ඡන්දය දෙන්න බැරි වෙච්ච බව කියනවා. එතකොට මූලාසනයෙන් ඒ මන්ත්‍රීවරයාව අමතලා, ඡන්දය ප්‍රකාශ කරන්නේ කොහොමද කියලා ඇහුවාට පස්සේ, කථාවකුත් කරලා තමයි ඡන්දය ප්‍රකාශ කරන්නේ. බලන්න, මොන තරම් නරක විධියට ද මේ පාර්ලිමේන්තුවේ හැසිරෙන්නේ කියලා. මෙතැන ගොඩක් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු ඉන්නවා. ඒ අය දන්නවා, මේ පාර්ලිමේන්තුව පසුගිය කාලයේ හැසිරුණේ කොහොමද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු කථානායකතුමාත්, ගරු නියෝජ්‍ය කථානායකතුමාත්, ඔබතුමාත් මේ කාරණය හොඳින්ම දන්නවා.

අපි අද මේ විශ්වාස භංග යෝජනාව පරාජය කරවනවා. හැබැයි, මම ඉල්ලා සිටිනවා අප දිනුවාට පසුවවත් පාර්ලිමේන්තුවක් විධියට වැඩ කරගෙන යමු කියලා. එහෙම කරද්දී සමහර මන්ත්‍රීවරු කෑ ගැහුවාට කමක් නැහැ. මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයක් තිබෙනවා. මේ ගරු සභාවේ අනවශ්‍ය විධියේ රීති ප්‍රශ්න නඟමින් දිගින් දිගටම කටයුතු කරනවා නම්, ඒ අයට එරෙහිව කටයුතු කරන්නත් මූලාසනය දරන කථානායකතුමාට, නියෝජ්‍ය කථානායකතුමාට බලය තිබෙනවා. ඔබතුමාටත් ඒ බලය තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ වාගේම, වෙලාව අනවශ්‍ය විධියට පාවිච්චි කරනවා නම් එය වළක්වන්නත් මූලාසනයට බලය තිබෙනවා. අප එවැනි ආකාරයට ඉදිරියේදී කටයුතු කළොත්, පාර්ලිමේන්තුව හොඳ තත්ත්වයකට ගෙන එන්න පුළුවන් කියලායි මා හිතන්නේ. මේ කාරණය අනුව ගත්තොත්, වත්මන් කථානායකතුමාට විරුද්ධව විශ්වාස භංගයක් ගෙන ඒමේ කිසිම පදනමක් නැහැ. එහෙම කියන්න තවත් ප්‍රධාන හේතුවක් තිබෙනවා. වත්මන් පොලිස්පතිවරයා පත් කිරීමත් මේ විශ්වාස භංගයට ප්‍රධාන හේතුවක් වෙලා තිබෙනවා නේ. එතැනදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් දෙදෙනෙක් විරුද්ධව ඡන්දය දෙනවා; දෙදෙනෙක් ඡන්දය නොදී ඉන්නවා; හතරදෙනෙක් පක්ෂව ඡන්දය දෙනවා. ඕක හැමදාම සිද්ධ වුණොත් මොකක්ද කරන්නේ? එහෙම නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හැදුවේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා ස්වාධීනව කටයුතු කරන්නයි. පාර්ලිමේන්තුවේ නිල වශයෙන් පත් වන කණ්ඩායම් ඉන්නවා; ඊට අමතරව, "ස්වාධීන කණ්ඩායම්" කියා ගන්නා උදවියත් ඉන්නවා. ඒ උදවිය තමයි මේ විධියට හැසිරෙන්නේ. එක්කෝ "පක්ෂයි" කියන්න ඕනෑ; එහෙම නැත්නම් "විරුද්ධයි" කියන්න ඕනෑ. ඔය විධියට හැමදාම කරගෙන ගියොත් මොකක්ද වෙන්නේ? එතකොට මේ රටට පොලිස්පතිවරයෙක් නැති වේවි. මා දන්නා විධියට ඡන්දය දීමෙන් වැළකී හිටපු දෙදෙනාට විපක්ෂයම තමයි උපදෙස් ලබා දීලා තිබෙන්නේ, ඡන්දය පාවිච්චි කිරීමෙන් වළකින්න කියලා. අපට දැනගන්න ලැබෙන තොරතුරු අනුව විපක්ෂය ඒ ගොල්ලන්ට එහෙම කියලා තිබෙනවා. මොකක්ද එහෙම කියන්න හේතුව? පාතාලය මර්දනය කරන්න, කුඩුකාරයන්, කුඩු ගේන මිනිසුන්, කුඩු බෙදන මිනිසුන්, ඒ ඔක්කෝම අල්ලන්න දැන් "යුක්තිය" මෙහෙයුම ක්‍රියාත්මක වෙනවා. ඒ "යුක්තිය" මෙහෙයුම ක්‍රියාත්මක කිරීමේදී පොලිස්පතිවරයා විශාල කාර්යභාරයක් කරනවා. ඒ මෙහෙයුම නිසා අද වැටලීම් විශාල වශයෙන් සිද්ධ වෙනවා. එහෙම නම්, ඒක වළක්වා ගන්න ඕනෑ කාටද? ඒක වලක්වාගන්න අවශ්‍යතාව තිබෙන කුඩු ගේන මිනිස්සු අද ගිහිල්ලා විපක්ෂයේ සමහර කණ්ඩායම් මුණ ගැහෙනවා. අපට ඒ ගැන ආරංචි ලැබෙනවා.

ඒ අය දැන් විපක්ෂයේ ඉන්න කණ්ඩායම් දෙකතුනම මුණ ගැහිලා, කොහොමද ඒක කඩාකප්පල් කරන්නේ, කොහොමද මේ පොලිස්පතිවරයා අයින් කරන්නේ, පුළුවන් නම් කොහොමද මේ ඇමතිවරයාත් අයින් කරන්නේ, කොහොමද මේ වැඩ පිළිවෙළ නවත්වන්නේ කියා කථා කරමින් එසේ කිරීමට උත්සාහයක් දරනවා. එහෙම නැත්නම්, මේ පොලිස්පතිවරයාට විරුද්ධ වෙන්න තිබෙන කාරණය මොකක්ද? මෙතෙක් කවදාවත් සිදු වුණේ නැති විධියට මේ රටේ මත් උවදුර නැති කරන්න මේ පොලිස්පතිවරයා මහන්සි වෙනවා. ඒක ඕනෑම කෙනෙකු හිතට එකඟව පිළිගන්නා කාරණයක්. මා නම් හැම වෙලාවේම විශ්වාස කළේ, ඒ නාම යෝජනාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ආවාම, සියලු දෙනා එක හඬින් ඔහුගේ පත්වීම අනුමත කරලා ඔහුට සහයෝගය ලබා දෙයි කියලායි. මොකද, මේ රටේ කුඩු වසංගතය නවත්වන්න හැමෝම ප්‍රතිඥා දෙනවා. හැම ඡන්දයකදීම, හැම වේදිකාවකදීම ඡන්ද පොරොන්දුවක් විධියට ඒ කාරණය කියනවා. හැබැයි, ප්‍රායෝගිකව ඒක ක්‍රියාත්මක වෙන්න ඉඩ දෙන්නේ නැහැ. මොකද, දේශපාලනඥයින්ට වෙන්න පුළුවන්, තවත් අයට වෙන්න පුළුවන් සල්ලි පොම්ප කරන්න හුඟක් කුඩුකාරයින්ට පුළුවන්. මෙච්චර කාලයක් ආරක්ෂක අංශයේ බොහෝ දෙනෙකු සල්ලිවලට යටත් කරගෙන හිටියා; කුඩුකාරයින්ට ඕනෑ විධියට පොලීසියේ ඉහළ නිලධාරින් හැසිරෙව්වා. මොකද, ඒ අය ළඟ

ලක්ෂ ගණනින්, මිලියන ගණනින් නොවෙයි සල්ලි තිබෙන්නේ; බිලියන ගණනින්. ඒ බිලියන ගණන් සල්ලිවලින් තමයි ඒ අය එම නිලධාරින් හැසිරෙව්වේ. මේ වතාවේ ඒක කර ගන්න බැරි වන කොට; පොලීසිය හසුරුවන්න බැරි වන කොට, දේශපාලනඥයින් හසුරුවාගෙන මේ වැඩ පිළිවෙළ කඩාකප්පල් කරන්න ඒ අය බලාපොරොත්තු වෙනවා. ඒ නිසා අපි පැහැදිලිව කියනවා, මේ වෙලාවේ මේ විශ්වාස භංග යෝජනාව ගෙන ආවේ කිසිම පදනමක් නැතිවයි කියලා. කිසිම පදනමක් ඇති කාරණයකට නොවෙයි මේ විශ්වාස භංග යෝජනාව ගෙන ආවේ.

අපේ නාලක ගොඩහේවා මන්ත්‍රීතුමා කිව්වා, හිටපු ජනාධිපතිතුමාට යන්න සිද්ධ වුණා කියලා. ඔව්, එතුමාට යන්න සිද්ධ වුණා. එතුමාව ජයග්‍රහණය කරවන්න අපිත් වැඩ කළා; කවුරුත් මහන්සි වුණා. හැටනව ලක්ෂයක් ජනතාව එතුමාට ඡන්දය දුන්නා. ගරු නාලක ගොඩහේවා මන්ත්‍රීතුමනි, හැබැයි ඒ ප්‍රතිපත්ති මාලාව හදපු වෙලාවේ ඔබතුමාත් ලොකු කාර්යභාරයක් ඉටු කළා. මා දන්නා විධියට, එම ප්‍රතිපත්ති ප්‍රකාශනය හදපු කණ්ඩායමේ ප්‍රධානියා වශයෙන් සිටියේ නාලක ගොඩහේවා මැතිතුමා. එතුමාත් එකතු වෙලා තමයි ඒ වැඩ පිළිවෙළ හැදුවේ. ඒක හොඳයි. "වියත්මග" එකතු කර ගත්තා. වියත්මග එක්ක ඒ වැඩ පිළිවෙළ කරගෙන ගියා. ඊට පසුව සංස්ථාවල ඉහළ තනතුරුවලට පත් කිරීම සිදු වුණා. ඒ තනතුරුවලට පත් කරන එකත් ඒ වෙලාවේ ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් තිබුණු කමිටුවකින් කළේ. සාමාන්‍ය සම්ප්‍රදාය වුණේ ඇමතිවරුන්ට ඕනෑ සභාපතිවරුන් පත් කිරීමයි. නමුත්, එතැනින් එහාට ගිහින් ඒ පත් කිරීම් සිදු කළේ එම කමිටුව විසින්. එතැනදීත් පත් කළ බොහෝ අය වියත්මග කණ්ඩායමේ සිටි අයයි. නමුත්, ඒ වැඩසටහන් අසාර්ථක වුණා. ඒක පිළිගන්න අපට සිදු වෙනවා. මේ රටේ හැම තැනම කියපු දෙයක් තමයි, මේ පාර්ලිමේන්තුවට එන්න ඕනෑ උගතුන්, බුද්ධිමතුන්, ආචාර්යවරුන්, මහාචාර්යවරුන්, දොස්තරවරුන්, ඉංජිනේරුවන් කියන එක. ඒ වෙලාවේ ඒ වාගේ මතයක් තිබුණා. අපි ඒක බැහැර කරන්නේ නැහැ. ඒ අය එන එක හොඳයි. තවත් මතයක් තිබුණා, තනතුරුවලට පත් කිරීමේදීත් ඒ වාගේම කණ්ඩායමක් පත් කරන්න ඕනෑ කියලා. නමුත්, ඒ වැඩේ අසාර්ථක වුණා නේ. ඒ සියලු පත් කිරීම් වෙනුවෙන් ගත්තු තීන්දු අසාර්ථක වුණා. අපි ඒක පිළිගන්න ඕනෑ. ඒ නිසා තමයි හිටපු ජනාධිපතිතුමාටත් යන්න වුණේ, හිටපු අගමැතිතුමාටත් යන්න වුණේ, පැවති ආණ්ඩුවටත් යන්න වුණේ; සම්පූර්ණ වෙනස් පරිසරයක් මේ රටේ නිර්මාණය වුණේ.

අපි දන්නවා, අවසාන මොහොතේ පාර්ලිමේන්තුවත් අල්ලාගන්න පැමිණි බව. ඔබතුමා පැහැදිලිව දන්නවා, එදා මේ පාර්ලිමේන්තුව අල්ලා ගත්තා නම් මොකද වෙන්නේ කියලා. ජනතා විමුක්ති පෙරමුණ තමයි ඒකට නායකත්වය දුන්නේ. අපි පැහැදිලිව දැක්කා එතැන හිටියේ කවුද කියලා. එදා මේ පාර්ලිමේන්තුව වටලලා පාර්ලිමේන්තුව අල්ලා ගත්තා නම්, මොකක්ද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට වෙන්නේ? ඒ අවස්ථාවේ ගරු ජනාධිපතිතුමා ගත්තු ඒ තීන්දුව නොවන්නට අද මෙහෙම කථා කරන්න පාර්ලිමේන්තුවක් නොතිබෙන්න ඉඩ තිබුණා. එක්කෝ පාර්ලිමේන්තුව ගිනි තියන්න ඉඩ තිබුණා, එහෙම නැත්නම් පාර්ලිමේන්තුව අල්ලාගෙන වෙනත් දෙයක් කරන්න ඉඩ තිබුණා. හැබැයි, ඒ වෙලාවේ ආරක්ෂක අංශත් ඒකාබද්ධ වෙලා ඒ කටයුත්ත සිදු කළා. ඒ නිසා තමයි මේ පාර්ලිමේන්තුව බේරුණේ. අද අපට, ඔබතුමන්ලාට මෙහෙම කථා කරන්න, විවේචන සිදු කරන්න පුළුවන් වෙන්නේ ඒ තත්ත්වය තුළයි. අපි ඒක අමතක කරන්න හොඳ නැහැ. එදා මේ රට තිබුණු තැනත්, අද මේ රට ගෙනැවිත් තිබෙන තැනත් පිළිබඳව හැමෝටම වැටහීමක් තිබෙනවා. මොන තරම් අභියෝග මැද්දේ ද මේ රට මේ තත්ත්වයට ගෙන ආවේ? පැය 12ක්, 13ක් විදුලිය කප්පාදු කළ, තෙල් ටිකක් ගන්න පෝලිමේ ගිහිල්ලා මිනිසුන් මැරුණු, ගෑස් ටික ගන්න පෝලිමේ ගිහිල්ලා මිනිසුන් මැරුණු, ගොවියා ගොවි බිමෙන් ඇත් කරලා පොහොර ටිකක් ඉල්ලාගෙන හිඟා කන තත්ත්වයට, අඩා වැටෙන තත්ත්වයට පත් වෙලා හිටපු තත්ත්වයක් එදා තිබුණේ. අද ඒ තත්ත්වය ක්‍රමානුකූලව වෙනස් කරගෙන යමින් තිබෙනවා. මම කියන්නේ නැහැ, ඒකෙන් මිනිසුන්ගේ ප්‍රශ්න ඔක්කොම විසඳුණා කියලා; ජීවන වියදම අඩු වුණා කියලා. හැබැයි, එදා තිබුණු තත්ත්වයත් එක්ක බැලුවාම අද තිබෙන තත්ත්වයට මේ රට ගෙනෙන්න අපට පුළුවන් වුණා.

එදා පක්ෂ නායකයෝ වගකීම් භාරගත්තේ නැහැ. වගකීම් භාරගන්න කියලා එදා දෙතුන් දෙනෙකුටම කථා කළා. ඒ කවුරුත් මඟ හැරපු නිසා තමයි වර්තමාන ජනාධිපතිතුමා මේ රට භාර ගත්තේ. එතුමා මේ රට භාරගෙන අද යම් මට්ටමකට ගෙනැල්ලා තිබෙනවා. දැන් මේ මට්ටම ඉස්සරහට ගෙන යන්නයි තිබෙන්නේ. එදා ඒ ගත්තු ක්‍රියා මාර්ගයේදී ජනාධිපතිතුමාම ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, "මම තනිවම ආපු පුද්ගලයෙක්, මේ රට ගොඩ ගන්න කවුරුත් මට සහයෝගය ලබා දෙන්න" කියලා. හැබැයි, ඒ වෙලාවේ විපක්ෂය විධියට කවුරුත් සහයෝගය ලබා දුන්නා නම් අද මේ තිබෙන තත්ත්වයට වඩා හොඳ තත්ත්වයකට රට එනවා. අඩු ගානේ බාධා නොකර හෝ හිටියා නම් හොඳයි. මොකද, බාධා විතරමයි ඇති වුණේ. බාධා කිරීම් මැද්දේ හෝ මේ තත්ත්වයට රට ගෙනාපු එක ගැන අපි සතුටු වෙන්න ඕනෑ.

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා**
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. (Dr.) Nalaka Godahewa, what is the point of Order?

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා**
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)

Sir, please give me a second.

ගරු ඇමතිතුමා සඳහන් කළ කාරණයක් ගැන මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. (Dr.) Nalaka Godahewa, that is not a point of Order.

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා**
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)

Sir, it is a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Okay. What is the point of Order?

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා**
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)

එතුමා මගේ නම කිව්වා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. That is my point of Order. He mentioned my name and made a major accusation. So, I have to answer that.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, වියත් මඟ අයව සභාපතිවරු වශයෙන් පත් කරපු එක අර්බුදයට හේතුවක් වුණා කියලා. ඒක සම්පූර්ණයෙන් වැරැදියි. අපි හැමෝම දන්නවා, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාව අරගළයෙන් පන්නා දමන්න ප්‍රධාන වශයෙන්ම හේතු වුණේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඇති වෙච්ච පොහොර අර්බුදය සහ ඊට පස්සේ ඇති වෙච්ච විදේශ විනිමය ප්‍රශ්නය නිසා ගෑස්, ඉන්ධන, විදුලිය ලබා ගැනීමට නොහැකි වුණු නිසා බව. ඔය ප්‍රශ්න දෙකටම වියත් මඟේ අයගේ සම්බන්ධයක් නැහැ නේ. විශේෂයෙන්ම එතුමා විසින් රචිත පොතේ කෘෂි කර්මාන්තය සම්බන්ධයෙන් සඳහන් කර තිබෙන දේවල් කියවා බලන්න. එතුමා දැන් පොතක් නිකුත් කර තිබෙනවා නේ. ඒ පොතේ පැහැදිලිවම එතුමා කෘෂිකර්මය සම්බන්ධයෙන් වූ ව්‍යාපෘතිය කරන වෙලාවේ එතුමාට උදවු කරපු කෙනා වශයෙන් හිටපු කෘෂිකර්ම ඇමති මහින්දානන්ද මහත්මයාගේ නම සඳහන් කර තිබෙනවා. වෙනත් කිසිම කෙනෙක් ගැන සඳහන් කර නැහැ. ඊට අමතරව මතක තබා ගන්න, ඒ වෙලාවේ ලේකම්වරු වශයෙන් පත් වෙච්ච වියත් මඟ සාමාජිකයෝ ඒකට විරුද්ධ වුණා කියන එක. එතකොට මොකක්ද වුණේ? හතර දෙනෙක්ව අස් කළා. ඒක තමයි ඇත්ත කතන්දරය.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Next, the Hon. Dilan Perera. You have seven minutes.

[අ.භා. 12.15]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කථානායකතුමාට එරෙහිව ගෙනැවිත් තිබෙන මෙම විශ්වාස භංග යෝජනාව පිළිබඳ මේ විවාදයේදී ඇත්තටම මම කථා කරන්න නොවෙයි හිටියේ. මෙම විශ්වාස භංග යෝජනාවට මම අත්සන් කළෙත් නැහැ. හැබැයි, මෙම විශ්වාස භංග යෝජනාවට පක්ෂව තමයි මම ඡන්දය පාවිච්චි කරන්න හිටියේ. විශ්වාස භංග යෝජනාවට මම අත්සන් නොකර හිටියේ සහ කථා නොකරන්න තීරණය කරගෙන හිටියේ, මේ කථානායකවරයා එම ධුරයට පත් වීමට පෙර මගේ හිතේ පැලපදියම් වෙච්ච, මම බොහොම ගෞරව කරන චරිතයක් නිසායි. ඒ නිසා මම හිතුවා මම විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඡන්දය පාවිච්චි කරනවා, හැබැයි, කථා කරන්නේ නැහැ කියලා. මම ඒකට අත්සන් කළේත් නැහැ. හැබැයි, ඊයේ, පෙරේදා සහ අද විරුද්ධ පක්ෂයේ නොවෙයි, ආණ්ඩු පක්ෂයේම සමහර කථීක මහත්වරුන්ගේ කථා අහගෙන හිටියාම මට හිතුණා, මම කථා කරන්න ඕනෑ කියලා. මොකද, ආණ්ඩු පක්ෂයේම සමහර කථීක මහත්වරුන්ගේ කථාවලින්- *[බාධා කිරීමක්]* මම කියන්නේ,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගැන නොවෙයි. සමහර අය ඉන්නවා නේ, සරමක් ඇඳගෙන මෙතැන කෑ ගහනවා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගේ. එයා දන්නේ නැහැ, එයා 8 පාස් ද, 10 පාස් ද කියලා. ඒ ගොල්ලන් ගැන නොවෙයි මම මේ කියන්නේ. නමුත්, ආණ්ඩු පක්ෂයේ ඉන්නවා, බුද්ධිමත් නීතිඥ මහත්වරු. අධිකරණ ඇමතිතුමාගේ මුළු කථාව පුරාම විවිධ කාරණා කියලා එතුමා කිව්වා, "ඔව්, අපි පිළිගන්නවා, Online Safety Bill එකේදී ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දුන් යෝජනා 4ක් අපට එකතු කරන්න බැරි වුණා" යනුවෙන්. ඒ කියන්නේ, එතුමාම පිළිගන්නවා ඒ කටයුත්ත කරන්න බැරි වුණා කියලා. බැරි වුණා කියන්නේ මොකක්ද? බැරි වුණාය කියන්නේ, ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි. මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා කිව්වා, මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න තිබුණේ ටිරාන් අලස් මහත්මයාට විරුද්ධව කියලා. නැහැ, ඉතාම අමාරු brief එකක් ඔප්පු කරන්න වාගේ අද කථා කරපු අපේ විදේශ කටයුතු ඇමතිතුමාටත් මේක අමතක වුණා. යම් පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් කවුරුන් හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාම ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුතුමන්ලා නඩු තීන්දුව එවන්නේ කාටද? පාර්ලිමේන්තුවටද, අදාළ ඇමතිතුමාටද? නැහැ, කථානායකතුමාට. ඇයි, ඒ කථානායකතුමාව address කරලා ඒක එවන්නේ? කථානායකතුමාගේ වගකීම තමයි, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුව අනුව අණපනත් සම්මත කරන්න කටයුතු කිරීම. කථානායකතුමාට එවන්නේ ඒ නිසායි. විජයදාස රාජපක්ෂ මැතිතුමා පිළිගත්තා, යෝජනා 4ක් එකතු කරන්න බැරි වුණා කියලා. ඒ කියන්නේ, මේ කාරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි.

ඊළඟට, අධිකරණ රාජ්‍ය ඇමතිතුමා කිව්වා, විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න ඕනෑ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේදී abstain කරපු අයට කියලා. ඒ කියන්නේ පුද්ගලයා කෙසේ වෙතත් පොලිස්පතිතුමා පත් කිරීම සම්බන්ධ කාරණයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් දුන් තීන්දුවේ කොහේ හෝ ප්‍රශ්නයක් තිබෙන නිසා නේ එහෙම කියන්නේ. අද විදේශ කටයුතු ඇමතිතුමාත් කිව්වා, විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න ඕනෑ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඉන්න abstain කරපු දෙදෙනාට කියලා. ඒ කියන්නේ පොලිස්පතිතුමා පත් කිරීම කියන කාරණයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ කවුරුන් හෝ කෙරෙහි විශ්වාසයක් බිඳිලා තිබෙනවා. ආණ්ඩු පක්ෂයෙන්ම කියනවා, විශ්වාසය භංග වෙලා කියලා.

ඒකේ වෙනස මේකයි. අපි කියනවා, විශ්වාසය භංග වුණේ කථානායකතුමා කෙරෙහි කියලා; ආණ්ඩු පක්ෂයෙන් කියනවා, "නැහැ, එහෙම වුණේ ඒ abstain කරපු දෙදෙනාගේ" කියලා. කොහොම හරි, විශ්වාසය භංග වෙච්ච සභාවකින් නේ, පොලිස්පතිතුමාව පත් කරලා තිබෙන්නේ. පොලිස්පතිතුමාගේ මට වරදක් පෙනෙන්නේ නැහැ. හැබැයි, එතුමාට කළ ලොකුම අපහාසය තමයි විශ්වාසය භංග වෙච්ච සභාවකින් හොර පාරෙන් එතුමා පොලිස්පති කරපු එක. එතුමා හරි පාරෙන් පොලිස්පති කිරීම තමයි එතුමාට දෙන්න තිබුණු ගෞරවය. එතුමා හොර පාරෙන් පොලිස්පති කිරීම තමයි එතුමාට කළ අගෞරවය. එතුමාව නිසි පරිදි පොලිස්පති කරන්න තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ උත්තර දෙන්නේ මේ ප්‍රශ්නය හරියටම technically argue කරපු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට විතරයි. මම අර කලින් කියපු අයට කථා කරන්න යන්නේ නැහැ. මොකද, ඒ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අයට වැඩියෙන් වෙලාව දුන්නෙත් ආණ්ඩු පක්ෂයෙන්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා තර්කයක් මතු කළා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

පිළිබඳ කොටස තිබෙන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධායකය යටතේ නිසා එය විධායකයට අයිති දෙයක් කියලා. හැබැයි විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කිව්වා, ඒක අයිති ව්‍යවස්ථාදායකයට කියලා. මම කියනවා, මේ දෙන්නාම වැරදි බව. ඇයි? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් හැදෙන්නේ විධායකයට ඕනෑ ඕනෑ විධියට තනතුරුවලට කට්ටිය පත්කිරීම නවත්වන්නයි. ඒ කියන්නේ, යම්කිසි ආකාරයක checks and balances සිදු කරන්න. ඒ නිසා ඒක විධායකයේ කොටසක් වෙන්න බැහැ. ඒ හින්දා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විධායකයේ කොටසක් සේ සලකලා විශ්වාස භංග යෝජනාවේදී කථානායකතුමාගේ පැත්ත ගැනීම තර්කානුකූලව සභානායකතුමා කරන්නේ වැරදි විධියට.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, you have only two more minutes.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
හොඳයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියනවා, එය තිබෙන්නේ ව්‍යවස්ථාදායකය යටතේ කියලා. නැහැ. පාර්ලිමේන්තුවේ කථානායකතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති වෙච්ච පලියට ඒක ව්‍යවස්ථාදායකයේ කොටසක් වෙන්නෙත් නැහැ, අධිකරණයේ කොටසක් වෙන්නෙත් නැහැ. එය මේ තුනෙන්ම ස්වාධීන වෙච්ච ආයතනයක්. මේ ස්වාධීන වෙච්ච ආයතනය තුළ පොලිස්පතිවරයා පත් කිරීම සම්බන්ධ කාරණයේදී කථානායකතුමා කරපු වරද තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම රැස්වීම තුළ, රැස්වීම යන කාලය තුළ එතුමා කොයි වේලාවකවත් කිව්වේ නැහැ, "Abstain කරපු දෙදෙනා විරුද්ධ සේ මා සලකනවා" කියලා. ඒ කියන්නේ ඒ රැස්වීම් කාලය තුළ එතුමාට තේරුණා, ඒ දෙදෙනා abstained; ඒ කියන්නේ, විරුද්ධ නැහැ කියලා. හැබැයි, රැස්වීම ඉවර වෙලා ජනාධිපතිතුමා එතුමාට එවපු ලිපියකට පිළිතුරක් යවනකොට තමයි එතුමාට නැවත වරක් මනස පහළ වෙන්නේ abstained දෙදෙනා විරුද්ධ වශයෙන් සැලකිය යුතුය කියලා. This evening, Sir, when we take a Vote on this Motion, if you would be in the Chair, can you vote? No, you cannot. කථානායකතුමා විවිධ අවස්ථාවලදී මෙතැනදී එක එක පනත් කෙටුම්පත්වලට ඡන්ද විමසලා තිබෙනවා. නමුත් කථානායකතුමා ඡන්දය පාවිච්චි කරන්නේ නැහැ නේ. Why? Today, most probably, the Hon. Deputy Speaker would be in the Chair when the Vote is taken up. He would not vote in the first round. Why? Because, he only has a casting vote. To use the casting vote, දෙපැත්තේ ඡන්ද සමාන වෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහින්ද අමරවීර අමාත්‍යතුමාත් කිව්වා, නාලක ගොඩහේවා මන්ත්‍රීතුමාත් කිව්වා, මේ කාරණය. මේ පාර්ලිමේන්තුව පිළිබඳව ලංකාවම, "මේ 225දෙනාම ගෙදර පලයන්" කියලා කියන අවස්ථාවකදී අපි පාර්ලිමේන්තුව තුළින් දෙන සංඥා මොනවාද? කථානායකතුමා ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා, එහෙම නැත්නම් COPE එකේ සභාපති වශයෙන් මහාචාර්ය රංජිත් බණ්ඩාර මහත්තයා වෙනුවට රෝහිත අබේගුණවර්ධන මහත්තයා පත් කිරීම වැනි කාරණා. මේවා හරි signals ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කථානායකතුමා ඉතා හොඳ මනුෂ්‍යයෙක්. එතුමා කථානායක වෙන්න පෙර දේශපාලනඥයෙක්. මම කෙළින්ම කියනවා, එතුමාගේ පෞද්ගලික ලේකම් චමීර යාපා අබේවර්ධන දොස්තර මහත්තයා ඉතාම හොඳින් අපේ ආංශික අධීක්ෂණ කාරක සභා කටයුතුවලට උදවු කරපු කෙනෙක් බව. හැබැයි, එහෙම කියලා කථානායකතුමාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්න බැහැ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. COPE එකේ මේ සභාපතිවරයා පිළිබඳ ප්‍රශ්නය මතු වෙච්ච වෙලාවේ, අපි COPE එකේ ඉඳගෙන උත්සාහ කළා, අලුතෙන් පත්වෙන්න යන සභාපතිතුමාව පරද්දන්න. හැබැයි, එදා විරුද්ධ පක්ෂයේ ඔක්කෝම ආවා නම්, පරද්දන්න තිබුණා. එදා ඒක කර ගන්න බැරි වුණා. ඒ නිසා මමත් COPE එකෙන් අද දින ඉල්ලා අස් වෙනවා. එම ලිපිය ඔබතුමාට භාර දෙන්නම්.

අවසාන වශයෙන්, කථානායකතුමාට මට කියන්න තිබෙන්නේ මෙච්චරයි. ඔබතුමා නැවත කථානායක පුටුවට ආවත්, නැතත් මේ ඉතිහාසය පුරාම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව සෑම කෙනෙකුටම ලැබිච්ච විමධ්‍යගත මුදලුත් මේ ආණ්ඩුව නවත්වා තිබෙනවා. අඩු ගාණේ ඒකටවත් මැදිහත් වෙන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. (Dr.) Bandula Gunawardana. You have ten minutes.

[අ.භා. 12.23]

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කථානායකතුමාට එරෙහිව ගෙනෙන ලද මෙම විශ්වාස භංග යෝජනාවේ දී වියත්, නීතිඥ වෘත්තියේ යෙදී සිටින සහ සුප්‍රසිද්ධ ජනාධිපති නීතිඥවරුන් ඇතුළු බොහෝ අය ඒ සම්බන්ධව නීතිමය තර්ක රාශියක් ඉදිරිපත් කළා. ඒ නිසා මම ඒවා පිළිබඳව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත් මට දැනෙන දෙයක් තිබෙනවා. මේ රටේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයත්, පාර්ලිමේන්තු ක්‍රමයත් ඉතාම දරුණු අර්බුදයකට ලක් කරලා ප්‍රචණ්ඩත්වයට සහ තියුණු සමාජ අර්බුදයකට මේ රට දවසින් දවස ගෙන යාම සඳහා අපි දායක වෙනවාද කියන ප්‍රශ්නය මට දැනෙනවා. මොකද, මීට අවුරුදු තිස් ගණනකට පෙර, එනම් 1989දී මා ප්‍රථම වරට මහජන ඡන්දයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වෙනකොට තිබුණේ මීටත් වඩා දරුණු තත්ත්වයක්. ඒ කාලය ගැන අවබෝධයක් නැති සමහර අයට පෙනෙන්නේ මේ තමයි දරුණුම තත්ත්වය කියලායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සමහර විට ඔබතුමා ඒ කාලයේ ඉපදිලාවත් නැතුව ඇති. ඒ කාලයේ "ජේ.ආර්. මරවු!" කියලායි කිව්වේ. ලංකාව පුරාම හැම තාප්පයකම අලවා තිබුණු පෝස්ටර්වල තිබුණේ, "ජේ.ආර්. මරවු! හොර පාර්ලිමේන්තුව වර්ජනය කරවු!" කියලායි. පාසල් ශිෂ්‍යයෝ, ගුරුවරු, විද්වතුන් කියන ඒ සියලු දෙනා කිව්වේ, පාර්ලිමේන්තුව හොර පාර්ලිමේන්තුවක් කියලායි. ඒ කාලයේ ජනතා විමුක්ති පෙරමුණ තහනම් කර තිබුණා. ජනතා විමුක්ති පෙරමුණේ තරුණ අයට විරුද්ධව ඒ කාලයේ විශ්වවිද්‍යාලවල ආචාර්යවරු, මහාචාර්යවරු මොකුත් කිව්වේ නැහැ. අර එල්ටීටීඊ එකට කිව්වා වාගේ, "our

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

boys" කියලා කිව්වේ. "ඒ අය කියන එක හරි. මේ ළමයින්ගේ ප්‍රශ්නයට විසඳුමක් නැහැ. පාර්ලිමේන්තුව කුඩු පට්ටම් කරන්න ඕනෑ" කියලා තමයි කිව්වේ. ඒ කාලයේ ඒ අය දරන මතයට විරුද්ධ මතයක් දරන්න කාටවත් බැහැ. එහෙම වෙනත් මත දරපු අය මැරුවා. නිරායුධ, අවිහිංසක මිනිස්සු මැරුවා. වෛද්‍යවරයෙක් වුණත්, මහාචාර්යවරයෙක් වුණත්, ආචාර්යවරයෙක් වුණත්, වෙනත් කෙනෙක් වුණත්, වෙනත් මතයක් දැරුවා නම් ඔහු මැරුවා.

සමහර ගම්වල පාලනය සම්පූර්ණයෙන්ම සිදු කළේ ඒ අයයි. ගෙවල්වල හිටපු අය ගෙන ගිහින් වෙඩි තබා මරා දැමුවා. ඒ කාලයේ -1989 දී- අපි හැමෝටම ලියුම් ආවා. ගරු දිලිප් වෙදආරච්චි මැතිතුමාට ඒ ගැන මතක ඇති. අපිට ලියුමක් ආවා, "හොර පාර්ලිමේන්තුව වර්ජනය කරවු! පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වන අයට දඬුවම මරණයයි" කියලා. මටත් මරණ දඬුවම සහිත ලිපියක් ලැබී තිබුණා. ඒ විතරක් නොවෙයි. ඡන්දය දෙන්න යන පළමු පස්දෙනා මරා දමනවා කිව්වා. ඒ ආකාරයට දකුණේ පැවැති මහ භීෂණය තුළ එසේ ඡන්දය දෙන්න ගිය පළමු වැනි පස්දෙනා මැරුවා. එසේ මැරුවා පමණක් නොවෙයි. ඒ අයගේ මිනී දණිසෙන් පහළට වන සේ රැගෙන පාරේ ඇදගෙන ගිහින් වළලන්න කිව්වා. සමනලයෙකුට වෙඩි තිබ්බා වාගේ විජය කුමාරණතුංග මරා දැම්මා. මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර වාගේ අය, කොටිකාවත්තේ සද්ධාතිස්ස නායක හාමුදුරුවෝ වාගේ අය මරා දැම්මා. මහා භීෂණයක්! අඩු ගණනේ එසේ මරපු කෙනෙකුගේ මළ ගෙදරකට යන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ තරමටම පාර්ලිමේන්තුව එපා කෙරෙව්වා. එහෙම එපා කරවලා මේ මුළු රටම ලේ විලක් බවට පත් කළා. විශ්වවිද්‍යාල අවුරුදු ගණනක් වසා තිබුණා. පාරට බැහැලා මාස ගණන් වර්ජන සිදු කළා. කියන දවසට වර්ජනය කළේ නැත්නම් රක්ෂා කළ අය මරා දැම්මා. කොන්දොස්තර මහත්තයාගේ, ඩ්‍රයිවර්ගේ ඔළුව සුක්කානමට තබලා තමයි වෙඩි තබා මැරුවේ. ඒ කාලයේ ඉන්දියන් විරෝධයක් පැවැති නිසා, කවුරු හරි කෙනෙක් වඩේ එකක් කෑවා නම්, කටේ වඩේ එකක් තිබුණාය කියා ඒ අයව මරා දැම්මා. එහෙම ඉතිහාසයක් තමයි අපි පහු කර තිබෙන්නේ.

එදා වටිනා මනුෂ්‍ය ජීවිත විනාශ වුණා. වැරදි දේශපාලන මතවාද නිසා අහිංසක තරුණයන් 60,000කට වඩා වැඩි ප්‍රමාණයක් මිය ගියා. ඒ අවස්ථාවේ දී ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරගන්න රජය පැත්තෙනුත් කටයුතු කළා. ඒ වනවිට රංජන් විජේරත්න මැතිතුමා තමයි රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා විධියට කටයුතු කළේ. මනුෂ්‍ය ඝාතන වළක්වා ගැනීම සඳහා වර්තමාන අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත්, අපත් එවකට පාර්ලිමේන්තුව තුළදී විශාල උත්සාහයක් ගත්තා. එවකට පාර්ලිමේන්තුවේ සිටියේ නැති වුණත් අපේ රාජිත සේනාරත්න මැතිතුමාට මතක ඇති, වෙනත් දේශපාලන මත දරපු අය ඒ කාලයේ එම දේශපාලන කටයුතු සිදු කළේ මොන තරම් බයෙන්ද, අමාරුවෙන්ද කියන එක.

භය හා සැකය නිසා ගෙදරක තරුණයෝ තියා ගත්තේ නැහැ. ඒ තිබුණු යථාර්ථය පිළිබඳව දන්නේ නැතිව එවැනි තත්ත්වයක් ඇති කිරීම සඳහා තමයි අදත් මේ මන්ත්‍රීවරුන් 225දෙනාම නැතිව මේක අලුත් ක්‍රමයකට කරන්න පුළුවන් කියලා කියන්නේ. අද වාගේ දවසක කථානායකතුමාට විරුද්ධව ගෙන ආ විශ්වාස භංග යෝජනාව නොවෙයි තිබෙන ප්‍රධාන ප්‍රශ්නය. මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවට කන්න ආහාර වේල දෙන්න ඕනෑ, ලෙඩ්ඩුන්ට බෙහෙත් ටික දෙන්න ඕනෑ, තෙල් ටික ගන්න ඕනෑ. රට තුළ තිබෙන අර්බුදයත් එක්ක තමයි අපි මේ සියල්ල කරන්නේ. අපි තවම ණය ගෙවන්නේ නැහැ. විදේශ රටවලට වෙච්ච ණය ගෙවන ක්‍රමවේදය සකස් කරගෙන අවසාන ගිවිසුමට අත්සන් කරන්නේ නැතිව, වෙන රටවලින් දමා තිබෙන නඩුවලින් බේරිලා තමයි දැනට අපි මේ කටයුතු කරගෙන යන්නේ. මේ වසන්ත සමය නොවෙයි. අන්තිම අමාරු අවස්ථාවකදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇවිල්ලා කඩා වැටිලා, විනාශ වෙලා තිබෙන ආර්ථිකය පිල්ලේ තබන්න උත්සාහ දරන වෙලාවක්, මේක. ඊයේ වෙන කොටත් මේ කණ්ඩායම් ගිහිල්ලා කියන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මර උගුලෙන් ගැලවෙන්න කියලායි. මර උගුල තිබෙන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නොවෙයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩ පිළිවෙළ ඉස්සරහට ගියේ නැත්නම් මුළු රටේම ඉන්න මිනිස්සු ටික මැරෙනවා. ඒකයි මර උගුලක් වෙන්නේ. ජාත්‍යන්තර ගනුදෙනු පියවීම සඳහා වන ක්‍රමවේදය හදා ගත්තේ නැත්නම් කවුරු ආණ්ඩුව ගත්තත් සති දෙකකට වඩා වැඩි කාලයක් ආණ්ඩුව කරන්නට බැහැ.

මම මේ ලෝක බැංකුවේ සමුළුවකට ගිහිල්ලා ඉඳලා තමයි කථානායකතුමා වෙනුවෙන් ඡන්දය දෙන්න මේ ආවේ. ඒ සමුළුවේ කටයුතුවලට සහභාගි වෙන්නේ නැතිව මම නැවත ආවේ එක දෙයක් නිසායි. මීට අවුරුදු දෙකකට පෙර අප්‍රේල් මාසයේ, හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට රට හැර යන්නට වෙන විධියේ අරගළයක් ඇති වුණා. ඒ අවස්ථාවේ දී කථානායකතුමාට එතුමාගේ නිල නිවසේ කොටු වෙලා තනියෙන් ඉන්න සිදු වුණා. සකලවිධ බලපෑම් යටතේ වැඩ බලන අගමැතිතුමෙක් සිටි අවස්ථාවක රට අරාජික වෙන්න යන කොට, මේ රට අරාජික වෙන්න දෙන්නේ නැතිව මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීම සඳහා ගරු කථානායකතුමා ගත් ක්‍රියා මාර්ගය වෙනුවෙන් කෘතවේදීත්වය දැක්වීමක් ලෙස තමයි අපි අද එතුමා වෙනුවෙන් මේ ඡන්දය පාවිච්චි කරන්නේ. එහෙම වුණේ නැත්නම් මේ රටේ ඉතිහාසය වෙනස් වෙනවා. එදා රාත්‍රියේ ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු විවිධ කණ්ඩායම් ඇවිල්ලා පාර්ලිමේන්තුව වට කරලා අල්ලා ගත්තා නම්, ප්‍රචණ්ඩත්වය තුළ අද අපි කවුරුත් නැහැ. එහෙම නම් අපිව එදා මරනවා. ඒ ගැන හංගන්න දෙයක් නැහැ. අපේ ගෙවල් ගිනි තියලා, එක මන්ත්‍රීවරයෙක් පාරේ යන කොට මරා දමලා කරපු විනාශය තමයි මේ රටේ නැවත නැවත - තව දවසකදී - සිදු වෙන්නේ. ඒ නිසා බොරු සිල්ලර කරුණුවලට කථානායකවරයාට එරෙහිව චෝදනා එල්ල කරන්නේ නැතිව, මේ රට වැටී තිබෙන තත්ත්වයෙන් ගොඩ ගැනීම සඳහාත්, මේ රට ප්‍රචණ්ඩත්වයෙන් තොරව ප්‍රජාතන්ත්‍රවාදය රකින රටක් කරන්නත් මේ ගරු සභාවේ සිටින විද්වතුන් කල්පනා කරන්නට ඕනෑ.

අපි ගරු කථානායකතුමාගෙනුත් ඉල්ලා සිටිනවා, එම්.එච්. මොහොමඩ් කථානායකතුමාගේ කාලයේ පාර්ලිමේන්තුව පාලනය කළේ කොහොමද කියලා බලන්න කියලා. ඒ ගැන ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමා දන්නවා. මොකද, එතුමාගේ පියා කථානායක ලෙස සිටියා. කථානායකවරුන් මේ විධියට විපක්ෂ නායකතුමාට හෝ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට නටන්න දීපු පාර්ලිමේන්තුවක් ඉතිහාසයේ තිබුණේ නැහැ.

"ආසියාතික දේශපාලනයේ හැරවුම් ලකුණ" යන කෘතියේ අබ්දුල් කලාම් සඳහන් කර තිබෙන කාරණා ටිකක් කියලා මම මගේ කථාව නතර කරනවා. අබ්දුල් කලාම් කියන්නේ ශ්‍රේෂ්ඨ විද්වතෙක්, ඉන්දියාවේ හිටපු ජනාධිපතිවරයෙක්. එතුමාගේ කෘතියේ සඳහන් කර තිබෙනවා, "ගෞරවනීය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි, විශේෂයෙන් ම තරුණ මන්ත්‍රීවරුනි, මා ඔබ හමුවන සෑම අවස්ථාවක ම ඔබ තුළින් මා දකින්නේ මහත්මා ගාන්ධි, ආචාර්ය රාජේන්ද්‍ර ප්‍රසාද්, පණ්ඩිත් ජවහර්ලාල් නේරු, සර්දාර් පටෙල්, සුබාෂ් චන්ද්‍රබෝස්, ආචාර්ය අම්බෙඩ්කාර්, අබ්දුල් කලාම් අසාද්, රාජාජී සහ අපේ ජාතියේ බොහෝ ශ්‍රේෂ්ඨ විචක්ෂණශීලී නායකයින්ගේ සාදාකාලික ව දැල්වෙන ආධ්‍යාත්මික ජීව

ගුණයයි. ඔබට වඩා ඉහළින් ජාතිය නංවාලිය හැකි ආකාරයේ දැක්මක් සහිත නායකයින් වන්නට ඔබටත් පුළුවන් ද? ඉන්දියාවේ ශ්‍රේෂ්ඨයින් අතර කෙනෙකු වන්නට ඔබට පුළුවන් ද? ඔව්, ඔබට පුළුවන්.

වර්ෂ 2020ට පෙර ඉන්දියාව ආර්ථික වශයෙන් සමෘද්ධිමත්, ප්‍රීතිමත්, ශක්තිමත් හා ආරක්ෂා සහිත රටක් බවට පරිවර්තනය කිරීමේ ශ්‍රේෂ්ඨ මෙහෙවර උදෙසා නායකත්වය ලබා දෙමින් පාර්ලිමේන්තුව ප්‍රාණවත්භාවයට පත් කළ හැකි නම් ඒ උදාරතර තත්ත්වය ඇති කිරීමට ඔබට පුළුවන. එම තත්ත්වය ඇති කිරීමට නම්, ගෞරවනීය මන්ත්‍රීවරුනි, ඔබට විසල් අරමුණක් තිබිය යුතුවාක් මෙන් ම පාර්ලිමේන්තුව තුළදී සහ ඉන් බාහිරවත් රට, ජාතිය වෙනුවෙන් වැඩ කළ යුතු ය. කටයුතු සම්පාදනයේ දී ලසු ව විසිරී ගිය මානසික තත්ත්වයෙන් අත්මිදී රටත් ජාතියත් වෙනුවෙන් ශ්‍රේෂ්ඨ, නිර්භීත හා ජවසම්පන්න මෙහෙවරක් ඉටු කිරීම වෙනුවෙන් ඉතිහාසය ඔබ සදාකාලික ව ස්මරණය කරනු ඇත" යනුවෙන්.

ඒ නිසා මේ තීරණාත්මක පැයේදීත් මේ ව්‍යවස්ථාදායකය වඩා වගකීම් සහගත ව්‍යවස්ථාදායකයක් බවට පත් කරන්න මේ කථානායකතුමා යටතේ අලුත් ආරම්භයක් ඇති කර ගන්න පුළුවන් වේවා කියා පතමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. C.B. Rathnayake. You have ten minutes.

[අ.භා. 12.35]

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon.C.B. Rathnayake)
අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මේ උත්තරීතර සභාවේ මුල් පුටුවට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා මේ රටේ පාර්ලිමේන්තුව තවත් අරාජික කිරීම සඳහා මාන බලන අවස්ථාවක් හැටියට අපි මෙය දකිනවා. මේ කාරණය ගැන කථා කරද්දී අපේ රට කොතැනද දැන් තිබෙන්නේ කියන එක ගැන කවුරුවත් කල්පනා කරන්නේ නැහැ. බලය අරමුණු කරගෙන, බලය සඳහා කෑදරකමින්, බලය ලබා ගැනීම සඳහා චරිත ඝාතනය කරමින් -චරිත විනාශ කරමින්- එකිනෙකා ඇන කොටා ගන්නා තැනට පත් වෙලා. බලව් මිනිසුනේ, මේ මාතෘ භූමිය තිබෙන තැනින් ගොඩ ගැනීම සඳහා අපි කුමක් අරබයා, කුමක් කළ යුතුද කියලා. අපි කවුරුවත් රටේ තත්ත්වය අවබෝධ කර ගන්නේ නැහැ.

දෙකෝටි විසි ලක්ෂයක් වන ජනතාවගේ අභිලාෂ සහ ස්වකීය නැඟීටීමේ අභිමතය ක්‍රියාත්මක කරන්න සූදානම් විය යුතු අවස්ථාවකයි අපි සිටින්නේ. එවන් අවස්ථාවක එකිනෙකාට ඇඟිල්ල දිගු කරනවා, මේ රටේ ආර්ථිකය එක පරපුරක් විනාශ කළා කියලා. විවෘත ආර්ථිකයත් එක්ක ගොඩනැඟීගෙන ආ අපේ ස්වයං ආර්ථිකය නැති කරගත් සමාජයක් බවට මේ සමාජය පරිවර්තනය වුණා. ඒ පරිවර්තනය වෙනවා වාගේම අරගළ කරමින්, උද්ඝෝෂණ කරමින් අපේ ආර්ථිකය පසුබෑමකට ලක් කරපු වාර අනන්තයි. ඒ වාගේම අපේ රටේ ජාතික සම්පත් විනාශ කරලා දැම්මා. ඒ නිසා මේ රට ඉස්සරහට ගෙන යන්න තිබුණු අවස්ථාව අපෙන් ගිලිහිලා තිබෙනවා.

1971දී පැවති අරගළයේදී අවි ආයුධ අරගෙන ක්‍රියාත්මක වෙද්දී එයට එදා මුහුණ දුන්නේ ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යවරිය වන ගරු සිරිමාවෝ බණ්ඩාරනායක දිවංගත අග්‍රාමාත්‍යතුමියයි. ඒ වෙලාවේ එතුමිය යම් තීන්දුවක් ගත්තා. ඒ තීන්දුව අරගෙන රට එක්සේසත් කිරීමේ වැඩ පිළිවෙළට යන්න අවස්ථාව, අවකාශය සලසා ගත්තා. ඒ විතරක් නොවෙයි. ඒ කාලයේ මිනිසුන්ව මරලා, මිනිසුන්ගේ දේපළ කොල්ලකාලා, මිනිසුන්ගේ හැකියාවන් සහ අයිතීන්, මානව හිමිකම් මොන විධියට උල්ලංඝනය කෙරුවාද කියලා අතීතයේ හිටපු අය දන්නවා. කැලය මාරු කළාට කොටියාගේ පුල්ලි මාරු වෙලා නැහැ කියන එක මම මේ අවස්ථාවේදී මේ රටේ සමස්ත ජනතාවටම කියන්න ඕනෑ.

පසුගිය කාලයේ අරගළය ක්‍රියාත්මක කරනකොට ගෙවල් අසූ ගණනකට ගිනි තියලා, එක ජීවිතයක් උදුරාගෙන මිනිසුන්ට අඩන්තේට්ටම් කරන්න ඔවුන්ට බලය ලබා දුන්නේ කවුද? ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් විධායකයට අත තියලා ව්‍යවස්ථාදායකයටත් අත තියන්නයි ආවේ. ඒ වෙලාවේදී අසරණ වුණු කෙනෙක් තමයි, කථානායකතුමා. ඒ වෙලාවේ කථානායකතුමා තනි වුණා. කථානායකතුමාට ඒ අවස්ථාවේ තීන්දු-තීරණ ගන්න බැරි වුණා. අනෙක් අයගේ ගෙවල් ගිනි තියලා හෙම්බත් වෙලා තිබුණු වෙලාවක එතුමා නිවැරැදිව තීන්දු ගන්න පාර්ලිමේන්තුවට ආවා. ඒ ආපු අවස්ථාවේදී පාර්ලිමේන්තුවට ගිනි තියන්න හැදුවේ, එදා මිනිසුන් මරලා, රටේ ජනතාවගේ මානව හිමිකම් උදුරා ගත්ත උදවියයි.

ජනතා විමුක්ති පෙරමුණ මේ පාර්ලිමේන්තුවට ගිනි තියන්න, ඒ විතරක් නොවෙයි, ශ්‍රේෂ්ඨාධිකරණයට ගිනි තියන්න, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගිනි තියන්න සූදානම් වුණු කාල වකවානුවක් තිබුණා. ඒ අවස්ථාවේ මේ ආර්ථික අර්බුදයට, මේ ආර්ථික විනාශයට ගත යුතු තීන්දුව මොකක්ද කියලා නොවෙයි බැලුවේ, සුන්දර වචන පමණක් පාවිච්චි කළා. එලෙස සුන්දර වචන පාවිච්චි කරලා මේ ආර්ථිකය ගොඩගන්න සැලසුම් ක්‍රියාත්මක කරලා තිබෙනවාද, සැලසුම් ලබා දීලා තිබෙනවාද කියන ප්‍රශ්නය අද අපට තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අද විපක්ෂ නායකතුමා මේ ගෙනැල්ලා තිබෙන කාරණය ගැනත් මම ඉතාම කනගාටු වෙනවා. එතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න ඇහුවා විතරක් නොවෙයි, මේ පාර්ලිමේන්තුව පටන් ගත් දවසේ ඉඳලාම පැය ගණනාවක් පාර්ලිමේන්තුවේ කාලය නාස්ති කළා. එසේ කාලය නාස්ති කළා වාගේම, දෛනික න්‍යාය පත්‍රයට අනුව වැඩ කරන්න ගියාම ඒ සඳහාත් පැය ගණනාවක් ගතවෙලා තිබෙනවා. ඒ අවස්ථාවල කථානායකතුමාත් එතුමාට අවස්ථාව සලසා දුන්නා. Point of Order එකක් - රීති ප්‍රශ්නයක් - ඉදිරිපත් කරන වෙලාවක ඒ සඳහා අවස්ථාව සලසා දුන්නා මිසක් කථානායකතුමාත් කාලය කළමනාකරණය කර ගත්තේ නැහැ. සමහර වෙලාවට ඒ පිළිබඳව නම් ගැටලුවක් තිබෙන්නට ඇති. නමුත්, කථානායකතුමාට ඉතාම ශ්‍රේෂ්ඨ දේශපාලන ජීවිතයක් තිබෙනවා.

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ජනාධිපතිතුමා විධියට සිටියදී හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අක්කර 50ක් රුපියල් 100ට ලබා දෙනකොට, වර්තමාන කථානායකතුමා බිම් අඟලක්වත් ලබා නොගෙන පාර්ලිමේන්තුවෙන් අයින් වෙලා මේ රටේ ජනතාවට ඒ අවකාශය සලසා දෙන්න ඕනෑය කියන කතන්දරය කියලා තිබුණා.

එතුමාගේ පවුලේ උදවිය විවිධ තනතුරු සඳහා පත් කර ගත්තා කියලා විශාල පිරිසක් චෝදනාත්මකව කථා කරලා තිබෙනවා.

[ගරු සී.බී. රත්නායක මහතා]

විශේෂඥ වෛද්‍යවරු, ඉංජිනේරුවරු, ඒ වාගේම දක්ෂ නීතිඥවරු, ඒ වාගේම හිටපු දේශපාලනඥයෙක් තමයි එහෙම පත් කරගෙන තිබෙන්නේ. ඔවුන්ට ලබා දුන් වැටුප සහ ඔවුන් පත්කර ගත් ආකාරය පිළිබඳ පත්‍රිකාව මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

ඔබතුමන්ලා මේ පත්‍රිකාව කියවලා බලන්න. දේශපාලනඥයෙකු හැටියට එතුමාට දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ, ඒ වාගේම කෘෂිකර්ම අමාත්‍යාංශය තුළ එතුමා විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. එසේම කෘෂි වගාවන්වලින් අධික අස්වැන්නක් ලබා ගත්තාම වර්තමාන ජනාධිපතිතුමා පවා මොකක්ද කළේ? මත්තල ගුවන් තොටුපළේ වී තොග ගොඩගැසුවේ නැද්ද? අස්වැන්න කළමනාකරණය කර ගැනීම සඳහා එවැනි අවස්ථා සලසාගෙන කටයුතු කළේ නැද්ද?

පොලිස්පතිතුමා පත් කර ගැනීමේදී ගත්තා වූ ක්‍රියාමාර්ගය ගැන කථා කළොත්, තමන්ගේ පක්ෂ ගොඩනඟන්න, තමන්ගේ පක්ෂ ඉදිරියට අරගෙන යන්න වියදම් කරන නිසාම රාජ්‍ය නොවන සංවිධානවල, කුඩුකාරයින්ගේ, පාතාල සාමාජිකයින්ගේ මුදල්වලට යටවෙලා -ඒ මාෆියාවලට යටවෙලා- කථානායකතුමාට පහර ගහන්න මේ අය සූදානම් වෙලා ඉන්නවා. ව්‍යවස්ථානුකූලව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගත්තා වූ තීන්දුව වැරදියි කියලා තර්ක කරන්න උත්සාහ ගත්තත්, ඒ තර්කය වැරදුණු තැන ඉඳලා වෙන විධියකට ක්‍රියාත්මක වෙන්න මේ අය සූදානම් වෙනවා. නීතිඥ මහත්වරු අද ඒ පිළිබඳව තර්ක විතර්ක ගෙනහැර පෑවා. එසේ ගෙනහැර පෑ තර්ක විතර්කත් එක්ක කථානායකතුමා නිවැරදි තීන්දුවක් අරගෙන තිබෙනවා, ඒ නිවැරදි තීන්දුවත් එක්ක ඉදිරියට යන්න සූදානම් වෙලා තිබෙනවා. ඒ නිසා අපි පාර්ලිමේන්තුව තුළ කථා කරනකොට, සමහර වෙලාවට ජනප්‍රිය මාතෘකාවක් අරගෙන කාට හෝ මඩ ගැහුවොත්, එසේ මඩ ගහපු එක තමයි news එකක් වෙන්නේ. රටේ අභිවෘද්ධිය සඳහා, රටේ අනාගතය සඳහා, රටේ ඉදිරි සැලැස්ම සඳහා, අනාගත දූ දරුවන් වෙනුවෙන් ගන්නා වූ තීන්දුවක් පිළිබඳව අපි කථා කරනවා නම්, මේ අය ඒ පිළිබඳව කථා කරන්නේ නැහැ. මේ රටේ හොඳ දේශපාලනඥයෙකු, නිහතමානී දේශපාලනඥයෙකු හැටියට ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මැතිතුමා මාත් එක්ක එකඟ වෙනවා ඇති. එතුමා මම ගරු කරන පුද්ගලයෙක්. ඔබතුමාගේ පොත එළිදක්වන දවසේ මට එන්න බැරි වුණා, මම එදා ලංකාවේ හිටපු නැති නිසා. මම මේ වෙලාවේ ඒ කාරණයත් මතක් කළ යුතුව තිබෙනවා. නමුත් මේ කාරණයේදී අපි එකට අත්වැල් බැඳගෙන, මේ රටේ ආර්ථිකය ගොඩනඟාගෙන ඉස්සරහට යා යුතු වෙනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. දිවංගත සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මේ පාර්ලිමේන්තුවේදීම කිව්වා, නිහතමානී ලෙස රටේ ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව කථා කරන්න, නමුත් එකිනෙකාට මඩ ගහන්න එපා කියලා. මම 1994 වර්ෂයේ ඉඳලාම පාර්ලිමේන්තුවේ සිටින කෙනෙක්. පාර්ලිමේන්තුවේ සිටින කෙනෙක් හැටියට මම ඉතාම වගකීමෙන් කියනවා, අපි එකිනෙකාට චරිත ඝාතනය කරන එක නොවෙයි කළ යුත්තේ කියා. මහජනතාවගේ ප්‍රශ්න ගැනයි අපි කථා කරන්නේ. ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මන්ත්‍රීතුමනි, අපි කථා කරන්නේත්, ඒ වාගේම ඔබතුමා කථා කරන්නේත් මහජනතාවගේ ප්‍රශ්න. විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ මහජනතාවගේ ප්‍රශ්න ගැන කථා කරනවා කියලා තමයි කිව්වේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

එතුමා කථා කළේ නැහැ, එතුමාගේ අක්කා සල්ලි අච්චු ගහපු එක ගැන. ඒ වාගේම එතුමා කිසිම වෙලාවක කථා කළේ නැහැ, දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමාට දෝෂාභියෝගයක් ගෙනාපු වෙලාවේ එතුමාගේ මැණියන් රාත්‍රී ඇඳුමෙන් ගිහිල්ලා මුම්ටාස් මහලේ පඩි පෙළේ ඉඳගෙන කථා කරපු එක ගැන. ඒ නිසා හැමෝගෙම කිල්ලෝටවල හුණු තිබෙනවා. ඒවා ගැන කථා කරන්නේ නැතිව රට අරාජික කරන්න, රටේ ජන ජීවිතය අඩාළ කරන්න, එක්සත්ව, එක්සිත්ව සිටින සිංහල, දමිළ, මුස්ලිම් කියන සියලුදෙනා ශ්‍රී ලාංකික මාතාවගේ දරුවෝ කියන එක නතර කරන්න ගන්නා වෑයමේ අස්වැන්න නෙළා ගන්නේ කවුද කියන ප්‍රශ්නය මතු කරමින් මට මේ අවස්ථාව සලසා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The Hon. (Dr.) Sarath Weersekera, please. You have nine minutes.

[අ.භා. 12.44]

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂය විසින් චෝදනා දෙකක් මත කථානායකතුමාට එරෙහි විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙන බව අපි දන්නවා. පළමුවැනි චෝදනාව තමයි, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පත - Online Safety Bill එක - පාර්ලිමේන්තුවෙන් සම්මත වුණාට පස්සේ ඒක ගැඹුරින් සලකා බලන තෙක් සහතික නොකරන ලෙස පක්ෂ නායකයින් කථානායකතුමාගෙන් ඉල්ලා සිටියදීත් එතුමා එය අත්සන් කළාය කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තවශයෙන්ම අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79වැනි ව්‍යවස්ථාවේ සහ ස්ථාවර නියෝග අංක 74 යටතේ ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා, පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව විසින් සම්මත වූ විගසම කථානායකතුමා විසින් අත්සන් කළ යුතුයි කියලා. එහෙම කළේ නැත්නම් තමයි එතුමා වැරැද්දක් කළා වෙන්නේ. නමුත්, එතුමා එතැනදී නිවැරදිව කටයුතු කර තිබෙනවා.

Is this not a democracy? Do people not have rights? If those officers have only been accused, that is another matter. You can say that they have only been accused, but not convicted. But, here, it is a conviction. So, purely on that matter, I have lost confidence in the Speaker. I am sorry, I am really sorry to say that; it is not the man, but the position. He wields so much power. We found out during the Debate in this House that the Hon. Speaker did not actually cast his casting vote at the Constitutional Council, he did not. The Hon. Lakshman Kiriella specifically stated that. And, it was much later that he wrote to the Hon. President saying that it was a 5: 4 vote.

Sir, there are many other issues that I wish to take up, but I am in no mood to do so because this is not something I enjoy doing; this is something that I do not enjoy doing, but I am doing it because it has to be done.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

So, it is on that basis and many other things that I support this Vote of No Confidence against the Speaker of Parliament.

Thank you very much.

**ගරු මුලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Douglas Devananda. You have 12 minutes.

[பி.ப. 1.41]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා (ධීවර අමාත්‍යතුමා)**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா - கடற்றொழில் அமைச்சர்)
(The Hon. Douglas Devananda - Minister of Fisheries)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கௌரவ சபாநாயகர் மஹிந்த யாப்பா அபேவர்தன அவர்களுக்கு எதிராக எதிர்க்கட்சியினரால் கொண்டு வரப்பட்டுள்ள நம்பிக்கையில்லாப் பிரேரணை தொடர்பிலும், தற்போது நாட்டில் நிலவுகின்ற பிரச்சினைகள் தொடர்பிலும் எனது கருத்துகளை முன்வைப்பதற்கு வாய்ப்பு வழங்கியமை தொடர்பில் முதலில் உங்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

நிகழ்நிலைக் காப்புச் சட்டமூலத்துக்கு கௌரவ சபாநாயகர் அவர்கள் கையொப்பமிட்டதானது, அரசியலமைப்பையும் நாடாளுமன்ற நிலையியற் கட்டளைகளையும் மீறிய செயற்பாடென்றும், அவர் உயர் நீதிமன்றத்தை அவமதித்திருப்பதாகவும் தெரிவித்தே எதிர்க்கட்சியினரால் இந்த நம்பிக்கையில்லாப் பிரேரணை கொண்டுவரப்பட்டுள்ளது. அதேநேரம் 2024ஆம் ஆண்டின் 9ஆம் இலக்க, நிகழ்நிலைக் காப்புச் சட்டமானது, அவசர அவசரமாகக் கொண்டுவரப்பட்டதாகவும் ஒரு கதை புனையப்பட்டு இருக்கின்றது. 2016ஆம் ஆண்டு நீதிச் சேவை ஆணைக்குழுவினூடாக இதற்கான சட்ட வரைவு தயாரிக்கப்பட்டது. அத்துடன், சிங்கப்பூரில் செயற்பட்டு வருகின்ற 11 சமூக வலைத்தளங்களின் முகவர்களுடனும் இது தொடர்பில் பேச்சுவார்த்தைகள் மேற்கொள்ளப்பட்டிருந்தன. இதன்போது சமூக வலைத்தளங்களுக்கான சுய ஒழுக்கக் கோவையை அறிமுகப்படுத்துவதாக அந்த முகவர் நிறுவனங்கள் தெரிவித்திருந்தபோதிலும், அது சாத்தியமாக்கப்படாத நிலையில்தான் இந்தச் சட்டம் சுய ஒழுக்கக் கோவையை முதன்மைப்படுத்தி இயற்றப்பட்டிருக்கிறது.

நாடாளுமன்றத்தால் சட்டங்களை இயற்றுகின்ற ஏற்பாடுகள் சட்டமா அதிபர் திணைக்களம் மற்றும் சட்டவரைஞர் திணைக்களம் என்பவற்றுடன் இணைந்ததாகவே முன்னெடுக்கப்படுகின்றன. இதன்போது உயர் நீதிமன்றத்தின் தீர்ப்புக்கு மாறாக அல்லது அரசியலமைப்புக்கு முரணாகச் செயற்படக் கூடிய வாய்ப்புகள் இல்லை என்றே கருத முடியும். அந்த வகையில், உயர் நீதிமன்றத் தீர்ப்பின் பிரகாரம், சட்டமா அதிபர் திணைக்களம் அதனை உறுதி செய்ததன் பின்னரே இந்த நிகழ்நிலைக் காப்புச் சட்டமூலம் நிறைவேற்றப்பட்டுள்ளது என்பதை ஏற்றுக்கொள்ள வேண்டும். அதன் அடிப்படையிலும், அரசியலமைப்பின் 78(1) மற்றும் (2), 79ஆம் உறுப்புரைகளின் அடிப்படையிலும் மிகச் சரியாகவே கௌரவ சபாநாயகர் அவர்கள் 2024ஆம் ஆண்டின் 9ஆம் இலக்க, நிகழ்நிலைக் காப்புச் சட்டமூலத்தில் கையொப்பமிட்டுள்ளார். இந்தச் சட்டமூலம் நிறைவேற்றப்பட்டது நாடாளுமன்ற உறுப்பினர்களால் என்பதையும் கௌரவ சபாநாயகரால் அல்ல என்பதையும் நாம் மனதில் கொள்ளவேண்டும்.

மேலும், பொலிஸ்மா அதிபராக தேசபந்து தென்னக்கோன் அவர்கள் நியமிக்கப்பட்டமை தொடர்பிலும் கௌரவ சபாநாயகர் அவர்கள் அரசியலமைப்பை மீறியுள்ளதாக எதிர்க்கட்சியினரால் தெரிவிக்கப்பட்டுள்ளது. அரசியலமைப்புப் பேரவையில் அங்கம் வகிக்கின்ற எட்டு உறுப்பினர்களில் நான்கு உறுப்பினர்கள் பொலிஸ்மா அதிபர் நியமனத்துக்கு ஆதரவு தெரிவித்தும், இருவர் எதிர்ப்புத் தெரிவித்தும், இருவர் வாக்களிப்பிலிருந்து விலகியிருந்த நிலையிலுமே, பெரும்பான்மை ஆதரவுடன் புதிய பொலிஸ்மா அதிபர் நியமிக்கப்பட்டுள்ளார் என்பது தெளிவாகவே தெரிய வருகின்றது. அந்த வகையில், கௌரவ சபாநாயகர் அவர்கள் சரியான முறையிலேயே இதனை மேற்கொண்டுள்ளார் என்பதில் எந்தவிதச் சந்தேகமும் இல்லை.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அடுத்து இன்னொரு முக்கிய விடயம் தொடர்பில் எனது கருத்துகளை முன்வைக்க விரும்புகின்றேன். இந்த நாட்டில் வாழுகின்ற இந்துக்களுக்கிடையில் மட்டுமல்ல, மத சுதந்திரத்தை மதிக்கின்ற அனைத்து மக்களுக்கிடையேயும் மனக் கசப்பையும் விரக்தி நிலையையும் ஏற்படுத்தியிருக்கின்ற விடயம் தொடர்பில் - வவுனியா, நெடுங்கேணி, வெடுக்குநாறி மலையிலுள்ள ஆதிசிவன் ஆலயத்தில் கடந்த சிவராத்திரி தினத்தன்று இடம்பெற்ற சம்பவம் தொடர்பில் - கூற விரும்புகின்றேன்.

மகா சிவராத்திரி என்பது, மாசி மாத கிருஷ்ணபட்ச - தேய்பிறை - சதுர்த்தசி திதியில் இரவில் வழிபடுகின்ற சிவனுக்குரிய விரதமாகும். சிவராத்திரி என்பதற்கு 'மங்களகரமான இரவு', 'இன்பம் தரும் இரவு' எனவும் பல்வேறு பொருள்கள் உண்டு. ஆனால், எமது மக்களுக்கு அமங்களமான இரவாகவும், துன்பம் தரும் இரவாகவும் இந்த வருட சிவராத்திரி அமைந்துவிட்டது. ஏனென்றால், வெடுக்குநாறி மலை ஆதிசிவன் ஆலயத்தில் பக்தர்கள் வழிபாடுகளை மேற்கொள்வதற்கான அனுமதி இருக்கின்ற நிலையில், இரவில் வழிபாடுகளை மேற்கொள்ள முடியாதென பொலிஸார் அதனைத் தடுத்திருப்பதும், சப்பாத்துக் கால்களுடன் ஆலய வளவுக்குள் நுழைந்து, அங்கிருந்த பூஜைப் பொருட்களை அப்புறப்படுத்தியிருப்பதும் ஏற்றுக்கொள்ள முடியாத செயற்பாடுகளாகும். மேலும், வழிபாடுகளுக்கெனச் சென்றவர்கள்மீது தாக்குதல் நடத்தியமையும், அவர்களை அங்கிருந்து வெறியேற்றிய முறையும், பூஜைகளை இடைநடுவில் நிறுத்தியமையும் மிக மோசமான மிலேச்சத்தனத்தையே எடுத்துக்காட்டி நிற்கின்றன.

இந்தச் சம்பவமானது, மதங்களுக்கிடையில் கசப்புத் தன்மையைத் தோற்றுவிக்கின்ற அதேவேளை, தேசிய இன நல்லிணக்கத்துக்கும் பாதிப்பை ஏற்படுத்தும். ஒரு பக்கத்தில் பொலிஸாரின் செயற்பாடுகள் இவ்வாறிருக்க, அங்கு சென்றிருந்த சிறு அரசியல் குழுவினரின் செயற்பாடுகளும் நிலைமையை மோசமாக்கி இருக்கின்றது என்பதையும் நான் இங்கு தெரிவித்துக்கொள்ள வேண்டும். தங்களது சுயலாப அரசியலை எல்லா இடங்களிலும் பயன்படுத்த முடியுமென எதிர்பார்த்துக்கொண்டு இருக்கின்ற இத்தகைய அரசியல் குழுவினர், எமது மக்களைப் பகடைக்காய்களாகப் பயன்படுத்தி வருவதையே நோக்கமாகக் கொண்டவர்கள். தேர்தல் காலங்களின்போது பல பொய்யான வாக்குறுதிகளை வழங்கி, எமது மக்களை ஏமாற்றி, வாக்குகளை அபகரித்துக்

கொள்கின்ற இவர்கள், அந்த வாக்குறுதிகளை நிறைவேற்ற வாய்ப்புகளற்ற நிலையில், மக்களைத் திசை திருப்புகின்ற வகையில், எமது மக்களைத் தூண்டிவிட்டு குளிர்காயும் நிலைமைகளை உருவாக்குவதையே இலக்காகக்கொண்டு செயற்பட்டு வருகின்றனர். எனவே, இவர்களிடம் எமது மக்கள் மிகவும் ஜாக்கிரதையாக இருக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

மேற்படி வெடுக்குநாறிமலைச் சம்பவம் தொடர்பில் ஒரு குழுவை அமைத்து, சுயாதீனமானதொரு விசாரணையை ஆரம்பிக்குமாறு கடந்த அமைச்சரவைக் கூட்டத்துக்கு முதல் நடைபெற்ற அமைச்சரவைக் கூட்டத்தில் நான் கோரிக்கை விடுத்திருந்ததுடன், அதனை எழுத்துமூலம் மாண்புமிகு ஜனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்களிடமும் கையளித்துள்ளேன். இது தொடர்பில் மாண்புமிகு ஜனாதிபதி அவர்கள் சாதகமான முடிவொன்றை எடுப்பார் எனவும் நம்புகின்றேன். கைதுசெய்யப்பட்டவர்கள் நீதிமன்றத்தால் விடுவிக்கப்பட்டதிலிருந்து அவர் சாதகமாக நடந்துகொண்டிருக்கிறார் என்பதையும் அறியக்கூடியதாக இருக்கின்றது. அதற்காக மாண்புமிகு ஜனாதிபதி அவர்களுக்கு நான் இந்தச் சந்தர்ப்பத்தில் நன்றி கூறுகின்றேன்.

இறுதியாக, நான் இங்கு இன்னுமொரு விடயத்தைத் தெரிவிக்க விரும்புகின்றேன். உணவுப் பாதுகாப்பு, எமது மக்களுக்கான வாழ்வாதாரங்களைப் பெருக்குதல், தேசிய உற்பத்தியை அதிகரித்தல், ஏற்றுமதிமூலம் அதிகளவு அந்நியச் செலாவணியை நாட்டுக்குள் கொண்டுவருதல் போன்ற நோக்கங்களின் அடிப்படையில் நாம் எமது கடற்றொழில் அமைச்சினூடாக கடற்றொழில் கைத்தொழிலையும், நீர் வேளாண்மையையும் பரவலாகவும் அதிகரித்த அளவிலும் மேற்கொண்டு வருகின்றோம். இத்தகைய நிலையில், எமது மக்கள் பொருளாதார நிலையில் மேம்பாடு அடையக்கூடாது எனவும், அவர்கள் அரசியல் ரீதியிலும் வாழ்வாதார ரீதியிலும் தங்களுக்கு அடிபணிந்தே இருக்க வேண்டும் எனவும் எண்ணுகின்ற சில தரப்பினர், எமது முன்னெடுப்புகளுக்குக் குந்தகம் விளைவிக்கின்ற வகையில் செயற்பட்டு வருவது தொடர்ந்துகொண்டு இக்கின்றது. இத்தகைய நிலையில், வடக்குக் கடலை பல்தேசியக் கம்பனிகளுக்குத் தாரைவார்க்கப் போவதாக ஒரு கட்டுக் கதையையும் இத்தரப்பினர் கட்ட விழ்த்து விட்டுள்ளனர்.

"யானையைப் பார்த்த குருடர்கள் போல்" இந்த அரசியல் வாதிகள் இந்தப் பிரச்சினைகளைப் பார்த்து, சுயமாக வியாக்கியானம் செய்து, அதில் குளிர்காய முற்படுகின்றனர். வடக்கில் எமது அமைச்சானது, அவ்வப் பகுதிகளில் செயற்படுகின்ற கடற்றொழிலாளர் சங்கங்கள், பிரதேச செயலாளர்கள், தேசிய நீர்வாழ் உயிரின அபிவிருத்தி அதிகாரசபை, தேசிய நீர்வளங்கள் ஆய்வு மற்றும் அபிவிருத்தி முகவர் நிறுவகம், கரையோரப் பாதுகாப்புத் திணைக்களம் போன்றவற்றின் அனுமதிகள் மற்றும் சிபாரிசுகளின் அடிப்படையில், உள்ளூர் உற்பத்தியாளர்களுக்கே கடலட்டைப் பண்ணைகள், கடல்பாசி செய்கைகள், நண்டு வளர்ப்பு, இறால் வளர்ப்பு, மீனின உற்பத்தி போன்ற செயற்பாடுகளை மேற்கொள்வதற்கு வாய்ப்பளித்து வருகின்றது. இத்தகைய செயற்பாடுகளின் போது எந்தவொரு சிறு கடற்றொழில் கைத்தொழிலாளர்களுக்கும் பாதிப்பு ஏற்படாத வகையிலேயே வேலைத் திட்டங்கள் முன்னெடுக்கப்பட்டு வருகின்றன. எம்மிடம் இருக்கின்ற வளங்களை நாம் சரியான முறையிலும், உச்ச பயனைப் பெறத்தக்க வகையிலும் பயன்படுத்தி வருகின்றோம். இதுவரை காலமும் ஒரு சிலர் வசமிருந்து வந்த கடலட்டை உற்பத்தி நடவடிக்கைகளை நாம் பலர் மத்தியில் விரிவுபடுத்தி இருக்கின்றோம். இதில் எந்தவொரு வெளிநாட்டவரும் ஈடுபடுத்தப்படவில்லை என்பதை நான் இந்தச் சபையில் ஆணித்தரமாகக் கூறிவைக்க விரும்புகின்றேன்.

இந்திய இழுவைமடி வலைப் படகுகளின் எல்லை தாண்டியதும், அத்துமீறியதும், தடைசெய்யப்பட்ட கடற் றொழில் உபகரணங்களைக் கொண்டதுமான கடற்றொழில் முறைமையால் பாதிக்கப்பட்டு வருகின்ற வடக்கு கடற் றொழிலாளர்களின் நிலைமையை உலகுக்கு எடுத்துக்காட்டும் வகையில், யாழ்ப்பாண மாவட்ட கடற்றொழிலாளர்கள் முன்னெடுத்து வருகின்ற உணவுத் தவிர்ப்புப் போராட்டமானது இன்று மூன்றாவது நாளாகவும் தொடர்கிறது. இந்த விடயம் தொடர்பில் நாங்கள் சட்டரீதியான நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றோம். நேற்றும்கூட, யாழ்ப்பாணக் கடற்பரப்பில் மூன்று இந்திய இழுவைமடி வலைப் படகுகள் கடற்படையினரால் பிடிக்கப்பட்டு இருக்கின்றன. அதே போன்று, மன்னார் கடற்பரப்பிலும் இரண்டு இந்திய இழுவைமடி வலைப் படகுகள் பிடிக்கப்பட்டு இருக்கின்றன. அதேநேரம், தமிழ்நாடு மற்றும் பாண்டிச்சேரி மாநிலங்களின் கடற்றொழில் துறை சார்ந்த அமைச்சர்களோடு நான் தொலைபேசியூடாக கலந்துரையாடல் ஒன்றையும் மேற்கொண்டு வருகிறேன். அதேபோல், இவ்விரு மாநிலங்களைச் சேர்ந்த முதலமைச்சர்களும் இப்பிரச்சினை தொடர்பில் என்னுடன் கலந்துரையாட வேண்டுமென்ற கருத்தையும் முன்வைத்திருக்கிறார்கள். அந்தக் கலந்துரையாடல் விரைவில் நடக்குமென நான் எதிர்பார்க்கின்றேன். தற்பொழுது அங்கு தேர்தல் அறிவிக்கப்பட்டுள்ளதால் சிலவேளைகளில் அதில் காலதாமதம் ஏற்படலாம்.

இன்றைய தினம் இச்சபையில் உரையாற்றிய தமிழ் நாடாளுமன்ற உறுப்பினர் ஒருவர், தமிழ் நாடாளுமன்ற உறுப்பினர்கள் கொல்லப்பட்டது சம்பந்தமாகக் கருத்துத் தெரிவித்திருந்தார். நாடாளுமன்றத்தில் அங்கம்வகித்த தமிழ் உறுப்பினர்கள் அல்லது தமிழ்க் கட்சித் தலைவர்கள் அல்லது தமிழ்ப் பிரதிநிதிகள் யாரால் கொல்லப்பட்டனர் என்பது அவருக்குத் தெரியும்! இருந்தும் அவர் இந்தச் சபையைத் தவறாக வழிநடத்தும் வகையில் கூறிய கருத்துகளை நான் கண்டிக்கின்றேன். நாடாளுமன்ற உறுப்பினர்கள் அல்லது தமிழ்க் கட்சித் தலைவர்கள் அல்லது தமிழ்ப் பிரதிநிதிகள் யாரால் கொல்லப்பட்டனர் என்பது உலகுக்கும் தெரியும் என்பதைக் கூறி, வாய்ப்புக்கு மீண்டும் நன்றி தெரிவித்து, எனது உரையை முடித்துக்கொள்கின்றேன். வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Lalith Ellawala. You have 12 minutes.

[අ.භා. 1.52]

**ගරු ලලිත් එල්ලාවල මහතා**
(மாண்புமிகு லலித் எல்லாவல)
(The Hon. Lalith Ellawala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඇත්තටම කනගාටු වෙනවා, අපි හැම දාම අවසානයේදී කථා කරනකොට අපේ කාලය ගොඩක් අඩුවීම සම්බන්ධයෙන්. මොකද, මට මුලින්ම විනාඩි 8ක් දීලා තිබුණා. තිලක් රාජපක්ෂ මන්ත්‍රීතුමාටත් විනාඩි 8ක් දීලා තිබුණා. තිලක් රාජපක්ෂ මන්ත්‍රීතුමා එතුමාගේ වේලාවත් අරගෙන මට කථා කරන්න කිව්වා. ඒ අනුව මට විනාඩි 16ක් ලැබෙන්න ඕනෑ. නමුත්, මට ලැබී තිබෙන්නේ විනාඩි 12ක් පමණයි. හැම දාම අපි අවසානයේදී කථා කරනකොට මේක තමයි

[ගරු ලලිත් එල්ලාවල මහතා]

සිදු වෙන්නේ. මන්ත්‍රීවරුන්ට කථා කරන්න තිබෙන කාලය කළමනාකරණය කර ගන්න බැරිවීම තමයි කථානායකවරුන්ට තිබුණු ප්‍රධානම ප්‍රශ්නය. ඒක නිසා මින් ඉදිරියටවත් මේ වාගේ දේවල් වෙන්න ඉඩ තියන්න එපා කියා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය ගැනත් මතක් කරන්න ඕනෑ. අපි වර්තමාන කථානායකතුමාට එරෙහිව තමයි දැන් විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙන්නේ. නමුත්, අපි අහලා තිබෙනවා, මෙතෙක් හිටපු කථානායකතුමන්ලා ඉතාම ගෞරවනීය විධියට සභාව පාලනය කළා කියලා. ගරු අනුර බණ්ඩාරනායක මැතිතුමා, ගරු වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමා, ගරු කේ.බී. රත්නායක මැතිතුමා කථානායකවරු වශයෙන් වාගේම ගරු ගාමිණී ෆොන්සේකා මැතිතුමා නියෝජ්‍ය කථානායකවරයෙකු වශයෙන් ගෞරවනීය විධියට මේ ගරු සභාව පාලනය කළා කියලා අපි අහලා තිබෙනවා.

ඇත්තටම වර්තමාන කථානායකතුමා පිළිබඳව වාගේම එතුමා මේ කරන වැඩ පිළිවෙළ පිළිබඳවත් අපි කනගාටු වෙනවා. මොකද, මට පෙනුණු විධියට වර්තමාන කථානායකතුමා සාමාන්‍යයෙන් මන්ත්‍රීවරු 134දෙනෙකුට විතරයි මේ පාර්ලිමේන්තුවේ කථානායක වෙලා තිබෙන්නේ. අපි ඒක හැම වෙලාවේදීම දකිනවා. අපි කථානායකතුමාගෙන් හැම දාම ඉල්ලපු දෙයක් තමයි 225දෙනාටම කථානායක වෙන්න කියන එක. ඒ නිසා තමයි මේ වාගේ වැරදි තීන්දු ගන්න වෙලා තිබෙන්නේ. අද රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා කථානායකතුමාට හිටගන්න කිව්වොත් එතුමා හිට ගන්නවා; වාඩි වෙන්න කිව්වොත් වාඩි වෙනවා. ඒ වාගේ කථානායකවරයෙක් තමයි අද වෙනකොට ඉන්නේ. එතුමාට මේ වාගේ කථානායකවරයෙක් වෙන්න සිදු වෙලා තිබෙන්නේ ඇයි? ඒ වෙන මුකුත් නිසා නොවෙයි. මම ඒවා ගැන කියන්න යන්නේ නැහැ. මේ දවස් දෙක, තුන තුළ ඒ ගැන අපට පැහැදිලි වුණා. කථානායකතුමාට තිබෙන වරප්‍රසාද, ඒ පවුලේ අයට තිබෙන වරප්‍රසාද නැති වෙයි කියන භයට ජනාධිපතිතුමා එතුමාට හිට ගන්න කිව්වොත් හිට ගන්නවා; වාඩි වෙන්න කිව්වොත් වාඩි වෙනවා. ඒ නිසා තමයි අද මේ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ. අද කථානායකතුමාටත් එරෙහිව මෙවැනි විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න හේතුව ඒකයි. ඒ නිසා මම ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ දවස් ටිකේ ගරු මන්ත්‍රීවරු කථානායකතුමා ගැන කියපු දේවල් ගැන කල්පනා කරලා කරුණාකරලා විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් ඡන්දය පැවැත්වීමට පෙර ඉල්ලා අස් වෙන්න කියලා. මේ පාර්ලිමේන්තුවට, මේ පාර්ලිමේන්තුවේ 225දෙනාටම අගෞරවයක් තමයි මේ කථානායකතුමා මේ කාලය තුළදී සිදු කරලා තිබෙන්නේ. ඒ නිසා ඒ ගැන අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. එතුමා මේ විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් පැවැත්වෙන ඡන්ද විමසීමෙන් ජයග්‍රහණය කරයි. ඒකට හේතුව මේකයි. මේ 134දෙනාගෙන් වැඩිදෙනෙක් ජනාධිපතිතුමා හිටගන්න කිව්වොත් හිට ගන්නවා; වාඩි වෙන්න කිව්වොත් වාඩි වෙනවා. හෘදය සාක්ෂියට එකඟව නොවෙයි වැඩි පිරිසක් මේකට ඡන්දය දෙන්නේ. වැඩි පිරිසක් ඡන්දය දෙන්නේ තමන්ට ලැබුණු නියෝගය අනුවයි. ඇයි, එහෙම කරන්න හේතුව? තමන්ගේ වරප්‍රසාද නැති වෙයි කියන භයට තමයි වැඩි පිරිසක් මේ විධියට ඡන්දය පාවිච්චි කරන්නේ. ඒ නිසා අපි හොඳටම දන්නවා, මේ මොන වැරදි තිබුණත්, මේ මොන දේ පාර්ලිමේන්තුව තුළදී කථා කළත් කථානායකතුමා විශ්වාස භංග යෝජනාවෙන් ජයග්‍රහණය කරනවා කියලා. මේ වෙනකොටත් ජනාධිපතිතුමා ආණ්ඩු පක්ෂයේ සියලුදෙනාට පැහැදිලිව කියා තිබෙනවා, මේ විශ්වාස භංග යෝජනාවට විරුද්ධව ඡන්දය දෙන්න කියලා. විදේශගතව ඉන්න අයවත් අද මේ ගරු සභාවට ගෙන්වලා තිබෙනවා. ඒ නිසා එතුමන්ලා මේ ඡන්දය ජයග්‍රහණය කරන එක ගැන සැකයක් නැහැ. මම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් පැහැදිලිව ඉල්ලන්නේ හෘදය සාක්ෂියට එකඟව ඡන්දය දෙන්න කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මම දකින විධියට මේ විශ්වාස භංග යෝජනාව ගැන දවස් තුනක් සාකච්ඡා කරන්න දෙයක් නැහැ. මේ ගැන සාකච්ඡා කරන්න එක දවසක් තිබුණා නම් ඇති. එක දවසකින් මේක ඉවර කරන්න තිබුණා. කෝටි ගණන් වියදම් කරලා මේ වාගේ දෙයකට දවස් තුනක කාලයක් අරගන්න අවශ්‍ය නැහැ. මීට වඩා ප්‍රශ්න මේ රටේ තිබෙනවා. එක දවසකින් මේක ඉවර කරන්න තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ ගොඩක් මන්ත්‍රීවරුන්ට -මම අපේ කළුතර දිස්ත්‍රික්කය ගැන කථා කරන්නේ - මේ වෙනකොට බාර් පර්මිට් දීලා තිබෙනවා. අද ඡන්ද ගන්නේ මේ වාගේ දේවල් දීලායි. කළුතර දිස්ත්‍රික්කයේ පානදුරේ පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ පිළිරුව අසල බාර් එකක් දාන්න අනුමැතිය දීලා තිබෙනවා. අද අපේ සංස්කෘතිය, සදාචාරය -මේ සියල්ල- විනාශ වෙන විධියට මේ කටයුතු කරනවා. මොන නායකයාද, මොන මන්ත්‍රීවරයාද, මොන මුදල් ඇමතිවරයාද මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ පිළිරුව අසල අරක්කු බාර් දාන්න පර්මිට් දෙන්නේ? මම මේ අවස්ථාවේදී ජනාධිපතිතුමාට කියනවා, කරුණාකර මෙය වහාම නවත්වන්න, මන්ත්‍රීවරුන්ට බාර් පර්මිට් දෙන එක නවත්වන්න කියලා. අද කළුතර දිස්ත්‍රික්කයට බාර් පර්මිට් දීම නිසා බණ්ඩාරගම ආසනයට විතරක් මේ වනකොට බාර් පර්මිට් 5ක් දීලා තිබෙනවා. පානදුර ආසනයේත් දීලා තිබෙනවා. මේවායින් තමයි ඡන්ද ගන්න උත්සාහ කරන්නේ. ජනාධිපතිතුමනි, මේවා කරන්න එපා. ගෞරවනීය ස්වාමීන් වහන්සේලා සහ අන්‍යාගමික පූජකතුමන්ලා මාරාන්තික උපවාස කරන්න බලාගෙන ඉන්නවා, ඒවා විවෘත කළොත්.

මේ විශ්වාස භංග ගැන නොවෙයි අපි කථා කරන්න ඕනෑ. රටේ විශාල දූෂණ, වංචා සිද්ධ වෙනවා. ඒවා ගැනයි අද කථා කරන්න ඕනෑ. මම මේ සභාවට සහ ගරු කථානායකතුමාට කියා සිටින්නේ මේ රටේ සිදු වන දූෂණ, වංචා ගැන මේ වාගේ දවසක් දෙකක් නොවෙයි සතියක් හරි කථා කරලා විසඳුම් දෙන්න ඕනෑ කියන එකයි. අපේ රටේ ආයතන අරගෙන බලන්න. ඒවායේ මොන තරම් දූෂණ, වංචා වෙනවාද කියලා බලන්න. උදාහරණයකට ජනතා වතු සංවර්ධන මණ්ඩලය ගන්න. මේවා තමයි විවාදයට ගන්න ඕනෑ. අද ජනතා වතු සංවර්ධන මණ්ඩලය අන්ත දූෂිත තැනක් වෙලා. එහි සභාපති ලෙස ඉන්නේ කවුද? බුවනෙක අබේසූරිය කියලා විශ්‍රාමික ගුවන් හමුදා නිලධාරියෙක්. මේවා තමයි ගෝඨාභය රාජපක්ෂ මහත්තයා කළ ලොකුම වැරදි. ඒ නිලධාරියා රජයේ සමහර මැති ඇමතිවරුන්ගේ අනුග්‍රහය ඇතිව කරන දේවල් බලන්න. මේ වෙලාවේ ගරු සභාවේ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා සිටියා නම් හොඳයි. මේ වෙනකොට හන්තාන වතු යායේ අක්කර 22ක භූමි ප්‍රමාණයක් ඉනෝකා ජයරත්න කියන මහත්මියට දෙන්න සියලු කටයුතු සූදානම් කරලා තිබෙනවා. මම මේ වෙලාවත් දූෂණ ගැන කථා කරන්න පාවිච්චි කරනවා. මොකද, මම හිතනවා මේ විශ්වාස භංග යෝජනාව දවස් තුනක් තිස්සේ විවාද කළ යුතු එකක් නොවෙයි කියලා. ඒ නිසා මේ දූෂණ ගැන කථා කළ යුතුයි. මේවා ගැන තමයි අපි හෙළි කරන්න ඕනෑ. මම තමුන්නාන්සේලාට කියනවා අපි මේවා ගැන කථා කරමු, කථා කරලා විසඳුම් දෙමු කියලා.

හන්තාන වතු යායේ ඒ අක්කර 22 දෙන්නේ කොහොමද? මිලියන 100කට වැඩි අත යට ගනුදෙනුවකුත් එක්ක තමයි එය දෙන්නේ. ජනවසමෙන් මොකක්ද කරන්නේ? මේවාට නඩු දානවා. නඩු දාලා ටික කාලයක් ගිහින් නඩුව ඉල්ලා අස් කර ගන්නවා. ඒ ඉල්ලා අස් කරගන්න හේතුව මොකක්ද? මේ

හොරකම, දූෂණය, වංචාව කරන්නම ඕනෑ නිසා අද ඒ සභාපතිවරයා මොකක්ද කරන්නේ? නීති නිලධාරියා හැටියට පත් කර ගන්නවා තමන්ගේ පුංචි අම්මාගේ, මාමාගේ පුතාව. ඒ කියන්නේ තමන්ගේ මස්සිනාව. ඒ හැම නඩු වාරයකටම රුපියල් 60,000කට වඩා නීති නිලධාරියාට දෙනවා. ඊට පස්සේ නීති නිලධාරියා මොකක්ද කියන්නේ? ටික කාලයක් ගිහින් නීති නිලධාරියා කියනවා "මේ ඉඩම අපට අයිති නැහැ" කියලා. එහෙම කිව්වාම අර නඩුව දාපු කෙනාට ඉබේම ඉඩම අයිති වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා නිකම් නොවෙයි කරන්නේ අත යට ගනුදෙනුවට. අපට දැනගන්න තිබෙන විධියට මේ ඉඩම සම්බන්ධව මිලියන 100කට වැඩිය අත යට ගනුදෙනු වෙලා තිබෙනවා. මේකට උදවු කරන්නේ හන්තාන වතුයායේ සුදේෂ් පෙරේරා නමැති කෙනෙක්. ඔහු හන්තාන වතු යායේ ගනුදෙනුව වෙනුවෙන් සෘජුවම පෙනී සිටින කෙනෙක්. අධ්‍යක්ෂ මණ්ඩලයේත් ඉන්න, හන්තාන වතු අධිකාරී සුදේෂ් පෙරේරා තමයි සම්පූර්ණයෙන් මේ ගනුදෙනුව යට ඉන්නේ.

මෙන්න මේවා නවතින්න ඕනෑ. ඒ වාගේම, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයිති වොක්ෂෝල් පටුමගේ පර්චස් 60කට වැඩි ප්‍රමාණයක් මේ වෙනකොට රුපියල් මිලියන 40ක අත යට ගනුදෙනුවකට මිස්ටර් ජේන්ට් නම් පුද්ගලික ආයතනයේ හිමිකරුවෙකුට දෙන්න සූදානම් කර තිබෙනවා. මේ වාගේ විශාල නාස්තියක්, දූෂණයක් වෙනවා. ඒ වාගේම එහි ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙනවා. මේ වෙනකොට ඒ ජල ව්‍යාපෘතියත් දෙන්න යනවා. මේවා ගැන කථා කරනකොට ඒ කථා කරන නිලධාරියාව මාරු කරනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, අබේකෝන් කියන නිලධාරියා, ජී.ඩී. කුසුම් කාන්තිලතා මහත්මිය කියන අයව අද මේවායෙන් ඉවත් කරනවා, විශ්‍රාම ගන්වනවා. නැත්නම් ඒ අයව interdict කරනවා. මේ ගැන කථා කරන සියලු දෙනා අයින් කරනවා. මේ වාගේ දේවල් තමයි මේ සභාපතිවරු එකතු වෙලා සම්පූර්ණයෙන් කරන්නේ.

මේ ජල ව්‍යාපෘතිය සම්පූර්ණ කරන්න භාර දීලා තිබුණේ ජේ.කේ.එන්.එල්. ජයනෙත්ති කියන මහත්මයාට. එතුමා මේක කරගෙන යනකොට එතුමාව අයින් කළා. මේකේ ජල ලීටර් 120,000කට වඩා තිබෙනවා. මේකෙන් ජලය බෝතල් 17,000ක් හැදුවත්, මාසයකට රුපියල් 510,000කට වඩා මේ ජනවසමට ලැබෙනවා. අද මට මේවා එකින් එක කියන්න වෙලාවක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විධියට ජනවසමේ සභාපතිවරයා රුපියල් කෝටි ගණන් විනාශ කරනවා. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අයත් මේ ජනවසමට මේ වාගේ ආයතන, අධ්‍යක්ෂ මණ්ඩල 6ක් තිබෙනවා. මෙන්න මේවා ගැනයි අපි කථා කරන්න ඕනෑ. මේකට අධ්‍යක්ෂ මණ්ඩල 6ක් ඕනෑ නැහැ. එක අධ්‍යක්ෂ මණ්ඩලයක් තිබුණා නම් ඇති. මේ හයටම මුදල් නාස්ති කරනවා. මේ මුදල් කාගේද? ජනතාවගේ මුදල් මේ නාස්ති කරන්නේ. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ මේවා නවත්වන්න කියලායි. එක ආයතනයක තොරතුරු විතරයි මම මේ කිව්වේ. රට වටේම මේ වාගේ දූෂණ, වංචා වෙනවා. දවසක් නොවෙයි සතියක් අරගෙන මේවා ගැන කථා කරලා මේවා නවත්වන්න වැඩ පිළිවෙළක් හදන්න. මේ සභාපතිවරු, මේගොල්ලෝ එකතු වෙලා විනාශ කරන්නේ ජනතාවගේ මුදල් කියන එකත් මම මතක් කරනවා. අවසාන වශයෙන් මම කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, ලජ්ජාවක් තිබෙනවා නම් මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳ ඡන්දයට පෙර ඉල්ලා අස් අස්වෙන්න, ඉල්ලා අස්වෙලා මේ සභාවේ ගෞරවය ආරක්ෂා කරන්න කියලා. එසේ කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Nimal Lanza. You have 11 minutes.

[අ.භා. 2.05]

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

මුලින්ම, ගරු කථානායකතුමාගේ ගෞරවය ආරක්ෂා කරන්නයි අද අපි කටයුතු කරන්නේ. මොකද, ගරු කථානායකතුමාට එරෙහිව ගෙනැල්ලා තිබෙන විශ්වාස භංගය පැහැදිලි කරුණු දෙකක් යටතේයි ගෙනැවිත් තිබෙන්නේ. එකක් තමයි Online Safety Bill එක සම්මත කිරීම පිළිබඳ කාරණය. ඒ Online Safety Bill එක සම්මත කිරීමෙන් මේ රටේ දරුවන්ගේ අනාගතය, කාන්තාවන්ගේ සුරක්ෂිතතාව විශාල වශයෙන් ආරක්ෂා වෙනවා. අනෙක් පැත්තෙන්, මේ රටේ විධායකය විසින් මේ රාජ්‍ය යන්ත්‍රණයේ තිබෙන ප්‍රධානම තනතුරු පුරවද්දී ඒ තනතුරුවලට නම් නිර්දේශ කරලා එව්වාම ඒ නිර්දේශය පිළිගැනීම හෝ නොපිළිගැනීම කරන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සියලුදෙනාට අයිතිය තිබෙනවා. ඒ නිසා ගරු කථානායකතුමා ඒ අයිතිය අරගෙන එතුමාගේ තීරක ඡන්දයෙන් ඒ කටයුත්ත කරලා තිබෙනවා. ඒ කටයුත්ත කිරීම නිසා මේ රටේ රාජ්‍යය අකර්මණ්‍ය වීම, රාජ්‍යයේ වැඩ කරන්න බැරි වීම කියන සියල්ලක්ම නැති වෙලා ඒ ආයතන සහ දෙපාර්තමේන්තු හරහා මේ රට ඉතා හොඳට කරගෙන යන්න පුළුවන්කම ලැබෙනවා. ඒ නිසා කථානායකතුමාට විරුද්ධව විශ්වාස භංගයක් නොවෙයි, කථානායකතුමා කරපු කාර්යය පිළිබඳව එතුමාට ස්තුති කරලා විශ්වාසය පළ කිරීමේ යෝජනාවක් තමයි ගෙනෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය විශ්වාස භංග යෝජනාවක් ගෙනාවත් කථා කරන්න විපක්ෂයේ මන්ත්‍රීවරු සභාවේ නැහැ. මම දැක්කා මීට ඉස්සෙල්ලා ආණ්ඩු පක්ෂයේ තුන්දෙනෙකු කථා කළාට පස්සේ තමයි විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කථා කළේ. මොකද, විශ්වාස භංග යෝජනාව ගෙනාවට විපක්ෂයේ මන්ත්‍රීවරුවත් මේ සභාවේ නැහැ. එතුමන්ලා මේක ගෙනෙද්දිම දන්නවා මේකෙන් පරාද වෙනවා කියන එක. හැබැයි ඒ අය විශ්වාස භංගයක් ගෙනැල්ලා උත්සාහ කරනවා, ජනතාව අතර ආණ්ඩුවට එරෙහි යම් මතවාදයක් ගොඩ නඟන්න. මොකද, ගරු ජනාධිපතිතුමා පත් වුණාම එක කාලයක රට පුරාම හර්තාල් කරලා බැලුවා, රට පුරා උද්ඝෝෂණ කරලා බැලුවා, රට පුරා වර්ජන කරලා බැලුවා, රට පුරා විවිධ බිල්ලෝ මැව්වා, ඩොලර් එක රුපියල් 500ට යයි කිව්වා.

බැංකු ටික කඩාගෙන වැටෙයි කිව්වා. මෙවැනි විවිධ උපක්‍රම යෙදුවා. විවිධ උපක්‍රම යොදලා බැලුවා, ජනාධිපතිතුමා ගෙන යන මේ වැඩසටහන කඩාකප්පල් කරන්න පුළුවන්ද කියලා. මොකද, මේ ජනාධිපතිතුමා ගෙන යන වැඩසටහන කඩාකප්පල් කළේ නැත්නම් විපක්ෂයට බලයට එන්න බැහැ. මේ ජනාධිපතිතුමා පසුගිය අවුරුදු එකහමාරක දෙකක ඉඳන් රට ඉතාම හොඳින් කරගෙන යනවා. අද මේ රටේ ආර්ථික සංඛ්‍යා දත්ත සියල්ල හොඳ තත්ත්වයක තිබෙනවා. ඒ නිසා විපක්ෂය සෑම අවස්ථාවකම උත්සාහ කරනවා මේ තත්ත්වය කඩාකප්පල් කරන්න. විපක්ෂය මේ තත්ත්වය කඩාකප්පල් කරන්න විවිධ ප්‍රශ්න අහනවා; බොරු බිල්ලෝ මවනවා; වැඩ වර්ජන, හර්තාල් කරනවා. එහෙම කරන ගමන් දැන් කථානායකතුමාට විරුද්ධව විශ්වාස භංගයක් ගෙනැල්ලා තිබෙනවා. හැබැයි, ඔය එකකින්වත් ගරු ජනාධිපතිතුමා ගෙන යන වැඩසටහන නවත්වන්න බැහැ.

මේ විශ්වාස භංගයට පදනම් වෙලා තිබෙන කාරණා දෙක මොනවා ද? Online Safety Bill එකයි, පොලිස්පති තනතුරට පත් කිරීම සම්බන්ධයෙන් කථානායකතුමාගේ හැසිරීමයි තමයි ඒ කාරණා දෙක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි 9ක් ලැබෙනවා.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පසුගිය දවස් දෙකේම විපක්ෂයේ මන්ත්‍රීවරුන් මතු කරපු කාරණාව මොකක්ද? ඒ තමයි, ජනාධිපතිතුමා විසින් පොලිස්පති තනතුරට නිර්දේශ කරලා එවා තිබුණු පුද්ගල නාමය තීරක ඡන්දයෙන් සම්මත කිරීම නිසා කථානායකතුමා වැරැදි වැඩක් කර තිබෙනවා කියන කාරණය. මම මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙරෙහි. එහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සම්බන්ධයෙන් ඉතා පැහැදිලිව කියා තිබෙන්නේ මොකක්ද? ජනාධිපතිතුමා විසින් නිර්දේශ කරනු ලබන නමක් අනුමත කිරීම සඳහා අඩුම වශයෙන් සභාවේ පස්දෙනෙකුවත් කැමැත්ත දෙන්න ඕනෑ. එහෙම නැත්නම්, එය ප්‍රතික්ෂේප කිරීම සඳහා පස්දෙනෙක්වත් අත්සන් කරන්න ඕනෑ. ඒ හැර ඒ අයට වෙනත් දෙයක් කරන්න බැහැ.

විපක්ෂ නායකතුමාත් කිව්වා, මේ සභා ගර්භය තුළ විද්‍යුත් ඡන්දය පාවිච්චි කරන්න මන්ත්‍රීවරුන්ගේ මේස මත සවි කර තිබෙන උපකරණයේ බොත්තම් 3ක් තිබෙනවා කියලා. ඔව්, ඒකේ බොත්තම් 3ක් තිබෙනවා තමයි. හැබැයි, කොහේවත් කියලා නැහැ නේ 5 දෙනෙක් ඡන්දය දෙන්න ඕනෑ, 120 දෙනෙක් ඡන්දය දෙන්න ඕනෑ, 140 දෙනෙක් ඡන්දය දෙන්න ඕනෑ කියලා. සරල බහුතරයකින් තමයි ගොඩක් ඒවා පාර්ලිමේන්තුවේ සම්මත වෙලා තිබෙන්නේ. සමහර ඒවා නම් කරලාම තිබෙනවා, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයකින් සම්මත වෙන්න ඕනෑ කියලා. එතකොට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට පුළුවන්, එක්කෝ අදාළ කාරණයට පක්ෂ වෙන්න; එහෙම නැත්නම් විපක්ෂ වෙන්න; එහෙමත් නැත්නම් ඡන්දය නොදී ඉන්න. හැබැයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඉන්න කිසිම සාමාජිකයෙකුට එහෙම කරන්න බැහැ. එහෙම කළොත් කොහොමද රට ගෙන යන්නේ? මොකද, සාමාජිකයන් අටදෙනෙකු ඉන්න තැනක යම් කාරණයකට පස්දෙනෙකු විරුද්ධ වීම හෝ එකඟ වීම නොවුණොත්, කිසිම දෙයක් වෙන්නේ නැහැ නේ. ඒ නිසා මේ රටේ ජනතාවට අපි පැහැදිලිවම කියනවා, දැන් මේ විපක්ෂ නායකතුමා කියනවා වාගේ හෝ අනුර කුමාර දිසානායක මහත්මයා කියනවා වාගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ ඡන්දය ලබා දෙන්නේ පාර්ලිමේන්තුවේ ඡන්දය ලබා දෙන ආකාරයට නොවෙයි කියලා. මේ රටේ තිබෙන ප්‍රධානම ආයතන පවත්වා ගෙන යන්න ඒ ආයතනවල ප්‍රධානින් පත් කරමින් විධායකය විසින් එවනු ලබන නිර්දේශය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමයි ඔවුන් කරන්න ඕනෑ. හැබැයි, පොලිස්පතිවරයා පත් කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් අතරින් දෙදෙනෙක් එම නිර්දේශය පිළිගන්නේත් නැහැ, මෙතුමන්ලා කියන විධියට ප්‍රතික්ෂේප කරන්නේත් නැහැ. එතකොට රාජ්‍ය යන්ත්‍රණයට මොකක්ද වෙන්නේ? රාජ්‍ය යන්ත්‍රණය පවතින්නේ කුමක් සඳහා ද? මේ රටේ ජනතාවට සේවය කරන්නයි. එහෙම නම් මේ කඩාකප්පල් කරන්න උත්සාහ කරන්නේ මොකක්ද? ජනතාවට සේවය කරන ආයතන කඩාකප්පල් කරන්න තමයි මේ උත්සාහ කරන්නේ. ඒ සඳහා වැඩ වර්ජන කරලා උත්සාහ කළා; හර්තාල් කරලා උත්සාහ කළා; බිල්ලෝ මවලා උත්සාහ කළා; "රට කඩා වැටෙනවා" වාගේ කථා කියමින් උත්සාහ කළා. එහෙමත් බැරි වුණාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු අල්ලා ගෙන දැන් උත්සාහ කරනවා, රාජ්‍ය යන්ත්‍රණය කඩා වට්ටන්න. මේක විපක්ෂය විසින් හැමදාම කරන දෙයක්. හැබැයි, ලෝකයේ කිසිම විපක්ෂයක් මෙහෙම හැසිරෙන්නේ නැහැ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේදී නම් ඡන්දය දීමේදී බොත්තම් ඔබන්න නැහැ. විපක්ෂ නායකතුමා කිව්වා, මේ සභාවේදී ඡන්දය දෙන්න කොළ, රතු, කහ ආදි වශයෙන් බොත්තම් 3ක් ඔබන්න පුළුවන් කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එහෙම බොත්තම් ඔබන්න නැහැ. ඔබන්න නැති බොත්තමක් කොහොම ඔබන්න ද? බොත්තමක් නැත්නම්, ඔබන්න පුළුවන් ද? විපක්ෂයේ කවුරු හරි කියන්න, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මේ වාගේ බොත්තම් තිබෙනවාද කියලා. එතුමන්ලා ඉන්න පුටුවේ කහ පාට බොත්තමක් තිබෙනවාද, ඔබන්න? රතු පාට බොත්තමක් තිබෙනවාද, ඔබන්න? කොළ පාට බොත්තමක් තිබෙනවාද, ඔබන්න? නැහැ, එහෙම ඔබන්න එකක් නැහැ. හැබැයි, විපක්ෂ නායකතුමා උදේ වරුවේ මේ සභාවේදී කිව්වා නේ, බොත්තම් ටික තිබෙනවා, මේ මේ විධියට තමයි ඒවා ක්‍රියා කරවන්න ඕනෑ කියලා. එහෙම නැහැ. මේක මොන්ටිසෝරි ළමයෙකුටත් තේරෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තිබෙන්නේ, තීන්දු දෙන්න. රුපියල උඩ දාලා "නෝනා ද, පොල්ල ද?" කියලා ඇහුවාම, අපි කියන්න ඕනෑ, "නෝනා", එහෙම නැත්නම් "පොල්ල" කියලා. වෙනත් එකක් කියන්න පුළුවන්ද? විපක්ෂ නායකතුමා කියනවා වාගේ ඒ දෙකෙන් එකක් ඉල්ලන්නේ නැතුව ඉන්න පුළුවන්ද? එක්කෝ "නෝනා" ඉල්ලන්න ඕනෑ; එක්කෝ "පොල්ල" ඉල්ලන්න ඕනෑ. සමහර අය "නෝනා" ඉල්ලන්න දන්නේ නැහැ. සමහර අය "පොල්ල" ඉල්ලන්න දන්නේ නැහැ. සමහර අය නැති බොත්තම් ඔබන්න බැරි බව දන්නේ නැහැ. හැබැයි, අපි බොත්තම් ඔබන්නත් දන්නවා; "නෝනා" ඉල්ලන්නත් දන්නවා; "පොල්ල" ඉල්ලන්නත් දන්නවා. මේ එකක්වත් දන්නේ නැති අය නෝනා ගැනත් කථා කරනවා, පොල්ල ගැන කථා කරනවා, බොත්තම් ඔබන එක ගැනත් කථා කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට "නෝනා - පොල්ල" කටයුත්ත ආදේශ කළොත්, විපක්ෂ නායකතුමා කියන විධියට කහ බොත්තම, රතු බොත්තම, කොළ බොත්තම ඔබන්න බැරි බව අපි ඉතා පැහැදිලිව කියනවා. ඒ ගොල්ලන් එක් තීන්දුවක් දෙන්න ඕනෑ. මොකද, මේ රාජ්‍යය පවත්වා ගෙන යන්න, මේ රටේ ජනතාවගේ එදිනෙදා කටයුතු කරගෙන යන්න තමයි ඒ නිලධාරින් පත් කරන්නේ. ඒ නිලධාරින් පත් නොකර හිටියාම මොකද වෙන්නේ? මේ රාජ්‍ය යන්ත්‍රණය කඩා වැටෙනවා. එය කඩා වට්ටන්නයි මේ උත්සාහ කරන්නේ.

ඉතින් තමුන් කැමති නැත්නම් කියන්න එපා යැ, "අපි කැමති නැහැ" කියලා. "අපි විරුද්ධයි" කියන්න අයිතිය තිබෙනවා නේ. එහෙම කියන්නේ නැතුව ඡන්දය නොදී සිටියාම මොකක්ද වෙන්නේ? රාජ්‍ය යන්ත්‍රණය කඩා වැටෙන එකයි වෙන්නේ. විපක්ෂය ඉහතින් කියපු විධියට බැලුවා, රාජ්‍ය යන්ත්‍රණය කඩා වට්ටන්න. බිල්ලෝ මැව්වා, රාජ්‍ය යන්ත්‍රණය කඩා වට්ටන්න. හැබැයි, එය කඩා වට්ටන්න බැරිව ගියා. ඒ නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සිටින තමන්ගේ ඉත්තන් උපයෝගි කරගෙන, තමන්ගේ ගෝල බාලයන් උපයෝගි කරගෙන, විපක්ෂය විසින් පත් කරන ලද අය උපයෝගි කරගෙන රාජ්‍ය යන්ත්‍රණය කඩා වට්ටන්න, ගරු ජනාධිපතිතුමා ගෙන යන වැඩසටහන කඩා වට්ටන්න, මේ රටේ ජනතාවට යම් ආර්ථික ප්‍රතිලාභයක් එන එක කඩා වට්ටන්න උත්සාහ කරනවා. මගේ පළමුවැනි තර්කය විධියට මම ඉතා පැහැදිලිව කියනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගැන කියද්දී මේ පාර්ලිමේන්තුව උදාහරණයට ගන්න බැරි බව.

සජිත් ප්‍රේමදාස මහත්මයාටත්, අනුර කුමාර දිසානායක මහත්මයාටත් මම ඉතා පැහැදිලි අභියෝගයක් කරනවා. පාර්ලිමේන්තුවේ ඡන්ද ක්‍රමය නොවෙයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඡන්ද ක්‍රමය කියන්නේ. ඒ බව පිළිගන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ රැස්වීම පැවැත්වෙන ස්ථානයේ කොහේවත් කහ පාට බොත්තමක් නැහැ. එහි කහ පාට බොත්තමක් තිබෙනවාද? තිබෙනවා නම් ඔබන්න කියන්න. එහි කහ පාට බොත්තමක්

තිබෙනවා නම්, ඒක ඔබන්න කියන්න. ඔබන්න කහ පාට බොත්තමක් එහි නැහැ. එහෙම තිබුණා නම් කථානායකතුමාට ඔය කියන විධියට තීරක ඡන්දයක් දෙන්න බැහැ නේ. පක්ෂ විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සමාන වුණා නම් එතුමා කොහොමටත් තීරක ඡන්දය දෙනවා. එහෙම වුණේත් නැහැ. ඒ ගොල්ලන්ට එහෙම නොදී ඉන්නත් බැහැ. ඒක තමයි කථානායකතුමා නීතිපතිතුමාගෙන් උපදෙස් ගත්තාම පැහැදිලිව කිව්වේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාටවත් නිශ්ශබ්ද වෙලා ඉන්න බැහැ, ඡන්දය දීමෙන් වැළකී ඉන්න බැහැ කියලා. එක්කෝ අදාළ නිර්දේශය පිළිගන්න ඕනෑ; එහෙම නැත්නම් නොපිළිගන්න ඕනෑ. ඉහත කී පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පස්දෙනෙක් ඉතාම පැහැදිලිව අනුමැතිය දීලා තිබෙනවා. මම ඒ ගැන මීට වඩා කියන්න යන්නේ නැහැ. ගරු කථානායකතුමා ගත්තු තීන්දුව ඉතාම නිවැරදි තීන්දුවක්. එහිදී නිශ්ශබ්ද වෙලා ඡන්දය දීමෙන් වැළකී ඉන්න බැහැ. එහෙම ඉන්නවා කියන්නේ, ඒ අයත් "විරුද්ධයි" කියන එක. ඒ ඡන්ද දෙකත් එකතු කරලා තිබෙන්නේ "විරුද්ධයි" කියන ගොඩට. ඉතින් ඒක හොඳයි නේ. සාමාන්‍යයෙන් එහෙම කරන්නේ නැහැ නේ. හරි නම් "පක්ෂයි" කියන ගොඩටයි ඒවා දමා ගන්න ඕනෑ. හැබැයි එතුමා "පක්ෂයි" කියන ගොඩට ඒවා දමා ගත්තේ නැහැ. ඡන්දය දීමෙන් වැළකී හිටපු අයත් නීතිපතිතුමාගේ උපදෙස් පරිදි "විරුද්ධයි" කියන ගොඩට දාලා තමයි එතුමා තීරක ඡන්දය දුන්නේ. එහෙම වුණු එක හොඳයි. එහෙම නැත්නම් මේ රටේ ප්‍රධාන ආයතනවල ඉහළම තනතුරුවලට නිලධාරින් නැතිව යනවා. නීතියේ තිබෙන සමහර හිඩැස් උපයෝගී කරගෙන විවිධ විධියේ කඩාකප්පල්කාරී ක්‍රියා කරන්න විපක්ෂය උත්සාහ කරනවා. මම යළිත් කියන්න ඕනෑ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ඡන්දය පාවිච්චි කරන්නේ පාර්ලිමේන්තුවේ විධියට නොවෙයි කියලා. අපි දන්නවා නේ ක්‍රීඩා තරග ගැන. ක්‍රිකට් මැච් එකක් ගහන්න ගියා කියලා හිතමු. ප්‍රිමියර් ලීග් තරගාවලියකදී වුණත් ලකුණු සමාන වුණොත් ප්‍රසාද ලකුණු සමානව ලබා දෙනවා. එල්ලේ මැච් එකකදී වුණත් එහෙමයි; ෆුට්බෝල් මැච් එකකදී වුණත් එහෙමයි. හැබැයි, අවසාන මහා තරගයේදී එහෙම වෙන්නේ නැහැ. කුමන හෝ කණ්ඩායමකට ශූරතාව ලැබෙන තෙක් එම තරගය පවත්වනවා. ෆුට්බෝල් මැච් එකකදී නම්, penalties දක්වා අරගෙන යනවා. ක්‍රිකට් තරගයකදී නම් Super Over එක බැගින් යවන අවස්ථාව දක්වා අරගෙන යනවා. එල්ලේ match එකකදී අමතර පන්දු කිහිපයක් ලබා දෙනවා. මේක ඒ විධියට සමාන කරන්න බැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කියන්නේ, තීන්දුවක් නොදී ඉන්න ඕනෑ තැනක් නොවෙයි. දෙකෙන් මොකක් හෝ තීන්දුවක් දෙන්න එපායැ. තීන්දුවක් දෙන්න නම් කොන්ද පණ තිබෙන්න එපායැ. කැමැති වෙන්න හෝ අකමැති වෙන්න -ප්‍රතික්ෂේප කරන්න හෝ පිළිගන්න- කොන්ද පණ තිබෙන්න ඕනෑ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කියන්නේ ඉහළින්ම තිබෙන ආයතනයක්. අපි පාර්ලිමේන්තුවේ කථානායකතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන එක නොවෙයි කරන්න ඕනෑ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේදී ඡන්දය දීමෙන් වැළකී සිටි සාමාජිකයන් දෙදෙනාට විරුද්ධවයි එවැන්නක් කරන්න ඕනෑ. මම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගැන මීට වඩා කථා කරන්න යන්නේ නැහැ.

ගරු කථානායකතුමාට චෝදනා එල්ල කර තිබෙන අනෙක් ප්‍රධාන කාරණය තමයි Online Safety Bill එක පිළිබඳ කාරණය. තමුන්නාන්සේලා දැක්කා ද සමාජ මාධ්‍යවල බලපෑම සම්බන්ධයෙන් ඇමෙරිකාව හැසිරුණු ආකාරය? ඇමෙරිකාවේ මාර්ක් සකර්බර්ග් ගේ ෆේස්බුක් සමාජ ජාලා වෙබ් අඩවිය ඇතුළු සමාජ ජාලා වෙබ් අඩවි නිසා ඇමෙරිකාවේ දරුවන්ට තර්ජනයක් එල්ල වෙලා තිබෙනවා. සමාජ මාධ්‍ය හරහා ළමයින්ට සිදු වන බලපෑම සහ ලිංගිකත්වය නිරාවරණය කිරීම පිළිබඳව ඇමෙරිකානු කොංග්‍රසය සමාජ ජාලා වෙබ් අඩවි ප්‍රධානීන් ගෙන්වා මොකක්ද කිව්වේ? අසාධාරණයට ලක් වූ ඒ දරුවන්ගෙන්, ඒ කාන්තාවන්ගෙන් සමාව ගන්න කිව්වා. Online Safety Bill එක සම්මත කිරීමෙන් අපේ ගරු කථානායකතුමා මොකක්ද කරලා තිබෙන්නේ? මේ රටේ දරුවන් ආරක්ෂා කරන්න, මේ රටේ කාන්තා හිංසනය වළක්වන්න, කාන්තාවන් ආරක්ෂා කරන්න, ළමයින්ගේ ලිංගිකත්වය ප්‍රදර්ශනය කරලා blackmail කරන එක නවත්වා ළමයින් ආරක්ෂා කරන්න තීන්දුවක් අරගෙන තිබෙනවා. මොකක්ද තීන්දුව? තීන්දුව තමයි, ආණ්ඩුව ගෙනාපු පනත් කෙටුම්පත සම්මත වූ බව ප්‍රකාශයට පත් කිරීම. කථානායකතුමා, පනත් කෙටුම්පත් ගෙනැල්ලා නැහැ; ඒ පනත් කෙටුම්පත් සම්මත කරන්න ඡන්දය දීලාත් නැහැ.

කථානායකතුමා කරලා තිබෙන්නේ මොකක්ද? ආණ්ඩුව හොඳ පනත් කෙටුම්පතක් ගෙනාවා. ආණ්ඩුව ඒක සම්මත කළා. කථානායකතුමා ඒක සම්මත වුණා කියලා අත්සන් කළා. ආණ්ඩුව ගෙනාපු පනත් කෙටුම්පත සම්මත වුණාම අත්සන් නොකර ඉන්න කථානායකතුමාට පුළුවන්ද? මම අහනවා, විපක්ෂයෙන් මේ කාරණය. ආණ්ඩුව ගෙනාපු පනත් කෙටුම්පත සම්මත වුණාම, නීතිපතිතුමා ඒක හරියි කිව්වාම, ශ්‍රේෂ්ඨාධිකරණයටත් ගිහිල්ලා නිර්දේශ දීලා තිබෙනවා කියලා කිව්වාම, කථානායකතුමා ඒක සම්මත වුණා කියලා අත්සන් කරන එක වැරදිද? ඒ ගොල්ලන් කියපු විධියටම සංශෝධන කරලා තිබෙනවා කියලා අපේ අධිකරණ ඇමතිතුමායි, සභානායකතුමායි ඊයේ කිව්වා. නීත්‍යනුකූලව කරපු දේ, නීත්‍යනුකූලව සම්මත වුණු දේ "එහෙම වුණේ නැහැ" කියලා කියන්න කථානායකතුමාට පුළුවන්ද? මේ ගොල්ලන් කථානායකතුමාට කියන්නේ ඒක කියන්න කියලා නේ. කථානායකතුමා කරලා තිබෙන කාර්යයන් දෙකම ඉතාම නිවැරදියි. ඒ නිසා කථානායකතුමාට විශ්වාසය පළ කිරීම අපි කරනවා.

අපේ සමහර මන්ත්‍රීවරු කිව්වා, හෘදය සාක්ෂියට එකඟව කටයුතු කරන්න කියලා. අපි සම්පූර්ණයෙන් හෘදය සාක්ෂියට එකඟව තමයි කටයුතු කරන්නේ. මොකද, මේ රටේ දරුවන් ආරක්ෂා කර ගන්න, මේ රටේ කාන්තාවන් ආරක්ෂා කර ගන්න, මේ රටේ මිනිස්සු blackmail කරලා කප්පම් ගන්න එක නවත්වන්න හෘදය සාක්ෂියට අනුව කටයුතු කරන්න අපි මේ අවස්ථාවේදී තීන්දු කළා.

මම මේ කාරණය කියන්න ඕනෑ. මම හිතන විධියට කථානායකතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාව ගෙනාවේ ආණ්ඩුවට විරුද්ධව ගේන්න බැරි හින්දා. මේක ඇත්තටම කථානායකතුමාගේ පනතක් නෙවෙයි නේ. ආණ්ඩුවේ පනතක්. ඉස්සෙල්ලා ආණ්ඩුවට විරුද්ධව එක එක යෝජනා ගේන්න බැලුවා. ජනාධිපතිතුමා රට භාර ගනිද්දී විපක්ෂය මොකද කළේ? මතක නේ, පැනලා දිව්වා. "අම්මෝ! අපට නම් මේ ආර්ථිකය ගොඩ දාන්න බැහැ" කිව්වා. දැන් පේනවා, ආර්ථිකය පොඩ්ඩ පොඩ්ඩ ගොඩ එනවා කියලා. මුළු ලෝකයේම ආර්ථිකය පිළිබඳ කථා කරන ආර්ථික විශේෂඥයින් කියනවා, ජනාධිපතිතුමා පසුගිය අවුරුදු එකහමාර තුළ මේ රට තිබුණු තත්ත්වයෙන් ඉතා ඉහළ තැනකට ගෙනැත් තිබෙනවා කියලා. වෙනිසියුලාවට තවම ඒක කර ගන්න බැරි වෙලා තිබෙනවා. ආර්ජන්ටිනාවට ඒක කර ගන්න බැරි වෙලා තිබෙනවා. හැබැයි, ජනාධිපතිතුමා ඉතා මැනවින් ආර්ථිකය කළමනාකරණය කළා. විපක්ෂයට තේරෙන්නේ නැති වුණාට, මේ ලෝකයේ ඉන්න සියලු දෙනා ඒක කියනවා. විපක්ෂයේ ආර්ථික විශේෂඥයෝ ගොඩක් නැහැ නේ. ඉන්න අය පිළිගන්නවා.

ජනාධිපතිතුමා මේ රට භාර ගනිද්දී තිබුණු තත්ත්වය ගැන තමුන්නාන්සේලා පොඩ්ඩක් කල්පනා කරලා බලන්න. ජනාධිපතිතුමා මේ රට භාර ගනිද්දී රුපියල් තිබුණේ නැහැ; ඩොලර් තිබුණේ නැහැ. මේ රට ගිනි කන්දක් උඩ තිබුණේ.

[ගරු නිමල් ලාන්සා මහතා]

බංකොලොත් වුණු ආර්ථිකයක් තිබුණේ. සමාජය ආර්ථික පීඩනයක හිටියේ. ලංකා ඉතිහාසයේ දරුණුම ආර්ථික අර්බුදය ඇති වෙලා තිබුණේ. ගෑස් නැහැ; පෙට්‍රල් නැහැ; බෙහෙත් නැහැ; පොහොර නැහැ; පාසල් වහලා; ප්‍රවාහනය ඇනහිටලා; සංචිත නැහැ; යන්න එන්න විධියක් නැහැ; පාටියක් දාගන්න විධියක් නැහැ; කන්න බොන්න විධියක් නැහැ; පෙට්‍රල් ගන්න විධියක් නැහැ. සමහර තැන්වල පෙට්‍රල් තිබුණා. හැබැයි, ඒ නියමිත මිල ගණන්වලට නොවෙයි, ගිනි ගණන්වලට -රුපියල් 3,000ට, 4,000ට- තිබුණේ. ඩොලර් එක රුපියල් 500ට, 700ට යයි කියලා ඒ කාලයේ හිටපු විගණකාධිපති කිව්වා. අද මොකද වෙලා තිබෙන්නේ? අද විපක්ෂයට මේවා පේන්නේ නැහැ. එදා එහෙම තත්ත්වයක් තිබියදී පිටරට ඉන්න අයට සල්ලි එවන්න එපා කියලාත් කිව්වා. සංචාරකයින්ට මේ රටට එන්න එපා කිව්වා. හැබැයි, ජනාධිපතිතුමා මේ රට භාර ගත්තාට පස්සේ සංචාරකයින්ගේ පැමිණීම වැඩි වෙලා තිබෙනවා. විදේශ රටවල රැකියා කරන අය එවන ප්‍රේෂණ ටික එන්න එන්න වැඩි වෙලා තිබෙනවා. උද්ධමනය එන්න එන්න අඩු වෙලා තිබෙනවා. බින්දුවක් වෙච්ච සංචිත ප්‍රමාණය බිලියන හතරහමාර දක්වා වැඩි වෙලා තිබෙනවා. භාණ්ඩ මිල එන්න එන්න අඩු වෙනවා. අද විපක්ෂයට සටන් පාඨ නැහැ. එදා සටන් පාඨ තිබුණා. බෙහෙත් නැහැ කිව්වා. පෙට්‍රල් නැහැ කිව්වා. විදුලිය නැහැ කිව්වා. අද පැය 24ම විදුලිය දෙනවා. ඉස්සර QR code එකට පොඩ්ඩ පොඩ්ඩ තෙල් දුන්නේ. දැන් ඕනෑ තරම් තෙල් දෙනවා. අපි බෙහෙත් ටික දෙනවා. ගිය අවුරුද්දේ තමයි ඉතිහාසයේ පළමුවැනි වතාවට රාජ්‍ය ආයතන ගෙවන්න තිබුණු ණය සියල්ල මේ රටේ සල්ලිවලින් ගෙව්වේ. මීට ඉස්සෙල්ලා ගෙව්වේ එක්කෝ මුදල් අච්චු ගහලා. එක්කෝ ණය අරගෙන. ජනාධිපතිතුමා ඉතා විශාල වැඩකොටසක් කරගෙන යනවා. ඒ නිසා තමයි IMF එක, World Bank එක, එහෙම නැත්නම් මේ ආර්ථිකය පිළිබඳ නිර්ණායක හදන ආයතන මේ රට ගොඩ එමින් පවතිනවා කියලා කියන්නේ. මේක පිළිගන්න බැහැ විපක්ෂයට. මේක කුහකත්වයක් නැතිව පිළිගන්න ඕනෑ. ජේවීපීකාරයෝ නම් කුහකයි. අපි ඒක දන්නවා. ගම්වල ජේවීපී එකට වැඩ කරන්නේ එක්කෝ පෙත්සම්කාරයෝ, එක්කෝ කුහකයෝ, එක්කෝ ඊර්ෂ්‍යාකාරයෝ, එක්කෝ අනෙක් අයට වෛර කරන අය. හැබැයි, විපක්ෂයේ අනෙක් මන්ත්‍රීවරුන්ට එහෙම වෙන්න බැහැ නේ. එතුමන්ලාට ජේවීපීකාරයෝ වාගේ කුහකත්වයෙන් හිතන්න බැහැ. ජේවීපීකාරයෝ වාගේ වෛරය වපුරවන්නත් බැහැ නේ. අනුර කුමාර මහත්මයාට ඇවිත් ඕනෑ දෙයක් කියන්න පුළුවන්. මොකද, මොකුත් කරන්නේ නැහැ නේ. එතුමා මොකුත් නොකර ඉතාම හොඳට ජීවත් වෙනවා.

ඒ ක්‍රමය රටේ ජනතාවටත් කිව්වා නම් හොඳයි නේ. රස්සාවකුත් නැතිව, ව්‍යාපාරයකුත් නැතිව ජීවත් වෙන විධිය රටේ ජනතාවට කිව්වා නම් එතුමා මෙතැනට ඇවිල්ලා කෑ ගහන්න ඕනෑත් නැහැ නේ. නේද? එතුමා ඒ ක්‍රමය කිව්වා නම් ඉතාම හොඳයි. ගොඩක් මළ ගෙවල්වලදී අපි දැකලා තිබෙනවා, රාත්‍රියේදී මිනිස්සු 20ක්, 25ක් එකතු කරගෙන විහිළු කථා කියන උදවිය. මළ ගෙවල්වලදී රෑට ඒ වාගේ විහිළු කථා කියන වෙනම කණ්ඩායම් ඉන්නවා. එයාට රස්සාවකුත් නැහැ; ව්‍යාපාරයකුත් නැහැ. අනෙක් අය හිනා කනවා. හැබැයි, එයාගේ කථා අහන්න හුඟක් අය එනවා. ඒ නිසා අනුර කුමාර කියන්නේ නිකම්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කෙනෙක්. ඒ අය රටක් කරන්න පුළුවන් මිනිස්සු නොවෙයි. ඒක මේ රටේ මිනිස්සුන්ට ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ. මේ අයට රනිල් වික්‍රමසිංහ මැතිතුමා එක්ක හැරෙන්නවත් බැහැ. මේ රටේ ඉන්න සමහර අයට රනිල් වික්‍රමසිංහ මැතිතුමා එක්ක හැරෙන්නත් බැහැ. මොකද, ලෝකය පිළිබඳ විශාල දැනුමක් තිබෙන කෙනෙක්, එතුමා. එතුමා නිසා තමයි අපට මේ ආධාර ටික හම්බ වෙන්නේ. එතුමා නිසා තමයි මේ ආර්ථිකය ඉහළට එන්නේ. අපි, තමුන්නාන්සේලා දන්නවා, අද වන විට ඩොලර් එක රුපියල් 280ට බැහැලා කියලා. එතකොට මොකද වෙන්නේ? භාණ්ඩ මිල අඩු වෙනවා. ඉස්සර ඩොලර් එක වැඩි වෙද්දී විපක්ෂයේ ඉන්න මේ අය මොකක්ද කිව්වේ? "අම්මෝ! ඩොලර් එක වැඩි වෙනවා. සියලු භාණ්ඩවල මිල ඉහළ යනවා" කියලා කිව්වා. හැබැයි, භාණ්ඩවල මිල අඩු වෙච්ච එක ගැන අද කවුරුවත් කථා කරන්නේ නැහැ නේ. ඩොලර් එක අඩු වෙනවා කියලා අද කථා කරන්නෙත් නැහැ නේ. එහෙම නේද? අපේ සංස්කෘතියේ ලක්ෂණයක් තිබෙනවා, අපි හොඳ දේට හොඳයි කියන්න ඕනෑ; නරක දේට නරකයි කියන්න ඕනෑ. ජේවීපීකාරයෝ වාගේ කුහක වෙන්න හොඳ නැහැ. හැබැයි, මම නියෝජනය කරපු පොහොට්ටුව පක්ෂයේ ආණ්ඩුව තුළ ආර්ථික වශයෙන් විශාල ප්‍රශ්න තිබුණත්, ආර්ථිකය කඩා වැටීම තිබුණත්, රනිල් වික්‍රමසිංහ මැතිතුමා බාර ගත්තාට පස්සේ මේ රටේ ආර්ථිකය ඉතාම හොඳට ඉහළට එනවා කියන එක අපි කවුරුත් කුහක නැතිව පිළිගන්න ඕනෑ. මට පිළිගන්න පුළුවන් නම් පොහොට්ටුවේ ආණ්ඩුව තුළ අපේ රටේ ආර්ථිකය කඩා වැටුණා කියලා, ඇයි ඔබතුමන්ලාට මේ කාරණය පිළිගන්න බැරි? ඒක පිළිගන්න වෙනවා නේ, ආර්ථිකය හොඳට යද්දී. හැබැයි, ආර්ථිකය කඩා වැටෙද්දී විපක්ෂය මතු කරන කාරණා, ආර්ථිකය හොඳ වෙද්දී මතු කරන්නේ නැහැ. ඒකට තමයි කියන්නේ කුහකකම, ඊර්ෂ්‍යාව කියලා. එම නිසා ජනාධිපතිතුමාට ඒ credit එක අපි දෙන්න ඕනෑ. මොකද, එදා මේ හැමෝම, මේ රට බාර ගන්න බැහැ කියලා පැනලා දිව්වා. එදා එතුමා තමයි මේ රට බාර ගත්තේ. මේ ආර්ථිකය පිළිබඳව දන්නා අය එදා කිව්වා, "මේක නම් බාර ගන්න එපා" කියලා. හැබැයි, ඒ වෙද්දී එතුමා කොන්ද පණ ඇතිව තනිවම ඇවිල්ලා මේ රටේ ආර්ථිකය බාර ගත්තා නේ, දෙවියනේ.

ඉදිරියේදී අපේ රටේ මිනිස්සු සිංහල අලුත් අවුරුද්දට, වෙසක් උත්සවයට හැම තැනම ගමන් බිමන් යනවා එනවා. පසුගිය කාලයේ එහෙම යන්න එන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. අද ඉතාම හොඳ තත්ත්වයට මේ රටේ ආර්ථිකය හැදිලා තිබෙනවා. ඒ නිසා අපි මිනිසුන්ට ආරාධනා කරනවා, සිංහල අවුරුදු උත්සවය පවත්වන්න, වෙසක් උත්සවය පවත්වන්න, පොසොන් උත්සවය පවත්වන්න කියලා. මොකද, එම උත්සව පවත්වන්න අවුරුදු ගණනාවකින් අපට මේ පුළුවන්කම ලැබෙන්නේ. ජනාධිපතිතුමා ගෙනියන වැඩසටහන නිසා එක පැත්තකින් සංචාරකයෝ වැල නොකැඩී අපේ රටට එනවා. මේ මාසයේත් Airport එක full. වාර්තාගත ප්‍රේෂණ ටිකක් දැන් අපේ රටට එනවා. පසුගිය දවස්වල මම දැක්කා, Colombo Port City එකට ආයෝජන එන ආකාරය. මේ ආකාරයට අපේ රටට ආයෝජන එනවා; සංචාරකයෝ එනවා; ප්‍රේෂණ ලැබෙනවා; විදේශ සංචිතය ඉහළට යනවා. ආනයන ban කරලා තිබ්බ ඔක්කෝම අද විවෘත කරලා තිබෙනවා. වාහන ගෙන්වන එක විතරයි විවෘත කරන්න තිබෙන්නේ. මම හිතනවා, ඒකත් නොබෝ දිනකින් විවෘත කරලා, ඒ තිබුණු bans ඔක්කොම අයින් කරලා, මේ රට යළිත් යථා තත්ත්වයට පත් කරන්න අවශ්‍ය පසුබිම සකස් වෙයි කියලා.

කථානායකතුමාට එරෙහිව ගෙනාපු විශ්වාස භංග යෝජනාව පරාජය කරන්න අද අපි සියලුදෙනා හෘදය සාක්ෂියට එකඟව ඡන්දය ලබා දෙනවා. මොකද, කථානායකතුමා පැහැදිලිවම තීන්දු අරගෙන තිබෙන්නේ මේ රටේ ළමයි ආරක්ෂා කරන්න; ලිංගික හිංසනවලින් දරුවන් ආරක්ෂා කරන්න; ලිංගික හිංසන නිසා ඇතිවන ප්‍රශ්නවලින් ළමයි ආරක්ෂා කරන්න සහ කාන්තාවන් ආරක්ෂා කරන්න. මේ රටේ රාජ්‍ය යන්ත්‍රණය ප්‍රශ්නයක් නැතිව පවත්වාගෙන යන්න ගරු කථානායකතුමා ගත්ත තීන්දුව අපි අගය

කරන්න ඕනෑ. එතුමා සම්මත වුණු පනතට අත්සන් කරපු එක විතරයි කළේ. ඒ පිළිබඳවත් අපේ ස්තුතිය පිරිනමමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. You have six minutes.

[අ.භා. 2.25]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

මට කලින් කථා කරපු නිමල් ලාන්සා මන්ත්‍රීතුමාගේ කථාවෙන්ම මේ පාර්ලිමේන්තුවේ විකෘතිය පේනවා. එතුමා ඉඳගෙන ඉන්නේ විපක්ෂයේ. හැබැයි කථා කරන්නේ ආණ්ඩු පක්ෂයට. ආණ්ඩු පක්ෂයේ ඉඳගෙන කරන්න ඕනෑ දේවල් තමයි එතුමා විරුද්ධ පක්ෂයේ ඉඳගෙන කරන්නේ. මේ විකෘති පාර්ලිමේන්තුවේ තවත් කෙනෙක් තමයි ඒ සද්දේ දැම්මේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ මහින්ද යාපා අබේවර්ධන මැතිතුමාට නොවෙයි. මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා හොබවන කථානායක ධුරය පිළිබඳව ගෙනාපු විශ්වාස භංග යෝජනාවක් තමයි මේ තිබෙන්නේ. අපට එතුමා එක්ක කිසිම ගැටලුවක් නැහැ. පාර්ලිමේන්තුව උත්තරීතරයි කියනවා. එළියේ ඉන්න මිනිස්සු නම් කියනවා, පාර්ලිමේන්තුවේ ඉන්න එවුන් ටික ගිල්වලා මරන්න ඕනෑ කියලා. හැබැයි, මේ පාර්ලිමේන්තුව උත්තරීතරයි. පාර්ලිමේන්තුවේ තිබෙන්නේ ලක්ෂ 220ක විතර ජනතාවකගේ උත්තරීතර බලය. ඒ බලය තුළින් එන නියෝජිතයෝ ටික තමයි මේ පාර්ලිමේන්තුව තුළ ඉන්නේ. මේකේ ඉන්න මහජන නියෝජිතයන්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ටික තෝරා පත් කරලා එවලා තිබෙන්නේ එළියේ ඉන්න ඒ ජනතාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි මේ පාර්ලිමේන්තුව උත්තරීතරයි කියලා කියන්නේ. ඉතින්, මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ සිටින නායකයා තමයි කථානායකවරයා. ඒ කථානායකවරයාට ආත්ම ගෞරවයක් තිබෙන්න ඕනෑ; පෞරුෂයක් තිබෙන්න ඕනෑ; කොන්දක් තිබෙන්න ඕනෑ; අභිමතයක් තිබෙන්න ඕනෑ. ඒ සියල්ල විනාශ කරගත්ත කථානායකවරයෙක් පිළිබඳව තමයි අද අපේ විශ්වාස භංග යෝජනාව අපි මේ ආකාරයට ඉදිරිපත් කරන්නේ. එතුමා පත් වෙන්නේ පක්ෂ සහ විපක්ෂ කියන දෙපාර්ශ්වයේම ආශිර්වාදයෙන්. හැබැයි, එතුමා පක්ෂග්‍රාහී වීම නිසා -එක් පක්ෂයකට පමණක් ලැදිව, ලෙන්ගතුව කටයුතු කිරීම නිසා- එතුමාට අද එක පක්ෂයක් විරුද්ධ වෙලා තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ තවත් කණ්ඩායම් විරුද්ධ පක්ෂයට එකතු වීම නිසා එතුමාව අනුමත නොකරන මන්ත්‍රීවරුන් විශාල ප්‍රමාණයක් මේ අවස්ථාවේ දී ඉන්නවා. ඒ වාගේම අපට පෙනෙන විධියට කථානායකතුමා මූලාසනයේ ඉඳගෙන ඉන්නෙත් ටිකක් ආණ්ඩු පාර්ශ්වය පැත්තට බර වෙන්න වාගෙයි. අර කාන්දමකින් අදිනකොට වාගේ ආණ්ඩු පක්ෂයට බරවෙන්න තමයි එතුමාගේ මුහුණ හැරිලා තිබෙන්නේත්, ඇඟ හැරිලා තිබෙන්නේත්. ඒ තත්ත්වය කොයි තරම්ද කියනවා නම්, අවුරුදු 30කට පස්සේ තමයි නැවත කථානායකවරයෙකු සම්බන්ධයෙන් මේ ආකාරයෙන් විශ්වාස භංග යෝජනාවක් ගෙන එන්නේ. සාමාන්‍යයෙන්, රාජපක්ෂ පවුල දූෂිතයි, රාජපක්ෂ පවුල හොරු කියලා අපි කියනවා. එළියේ එහෙම විශාල මතවාදයක් තිබෙනවා. ඒ දූෂිතයි කියන රාජපක්ෂ පවුලේ කථානායකවරයෙකුත් මේ පාර්ලිමේන්තුවේ සිටියා. ඒ නිසා මම මහින්ද යාපා මැතිතුමාට කියන්න කැමැතියි, අඩුම තරමින් චමල් රාජපක්ෂ මහත්මයා මේ පාර්ලිමේන්තුවේ කථානායක ධුරය හොබවද්දීවත් මේ තරම් පක්ෂග්‍රාහි වුණේ නැහැ, රාජපක්ෂවරු ඇතුළු ආණ්ඩුව වෙනුවෙන් මේ තරම් කඩේ ගියේ නැහැ කියන කාරණය. චමල් රාජපක්ෂ මහත්මයාත් මීට වඩා හොඳින් හැසිරුණා කියන එක මම කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only two more minutes.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායක අපේ කිරිඇල්ල මැතිතුමා මට තව විනාඩි දෙක තුනක් දෙනවා කියලා තිබුණා. මම ඒක දැනුම් දෙන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කරුණාකර කිරිඇල්ල මන්ත්‍රීතුමාගෙන් ඒ ගැන අහලා මට දැනුම් දෙන්න.

අපි Online Safety Bill එක ගැන කියනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව දුන් තීන්දුව ගැන කියනවා, වෙනත් කථානායකවරු වාගේ නොවෙයි බැසිල් මහත්මයා දිවුරුම් දෙන්න එනකොට මේ කථානායකතුමා හිටගත්තාය කියනවා. ඒවා ගැන ඊයේ, පෙරේදා වාගේම අදත් සිදු කළ සියලු කථාවලදී කියැවුණා. මේ කථානායකතුමාට quality එකක් නැහැ කියන එක මතුවන තවත් කාරණයක් තිබෙනවා. එතුමා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ කථානායකතුමා. කරු ජයසූරිය මහත්මයා කථානායකවරයා වෙලා සිටි කාලයේ එතුමා එක්සත් ජාතික පක්ෂයේ සිරිකොත කාර්යාලයටවත් ගොඩ වුණේ නැහැ. අපේ දේශපාලන රැස්වීමකටවත් එතුමා ආවේ නැහැ. කථානායක ධුරයේ තිබෙන ගෞරවනීයභාවය එතුමා රැක ගත්තා.

මම දැන් කියන්න කැමැතියි, මේ කථානායකතුමා ගැන. මේ කථානායකතුමා දැන් වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංවර්ධන කමිටුවේ සභාපති ධුරයත් හොබවනවා. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ කථානායක ධුරයයි, එම සංවර්ධන කමිටුවේ සභාපති ධුරයයි දෙකම එතුමා දැන් හොබවනවා. මේ කථානායකවරයාගේ quality එක, එතුමාගේ පරිමාණය සොයාගන්න පුළුවන් සාධකයක් හැටියටත් මම මේ අවස්ථාවේදී මේ කාරණය ඉදිරිපත් කරනවා.

අපි දකිනවා, කථානායකතුමාට ඔළුවට දමන පළඳනාවක් - headdress එකක් - දීලා තිබෙන බව. ඒ වාගේම, කථානායකතුමාට ලෝගුවක් දීලා තිබෙනවා. මොනවාටද මේ headdress, ලෝගු දෙන්නේ? ඒවා දෙන්නේ කථානායක ධුරයට අවශ්‍ය පෞරුෂය ඒ පුද්ගලයා තුළ ගොඩනඟන්නයි. අපි දකිනවා, විනිශ්චයකාරවරුන්ටත් ඒ ආකාරයේ headdress දීලා තිබෙන බව. ඒ වාගේම එක් එක් රාජකාරිවලට අවශ්‍ය විධියට නිල ඇඳුම් දීලා තිබෙන බව. එම වෘත්තියට අවශ්‍ය වන ගෞරවය, පෞරුෂය ප්‍රදානය කරන්න, පෙන්නුම් කරන්න තමයි ඒ නිල ඇඳුම් දීලා තිබෙන්නේ. හැබැයි, අර බැටලු හම පොරවා ගත් වෘකයෙකුට සිද්ධ වෙච්ච දේ තමයි දැන් මේ සිද්ධ වෙමින් යන්නේ කියලා අපට පෙනෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over now.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මට තව කොච්චර වෙලාවක් ලැබෙනවාද? *[බාධා කිරීමක්]* ඒක දැනුම් දීලා නැද්ද?

මට තව විනාඩි කීයක් ලැබෙනවාද? ඒක ඉක්මනට කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have another three minutes.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමා මේ කථා අහගෙන ඇති කියලා මම හිතනවා. මම එතුමාට මේ කාරණය කියන්න කැමැතියි. අගමැතිවරයා මේ ගරු සභාවට එනකොට කවුරුවත් නැඟිටින්නේ නැහැ. කැබිනට් ඇමතිවරයෙක් ගරු සභාවට එනකොට කවුරුවත් නැඟිටින්නේ නැහැ. විමලවීර දිසානායක මහත්මයා ගරු සභාවට එනකොට කවුරුවත් නැඟිටින්නේ නැහැ. හැබැයි, කථානායකතුමා එනකොට මේ සභාවේ අපි කවුරුත් නැඟිටිනවා, හිස නමා ගෞරව කරනවා. ඒ ගෞරව කරන්නේ මේ පාර්ලිමේන්තුවේ එදා ඉඳලා තිබුණු උත්තරීතරභාවයට, මේ පාර්ලිමේන්තුවේ එදා ඉඳලා තිබුණු පාර්ලිමේන්තු සම්ප්‍රදායට. එහෙම කරන්නේ කථානායකවරයෙකුට ඒ ගෞරවය හිමි විය යුතු නිසා. මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා මෙතෙක් කාලයක් කථානායකවරුන් වෙනුවෙන් තිබුණු ඒ සම්ප්‍රදාය, චාරිත්‍ර, ඒ ක්‍රමවේද මේ පක්ෂග්‍රාහී වීම සහ අන්තවාදී වීම තුළ බැහැර කරනවා නම්, මේ මුළු පාර්ලිමේන්තු සම්ප්‍රදායටම එතුමා කරන්නේ අගෞරවයක්. මේ සභාවේ එතුමා ගැන පම්පෝරි ගහනවා අපි අහගෙන හිටියා; කථානායක හොඳයි, කථානායක හොඳයි, එතුමා මෙහෙමයි, අරහෙමයි කියනවා අපට ඇහුණා. සමහර විට කථානායකතුමා අද මෙම විශ්වාස භංග යෝජනාව දිනයි.

මේ වාගේම කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිවරයාට විරුද්ධවත් අපි විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කළා. වංචා, දූෂණ, බාල ඖෂධ ගැන දස අතින් චෝදනා ඉදිරිපත් වෙලා තිබෙද්දීත් මේ ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම එතුමාව ශුද්ධ කළා, එතුමා නිවැරදි කළා. එතුමා විශ්වාස භංගය දිනුවාට පස්සේ එළියට ගිහිල්ලා ජයග්‍රාහී විලාසයෙන් voice cuts දීලා තමන් ජයග්‍රහණය කළාය කියපු ආකාරය අපි දැක්කා. හැබැයි, මේ වන විට එතුමාට විරුද්ධව අධිකරණයේ නඩු පවරා තිබෙනවා. කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිවරයා මේ චෝදනාවලට වැරැදිකරුවෙක් නම්, ඒ වෙනුවෙන් අත ඔසවපු පාර්ලිමේන්තුවේ ආණ්ඩු පාර්ශ්වයේ කණ්ඩායමත් වැරදිකාරයෝ වෙන්නට ඕනෑ. ඒ විධියට අද කථානායකතුමාත් දිනයි. එතුමාව දිනවන්න තමුන්නාන්සේලා සියලුදෙනා ඡන්දය ලබා දීම මේ පාර්ලිමේන්තු සම්ප්‍රදායයට කරන අගෞරවයක් කියන එකත් මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

කථානායකතුමාට මම මේ කාරණයත් කියන්න කැමැතියි. මේ පාර්ලිමේන්තුව වාර්තා ගොඩක් පිහිටෙව්වා. ඉන් එකක් තමයි, මේ රටේ හිටපු අසාර්ථකම ජනාධිපතිවරයා වූ ගෝඨාභය රාජපක්ෂ කියන ජනාධිපතිවරයා බිහි වුණේ මේ කාල සීමාව තුළයි. ඊළඟට, හොරකම් කළ ඇමතිවරයෙක් හිරේට යැව්වේ මේ කාලසීමාව තුළයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මම තව විනාඩියකින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තනි පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක් අරගෙන පාර්ලිමේන්තුවට පැමිණ ජනාධිපති ධුරය දක්වා ගිය ජනාධිපතිවරයෙක් බිහි වුණේත් මේ කාලසීමාව තුළයි. මම කථානායකතුමාට කියන්න කැමැතියි, මේ කාරණයත්. ඔබතුමා තමන්ගේ ගෝල බාලයන්ගේ ඡන්දයෙන් විශ්වාස භංග යෝජනාව දිනයි. හැබැයි, තමුන්නාන්සේ දිහා CPU එක, අන්තර් පාර්ලිමේන්තු සංගමය - IPU එක -, යුරෝපා පාර්ලිමේන්තු සංගමය බලාගෙන ඉන්නවා. තමුන්නාන්සේගේ අපකීර්තිය මේ සියලුදෙනා අතර පැතිරෙනවා කියන කාරණයත් මම මතක් කරන්න කැමැතියි.

මම අහගෙන හිටියා, මෙන්න මේ කථාවත්. 1987 දී ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ ආණ්ඩුව කාලයේ මෙතුමාට හොඳ කොන්දක් තිබුණා ලු, ඉන්දු-ලංකා ගිවිසුමට විරුද්ධ වෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please wind up now.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මට තව පොඩි වෙලාවක් දෙන්න.

හැබැයි, මට නම් පෙනෙන්නේ නැහැ, එහෙම කොන්දක් තිබුණු බවක්. ජනතා විමුක්ති පෙරමුණ හතර වටෙන් ගහද්දී, එක්සත් ජාතික පක්ෂයේ අනෙක් මන්ත්‍රීවරු කෙළින් සිටියදී, ඒ තර්ජනවලට බියෙන් එතුමා එදා අයින් වෙලා ගියා කියලා තමයි මට නම් පෙනෙන්නේ. එදා පෙන්නුම් කළෙත් මේ කථානායකතුමාගේ කොන්ද නැති බව තමයි. මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිමල් ලාන්සා මැතිතුමා.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී කිව්වා, මම විපක්ෂය නියෝජනය කරමින් ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කථා කරනවා කියලා. එතුමාගේ නොදැනුවත්කම නිසා මම ඒක නිවැරදි කරන්න ඕනෑ. ආණ්ඩු

පක්ෂයේ ඉඳලා ස්වාධීන මන්ත්‍රීවරයෙකු විධියට තමයි මම විරුද්ධ පාර්ශ්වයට ආවේ. තවමත් ස්වාධීන මන්ත්‍රීවරයෙකු විධියට තමයි මම පෙනී සිටින්නේ. මම විපක්ෂයට ගිහිල්ලාත් නැහැ. විපක්ෂය වෙනුවෙන් මම පෙනී සිටින්නෙත් නැහැ. එතුමා එහෙම හිතාගෙන ඉන්නවා නම් ඒක වැරදියි. මම විපක්ෂය වෙනුවෙන් පෙනී සිටින්නේ නැති බව එතුමාට කියන්න ඕනෑ. ආණ්ඩුව ගෙනෙන හොඳ ඒවාට අපි හොඳයි කියනවා. නරක ඒවායේදී එහි නරක පෙන්වා දෙනවා. *[බාධා කිරීමක්]* මම එතුමාගේ නම කිව්වේ නැහැ. ඒ නිසා එතුමාට මා ගැන කථා කරන්න දෙයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමා මගේ නම කිව්වා. ඒ පිළිබඳව මම නිවැරදි කිරීමක් විතරයි කරන්නේ. මම විපක්ෂය නියෝජනය කරන්නේ නැහැ. මම ස්වාධීන මන්ත්‍රීවරයෙකු විධියටයි මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපි 4.30 p.m. වනකොට ඡන්දය පවත්වන්න ඕනෑ. The next speaker is the Hon. Chinthaka Amal Mayadunna. You have eight minutes.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයෙකුගේ නමක් යෝජනා කරන්න.

**ගරු චින්තක අමල් මායාදුන්න මහතා**
(மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன)
(The Hon. Chinthaka Amal Mayadunna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

**ගරු රෝහණ දිසානායක මහතා (ක්‍රීඩා හා යෞවන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க - விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகாரங்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Rohana Dissanayaka - State Minister of Sports and Youth Affairs)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. S.M.M. MUSZHAARAFF left the Chair, and THE HON. NALAKA BANDARA KOTTEGODA took the Chair.*

[අ.භා. 2.38]

**ගරු චින්තක අමල් මායාදුන්න මහතා**
(மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன)
(The Hon. Chinthaka Amal Mayadunna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ විවිධ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුව තුළ සම්මත කරන්න තිබෙන අවස්ථාවේ, විශේෂයෙන්ම මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ කථානායකතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා විපක්ෂයේ කණ්ඩායම උත්සාහ කරනවා, මේ උත්තරීතර ආයතනය තුළ තිබෙන ප්‍රශ්න ලෝක ප්‍රජාව හමුවට ගෙනිහිල්ලා ඒ ප්‍රජාව තුළ අපට අපකීර්තියක් අත් කර දෙන්න. විශේෂයෙන්ම අපි දන්නවා, අපේ ගරු කථානායක ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා කීර්තිමත් ලෙස දේශපාලනය කරපු නායකයෙක් බව. *[බාධා කිරීමක්]* ඒ දේශපාලන නායකයාගේ කීර්තිමත් දේශපාලන ජීවිතය විනාශ කරන්න තමයි මේ පාර්ලිමේන්තුවේ අමනෝඥ කණ්ඩායමක් එකතු වෙලා විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා මේ උත්සාහ කරන්නේ. අපට එතුමාගේ දේශපාලන ජීවිතය පිළිබඳව ගැටලුවක් නැහැ. හැබැයි, මේ පාර්ලිමේන්තුවේ හිටපු කථානායකවරු එක්ක ගත්තාම, අපි දැකපු ඉතාම හොඳ කථානායකවරයෙකු හැටියට ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමාව අපට හඳුන්වන්න පුළුවන්. *[බාධා කිරීමක්]* සමාවෙන්න, මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඔබතුමා කථානායකතුමාගේ නමවත් දන්නේ නැහැ නේ.

**ගරු චින්තක අමල් මායාදුන්න මහතා**
(மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன)
(The Hon. Chinthaka Amal Mayadunna)
ඔබතුමා සමාවෙන්නකෝ. මගේ ආණ්ඩුකාරතුමා ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා නිසා තමයි මට ඒ නම කියැවුණේ.

අපි දැකලා තිබෙනවා, ගරු විපක්ෂ නායකතුමා හැමදාම උදේට පැය එකහමාරක් දෙකක් මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කරනකොට, points of Order ගෙනැල්ලා විපක්ෂයේ කණ්ඩායම ප්‍රශ්න කරනකොට ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා ඒ අයට ඒ අවස්ථාව නිරන්තරයෙන් ලබා දීලා තිබෙන බව. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව කටයුතු කරන කථානායකවරයෙකු හැටියට එතුමා හැම මොහොතකම උත්සාහ කළේ මේ පාර්ලිමේන්තුව සමතුලිතව කරගෙන යන්නයි. විශේෂයෙන්ම මේ දින තුන තුළ එතුමාගේ පවුලේ අය සම්බන්ධ කරගෙන දේශපාලන වශයෙන් ඒ අයට මඩ ගැසීමක් කරලා, මේ රැකියා අවස්ථා ලබා දීලා තිබෙන්නේ එතුමාගේ පවුලේ උදවියට බව කියන්න විපක්ෂය උත්සාහ කළා. ඒ පවුලේ උදවිය විවිධ වෘත්තීන්වල නියැළෙන අය. නීතිඥ වෘත්තිය, වෛද්‍ය වෘත්තිය, ඉංජිනේරු වෘත්තිය ආදී වෘත්තීන්වල නියැළෙන විවිධ වෘත්තිකයන් විධියට තමයි අපි ඒ අය හඳුනන්නේ. නමුත්, විපක්ෂයේ කණ්ඩායම මේ කාරණා කියලා උත්සාහ කරන්නේ ගරු කථානායකතුමා තමන්ගේ කාර්යභාරය හරියට නොකරන, තමන්ගේ පවුලේ අයට විතරක් රැකියා අවස්ථා දීලා කටයුතු කරන කෙනෙක් කියලා කථානායකතුමා සම්බන්ධව විනිවිදභාවය පිළිබඳ ප්‍රශ්නයක් ගොඩ නඟන්නයි. සජිත් ප්‍රේමදාස මහත්තයා, අනුර කුමාර දිසානායක මහත්තයා සහ දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන්ට මේ වෙනකොට ඕනෑ කරලා තිබෙන්නේ, මේ පාර්ලිමේන්තුවේ තිබෙන උත්තරීතරභාවය නැති කරන්නයි. ඒ අයට අවශ්‍යතාව තිබෙන්නේ අද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කරන එක වළක්වන්නයි. එදා ව්‍යවස්ථාවට පටහැනිව කටයුතු කරමින් මේ පාර්ලිමේන්තුව ගිනි තියන්න හදලා, ඒ වාගේම එදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු නව ව්‍යවස්ථාවට ගිනි තැබූ මේ අය අද මෙවැනි ප්‍රශ්න ගණනාවක් ගෙනැල්ලා, විවිධ ආකාරයෙන් උත්සාහ කරනවා, මේ විශ්වාස භංග යෝජනාව තුළින් කථානායකවරයාට එරෙහිව කටයුතු කරන්න.

[ගරු චින්තක අමල් මායාදුන්න මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වැඩිදුර කථා කරන්නේ නැහැ. මොකද, කථානායකතුමා විසින් පාර්ලිමේන්තුව තුළ සිදු කරනු ලබන කාර්යභාරය රටේ ජනතාවට සජීවීව බලා ගැනීමට දැන් අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒ අනුව රටේ ජනතාවට දැකගන්න පුළුවන්, එතුමා කොයි තරම් නිරවුල්ව මේ පාර්ලිමේන්තුව හසුරුවනවා ද කියන එක.

අපි දැක්කා, එතුමාට එරෙහිව ගෙනැවිත් තිබෙන විශ්වාස භංග යෝජනාව තුළ පොලිස්පතිවරයා පත් කිරීමේ කාරණාව ගැනත් සඳහන් කර තිබෙන බව. මේ අය හැම වෙලාවේම උත්සාහ කරන්නේ මේ රට අරාජික තත්ත්වයට පත් කරලා පොලිස්පතිවරයෙකු නැති, හමුදාවන්ට අදාළ ඉහළ නිලධාරීන් නැති රටක් විධියට රටේ ආරක්ෂක තත්ත්වය සම්පූර්ණයෙන් බිඳ වට්ටන්නයි. ඇත්ත වශයෙන්ම කියනවා නම්, ටිරාන් අලස් ඇමතිතුමාටත් අපි මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම වර්තමාන පොලිස්පතිවරයා මේ වෙනකොට "යුක්තිය" මෙහෙයුම ක්‍රියාත්මක කරලා රට තුළ ක්‍රියාත්මක වන මත්කුඩු ජාවාරමෙන් බාගෙට බාගයක් අතුගා දමා තිබෙනවා. අපේ ගම්වල සිටින දරුවෝ අද වන විට මේ උවදුරෙන් ඈත්වෙලා තිබෙනවා. දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරු කියන විධියට ඔය ජාතිවාදී අදහස් තිබෙන ගම් ඇතුළේ තවම එවැනි ගැටලු තිබෙනවාද, නැද්ද කියන්න අපි දන්නේ නැහැ. හැබැයි, දිවයිනේ බොහෝ ප්‍රදේශවල විසිරී තිබුණු අයිස් ඇතුළු මත්කුඩු ජාවාරම් තුරන් කිරීම සඳහාත්, ඒ වාගේම smuggling නැවැත්වීම සඳහාත් අවශ්‍ය වැඩ පිළිවෙළ අද වන විට අපි ක්‍රියාත්මක කර තිබෙනවා. සමහර විට තමුන්නාන්සේලාට ඕනෑ කරන්නේ එදා එල්ටීටීඊ ත්‍රස්තවාදී කලබල පැවැති කාලයේ රට තුළ තිබුණු වාතාවරණය වාගේ තත්ත්වයක් නැවත ඇතිවීම වෙන්න ඇති. මොකද, එදා රටේ නීතියක් තිබුණේ නැහැ. එදා මේ රටේ දකුණේ සිටි ජනතාවට වවුනියාවෙන් එහාට යන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. නමුත්, උතුරේ හිටපු දෙමළ සහෝදරයින්ට දකුණට එන්න පුළුවන්කමක් තිබුණා. එදා දකුණේ සිටි ජනතාවට එම අවස්ථාව අහිමි කළේත් තමුන්නාන්සේලාමයි. තමුන්නාන්සේලා තවම විශ්වාස කරන්නේ දකුණේ ඉන්න සිංහල මිනිහෙකුට කවදාවත් උතුරට යන්න බැහැ කියන මතයමයි. අන්න ඒ මතය අවසන් කරගන්න හොඳ කාල වකවානුවක් අද පැමිණ තිබෙනවා. මේ රජය තුළ, මේ ජනාධිපතිතුමා තුළ ඒ සඳහා හොඳ වැඩ පිළිවෙළක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථානායකතුමාට එරෙහිව විපක්ෂය විසින් ගෙනෙන ලද මේ විශ්වාස භංග යෝජනාව පරාජයට පත් කරලා මේ විවාදය තුළින් එතුමා කෙරෙහි විශ්වාසය ගොඩනඟනවා කියන කාරණාව අසනීපයෙන් සිටියදී වුණත් මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චාල්ස් නිර්මලනාදන් මැතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.44]

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! எனக்கு 10 நிமிடங்கள் ஒதுக்கப்பட்டிருந்தது. தற்பொழுது அது 5 நிமிடங்களாகக் குறைக்கப்பட்டு இருக்கிறது. அதற்குக் காரணம், சபாநாயகர் அவர்கள் நேர முகாமைத்துவத்தைச் சரியாக மேற்கொள்ளாததுதான் என்பதை நான் இங்கு பதிவு செய்கின்றேன். இன்றைய பேச்சாளர் பெயர்ப் பட்டியலில் 10 நிமிடங்கள் என்று குறிப்பிட்டு வந்ததன் பிற்பாடு, அது குறைக்கப்படுகின்றது என்றால், அதற்குச் சபாநாயகர்தான் பொறுப்புக்கூற வேண்டுமென நான் நினைக்கின்றேன். சற்றுமுன்னர்கூட, எங்களுக்கு ஒதுக்கப்பட்டிருந்த நேரத்தைக் குறைக்கும்படி எதிர்க்கட்சித் தலைவரின் அலுவலகத்திலிருந்து பாராளுமன்ற உதவிச் செயலாளர் நாயகத்துக்கு தொலைபேசி அழைப்பு வந்துள்ளது. எனவே, எங்களுக்கென ஒதுக்கப் பட்டுள்ள நேரத்தைக் குறைப்பது தொடர்பில் எதிர்க்கட்சியும், எதிர்க்கட்சித் தலைவரின் அலுவலகமும், சபாநாயகரும் பொறுப்புக்கூற வேண்டுமென்று நான் இந்த நேரத்தில் கூறிக்கொள்கின்றேன்.

வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள 8 மாவட்டங்களி லிருந்தும் தமிழ்த் தேசியக் கூட்டமைப்பு சார்பில் பாராளு மன்றத்துக்குத் தெரிவாகி வந்துள்ள அனைத்து உறுப்பினர் களுக்குமென ஒரு நாளைக்கு வெறும் 20 நிமிடங்கள் மாத்திரமே ஒதுக்கப்படுகிறது. இன்றைய தினம் ஏற்கெனவே பேசிய தமிழ்த் தேசியக் கூட்டமைப்பின் பாராளுமன்ற உறுப்பினர் 8 நிமிடங்கள் பேசியிருந்தார். தற்பொழுது எனக்கு 5 நிமிடங்கள் வழங்கப்பட்டு இருக்கிறது. மொத்தம் 13 நிமிடங்கள்தான் வழங்கப்பட்டு இருக்கிறது. மிகுதி 7 நிமிடங் களும் குறைக்கப்பட்டிருக்கிறது.

சபாநாயகருக்கு எதிராகக் கொண்டுவரப்பட்டுள்ள நம்பிக் கையில்லாப் பிரேரணை தொடர்பான விவாதம் இன்றைய தினமும் இச்சபையில் இடம்பெறுகின்றது. என்னைப் பொறுத்தவரையில், சபாநாயகர் சபாநாயகராக நடந்து கொள்ளவில்லை. பொலிஸுக்குப் பொறுப்பான அமைச்சர் மாண்புமிகு டிரான் அலஸ் அவர்கள் தற்போது இச்சபையில் இருக்கிறார். நான் அவரிடம் ஒருசில விடயங்களைக் குறிப்பிட விரும்புகிறேன். கௌரவ அமைச்சர் அவர்களே, கடந்த சிவராத்திரி தினத்துக்கு முதல்நாள் வவுனியா, நெடுங்கேணிப் பொலிஸ் நிலையப் பொறுப்பதிகாரி - OIC - வெடுக்குநாறி மலை சிவன் கோவில் நிர்வாகத்தினரிடம், "நீங்கள் பகலில் மாத்திரம்தான் வழிபாடு செய்ய முடியும்" எனக் கூறியிருந்தார்.

சிவராத்திரி வழிபாடு என்பது, இரவில் செய்யப்படுகின்ற ஒரு வழிபாடாக இருக்கின்றபோது, அதனைப் பகலில் செய்யுமாறு பொலிஸார் கூறுவது எந்தவிதத்தில் நியாயமென நான் கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்க விரும்புகின் றேன். என்னைப் பொறுத்தவரையில், அந்த இடம் தொல் பொருளுக்குரிய இடமாக இருக்கின்றபடியால், அவ்விடத்து க்கு எந்தவித சேதமும் ஏற்படாமல் வழிபாடுகளைச் செய்யலாம். அவ்வாறுதான் அங்கு வழிபாடுகள் வழமையாக நடைபெற்றும் வந்தன.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC - Minister of Justice, Prison Affairs and Constitutional Reforms)
ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමනි, එදා ඔබතුමන්ලා පාර්ලිමේන්තුවේදී ඔය ප්‍රශ්නය අපට ඉදිරිපත් කළාට පසුව පැයක්, දෙකක් යන්න කලින් අපි ඒ ප්‍රශ්නය විසඳා දුන්නා නේ. *[බාධා කිරීමක්]* හොඳයි, ඉදිරියේදී තමයි කරන්න වෙන්නේ.

අධිකරණයේ තිබෙන කාරණයක් සම්බන්ධයෙන් මේ ගරු සභාවේදී පැයක්, දෙකක් ඇතුළත තීන්දු ගන්න බැහැ නේ. නමුත්, අපි කිව්වා නේ, ස්වාධීන පරීක්ෂණයක් කරලා, ඒගොල්ලන්ට ඇප දීමේ කටයුතු අවසන් කර දෙනවා කියලා.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ගරු ඇමතිතුමනි, නැවතත් එවැනි ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැති වන විධියට කටයුතු කරන්න.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
අපි ඒ ගැන සාකච්ඡා කරමු.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ඒ ප්‍රශ්න ටික ඇති වුණේ ඇයි කියලා මම කිව්වා.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
කමක් නැහැ කියන්න. ප්‍රශ්නයක් තිබෙනවා නම් අපි සාකච්ඡා කරලා විසඳා ගනිමු.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ආයෙත් මේ වාගේ ප්‍රශ්න ඇති වෙන්න හොඳ නැහැ නේ. ඒ නිසා තමයි මම මෙහෙම කියන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ඔබතුමන්ලා පාර්ලිමේන්තුවට එවලා තිබෙන්නේ මේවා ගැන කථා කරන්න නේ. අපි සාකච්ඡා කරලා විසඳා ගනිමු.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ඒක තමයි. අපිටත් මෙතැනදී විතරයි මේවා ගැන කියන්න පුළුවන්. ඒකයි මම මේ කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
கௌரவ அமைச்சர் அவர்களே, அங்கு பகலில் மாத்திரந்தான் வழிபாடு செய்ய முடியுமென கடந்த 7ஆம் திகதி நெடுங்கேணிப் பொலிஸார் கூறியிருக்கிறார்கள். ஆனாலும், அங்கு வழிபாடு செய்ய முடியுமென நீதிமன்றக் கட்டளை இருக்கிறது. அந்த ஆலயத்தைச் சேதப்படுத்தியதாகத் தொல் பொருள் திணைக்களத்தினர் வழக்குத் தாக்கல் செய்திருக் கிறார்கள். உண்மையில் அந்த ஆலயத்தைச் சேதப்படுத்த வில்லை. அதன் அடிப்படையில்தான் கைதுசெய்யப்பட்டவர் கள் நீதிமன்றத்தால் விடுவிக்கப்பட்டு இருக்கிறார்கள். நான் அதை வரவேற்கின்றேன்.

தென்பகுதியில் தொல்பொருளுக்குரிய இடமென அடை யாளப்படுத்தப்பட்டுள்ள ஒரு பௌத்த விகாரையில் வெசாக் பண்டிகை நடைபெறும்பொழுது, அந்தப் பிரதேசத்துக்குப் பொறுப்பான பொலிஸ் அதிகாரிகள் எவரேனும் அங்கு சென்று, "நீங்கள் இரவில் வழிபாடு செய்ய வேண்டாம்; பகலில் வழிபாடு செய்யுங்கள்!" என்று கூறுவார்களா? இல்லைதானே! வெடுக்குநாறி மலையிலுள்ள மதஸ்தலம் தொல்பொருள் அடையாளமாக இருந்தாலும், அது சிவன் கோயிலாக இருக்கின்றது. ஆகையால், எங்களுடைய மக்கள் எந்த வகையிலும் தங்களுடைய சிவன் கோயிலைச் சேதப்படுத்த மாட்டார்களென்பதை நெடுங்கேணியில் இருக்கின்ற பொலிஸ் அதிகாரிகள் புரிந்துகொள்ள வேண்டும். உண்மையில் அங்கு பொலிஸார் மக்களுக்குப் பாதுகாப்பு அளித்திருக்க வேண்டும்; கண்காணிப்பு நடவடிக்கைகளை மேற்கொண்டிருக்க வேண் டும். குறிப்பாக, அங்கு ஏதாவது சேதங்களை ஏற்படுத்து கின்றார்களா என்று பார்த்திருக்க வேண்டும். அங்கு நடந்த சம்பவத்தின் உண்மைத் தன்மையை நீங்கள் புரிந்துகொள்ள வேண்டும் என்பதுதான் என்னுடைய கருத்தாக இருக்கின்றது. எனவே, இனிவரும் காலங்களில் இப்படியானதொரு பிரச்சினை வராமல் பார்த்துக்கொள்ள வேண்டும் என்பது என்னுடைய கோரிக்கையாக இருக்கின்றது. நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Jayantha Weerasinghe, PC. You have eight minutes.

[අ.භා. 2.50]

**ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැදගත් විවාදයේදී මට අදහස් දක්වන්නට අවස්ථාව ලබා දීම ගැන මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි අද මේ ගරු සභාවට ඇවිල්ලා ඉන්නේ ගරු කථානායකතුමාගේ පෞද්ගලික ජීවිතය ඇදලා ඒ ගැන කථා කරන්න නොව එතුමා කරුණු-කාරණා දෙකක් සම්බන්ධයෙන් ගත් ක්‍රියා මාර්ග හරිද කියලා බලන්නයි.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පත සම්මත කරන දවසේ එතුමා ගෙන ගිය වැඩ පිළිවෙළ හරිද කියා බලන එකත්, පොලිස්පති පත් කිරීම සම්බන්ධයෙන් එතුමා ගත් ක්‍රියා මාර්ගය හරිද කියලා බලන එකත් තමයි ඒ කාරණා දෙක. ඒ කාරණා දෙක ගැන කථා කරනවා හැරෙන්න කෙහෙළිය මහත්තයා ගැනයි, එක එක්කෙනා ගැනයි කථා කරලා අපි මෙතැන නිකම් මඩ ගහ ගන්න අවශ්‍ය නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට ප්‍රථමයෙන් කියන්න ඕනෑ, ඒ කාරණා දෙකේදීම ගරු කථානායකතුමා ගත් ක්‍රියා මාර්ගය හරියට හරියි කියලා. මම එහෙම කියන්නේ ඇයි? අපි ඉස්සෙල්ලාම බලමු, මේ වාගේ පනතක් අවශ්‍ය වුණේ ඇයි කියන එක. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 සහ 15 කියන ව්‍යවස්ථා දෙක හොඳට බැලුවොත් භාෂණයේ නිදහස, ආගම් ඇදහීමේ නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස කියන සියල්ලම සාක්ෂාත් කරලා, සහතික කර තිබෙනවා.

[ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා]

ඒ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 සහ 15 ව්‍යවස්ථාවලින් -Articles 14 and 15 of the Constitution. මේ පනත ගෙන ඒමෙන් අදහස් කළේ මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත ගෙනෙන්න ඉස්සෙල්ලා ඕනෑම බොරුවක්, බොරු ප්‍රචාරයක් තත්පර කීපයකින් මුළු ලෝකයටම ප්‍රචාරය කරන්න හැකියාව තිබුණා කියලා ඔබතුමා දන්නවා. මේ පනත ගෙනාපු එකෙන් ඇත්තටම කළේ අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන කරුණු තවදුරටත් ශක්තිමත් කරලා, සාක්ෂාත් කරගන්න එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පතට විරුද්ධව නඩු දැම්මා. මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණයට ගියාම කරන්න ඕනෑ සංශෝධන සහිතව පාර්ලිමේන්තුවට එව්වා. ඊට වඩා සිදු විය යුත්තේ මොකක්ද? අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77 (1) අනුව්‍යවස්ථාව අනුව බැලුවොත්, පනත් කෙටුම්පතක් සම්මත කර ගන්න විශේෂ බහුතර ඡන්දයක් අවශ්‍ය නම්, ඒ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කිව්වාම කථානායකතුමා ඒ බව පාර්ලිමේන්තුවට දන්වන්න ඕනෑ. නමුත්, එහෙම දෙයක් සිදු වෙලා තිබුණේ නැහැ.

ඊළඟට, මේ පනත් කෙටුම්පතට සංශෝධන ගෙනෙන වෙලාවේ කරන්න තිබුණේ එකම දෙයයි. බලන්න, නීතිය. නීතිය අනුව එකම දෙයයි කරන්න තිබුණේ. මේ සංශෝධනවලට නීතිපති දෙපාර්තමේන්තුවේ කැමැත්ත ලැබෙනවාද කියන එක බලන්න ඕනෑ. එහෙම බැලුවා නම් එතකොට පැහැදිලිව පෙනෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණයේ නිර්ණායකයන්ට අනුකූලවයි මේ සංශෝධන සිදු කරන්නේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත සම්මත කරන වෙලාවේ මෙතැන යම් කලබැගෑනියක් ඇති වුණාම මම අපේ ආසනවලට ආසන්නව තිබෙන රාජ්‍ය නිලධාරි මැදිරිය ළඟට ගිහිල්ලා ඇහුවා, නීතිපති දෙපාර්තමේන්තුවෙන් මෙතැනට ඇවිල්ලා ඉන්නේ කවුද කියලා. එතකොට නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් විරාජ් දයාරත්න මහත්මයා කිව්වා, එතුමා තමයි අද ඇවිල්ලා ඉන්නේ කියලා.

එතුමා සාමාන්‍ය පුද්ගලයෙක් නොවෙයි, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයෙක්. එතුමාගෙන් මම ඇහුවා, මේ ගෙනෙන සංශෝධන නීතිපතිගේ අනුමැතියට යටත් වෙනවාද කියලා. එතුමා කිව්වා, "පැහැදිලිව ඒක එසේමයි" කියලා. නීතිපතිතුමාගේ අන්න ඒ සහතිකය ලැබුණාම පැහැදිලිව කථානායකතුමාට අයිතිය තිබෙනවා, ඒ කටයුතු දිගටම ගෙන යන්න. -ඒ වෙලාවේ සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා ඔතැන සංශෝධන කියවමින් හිටියා- මම ඒ බව එතුමාට දැන්වූවා, නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඒකට කැමැත්ත දීලා තිබෙනවා කියා. ඒ අනුවයි ඒ කටයුතු කළේ. ඒ ක්‍රියා මාර්ගය හරියටම හරි. එම නිසා කාටවත් කියන්න බැහැ ගරු කථානායකතුමා වැරදි ක්‍රියා මාර්ගයක් ගත්තා කියලා.

ඊළඟට, ස්ථාවර නියෝග 71, 72, 73 අනුව තමයි පාර්ලිමේන්තුවේදී ඒ පනත් කෙටුම්පත pass වුණේ. ඒවා එකක්වත් කඩ වුණාද? එම නිසා ගරු කථානායකතුමා මෙතැනදී හරියටම කටයුතු කරලා තිබෙනවා. ඒ ගැන කාටවත් දොස් කියන්න බැහැ. ඊළඟට බලන්න, පොලිස්පති පත් කිරීම. දැන් ඔය කාරණා දෙකට නේ මේ පහර ගහන්නේ. පොලිස්පති පත් කිරීම ගැන බලන කොට අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ආ) ව්‍යවස්ථාව වැදගත් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)
මම ඉක්මනට අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ආ) ව්‍යවස්ථාවේ කියලා තිබෙන්නේ, රටේ ආරක්ෂාව ඇතුළු විධායක බලය ජනාධිපතිතුමා සතුය කියලායි. නිකම් විධායක බලය කියන්නේ නැහැ. "ආරක්ෂාව ඇතුළු" කියලා කියන්නේ. රටේ ආරක්ෂාව හා විධායක බලය නිසි ලෙස පාවිච්චි කරනවාද කියලා වග කියන්න සලස්වන එක මේ පාර්ලිමේන්තුවේ අයිතියක්. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ. (2) ව්‍යවස්ථාව යටතේ මොකක්ද කියලා තිබෙන්නේ? ඒ කාරණය ගැන කවුරුත් දන්නවා. ඒකට අනුව පොලිස්පති පත් කළොත් දින 14ක් ඇතුළත ඒ බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ -Constitutional Council එකේ - සම්මත කළ යුතුයි. දින දාහතරේ දෙකක් යනවා නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ඒකටත් අවසර ගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය කෙරෙහිත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. දැන් මෙතැනදී පස්දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් මේකට කැමැත්ත දෙන්න ඕනෑ. ගොඩාක් දෙනෙක් කථා වෙන්නේ පස්දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් කැමැත්ත දෙන්න ඕනෑ නම් කොහොමද ගරු කථානායකතුමා මේක pass කළේ කියලායි. ඉතා පැහැදිලියි නේ එතුමා කරපු දේ. තීරක ඡන්දය එන්නේ කාටද කියන එක එදා මෙතැනදී ප්‍රශ්නයක් වුණේ නැහැ. ඒ සභිකයන් දෙදෙනෙක් එදා ඡන්දය දීමෙන් වැළකී සිටියා. අන්න ඒක කරන්න ප්‍රතිපාදන නැහැ. එහෙම කරන්න ප්‍රතිපාදන නැති නිසායි විරුද්ධව ඡන්දය දීපු දෙන්නෙක් හැටියට සලකා ගරු කථානායකතුමා එතුමාගේ තීරක ඡන්දය පාවිච්චි කළේ. ඒකේ කිසි වරදක් නැහැ. ඡන්දය දීමෙන් වැළකී සිටීමට හැකියාවක් තිබෙනවා කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොහේවත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)
මට මොහොතක් දෙන්න.

එම නිසා මම ඉතාම ඕනෑකමින් කියනවා, ගරු කථානායකතුමා එදා ඒ තීරක ඡන්දය පාවිච්චි කරපු එක හරියට හරි කියලා. එහෙම නැත්නම් කරන්න වෙන්නේ ව්‍යවස්ථාවම උල්ලංඝනය කරලා කටයුතු කරන්න වෙන එකයි. සති දෙකකට වඩා ගෙන යන්න බැහැ, ඒ පොලිස්පතිවරයා පත් කිරීම. මේ අවස්ථාවේදී මම කෙළින්ම කියනවා, ගරු කථානායකතුමා මේ අවස්ථා දෙකම සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර තිබෙනවා කියලා. එසේ ප්‍රකාශ කරමින් මට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මැතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.59]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්න කාරණා ගණනාවක් තිබෙනවා. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පත - Online Safety Bill එක - පිළිබඳව අපි දිගින් දිගටම කථා කළා. නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා කියනවා, ඒ පනත් කෙටුම්පතට සංශෝධන 40ක් තිබෙනවා කියලා.

ඊට පස්සේ ඒ සංශෝධන ටික පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාම සුමන්තිරන් මන්ත්‍රීතුමා නැඟිටලා කියනවා, ඇතුළත් වෙලා නැති සංශෝධන 13ක් තිබෙනවා කියලා. ඊට පස්සේ අපි ටිරාන් අලස් ඇමතිතුමා එක්කත් ඒ ගැන කථා කළාම එතුමා මට කිව්වා, මේකට අනුමැතිය දීලා තිබෙනවා කියලා. හැබැයි -ජයන්ත වීරසිංහ මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න ලැබුණු එකත් හොඳයි- මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායක් තිබෙනවා, පනත් කෙටුම්පතකට සංශෝධන ගෙනෙනවා නම්, ඒවා මේ පාර්ලිමේන්තුවේ හැම මන්ත්‍රීවරයෙකුගේම මේස මත තබන්න ඕනෑ කියලා. ඒ ගැන කියන්න තමයි, අපි කථානායකතුමාට දිගින් දිගටම "point of Order" කියලා කථා කරන්න උත්සාහ කළේ. හැබැයි, කථානායකතුමා අපේ පැත්ත පළාතවත් බැලුවේ නැහැ. ආණ්ඩුවේ කට්ටිය කථා කරලා නිකම් හිටියා. පාර්ලිමේන්තුවේ කථානායකවරයා ඉන්නේ ස්වාධීනත්වයෙන් දෙපැත්තටම සවන් දෙන්න. මේ රටේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවෙලා ඉන්නකොට එතුමාගේ අයියාව කථානායකවරයා විධියට පත් කළා. හැබැයි, එතුමාවත් මේ විධියට කටයුතු කළේ නැහැ. මම මේ ගරුත්වයක් ඇතිව කියන්නේ. එතුමා ඊට වඩා කොන්දක් ඇතිව කටයුතු කළා. ඒ වාගේම චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ කාලයේ අනුර බණ්ඩාරනායක මැතිතුමා කථානායකවරයා හැටියට කටයුතු කළා. තමන්ගේ අක්කා ජනාධිපතිනියයි කියලා එතුමාත් එහෙම කටයුතු කළේ නැහැ. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය.

මේ Online Safety Bill එක සම්මත කරලා අවසන් වුණාට පස්සේ කැබිනට් මණ්ඩලය කියනවා තවත් යෝජනා 19ක් ගේන්න තිබෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් හදලා මේවා දැන් පුන්නක්කු වාගේ වෙලා තිබෙන්නේ. මොකද, ඒවායේ තිබෙන දේවල් හොයා ගන්න බැහැ. එක පනතක් ගෙනෙනවා, තව යෝජනාවක් ගෙනෙනවා, තව සංශෝධනයක් ගෙනෙනවා. මේක මහා විශාල ප්‍රශ්නයක්. අපි තමුන්නාන්සේලාට කියන්නේ වෙන මුකුත් නොවෙයි, මේ රටේ මේවා කරන ක්‍රමයක් තිබෙනවා. තමුන්නාන්සේලාට හදිසියට පනත් ගෙනෙන්න ඕනෑ වුණාම අච්චු ගහලා දෙනවා වාගේ දවස ගණනේ පනත් කෙටුම්පත් ගෙනැල්ලා සම්මත කර ගන්නවා. සාකච්ඡාවක් නැහැ, කථා කිරීමක් නැහැ, කථා කරන්න ඉඩක් නැහැ. එවැනි තත්ත්වයක් තමයි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවට කථානායකවරයෙක් පත් කරන්නේ ඇයි? ස්වාධීනත්වය වෙනුවෙන්. එහෙම නැතිව කවුරුවත් වෙනුවෙන් වැඩ කරන්න නොවෙයි. පොලිස්පතිතුමා පත් කරන කාරණයේදී බොහොම පැහැදිලිව එතුමා විසින් යවා තිබෙන ලිපියේ සඳහන් කර තිබෙනවා, "ඒ අනුව, ඔබතුමන් විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශය අනුමත කිරීම හෝ අනුමත නොකිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ඉ) (4) ව්‍යවස්ථාවේ දැක්වෙන පරිදි අවම සාමාජිකයන් පස් දෙනෙකු විසින් සනාථ නොකරන ලදී" කියලා. ඒ නිර්දේශය සනාථ කළේ නැහැ කියලා එතුමා කියනවා. සනාථ කළේ නැත්නම්, එතුමාට ඡන්දය දෙන්න තිබුණා එතැනදී. එතුමා එහෙම කරන්නේ නැතිව "සනාථ නොකරන ලදී" කියලා ලියුමක් යවලා පොලිස්පතිතුමා පත් කරන්න එතුමා තැපෑලෙන් ඡන්දය දෙනවා. අපට තිබෙන්නේ පොලිස්පතිතුමාව පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. ඒ කර තිබෙන දෙයින් එතුමාටත් හොඳ නැහැ.

ඒ විතරක් නොවෙයි, ජනාධිපතිතුමා විසින් කථානායකතුමාගේ පුත්‍රයාව පත් කරනවා National Lotteries Board එකේ සභාපතිවරයා විධියට. දැන් මේවා තමයි ප්‍රශ්න. කවදාවත් කථානායකවරයෙක්ගේ දරුවෙක් කොතැනකටවත් පත් කරන්නේ නැහැ නේ. ඒ අය අඩුම තරමින් කමිටුවකවත් ඉඳ ගන්නේ නැහැ. ඒ තරම් ස්වාධීනව ඒ අය කල්පනා කරනවා. අපිත් අවුරුදු 20ක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ හිටියා. හැබැයි, මෙහෙම කථානායකවරු අපි දැක්කේ නැහැ නේ. මට එතුමාත් එක්ක පෞද්ගලික තරහක්, වෛරයක් නැහැ. එතුමා මාත් එක්ක ඉතා හොඳින් කටයුතු කරනවා. හැබැයි, මෙතැන තිබෙන ප්‍රශ්නය මොකක්ද? උදේ ඉඳලා මේ පාර්ලිමේන්තුව තුළ සමහරු නැඟිට නැඟිට සිදු කරන හැම ක්‍රියාවලියකදීම අපි දකින දේ තමයි එතුමාගේ පක්ෂපාතීභාවය පෙන්නුම් කිරීම.

ඊළඟට, දැන් මේ ජාතික ලොතරැයි මණ්ඩලයට සභාපතිවරයා පත් වුණාට පස්සේ ඒ ආයතනයේ online system එක, විශේෂයෙන්ම accounts system එක වෙනස් කරන්න ඒ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් PBSS Group කියන ආයතනයකට රුපියල් කෝටි 29ක කටයුත්තක් සඳහා අනුමැතියක් ලබා දීලා තිබෙනවා. රුපියල් කෝටි 29ක් අවශ්‍ය වෙනවා ද online system එකක්, accounts system එකක් වෙනස් කරන්න? ලක්ෂ 50කින්, 60කින්, 100කින් ඒක කරන්න පුළුවන්. නමුත් accounts system එක වෙනස් කරන්න රුපියල් කෝටි 29ක් වැය කිරීමට අනුමැතිය දී තිබෙනවා. අද ඒකට අත්සන් කරන්නේ නැහැ එහි සිටින මූල්‍ය නිලධාරියා; ඔහු ඒකට කැමති නැහැ. ඔහු කියනවා, ඒ ක්‍රියාදාමය වැරදියි කියලා. හැබැයි මේවා සිදුවෙනකොට අනෙක් පැත්තෙන් ඒවා වහන්න කටයුතු කරනවා. වෙලාව තිබෙනවා නම් මට තව කියන්න පුළුවන්. තව දිග හරින්න ගොඩක් දේවල් තිබෙනවා. හැබැයි, මම කාටවත් මඩ ගහන්න සූදානම් නැහැ. නමුත් සාධාරණත්වයෙන් විනිශ්චය දෙන ප්‍රධාන ස්ථානයේ ඉඳලා මේ වාගේ වැරදි කරනකොට අපට ඒක ඉවසාගෙන ඉන්න පුළුවන්කමක් නැහැ.

මේ විශ්වාස භංග යෝජනාව පරදින්න පුළුවන්. අපි දන්නවා, මේක පරදිනවා කියලා. හැබැයි මෙය පැරදුණත් කථානායකතුමාගේ අපක්ෂපාතීභාවය පිළිබඳ යථාර්ථය තමයි පසුගිය දවස් දෙකේම මේ පාර්ලිමේන්තුව තුළ පිළිඹිඹු වුණේ. ඒක වහන්න එතුමාගේ ඉතිහාසය ගැන කිව්වත් - එතුමා හොරකම් කරලා නැහැ කිව්වා. ඔව්, අපි පිළිගන්නවා එතුමා හොරකම් කරලා නැහැ, මංකොල්ලකාලා නැහැ කියලා. ඒ ඔක්කෝම හරි- අපි කථා කරන්නේ එතුමාගේ ඉතිහාසය නොවෙයි, වර්තමානයයි කියන එකත් මතක් කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු වජිර අබේවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.05]

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මහින්ද යාපා අබේවර්ධන කථානායකතුමාට විරුද්ධව ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදයේදී මම මුලින්ම කිව යුතු කරුණක් තිබෙනවා. මගේ පාර්ලිමේන්තු ජීවිතයේ කථානායකවරුන් හත්දෙනෙකු යටතේ මේ ගරු සභාවේ අත්දැකීම් ලබන්නට මට අවස්ථාව ලැබී තිබෙනවා. ඒ කථානායකවරුන් තමයි, ගරු කේ.බී. රත්නායක මැතිතුමා, ගරු අනුර බණ්ඩාරනායක මැතිතුමා, ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා, ගරු වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමා, ගරු චමල් රාජපක්ෂ මැතිතුමා, ගරු කරු ජයසූරිය මැතිතුමා සහ ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා. මේ විශ්වාස භංග යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ වර්තමාන කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමාට විරුද්ධවයි. ඇත්ත වශයෙන්ම එතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒම ගැන අපි කනගාටු විය යුතුයි. මොකද, වර්තමාන කථානායකතුමා ප්‍රජාතන්ත්‍රවාදය ඉහළින්ම ක්‍රියාත්මක කරන්න ගිහිල්ලා තමයි මේ සභාවේ ගෞරවය පිළිබඳ ප්‍රශ්නයක් පැන නැගිලා තිබෙන්නේ. අපේ මහජන නියෝජිතයින්ගෙන් බහුතරයක් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග - Standing Orders - අනුව නොවෙයි ක්‍රියා කරන්නේ. නැගිටිනවා, "point of Order" කියනවා. ඒක දැන් නිකම් විනෝදාංශයක් බවට පත් වෙලා තිබෙනවා. ඉතින්, එය කනගාටුදායකයි! පක්ෂ, විපක්ෂ සියලු මහජන නියෝජිතයන් තමන් පාර්ලිමේන්තුවේ හැසිරෙන්න ඕනෑ කොහොමද කියලා දැන ගන්න ඕනෑ. නමුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලවත්, ස්ථාවර නියෝගවලට අනුකූලවත් නොවෙයි අපේ මහජන නියෝජිතයන්ගෙන් බහුතරය කටයුතු කරන්නේ.

ඇත්ත වශයෙන්, වර්තමාන කථානායකතුමා මහා ප්‍රජාතන්ත්‍රවාදියෙකු හැටියටයි කටයුතු කරන්නේ; මා අර මුලින් කියපු කථානායකවරුන් සියලුදෙනාට වඩා වෙනස් විධියකටයි කටයුතු කරන්නේ. නැඟිට නැඟිට කථා කරන හැම මහජන නියෝජිතයෙකුටම එතුමා ඇහුම්කන් දෙන්න යනවා. ඒ නිසා විශාල අසාධාරණයක් ඇතැම් මන්ත්‍රීවරුන්ට සිදු වෙලා තිබෙනවාය කියනවා. දෙමළ ජාතික සන්ධානයේ ගරු මන්ත්‍රීවරයෙකුත් මේ ගැන කිව්වා. එහෙම නම් අපට යුතුකමක් තිබෙනවා, කථානායකතුමාගේ ක්‍රියා දාමය පිළිබඳව **සාධාරණව බලන්න.**

ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාත්, ගරු ජයන්ත වීරසිංහ මැතිතුමාත් කියනවා මම අහගෙනයි, න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා තිබෙන මේ විශ්වාස භංග යෝජනාවේ සඳහන් චෝදනා සියල්ලෙන් ගරු කථානායකතුමා නිදහස් බව. නීතියට අනුව එතුමා නිදහස්. ඒ චෝදනා සියල්ල බැලුවාම, ඔප්පු කළ හැකි එක කරුණක්වත් නොමැතිව තමයි මේ විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. මේ විශ්වාස භංග යෝජනාව ගෙන ඒමේ අරමුණ මොකක්ද? අපේ සමහර මහජන නියෝජිතයන් කියනවා මම අහගෙන හිටියා, "මේ විශ්වාස භංග යෝජනාව පරාජයට පත් කරයි. හැබැයි, ජාත්‍යන්තරය බලා ගනීවි" වාගේ කථාවක්. ඒ කියන්නේ, "රාජ්‍ය නොවන සංවිධාන බලා ගනියි" කියලා වාගේ කථාවක්. ඇත්ත වශයෙන් ලංකාවට වැරදුණේ ඔතැනයි. ලංකාව හැම වෙලාවේම හිටගන්න ඕනෑ ලංකාව පැත්තේ. නමුත්, ලංකාව හිටගන්නේ නැහැ ලංකාව පැත්තේ. ලංකාව හිටගන්නවා වෙනත් තැන්වල. වෙනත් තැන්වල හිටගෙන ඒ තැන්වල හුවමාරු වන පණිවුඩ අපේ සභාවේ ක්‍රියාත්මක කරන්න උත්සාහ කරනවා. එය ඇත්ත වශයෙන් කනගාටුදායකයි. මෙම විශ්වාස භංග යෝජනාවේ සඳහන් චෝදනා සියල්ල නිවැරදි **නොවන** බව අපේ ගරු අධිකරණ ඇමතිතුමාත්, ආණ්ඩු පක්ෂයේ අපේ ගරු මන්ත්‍රීවරුත් ප්‍රකාශ කළා. ඒ නිසා මම ඒ ගැන කරුණු කියන්න යන්නේ නැහැ.

ඇත්ත වශයෙන් මෙය කථානායකතුමාම ඉලක්ක කරලා කරන ක්‍රියාවලියක් නොවෙයි. රජයේ අවධානය වෙනත් මාර්ගයකට යොමු කරලා -තල්ලු කරලා- හෝ දැනට රජය කරගෙන යන මේ ක්‍රියාවලිය කඩාකප්පල් කිරීම සඳහා තමයි කථානායකතුමාව භාවිත කර තිබෙන්නේ. මම අහගෙනයි, කථානායකතුමාගේ පුතා ගැනත් කියනවා. කථානායකතුමාගේ පුතා පත් කළේ කථානායකතුමා නොවෙයි. එතුමාගේ දරුවෝ වැඩිහිටියෝ; වෙනම වෘත්තිකයෝ. එතුමාගේ එක් පුතෙක් වෛද්‍යවරයෙක්. තව පුතෙක් ඉංජිනේරුවෙක්. තවත් පුතෙක් ව්‍යාපාරිකයෙක්. අනෙක් පුතාත් හොඳින් ඉගෙන ගත්තු කෙනෙක්. දේශපාලනඥයින්ගේ සමහර ළමයි තමන්ගේ ගෙදර වට පිටාව දිහා බලලා හැඩ ගැහෙනවා, දේශපාලනඥයන් හැටියට. වෛද්‍යවරුන් බහුතරයකගේ ළමයි ඒ වටපිටාව අනුව හැඩ ගැහෙමින් වෛද්‍යවරු වෙනවා. ඉංජිනේරුවන්ගේ ළමයි ඒ වටපිටාව අනුව හැඩ ගැහෙමින් ඉංජිනේරුවන් වෙනවා. Accountantsලාගේ ළමයි ඒ වටපිටාව අනුව හැඩ ගැහෙමින් accountantsලා වෙනවා. ඉතින්, දේශපාලනඥයන් වන අපි අපටම ඇඟිල්ල දිගු කර ගනිමින් අරයාගේ ළමයා මෙහෙම කරනවා, මෙයාගේ ළමයා මෙහෙම කරනවා කීම සුදුසු ද? නම් කියන්න යන්නේ නැතත් මා ඉහතින් කියපු කථානායකවරුන්ගේ ලැයිස්තුවේ ඉන්න අනෙක් හැමෝම අනුගමනය කරලා තිබෙන ක්‍රියාවලිය දිහා බලන්න. ඇත්තටම සුළු පඩියකට, විශ්වසවන්තභාවය තියාගෙන තමන්ගේ කර්තව්‍යය කරගෙන යන්න ලේසි නැහැ.

වත්මන් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා දකුණේ නායකයෙක්; දකුණු පළාත් සභාවේ හිටපු මහ ඇමතිවරයෙක්. ඒ වාගේම ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ පාලන කාලයේදී යම් යම් කාරණා සම්බන්ධයෙන් ගත්තු තීරණවලට විරුද්ධව එතුමා, ගාමණී ජයසූරිය මැතිතුමා වාගේම කඹුරුපිටියේ විජේගුණවර්ධන මැතිතුමා ආදි අය ප්‍රසිද්ධියේ තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව, භය නැතුව ඡන්දය ප්‍රකාශ කරලා, මන්ත්‍රී ධුරය එපා කියලා පාර්ලිමේන්තුවෙන් එළියට ගියා. එතුමා එවැනි ආත්ම විශ්වාසයක් තිබුණු පුද්ගලයෙක්. ඇත්ත වශයෙන් දකුණු පළාතෙන් බිහි වෙච්ච ඉතාම ශ්‍රේෂ්ඨ දේශපාලඥයෙකුට විරුද්ධවයි මේ සභාවට මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. මා හිතන්නේ නැහැ, එතුමාට ඇඟිල්ල දිගු කරලා කිසිම යෝජනාවක් ගෙනෙන්න මේ සභාවේ ඉන්න කිසිම මහජන නියෝජිතයෙකුට පුළුවන්කම තිබෙනවා කියලා. එහෙම නම්, මෙය ගෙනැල්ලා තිබෙන්නේ, වෙනත් අරමුණක් සඳහායි. ඒ අරමුණ මොකක්ද? ඩොලර් එක රුපියල් 350 වන කොට, රුපියල් 375 වන කොට, රුපියල් 395 වන කොට, black market එකේ රුපියල් 450-500 වන කොට ලංකාවේ channelsවල පැත්තකින් දැම්මා, රට වැටෙනවා, black market එකේ ඩොලර් එකේ අගය මෙච්චරයි, ආණ්ඩුව ගෙවන ගණන මෙච්චරයි කියලා. දැන් බලන්න, ඩොලර් එකේ අගය ක්‍රමක්‍රමයෙන් පහළට එනකොට - ඩොලර් එක රුපියල් 290ට, 295ට එනකොට - කිසිම channel එකක පැත්තකින් ඒ බව සඳහන් කරන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුව, කැබිනට් මණ්ඩලය දැන් වැඩේ කොහොම හරි නිවැරදි පාරට දාලා, රට යථා තත්ත්වයට තල්ලු කරගෙන යනවා කියන පණිවුඩය නොදී ඉන්න තරම් ඒ අය කුහක වෙලා තිබෙනවා. අපි ඒ ගැන කනගාටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන් මේක තම තමන්ගේ ඊර්ෂ්‍යාව, කුහකකම සහ වෛරය මුල් කරගෙන කරන ක්‍රියාවලියක්. මේ ක්‍රියාවලිය නවත්වා ගන්න අපට බැරි නම්, මේ රට කවදාවත් දියුණු කරන්න හම්බ වෙන්නේ නෑ. එක එක්කෙනාගේ හිතේ තිබෙන ජනාධිපතිකම්, අගමැතිකම්, ඇමතිකම්, මහජන නියෝජිතකම් මුල් කරගෙන අපි අපිම අපේ රට පාවා දෙනවා නම්, අපි අපිම අපේ රට පැත්තේ හිට ගන්නේ නැතුව වෙනත් රටවල් පැත්තේ හිට ගන්නවා නම්, කවදාවත් ශ්‍රී ලංකාවට අනාගතයක් හදා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර මම ඉහතින් කියපු කථානායක ලැයිස්තුව දිහා බලන්න. මම 1994 ඉඳලා ඔය මූලාසනයේ හිටපු කථානායකවරුන් දැකලා තිබෙනවා; එතුමන්ලා සමඟ කටයුතු කර තිබෙනවා. අපි කිසිම අවස්ථාවක ස්ථාවර නියෝග කඩ කරලා පාර්ලිමේන්තුවේ කටයුතු කරලා නැහැ. අපේ මේ ගරු සභාවේ පක්ෂ විපක්ෂ සියලුදෙනා point of Order එකක් ගෙනෙන කොට ස්ථාවර නියෝගයේ අංකය මොකක්ද, එය කොතැනද තිබෙන්නේ, මොකක්ද ඒ රීතිය කියලා ඉදිරිපත් කරමින් මේ රටේ අනාගත පරම්පරාවට ආදර්ශයක් වන හැටියට ක්‍රියා කළ යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ විශ්වාස භංග යෝජනාව නියත වශයෙන් පරාජය කරනවා. ඒ බව කියන කොට සමහර මහජන නියෝජිතයන් කියනවා, මෙය පරාජය කළොත් අහවල් ජාත්‍යන්තර සංවිධානය, එහෙම නැත්නම් අහවල් රාජ්‍ය නොවන සංවිධානය බලා ගනියි කියලා. එවැනි සංවිධාන දීර්ඝ කාලයක් ලංකාව බලා ගත්තා. අවුරුදු 75ක් ඒ ගොල්ලන් ලංකාවට හානි කළා. තවදුරටත් ඒ හානියට හසු නොවී මේ රට ගැන හිතලා කටයුතු කරන්න මේ සභාවේ ඉන්න මහජන නියෝජිතයන් සියලුදෙනාගේ මනස වෙනස් වේවා කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.13]

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන් මේ පාර්ලිමේන්තුවේ තිබෙන ගැටලුව තමයි මේක; කාල කළමනාකරණයක් නොමැති වීම. මට විනාඩි 12ක් කථා කරන්න දෙනවා කිව්වා. පසුව විනාඩි 10ක් කථා කරන්න දෙනවා කිව්වා. නමුත්, දැන් තිබෙන්නේ විනාඩි 5යි. ඇත්ත වශයෙන් මේ පාර්ලිමේන්තුවේ කථානායකවරයා ඇතුළු කාර්ය මණ්ඩලයේ වගකීම තමයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කථා කිරීමේ අයිතිය සහතික කරලා, කාලය කළමනාකරණය කිරීම. ඒ නිසා එක විශ්වාස භංග යෝජනාවක් නොවෙයි, විශ්වාස භංග යෝජනා ගණනාවක් ගෙනෙන්න ඕනෑ, කාල කළමනාකරණයවත් කර ගන්න බැරි පාර්ලිමේන්තුවක් පවත්වාගෙන යෑම සම්බන්ධයෙන්.

ගරු කථානායකතුමාට එරෙහිව ගෙනැල්ලා තිබෙන විශ්වාස භංග යෝජනාවේ ප්‍රධාන කාරණා දෙකක් තිබෙනවා. එනම්, පනත් කෙටුම්පතක් අනුමත කර ගනිද්දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දීලා තිබෙන මාර්ගෝපදේශයන්ට පටහැනිව, නීතිපතිවරයා සමඟ විතරක් සබඳතා පවත්වා ගනිමින් කටයුතු කිරීම. දෙවැන්න, පොලිස්පතිවරයා පත් කර ගැනීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කරලා තිබෙන ආකාරයට පටහැනිව තමන්ගේ තීරක ඡන්දය පාවිච්චි කිරීම. මෙතැනදී නොයෙක් තාක්ෂණික කාරණා ගැන කිව්වා. නමුත් සමුදයාර්ථයෙන් ගත්තොත් ඒ කරුණු දෙකේදීම එතුමා වැරදි සහගත ලෙස කටයුතු කර තිබෙනවා කියන එක තමයි මගේත් ස්ථාවරය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පළමුව අවබෝධ කර ගන්න ඕනෑ, මේ කථානායක ධුරයේ හා මේ පාර්ලිමේන්තුවේ ගරුත්වය මොකක්ද කියලා. මේ රටේ ඉතිහාසයේ නිදහසින් පසු අවුරුදු 76ක ඉතිහාසය තුළ ප්‍රථම වතාවට කෝපයට පත් වෙච්ච ජනතා සාමූහිකයක් විසින් තමන්ම ඡන්දය දීලා පත් කර ගත්තු රටේ ජනාධිපතිවරයා, රටේ අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ ආණ්ඩුව ඍජු ක්‍රියා මාර්ගයක් මඟින් පලවා හැරියා. පසු ගිය කාලයේ එවන් තත්ත්වයක් තිබුණේ.

මේ පාර්ලිමේන්තුව ආරක්ෂා වුණේත් ඉතාම අපහසුවෙන්. මේ තත්ත්වය තුළ අසහනයට පත් වෙලා ඉන්න ජනතාව දන්නවා, මේ පාර්ලිමේන්තුවේ ඉන්න මා ඇතුළු සියලුදෙනාට දැන් නව ජනවරමක් අවශ්‍යයි. ඒ වාගේම, මේ පාර්ලිමේන්තුව තුළ ඉන්න ජනවරමක් නැහැ කියන එක. එහෙම තත්ත්වයක් තුළ පාර්ලිමේන්තුවේ හැසිරීම, පාර්ලිමේන්තුවේ කාරක සභාවල හැසිරීම, කථානායකවරයාගේ හැසිරීම යන සියල්ලක්ම පාර්ලිමේන්තුවේ හා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ විශ්වාසය තහවුරු කරන්න ඉතා වැදගත් වෙනවා. මොකද, මේ රට කැරලි ගණනාවක් ඇති වෙච්ච රටක්. ඒ කැරලි ගණනාව ඇති වෙන්න, ලේ ගංගා ගලා යන්න, ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ ක්‍රියාත්මක වෙච්ච නායකයින්ගේ හැසිරීම අතිශයින්ම බලපෑවා. ඒ වාගේම, මේක දැන් බංකොලොත් රටක්. මේ බංකොලොත්භාවයෙන් මිදෙන දවසක් ගැන අපට ඉමක් පෙනෙන්නේ නැහැ. එවැනි අවිනිශ්චිත, අස්ථාවර තත්ත්වයක් තුළ අඩු තරමින් මේ පාර්ලිමේන්තුවවත් විනයානුකූලව හා ආදර්ශවත්ව රටට, ලෝකයට පෙනෙන ආකාරයට හැසිරීම අත්‍යවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථානායකවරයාගේ ඉතිහාසය දන්නවා. දහතුන්වන සියවසේ එංගලන්ත පාර්ලිමේන්තුව ආදර්ශයෙන් තමයි අපි මේ කථානායක ධුරය ලබා දීලා තිබෙන්නේ. එක කාලයක එංගලන්තයේ රාජවංශයට ජර්මන් රජෙකු පත් වුණාම කථානායකවරයාගේ කාර්යභාරය වුණේ, ඉංග්‍රීසි භාෂාවෙන් සිදු වන පාර්ලිමේන්තුවේ කටයුතු ඒ ජර්මන් රජුට ජර්මන් භාෂාවෙන් පරිවර්තනය කිරීමත්, ජර්මන් බසින් වූ රජ්ජුරුවන්ගේ නියෝග ඉංග්‍රීසියට පරිවර්තනය කිරීමත් කියන කාරණා. ඒක තමයි කථානායකගේ එක කාර්යභාරයක් වුණේ. ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවේ කටයුතු පාර්ලිමේන්තුවට පරිවර්තනය කිරීමත්, පාර්ලිමේන්තුවේ කටයුතු ජනාධිපතිවරයාට පරිවර්තනය කිරීමත් තමයි අද මේ කථානායකතුමාට තිබෙන චෝදනාව. ඒක නොවෙයි, කථානායකගේ කාර්යභාරය. වරක් එංගලන්තයේම රජ්ජුරුවෝ ඇවිල්ලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හතරදෙනෙකු රාජ ද්‍රෝහීත්වය මත අත් අඩංගුවට ගන්න උත්සාහ කළා. නමුත්, කථානායකවරයා රජුට එරෙහිව නැඟී සිටියා. එතැනින් තමයි, පාර්ලිමේන්තුවේ ස්වෛරීත්වය පිළිබඳව අදහස මතු වුණේ.

ඒක නිසා ආණ්ඩුවේ කවුරු හිටියත්, විධායකයේ -ජනාධිපති ධුරයේ- කවුරු හිටියත් නීති තනන ඉහළම තැන හැටියට අධිකරණයට ඉහළින් තමයි පාර්ලිමේන්තුව තිබෙන්නේ. ඒ නිසා එහි ගරුත්වය අපි ආරක්ෂා කර ගත්තේ නැත්නම්, මේ රටේ ඉදිරි කාලයේ ඇති වන අර්බුදවලදී මේ පාර්ලිමේන්තුවටත් ජනාධිපති කාර්යාලයට, ජනාධිපති මන්දිරයට, අග්‍රාමාත්‍ය කාර්යාලයට, අග්‍රාමාත්‍ය මන්දිරයට සිදු වුණා වැනි ව්‍යසනයක් ඇති වීමට නියමිතයි. ඒ නිසා අපි සියලුදෙනා වගකීමෙන් හැසිරෙන්න ඕනෑ විතරක් නොවෙයි, මේ අර්බුදයෙන් ගොඩ ඒම සඳහා, රාජ්‍ය මූල්‍ය භාර ප්‍රධාන ආයතනය හැටියට ඊට අදාළ අතිරේක ආයතනත්, ඒ සඳහා තිබෙන කාරක සභාත්, ඒවායේ ක්‍රියාකාරිත්වයත් පිළිබඳව මීට වඩා වගකීමෙන් හා සහතිකවීමකින් කටයුතු කිරීම ඉතා අවශ්‍යයි. ඒ බව අපි තදින්ම අවධාරණය කරනවා. මේ රට ඇතුළත තවදුරටත් දේශපාලන ගේම් ගහන්න ඉඩක් නැහැ. මහජනයා තුළ කෝපය සංසිඳිලා නැහැ. තාවකාලිකව මූල්‍ය ස්ථාවරත්වයක් ඇති වෙලා තිබුණත්, මහජන ජීවිත තිබෙන්නේ ඉතාම අවිනිශ්චිතවයි. මුදල් අමාත්‍යාංශය කියන විධියට, අපේ රටේ බහුතර ජනතාව -

[ගරු පායලි චම්පික රණවක මහතා]

සියයට 90ක්- තමන්ගේ ආදායම අහිමිවීම පිළිබඳව හා වියදම වැඩිවීම පිළිබඳව වේදනාවක ඉන්නේ. ඒ වේදනාව යටි හිතේ තිබෙන්නේ. ඒ නිසා ප්‍රජාතන්ත්‍ර විරෝධී බලවේගවලට අත වනන ක්‍රියාවලියකට වඩා, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වෙන ආකාරයට පාර්ලිමේන්තුව තුළින් ආදර්ශවත් හැසිරීමක් අපි බලාපොරොත්තු වෙනවා. කථානායකවරයා ඒකට නායකත්වය දිය යුතුයි. නමුත්, අවාසනාවකට කථානායකවරයාගෙන් එවැනි තත්ත්වයක් පළ වෙලා නැති බව කනගාටුවෙන් යුතුව ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.19]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමාට විරුද්ධව ගෙන ආපු විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් අද සවස 4.30ට ඡන්දය විමසනවා. අපි ආණ්ඩු පක්ෂයේ. අපි ඒක පරාජය කරනවා. බොහොම වගකීමකින් මම ඒක කියන්නේ. ඒ ඡන්දයේදී අපි මේ යෝජනාව ගෙනාපු විපක්ෂය පරාජය කරලා, කථානායකවරයාට විශ්වාසය තිබෙනවා කියලා පැහැදිලිව පෙන්වනවා.

මේ කථානායකතුමාට විශ්වාස භංග යෝජනාවක් ගෙනාවේ එතුමා නිහතමානී වැඩි වුණු නිසායි. එතුමා, එතුමාගේ කථානායක ධුරයේ බලතල පාවිච්චි කළේ නැහැ. එතුමා ආණ්ඩුවට වැඩිය, විපක්ෂයේ අය නැඟිටින කොටම විපක්ෂයට වෙලාව දෙනවා. විපක්ෂයට තමයි වැඩිපුරම වෙලාව දෙන්නේ. කථානායකවරයාගේ පසුගිය කාල වකවානුව ගත්තාම, එතුමා මේ වෙලාව ලබා දීලා තිබෙන්නේ කොහොමද කියලා පැය ගණන, විනාඩි ගණන අනුව බැලුවාම අපට බලා ගන්න පුළුවන් වෙයි. හැබැයි, කිව්වේ මොකක්ද? කථානායකතුමා ආණ්ඩු පක්ෂය දිහා බලනවා ලු. ආණ්ඩු පක්ෂය දිහා බලලා ලු, වෙලාව දෙන්නේ. නැහැ, එහෙම කරපු කථානායකවරයෙක් නොවෙයි, එතුමා.

අපිත් අවුරුදු 24ක් තිස්සේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. සමහර කථානායකවරු හිටියා, හඬ අනුව තමයි ඡන්දය ගත්තේ. දැකලා නොවෙයි. එහෙම ඉතිහාසයක් තිබුණු පාර්ලිමේන්තුවක් මේක. මේ කථානායකතුමා නිහතමානී වැඩියි. එතුමා හොඳ කෘතහස්ත දේශපාලනඥයෙක්, වැදගත් දේශපාලනඥයෙක්. එතුමා කථානායක ධුරයේ රාජකාරි හරියාකාරව ක්‍රියාත්මක කළා. හැබැයි, එතුමා කථානායක ධුරයේ තිබෙන බලතල ක්‍රියාත්මක කළා නම්, විපක්ෂයට ඕච්චර වෙලාවක් යන්නේ නැහැ.

දැන් විපක්ෂ නායකතුමා වාර්තාවක් තියලා තිබෙනවා. එතුමා තමයි මේ පාර්ලිමේන්තුවේ වැඩිම වෙලාවක් කථා කරලා තිබෙන්නේ. එතුමා ඒ කාරණයට ගිනස් වාර්තාවක් තියනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු කෑ ගහන එක සාධාරණයි. මොකද, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට වෙන් වෙන්නේ විනාඩි 150යි නම්, ඒකෙන් 50ක් අනෙක් ඔක්කෝටම, 100ක් විපක්ෂ නායකට. ඒකයි ඇත්ත තත්ත්වය.

පළමුවෙනි කාරණය මේකයි. ඇයි කථානායකතුමාට විරුද්ධව මේ විශ්වාස භංග යෝජනාව ගේන්නේ? එක චෝදනාවක් තමයි, Online Safety Bill එක සම්මත කිරීම සම්බන්ධව වැරැද්දක් තිබෙනවා කියන එක. එතකොට Online Safety Act එකට විරුද්ධ වෙන්නේ කවුද? කාට හරි මඩ ගහන්න, කාගේ හරි චරිතය විනාශ කරන්න, දේශපාලන වශයෙන් පළි ගන්න කාට හරි වුවමනාවක් තිබෙනවා නම්, අන්න ඒ අය තමයි ඒකට විරුද්ධ වෙන්නේ. කථානායකවරයා බොහොම පැහැදිලිව නීතිපතිවරයාගේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නිර්දේශ අනුව තමයි කටයුතු කරලා තිබෙන්නේ. විෂය භාර අමාත්‍ය විජයදාස රාජපක්ෂ මැතිතුමා ඒ ගැන පැහැදිලි කරලා දුන්නා.

ඊළඟට, දෙවෙනි චෝදනාව මොකක් ගැනද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගැන. නව පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහත්තයා පත් කරන්න යනකොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේදී ඡන්දය ලබා දීම. ඒ ඡන්දය ලබා දීම සම්බන්ධව තමයි කථානායකවරයාට එක චෝදනාවක් තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද මේකේ ඇත්ත කථාව? ඇත්ත කථාව තමයි විපක්ෂ නායක ඇතුළු විපක්ෂය කැමැති නැහැ මේ පොලිස්පතිවරයාට. පත් කරපු පොලිස්පතිවරයාට විපක්ෂ නායක කැමැති නැති නිසා ඒකට කථානායකවරයාට විරුද්ධව විශ්වාස භංගයක් ගේනවා. විපක්ෂ නායකවරයාට කැමති පොලිස්පතිවරයෙක්ද ආණ්ඩුව පත් කර ගන්න ඕනෑ? දැන් එහෙමයි ඉල්ලන්නේ. විපක්ෂ නායක ඉල්ලනවා පොලිස්පති පත් කරනකොට විපක්ෂ නායකවරයා තමයි නාම යෝජනා කරන්න ඕනෑ කියලා "මම මෙන්න මෙයාව පොලිස්පති කරනවා" කියලා. ඒකද වෙන්න ඕනෑ? කථානායකට විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා බලාපොරොත්තු වෙන්නේ, මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කරලා විපක්ෂ නායක කැමති කථානායකවරයෙක් පත් කර ගන්න.

මම දැන් COPE එකේ සභාපතිවරයා. මම ගිහිල්ලා COPE එකේ සභාපතිවරයා හැටියට පත් වුණා නොවෙයි. එහි සාමාජික මන්ත්‍රීවරු 31දෙනෙක් ඉන්නවා. ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය නියෝජනය කරන සාමාජික මන්ත්‍රීවරු 31දෙනෙක් ඉන්නවා. ඒ 31දෙනාගෙන් නම් දෙකක් ඉදිරිපත් වුණා, සභාපති ධුරය සඳහා. මගේ නම ඉදිරිපත් කළා, අපේ සහෝදර ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමා. මම වැඩි ඡන්දයෙන් ජයග්‍රහණය කළා. දැන් විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු ඒ කාරක සභාවෙන් ඉල්ලා අස් වෙනවා. ඉතින් මොකක්ද කරන්නේ? එතකොට විපක්ෂය කැමති කෙනාද ඒකේ සභාපති වෙන්න ඕනෑ? ඒකද සම්ප්‍රදාය? ඒකද සම්ප්‍රදාය වෙන්න ඕනෑ? මම තේරී පත් වෙලා තිබෙන්නේ ඡන්දයකින්. විපක්ෂ නායකතුමා අද උදෙත් මේ ගැන ඇහුවා ලු. එහෙම නම් විපක්ෂ නායකතුමාට කරන්න තිබෙන හොඳම වැඩේ මොකක්ද? ඔබතුමා එන්න COPE එකේ සභාපති ධුරයට තරග කරන්න. මම එතුමාට ආරාධනා කරනවා. එතුමාත් ඉදිරිපත් වුණාට පස්සේ නැවත ඡන්දයක් තියලා, මොකක්ද වෙන්නේ කියලා බලමු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කැමති දේම වෙන්නේ නැහැ, අපි කැමති දේම කරන්න පුළුවන් නම් හොඳයි. ඒක වෙන්නේ නැහැ. නමුත්, අද මේ දේශපාලනය කොතැනටද ඇවිල්ලා තිබෙන්නේ? අද දේශපාලනය, මඩ දේශපාලනයක තත්ත්වයට පත් වෙලා තිබෙනවා; මඩ ගහනවා. මේ පැත්ත ඒ පැත්තට මඩ ගහනවා, ඒ පැත්ත මේ පැත්තට මඩ ගහනවා. 225දෙනායි මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ. හිරිකිතක් නැතිව මඩ ගහනවා. කිසිම චෝදනාවක් නැතිව ඕනෑම කෙනෙකුට මඩ ගහනවා. ඒකයි අද සිද්ධ වෙලා තිබෙන්නේ. හුඟක් අය කියනවා අපේ කථානායකතුමාගේ උපාසක ගති වැඩියි කියලා. ඉතින් එතුමාටත් විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා නම්

අපි ගැන මොන කථාද? අපේ කට සැරයි නේ. ඉතින් එතුමාට විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා නම් අපි ගැන මොන කථාද? බුදු හාමුදුරුවන්ටත් හතුරෙක් විධියට දෙව්දත් තෙරුන් හිටියා. ඒ වාගේ තමයි, අපට හතුරෝ නැත්තේ නැහැ, හතුරෝ ඉන්නවා. ඒ නිසා මම බොහොම පැහැදිලිව කියනවා, මේ කථානායකතුමාට මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ වෛරීසහගත ලෙස බව.

මම අහගෙන හිටියා එක මන්ත්‍රීවරයෙක් කියනවා කථානායකතුමාගේ පුතාට ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපතිකම දුන්නා කියලා. හැබැයි, ඒ කථා කළ මන්ත්‍රීතුමාට ලොතරැයි මණ්ඩලයත් එක්ක ළඟම නෑකමක් තිබෙනවා. ඒ කථා කළ මන්ත්‍රීතුමායි, ලොතරැයි මණ්ඩලයයි අතර ලේ ඥාතිකමක් වාගේ නෑකමක් තිබෙනවා. ඒ ඔක්කෝම යටි හිතේ තිබෙන දේවල්, තමන්ගේ වැඩේ කර ගන්න බැරි වුණාම, තමන් උත්සාහ කළ දේ කර ගන්න බැරි වුණාම ඒකට බණිනවා. එතුමා කථානායක වුණා කියලා, සුදුසුකම් තිබෙනවා නම් එතුමාගේ පුතාට ඒ තනතුරුවලට යන්න පුළුවන්කමක් නැද්ද? යන්න පුළුවන්.

ඒ නිසා මම බොහොම පැහැදිලිව මේ කාරණය කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙය ගරු කථානායකතුමාට වාර්තා කරන්න. අපේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල වෙනසක් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මොකක්ද ඒ වෙනස? මේ රටේ COPE එකට, COPA එකට සහ අනෙකුත් කමිටුවලට සභාපතිවරු පත් කරනකොට ඔවුන්ගේ සුදුසුකම් හොයන්න. ඒවාට ඕනෑ සුදුසුකම් මොනවාද? අධ්‍යාපන සුදුසුකම්, ජාතිය, කුලය, උස, මහත ඇතුළු සියල්ල හොයන්න. සියල්ලම හොයලා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පමණක් නම් වැඩක් වෙන්නේ නැත කියලා දමන්න. මේකට පාර්ලිමේන්තු මන්ත්‍රීකම විතරක් තිබිලා බැහැ, මෙන්න මේ සුදුසුකම් ටික සපුරන්න ඕනෑ, එතකොට ඔහුට පුළුවන් අහවල් කාරක සභාවේ සභාපති වෙන්න කියලා දමන්න. අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු. ජනතාව තමයි අපිව පාර්ලිමේන්තුවට එවලා තිබෙන්නේ. 24 අවුරුද්දක් මාව මේ පාර්ලිමේන්තුවට එවලා තිබෙන්නේ කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව. ඒ ජනතාව කිසි දවසක අපිව පරද්දලා නැහැ. ආණ්ඩුව නැති වෙනකොටත් අපි පාර්ලිමේන්තුවේ සිටියා. ජනතාව අපිව පාර්ලිමේන්තුවට එවලා තිබෙනවා. ඊළඟ පාර්ලිමේන්තුවටත් ජනතාව අපව තෝරා පත් කර එවනවා කියන විශ්වාසය අපට තිබෙනවා. ඒ වෙනකොට අපට ආණ්ඩුව නැති වෙන්නත් පුළුවන්; තිබෙන්නත් පුළුවන්. නමුත් ජනතාව අපව පාර්ලිමේන්තුවට එවන බවට විශ්වාසය තිබෙනවා. අපිව පාර්ලිමේන්තුවට එවන්න හොඳ නම්, අපිට ඒ තනතුරු දරන්න හොඳ නම්, අපි COPE එකේ සභාපතිකම දරනකොට අපිට චෝදනා පත්‍රයක් එල්ල කරන්නේ ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථානායකතුමාටත් අද එහෙම තමයි චෝදනා එල්ල කරලා තිබෙන්නේ. දේශපාලන කෝණයෙන් බලන්න එපා. අපි ලැජ්ජියි. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති හැටියට වැඩ කරන ආකාරය අපි දැක්කා. අපි එය අගය කරනවා. එතුමා ආණ්ඩුවේද, විපක්ෂයේද කියන එක නොවෙයි අපට අවශ්‍ය වෙන්නේ, හරියට වැඩේ කරන එක. ඒ නිසා මම බොහොම පැහැදිලිව කියනවා, අපට පැවරුණු වගකීම අපි ඉටු කරන බව. අභියෝග මැද හරි අපි ඒ වගකීම ඉටු කරනවා. ඒ නිසා අපි කථානායකතුමාට කියනවා, අද ඡන්දයෙන් විශ්වාස භංග යෝජනාව පරාජය කළාට පස්සේ ඔබතුමා නැවත කථානායක පුටුවේ වාඩිවෙන්න. වාඩිවෙලා වෙනදාට වැඩිය සැර වෙන්න. වම බලන්නත් එපා, දකුණ බලන්නත් එපා. සභාවේ මෙන්න මේ රතු පලස දිහා බලාගෙන ඉන්න. මේක දිහා බලාගෙන, ආණ්ඩුවේ වුණත්, වෙනත් පක්ෂයක වුණත් කමක් නැහැ, වැරදි නම්, ස්ථාවර නියෝගවලට පටහැනිව කටයුතු කරනවා නම් ඕනෑම කෙනෙකු වෙනුවෙන් තීන්දු ගන්න කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊළඟට, සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා (සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹரின் பர்னாந்து - சுற்றுலாத்துறை மற்றும் காணி அமைச்சரும் விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகாரங்கள் அமைச்சரும்)
(The Hon. Harin Fernando - Minister of Tourism and Lands and Minister of Sports and Youth Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வசந்த யாப்பாபண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. NALAKA BANDARA KOTTEGODA left the Chair, and THE HON. WASANTHA YAPABANDARA took the Chair.*

[பி.ப. 2.29]

**ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා (ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சிவநேசதுரை சந்திரகாந்தன் - கிராமிய வீதிகள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Sivanesathurai Santhirakanthan - State Minister of Rural Road Development)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ சபாநாயகர் மஹிந்த யாப்பா அபேவர்தன அவர்களுக்கு எதிராக எதிர்க்கட்சியினரால் கொண்டுவரப்பட்டிருக்கின்ற நம்பிக்கையில்லாப் பிரேரணை மீதான விவாதம் மூன்றாவது நாளாகவும் இடம்பெறுகின்றது. இதில் பேசுவதையிட்டு நான் கவலையடைகின்றேன்.

எதிர்க்கட்சியானது, பொறுப்புமிக்க ஓர் எதிர்க்கட்சி என்ற அடிப்படையில் இங்கு பல விடயங்களைக் கொண்டுவந்ததை நான் பார்த்திருக்கிறேன். இருந்தாலும், இந்த நம்பிக்கையில்லாப் பிரேரணைக்காக மூன்று நாட்களைச் செலவு செய்வது என்பது நேரத்தையும், அரச சொத்துகளையும் வீணடிக்கின்ற ஒரு விடயமாகும். இங்கு பேசிய பலரும் குறிப்பிட்டதுபோல, கௌரவ சபாநாயகர் அவர்கள் எதிர்க்கட்சி உறுப்பினர்களுக்குத்தான் அதிக முக்கியத்துவத்தைக் கொடுத்திருக்கிறார். நேரமாக இருந்தாலும் சரி, வாய்ப்புகளாக இருந்தாலும் சரி, ஆளுங்கட்சி உறுப்பினர்களாகிய எங்களுக்குக் குறைவாக வழங்குவதை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. இருந்தாலும், அவர் சபாநாயகர் என்ற அடிப்படையில் தன்னுடைய பணிகளை எதிர்காலத்தில் சிறப்பாக மேற்கொள்ள வேண்டும்.

[ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා]

சபாநாயகருக்கு எதிராகக் கொண்டுவரப்பட்டுள்ள இந்த விடயத்தை நான் அரசியல் ரீதியான கோணத்திலே பார்க்கின்றேன். காரணம் என்னவென்றால், 2019ஆம் ஆண்டின் கடைசிப் பகுதியிலிருந்து 2023ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் இந்த நாட்டில் மிகப்பெரிய மாற்றங்களெல்லாம் இடம்பெற்றும் சபாநாயகர் மாறவில்லை என்பதுதான். அதாவது, மக்களால் தெரிவுசெய்யப்பட்ட சனாதிபதி அகற்றப்பட்டு இருக்கிறார். அதுமாத்திரமன்றி, பிரதமரும் அகற்றப்பட்டு இருக்கிறார். ஆனாலும், ஒன்பதாவது பாராளுமன்றத்தின் பதவிக் காலம் ஆரம்பித்ததிலிருந்து இன்று வரைக்கும் இருக்கக்கூடிய ஓர் உறுதியான தலைவராகத் தற்போதைய சபாநாயகர் இருக்கிறார். அவரையும் நம்பிக்கை இழந்த ஒரு மனிதராக ஆக்க வேண்டும், ஆளும் கட்சியைப் பலவீனப்படுத்தி அடுத்த முறை ஆட்சியைப் பிடிக்க வேண்டும், எதிர்வருகின்ற தேர்தலில் தங்களுடைய அதிகாரத்தைப் பலப்படுத்திக்கொள்ள வேண்டும் என்பதற்காக எதிர்க்கட்சியினர் போலியான விடயங்களை எல்லாம் புனைந்து இங்கு பேசுவதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. இது இந்த நாட்டுக்குச் சிறந்த எதிர்காலத்தை ஏற்படுத்தாது.

எதிர்க்கட்சியினர் 2022ஆம், 2023ஆம் ஆண்டுகளில் செயற்பட்டதற்கும், இப்பொழுது செயற்படுவதற்கும் இடையில் வித்தியாசம் இருப்பதை நாங்கள் பார்க்கின்றோம். எனக்கு முன்னர் பேசிய ஆளுங்கட்சி உறுப்பினர்கூட, இவ்விடயம் தொடர்பில் தன்னுடைய கவலையை வெளியிட்டிருந்தார். மக்கள் இறைமையுள்ள இந்த நாட்டில், மக்களால் தெரிவு செய்யப்பட்ட பாராளுமன்ற உறுப்பினர்களை வெளியில் மிகக் கேவலமானவர்களாகச் சித்தரித்துக் காட்டுவதும், அந்த இறைமையின் மையமாகக் காணப்படுகின்ற, அதைப் பாதுகாக்கின்ற இந்தப் பாராளுமன்றத்தின் நம்பிக்கையீனங்களை மக்களிடம் கொண்டுசெல்வதும், COPE குழுவில் அங்கம்வகிக்கின்ற எதிர்க்கட்சி உறுப்பினர்கள் தங்களுடைய பதவியைத் துறந்து, அக்குழுவை இயங்கவிடாமல் செய்வதற்கான முறைமையை ஏற்படுத்துவதுமான செயற்பாடுகளைத்தான் - ஒரு மாயையைத் தோற்றுவிக்கின்ற விடயங்களைத்தான் - இன்று எதிர்க்கட்சியினர் அதிகமாகச் செய்துகொண்டு இருக்கின்றார்கள். அதைவிடுத்து, அவர்கள் தங்களுடைய கொள்கை ரீதியான திட்டங்கள் என்ன, தங்களுடைய அரசாங்கம் அமைந்தால் என்ன செய்வது, தங்களுடைய கூட்டுப்பொறுப்பு என்ன, தங்களுடைய எதிர்காலத் திட்டங்கள் என்ன என்பது பற்றிப் பேசுவதைக் காண முடிவதில்லை. அதிலும் குறிப்பாக, எங்களுடைய தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்கள் ஏதோ அடுத்த முறை அரசாங்கம் மாறி விட்டால், தாங்கள் இந்த நாட்டை நடத்தப்போவதுபோல சில விஷயங்களைப் பேசுகிறார்கள். அதைப் பார்த்து நான் கவலைகொள்கின்றேன்.

எந்த அரசாங்கம் ஆட்சிக்கு வந்தாலும், இவர்கள் மக்கள் நலன் சார்ந்த திட்டங்கள் எதையும் செய்யப்போவதில்லை. அதுமாத்திரமன்றி, எந்த அரசாங்கம் ஆட்சிக்கு வந்தாலும் அதற்கு எதிராகப் பேசிக்கொண்டு இருப்பார்கள். எனவே, மக்கள் எதற்காக எங்களைத் தெரிவுசெய்து இச்சபைக்கு அனுப்பியிருக்கிறார்கள்? நாங்கள் என்ன செய்துகொண்டு இருக்கிறோம்? என்பதில் தெளிவு வேண்டும்.

எங்களுடைய சபாநாயகருக்கு எதிராக முக்கியமாக இரண்டு விடயங்கள்தான் முன்வைக்கப்படுகின்றது. ஒன்று, பொலிஸ்மா அதிபர் நியமனம் தொடர்பான விடயம். அடுத்தது, நிகழ்நிலைக் காப்புச் சட்டமூலத்துக்குக் கையொப்பம் இட்ட விடயம். இந்த நாட்டில் போராட்டம் நடந்த காலப்பகுதியில் கொழும்பில் இடம்பெற்ற சம்பவங்களை மையப்படுத்தி, தேசபந்து தென்னகோன் அவர்களைப் பொலிஸ்மா அதிபர் பதவிக்கு நியமிக்கக்கூடாது என்பதில் எதிர்க்கட்சியினர் உறுதியாக இருந்தார்கள். இந்தப் பின்புலத்தில் எப்படியாவது இந்த விடயத்தை அமுலாக்க வேண்டுமென்று உறுதியாக இருந்ததன் காரணமாகவே இவ்விடயம் நடந்தேறியிருக்கிறது என்பதை இலகுவாக விளங்கிக்கொள்ள முடியும். எனவே, அரசியல் ரீதியாகத் தங்களுக்கு விரும்பாத விடயங்கள் நடக்கக்கூடாது என்பதற்கான அழுத்தமாகத்தான் நான் இதைப் பார்க்கின்றேன்.

இங்கு பேசிய பல உறுப்பினர்கள் சொன்னதுபோல, தமிழ் மக்கள் விடுதலைப் புலிகள் கட்சியின் தலைவர் என்ற அடிப்படையில் என்னையும் NGOஇன் பிரதிநிதிகள் சந்தித்தார்கள். அவர்கள் என்னிடம், "நீங்கள் நிகழ்நிலைக் காப்புச் சட்டமூலத்துக்கு எதிராக வாக்களிக்க வேண்டும்" என்று நேரடியாகவே சொன்னார்கள். அப்போது நான், "ஏன் அவ்வாறு செய்ய வேண்டும்" எனக் கேட்டேன். ஓர் அரச சார்பற்ற நிறுவனத்தின் கோரிக்கைக்கு ஏற்பவா நாங்கள் பாராளுமன்றத்தில் இயங்க வேண்டும்? முகநூல் வாயிலாக எத்தனையோ குடும்பங்களில் பிரச்சினைகள் ஏற்பட்டிருக்கின்றன. அதேபோன்று, எத்தனையோ பேர் வேறொருவரின் பெயரில் முகநூல் கணக்குகளை ஆரம்பித்து சிக்கல்களை உருவாக்கிக்கொண்டு இருக்கிறார்கள். இவற்றைத் தடுப்பதற்கென ஒரு காப்பரண் இடப்பட வேண்டும் என்பதில் நான் உறுதியாக இருந்தேன்.

நான் இதை இங்கு குறிப்பிடுவதற்குக் காரணம், இங்குள்ள பலர் இதை ஒத்துக்கொள்ளாவிட்டாலும்கூட, இன்று இதுதான் நடக்கிறது. எங்களுடைய மக்களின் பிரச்சினை என்ன? எங்களுடைய பிரச்சினை என்ன? எங்களுடைய கட்சியின் பிரச்சினை என்ன? என்பதை ஆராயாமல், மற்றவர்களுடைய தேவைக்காகவும் மற்றவர்கள் சொல்கிறார்கள் என்பதற்காகவும் கருத்துகளைக் கூறிக்கொண்டு, தேவையில்லாமல் நேரத்தை வீணடித்து, பாராளுமன்றத்தின் மரியாதையைப் போக்குகின்ற பல விடயங்களைப் பார்த்து நாங்கள் கவலையடைகிறோம். இந்த உயரிய சபையின் கௌரவத்தைப் பாதுகாக்கின்ற சபாநாயகர் அவர்கள் தொடர்ந்து பதவியில் நீடிப்பார் என்பது என்னுடைய நம்பிக்கையாகும். அவ்வாறு நீடிக்கும்பொழுது, எதிர்காலத்தில் பாராளுமன்றத்தைச் சிறப்பாக நடத்துவதற்கும், இங்கு குறிப்பிட்ட பிழைகளை உடனடியாகத் திருத்தம் செய்து, சட்ட வலுவுள்ள ஒரு சபையாக இச்சபையைக் கொண்டு செல்வதற்கும் அவர் முனைவார் என்று கூறிக்கொள்கிறேன்.

அடுத்து, சில பாராளுமன்ற உறுப்பினர்கள் ஊடகங்கள் வாயிலாக பாராளுமன்றத்தை கேவலப்படுத்துவது மாத்திரமன்றி, தாங்கள் மாத்திரம்தான் மக்களுடைய பிரதிநிதிகள் போல நினைத்துக் கொண்டு, தங்களுக்குத் தெரியாத பிரச்சினைகளையெல்லாம் தெரிந்ததுபோல காட்டிக் கொள்கிறார்கள். தற்பொழுது, இச்சபையில் கௌரவ சுமந்திரன் அவர்களைக் காணவில்லை. அவர் மிக அழகாகப் பேசுவார். இன்று காலை இச்சபையில் உரையாற்றிய அமைச்சர்கள், "இன்று அதிகாரத்தைக் கேட்டு நிற்கின்ற எங்களுடைய எதிர்க்கட்சி உறுப்பினர்களுள் அதிலும் தமிழ் பாராளுமன்ற உறுப்பினர்களுள் மாகாண சபைத் தேர்தல்கள் திருத்தச் சட்டமூலத்தை நிறைவேற்றவிடாமல் தடுத்ததில் பிரதான பங்கு சுமந்திரன் அவர்களுக்கு உண்டு" என மிகத் தெளிவாகச் சொன்னார்கள். அதற்கு யாரும் பதிலளிப்பது கிடையாது.

இன்று தமிழரசுக் கட்சி, யார் தலைவர் என்று தெரியாமல் எடுப்பார் கைப்பிள்ளை போன்று வீதியில் நிற்கின்றது. அதைப் பற்றி யாரும் பேசுவது கிடையாது. அவர்கள் தங்களைத் திருத்த மாட்டார்கள்; தங்களுடைய கட்சியைத் திருத்தமாட்டார்கள்; மக்களுக்கான வேலைத்திட்டங்களை முன்னெடுக்கமாட்டார்கள். ஏதாவது பிரச்சினை வந்தால் மாத்திரம் கூச்சலிடுவதும், கும்மாளமடிப்பதுபோல கத்திக் கொண்டு ஊடகங்களுக்குத் தங்களுடைய முகங்களைக் காட்டுவதையும்தான் செய்கிறார்கள். நீண்டகாலம் பாராளுமன்றத்தில் இருக்கிறோம் என்பதற்கு அப்பால், அவர்கள் மக்களுக்கு ஏதாவது நல்ல விடயங்களைச் செய்ய வேண்டும் என்பதுதான் எங்களுடைய கோரிக்கை யாகும். இறுதியாக, கௌரவ சபாநாயகருக்கு எதிராக எதிர்க்கட்சியினரால் கொண்டுவரப்பட்டு இருக்கின்ற இந்த நம்பிக்கையில்லாப் பிரேரணையைத் தோற்கடிப்பதற்காக நான் வாக்களிப்பேன் எனக் கூறி முடித்துக்கொள்கின்றேன். நன்றி. வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විමල් වීරවංශ මැතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට උදේ වෙනකොට වෙන් වෙලා තිබුණු කාලය කොපමණද කියලා දැනගන්න පුළුවන්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට උදේ මුලින්ම විනාඩි 10ක් ලැබිලා තිබෙනවා. ඒක විනාඩි 8, 7 වශයෙන් අඩු වෙලා තිබෙනවා. දැන් ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ඔය කාලය අඩු කරන්න අපි සම්මාදම් වෙලා නැහැ. සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන්ගෙන් කාලය කැපුවාට අපේ කාලය කපන්න එපා.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ඒක අපටත් කරලා තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ඒක වැරදියි.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
ඒක වැරදියි තමයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
කාලය කා දමන අයගෙන් ඒ කාලය කපන්න. අපි ඒකට වග කියන්න ඕනෑ අය නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වීරසුමන වීරසිංහ මැතිතුමාට කොපමණ වෙලාවක් තිබෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.34]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ඒ විනාඩි 5ත් මට දෙන්න. එතුමාගේ එකඟතාව මතයි මා එය කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථානායකතුමාගේ ක්‍රියා කලාපය පිළිබඳව සෑහීමකට පත් වෙන්න බැහැ කියන පදනම මත ඉඳලා විරුද්ධ පක්ෂය විසින් ඉදිරිපත් කරපු මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව අපේ කරුණු දැක්වීම සිදු කරන්න මම මේ අවස්ථාවේදී ඔබතුමාගෙන් අවසර ඉල්ලා සිටිනවා. වර්තමාන කථානායකතුමාගේ අතීත දේශපාලන භාවිතාවත් එක්ක හිතුවාම එතුමා ඓතිහාසිකව ඉතා වැදගත් දේශපාලන තීරණ ගත් පුද්ගලයෙකු බව අපි දන්නවා. 1987දී ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කරපු වෙලාවේ ඉස්කෝලේ යන දරුවෙකු හැටියට සිටි මට මතකයි, එතුමා එදා ගාමිණී ජයසූරිය මැතිතුමාත් එක්ක ඒ ආණ්ඩුවේ ක්‍රියා කලාපයට එරෙහිව එළියට බැහැපු පුද්ගලයෙකු බව. ඒ කොන්ද එදා වෙන කාටවත් තිබුණේ නැහැ. ඒ දෙපළට විතරයි ඒ කොන්ද තිබුණේ. *[බාධා කිරීමක්]* ඔව්, තුන්දෙනෙක් ඒ අවස්ථාවේ එළියට බැස්සා.

ඒ වාගේම, පසුගිය අරගළ සමයේ යම් යම් විදෙස් තානාපති බලවේග සහ ඒවායේ ඉන්න දේශීය ඒජන්තවරු එතුමාට යෝජනා කළා, කථානායක හැටියට රටේ රාජ්‍ය නායක වගකීම භාරගන්න කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නිසා ඒ අවස්ථාවේත් එතුමා ඒ යෝජනාව පිළිගත්තේ නැහැ; ප්‍රතික්ෂේප කළා. එතුමා සම්බන්ධයෙන් මම පෞද්ගලිකව ගෞරවයට ලක් කරන කාරණා දෙකක් තමයි මම ඒ කිව්වේ. මොකද, ඒ වෙලාවේ බල පෙරේත මානසිකත්වයෙන් යුතු කෙනෙක් ඔය පුටුවේ හිටියා නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට බම්බු ගහන්න කියලා ඒ තානාපතිතුමිය කරපු යෝජනාවට - ඇමෙරිකානු තානාපති කාර්යාලයෙන් ආපු යෝජනාවට - පස්වනක් ප්‍රීතියෙන් යුතුව එකඟ වෙලා රටේ විශාල වියවුලක් ඇති කිරීමේ හැකියාව තිබුණා. මේ අවස්ථා දෙක සම්බන්ධයෙන් එතුමා කෙරෙහි අපේ තිබෙන ගෞරවය පළමුවෙන්ම මම පුද කරන්න ඕනෑ. නැත්නම් මම කුහක දේශපාලනඥයෙකු හැටියට වර්ගීකරණය වෙන එක වළක්වන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් තනතුරු තිබෙන්නේ අපට බැබළෙන්න නොවෙයි. තනතුර බබළවන්න අපට පුළුවන් වෙන්න ඕනෑ. තනතුරෙන් බැබළෙනවාට වඩා තනතුර බබළවන්න පුළුවන් වෙන්න ඕනෑ.

COPE එකේ සභාපතිකමට රෝහිත අබේගුණවර්ධන මැතිතුමාව පත් කළා. ඒ සභාපතිකමෙන් බැබළෙන්න එතුමාට පුළුවන් වෙයි. හැබැයි, ඒ සභාපතිකම බබළවන්න එතුමාට පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. තනතුරෙන් බැබළෙනවා

[ගරු විමල් වීරවංශ මහතා]

වෙනුවට තනතුර බබළවන්න පුළුවන් වෙන්න ඕනෑ. වර්තමාන කථානායකතුමා, කථානායකවරයාගේ භූමිකාව නිසි පරිදි ඉටු කරනවා කියලා අපට පිළිගන්න පුළුවන්කමක් නැහැ. දැන් මේ කාලය කා දැමීම පිළිබඳ ප්‍රශ්නය ගත්තත්, එතැනත් තිබෙන්නේ, මේ සභාවේ නිසි පාලනයක් නොමැතිකම පිළිබඳ ගැටලුවක්. අනුර බණ්ඩාරනායක මැතිතුමා මේ සභාවේ කථානායකවරයා හැටියට කටයුතු කළ කාලයේ අපි තරුණ මන්ත්‍රීවරු හැටියට මේ සභාවේ කටයුතු කරද්දී එතුමා ඉතාම ඉහළ පෞරුෂත්වයකින්, ඒ තනතුර බබළවමින් -තනතුරෙන් බැබළෙනවා නොවෙයි, තනතුර බබළවමින්- කථානායක භූමිකාව ඉතා ප්‍රශස්ත අයුරින් ඉටු කළා. මේ පාර්ලිමේන්තුව කෙරෙහි මහජන විශ්වාසය බිඳ වැටෙන්න, පාර්ලිමේන්තුවේ ඉන්න 225දෙනාගේ ක්‍රියා කලාපවල අඩුපාඩු වාගේම කථානායකවරයාගේ ක්‍රියා කලාපයේ අඩුපාඩුත් බලපානවා. කථානායකවරයාගේ භූමිකාව සැහෙන දුරකට බලපානවා, පාර්ලිමේන්තු සභා ගර්භයේ තිබෙන ක්‍රියා කලාපය තීරණය කරන්න. වර්තමාන කථානායකවරයා එක්තරා දුරකට පක්ෂග්‍රාහීව කටයුතු කරන අවස්ථා නිර්මාණය වෙලා තිබුණු බව අපට පෙණුනා. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු ගණනාවක් පැහැදිලි කළා, Online Safety Bill එක ගෙනාපු වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණය දීපු සංශෝධන නියමිත පරිදි ඇතුළත් කරනවා වෙනුවට, ඒ සංශෝධනවලට කොළේ වහලා ගහද්දී, ඒ අර්බුදය විපක්ෂයේ මන්ත්‍රීවරු පෙන්වා දෙමින් තිබියදී, එය අභියෝගයට ලක් කරමින් තිබියදී එතුමා ඒ පනත් කෙටුම්පතට අත්සන් කරලා ඒක වලංගු පනතක් බවට පත් කළා. මේ රටේ වැසියන් යම්කිසි පනත් කෙටුම්පතකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට යන්නේ, ඔවුන්ට ඒ පනත් කෙටුම්පතෙන් සිදුවන අගතිය වළක්වා ගන්න තිබෙන එකම ස්ථානය එතැන හැටියට සලකලායි. එතකොට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දෙන මහ පෙන්වීම මේ සභාව පිළිගන්නේ නැත්නම්, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දෙන මඟ පෙන්වීම පිළිගත්තා යැයි කියමින් කොළේ වහලා ගහනවා නම්, එතැන තිබෙන්නේ මොකක්ද?

මට මතක් වන ආන්දෝලනාත්මක තව කාරණයක් තමයි, පළාත් සභා පනත, එහෙම නැත්නම් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආපු වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණය බෙදුණු තීරණයක් දුන් බව. ඒ බෙදුණු තීරණයේදී එක විනිශ්චයකාරවරයෙක් කරපු මහ පෙන්වීම වැරැදියට අර්ථ කථනය කළා. මට මතක හැටියට ඒ පාරින්ද රණසිංහ විනිශ්චයකාරතුමා. එතුමා කරපු ඒ මඟ පෙන්වීම වැරැදියට අර්ථ කථනය කරලා නීතිපතිවරයා ඒකට අනුමැතිය දුන්නා. හැබැයි, අදත් නීති ක්ෂේත්‍රයේ බොහෝදෙනෙක් පිළිගන්නවා, එදා ඒ නීතිපතිවරයා දීපු අනුමැතිය නීතියට පටහැනියි කියලා. මේ කාරණයේදීත් කථානායකතුමා තමන්ගේ ගැලවීමට පෙන්වන දේ තමයි, නීතිපතිවරයාගේ අනුමැතිය ලැබී ඇත, නිසි පරිදි සංශෝධන සිදුවී ඇත කියන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1987දී පළාත් සභා පනත, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු වෙලාවේත් කරපු ඒ කුප්ප වැඩේට, කැත වැඩේට නීතිපතිවරයාගේ අනුමැතිය ලැබී තිබුණා. ඒ කොළේ වහලා ගැහිල්ලට නීතිපතිවරයාගේ අනුමැතිය ලැබී තිබුණා. "නීතිපතිවරයාගේ අනුමැතිය" නැමැති සළුව ඉස්සරහට දමාගෙන තමයි ඒ වාගේ අවස්ථාවලදී හෙලුව වහගන්නේ. මේ සභාව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දෙන මඟ පෙන්වීම් නොසලකා හැර වැඩ කරන සභාවක් බවට පත් විය යුතු නැහැ. එහෙමනම් ශ්‍රේෂ්ඨාධිකරණය වැනි ආයතනයක් පවත්වාගෙන යෑමේ වැදගත්කමක් නැහැ. රටවැසියාට එහි පිහිට පතන්න අවස්ථාව ලබා දීමේ වැදගත්කමක් නැහැ. මේ සභාව ශ්‍රේෂ්ඨාධිකරණය දෙන මඟ පෙන්වීම් පිළිපදින සභාවක් බවට පත් විය යුතුයි. ඒක එසේද නැද්ද කියන කාරණයේ ප්‍රධාන වගඋත්තරකාරයා තමයි, කථානායක පුටුවේ ඉන්න පුද්ගලයා. එතුමා තමයි ශ්‍රේෂ්ඨාධිකරණයේ මඟ පෙන්වීම නිසි පරිදි මේ සභාව තුළ ක්‍රියාත්මක වෙලාද නැද්ද කියන එක ගැන සොයා බලා තීරණය ගත යුත්තේ. නමුත්, ඒ තීරණය ගත යුතු පුද්ගලයා ඒ වගකීම ඉටු නොකරන්නේ නම්, ඒ තීරණය ගත යුතු පුද්ගලයා ඒ වගකීමෙන් පලා යන්නේ නම්, මේ සභාවේ ඒ භූමිකාව ඉටු කරන්න වෙන කාටවත් පුළුවන්කමක් නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දුන් සංශෝධන නිසි පරිදි සිදුවෙලා නැති බවට විපක්ෂයේ මන්ත්‍රීවරු දිගින් දිගටම පෙන්වා දෙද්දී, නෑසූ කන්ව ඒ පනත් කෙටුම්පත අභිමත පරිදි සම්මත කරගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේ වැදගත්කම, පැවැත්ම රඳා පැවැත්මට, මේ සභාව කෙරෙහි මහජන විශ්වාසය ඇති වීමට කථානායකවරයාගේ භූමිකාව ඉතා ප්‍රබල දායකත්වයක් සපයනවා.

මේ ගරු සභාවේ ගෞරවය ආරක්ෂා කිරීම පැත්තෙන් ගත්තොත්, මහජන නියෝජිතයන් හැටියට අපගේ භූමිකාව වාගේම, අපටත් වඩා ඉහළින් කථානායකවරයාගේ අපක්ෂපාතිත්වය, කථානායකවරයාගේ පක්ෂග්‍රාහී නොවීම, කථානායකවරයාගේ මධ්‍යස්ථ භූමිකාව ඉතා සැලකිය යුතු වටිනාකමක් දෙන භූමිකාවක් බව අපි පිළිගන්න ඕනෑ. මට කනගාටුවෙන් වුවත් කියන්න තිබෙන්නේ ආණ්ඩු පක්ෂයේ බලපෑමට, ආණ්ඩු පක්ෂයෙන් එන පීඩනයට, ආණ්ඩු පක්ෂයෙන් එන විධානයන්ට යටත්ව කටයුතු කරන කථානායකවරයෙකු බවට එතුමා බොහෝදුරට පත් වෙලා තිබෙනවා කියන එකයි. ඒ නිසා තමයි විරුද්ධ පක්ෂයට මේ විධියේ විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මම හිතනවා, කථානායකවරයෙකුට විරුද්ධව පාර්ලිමේන්තුවේ විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා වැඩි ඡන්දයෙන් ඒ විශ්වාස භංග යෝජනාව පැරැද්දුවත් එම කථානායකවරයා පරාදයි කියලා. කථානායකවරයාට විරුද්ධව විශ්වස භංගයක් ගෙන එන වාතාවරණයක් ඇතිවීමම, විශ්වාස භංගයක් ගෙන ඒමට සිදුවීමම, විශ්වාස භංගයක් මේ ගරු සභාවේ සාකච්ඡාවට ගැනීමට සිදුවීමම කථානායක භූමිකාවේ දෝෂයක් නිසා සිදුවන එකක් මිසක් වෙනත් හේතුවක් මත සිදුවන දෙයක් නොවෙයි.

ගරු අනුර බණ්ඩාරනායක මැතිතුමා වාගේ කථානායකවරයෙකුට විරුද්ධව විශ්වාස භංග යෝජනා මේ ගරු සභාවට ඉදිරිපත් කළේ නැහැ. තවත් කථානායකවරු ඕනෑ තරම් හිටියා. ගරු චමල් රාජපක්ෂ මැතිතුමාත් කථානායකවරයෙක් වෙලා හිටියා. එතුමාට වරුද්ධවත් විශ්වාස භංග යෝජනා ගෙනාවේ නැහැ. දිවංගත වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමාත් කථානායකවරයෙක් වෙලා හිටියා. එතුමාට විරුද්ධවත් විශ්වාස භංග යෝජනා ගෙනෙන්න ඕනෑ වුණේ නැහැ. එතුමන්ලා එම භූමිකාව බොහෝදුරට මධ්‍යස්ථව -ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් අතර තුලනයක් ඇති කරගෙන - ඉටු කරන්න සමත් වුණා. ඛේදජනක කාරණය තමයි, මේ වර්තමාන කථානායකතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනා ගෙන එන්න සිද්ධ වෙලා තිබෙන එක. එතුමා තමන්ගේ භූමිකාව හරියට කරලා නැහැ. තමන්ගේ තනතුරෙන් ඒ ධුරය බබළවනවා වෙනුවට, එතුමා තම ධුරයෙන් බැබළෙමින් පක්ෂග්‍රාහීව ක්‍රියා කිරීමේ ප්‍රතිවිපාකයක් හැටියට තමයි මේ විශ්වාස භංග යෝජනාව ගෙන එන්න සිදු වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිරිත් පරිදි තමුන්නාන්සේලාගේ තිබෙන බහුතර ඡන්ද බලය පාවිච්චි කරලා මේ විශ්වාස භංගය අද හැන්දෑව වන විට පරාජයට පත් වෙයි. ඒක අරුම පුදුම කාරණයක් නොවෙයි. නමුත්, සදාචාරාත්මකව කථානායකවරයා පරාජයට පත් වෙලා ඉවරයි. සදාචාරාත්මකව කථානායකවරයා පරාජයේ පිළිකන්නට යවලා ඉවරයි. එතුමා සංඛ්‍යාත්මකව ලබන ජයග්‍රහණයක් නොවෙයි, සදාචාරාත්මකව පරාජයක් අත්පත් කරගෙන ඉවරයි. කථානායකවරයෙකුට විරුද්ධව විශ්වාස භංගයක් ගෙන ඒමට තුඩු දෙන වාතාවරණයක් ඇති කිරීමම

කථානායකවරයා සදාචාරාත්මකව පරාජයට පත් වීමක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි හිතනවා, මේ සභාවේ ගරුත්වය, මේ සභාවේ පැවැත්ම, මේ සභාව දිහා බලාගෙන ඉන්න කෝටි ගණනක මහජනයා පාර්ලිමේන්තුව කෙරෙහි තිබෙන විශ්වාසය වැඩිදියුණු කරන්න, වර්ධනය කරන්න කථානායකතුමාගේ භූමිකාව ඉතා ඉහළ දායකත්වයක් සපයනවා කියලා. නමුත්, කනගාටුවට කරුණ එතුමාට ඒ පක්ෂග්‍රාහී භූමිකාවෙන් එළියට ඒමට නොහැකි වීමයි. ඒ නිසා තමයි අපට මෙවැනි විවාදයක් දින තුනක කාලයක් පවත්වන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ පිළිබඳව කථානායකවරයා කෙරෙහි අපේ තිබෙන අප්‍රසාදය පළ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අධිකරණ ඇමතිතුමා.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මේ ගරු සභාවේ කතික මන්ත්‍රීතුමන්ලා බොහෝදෙනෙක් ඉදිරිපත් කළා, කොළේ වහලා ගහලා, එහෙම නැත්නම් මේ ගරු සභාවට කරුණු සඟවලා අපි ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයට විරුද්ධව ගියා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඊයේ දිනයේ දී මෙම විශ්වාස භංග යෝජනාවේ තිබෙන කරුණු නවයම අරගෙන පෙන්නුවා. ඒ කරුණු නවයම පිළිබඳව අපි කිසිම ආකාරයකින් ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයෙන් පිට කටයුතු කරලා නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
Point of Order එකකට තමයි මම මේ කියන්නේ. මම කියලා අවසන් වුණාට පස්සේ ඔබතුමා කියන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අහන්නේ රීති ප්‍රශ්නයක්.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
හොඳයි. රීති ප්‍රශ්නය අහලා ඉන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එකම විවාදයේදී මන්ත්‍රීවරයෙකුට දෙවතාවක් කථා කරන්න පුළුවන්ද?

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ආණ්ඩුවට අයිතියක් තිබෙනවා, පිළිතුරු දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
නැහැ. නැහැ. එහෙම බැහැ. එකම විවාදයේදී මන්ත්‍රීවරයෙකුට දෙවතාවක් කථා කරන්න බැහැ.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ආණ්ඩුවට අයිතියක් තිබෙනවා, පිළිතුරු දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
එහෙම කොහොමද කරන්නේ? ඊයේත් කථා කරලා අදත් කථා කරන්න පුළුවන්ද? මොකක්ද, මේ ගරු සභාවේ තිබෙන ස්ථාවර නියෝග?

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මතුවන යම් කාරණයක් සම්බන්ධයෙන් උත්තරයක් දෙන්න ඕනෑම පාර්ශ්වයකට අයිතියක් තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
දෙවතාවක් කථා කරන්න අයිතියක් නැහැ.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ඔබතුමා දැන් කථානායක වෙලා නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
මම කථානායක වෙලා නැහැ.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
ඔහොම තමයි කථානායකතුමාට ප්‍රශ්නය ආවේ. දැන් ඔබතුමා කථානායක වෙලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඉතාම සුළු වෙලාවක් තිබෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලාට කාලය නාස්ති කරන්න දෙන්න අමාරුයි.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
හොඳයි. මම විනාඩියෙන් මේ කාරණය කියා අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය කියපු වගන්තිවලින් මෙහි තිබෙන 33(6), 34(1), 35(1) කියන වගන්ති සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දීලා නැහැ. ඒක මේ නඩු තීන්දුවේ සඳහන් නැති දෙයක්. ඒ නිසා කොළේ වහලා ගහලා කියනවා නම්, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවට විරුද්ධව කටයුතු කළා කියනවා නම් කොතැනද එහෙම කරලා තිබෙන්නේ කියලා පෙන්වන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීට වඩා වැඩි කාලයක් දෙන්න බැහැ, ගරු අමාත්‍යතුමනි.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මම මේ කාරණයත් කියන්න ඕනෑ. ඒගොල්ලන් කැමති තීන්දුවක් ශ්‍රේෂ්ඨාධිකරණය දුන්නාට පස්සේ ඒ අනුව කටයුතු කරන්න කියනවා. ඒගොල්ලන්ගේ හිතැඟියාවට අකැමති තීන්දුවක් දුන්නාම ශ්‍රේෂ්ඨාධිකරණය ගෙදර යවන්න කියනවා. එහෙම නේ කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.49]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා (සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹரின் பர்னாந்து - சுற்றுலாத்துறை மற்றும் காணி அமைச்சரும் விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகாரங்கள் அமைச்சரும்)
(The Hon. Harin Fernando - Minister of Tourism and Lands and Minister of Sports and Youth Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථානායකතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබෙන මේ මොහොතේදී මුළු ශ්‍රී ලංකාවටම පැහැදිලි වන එක කරුණක් තිබෙනවා. ඒ මූලිකම කරුණ තමයි විපක්ෂයේ තිබෙන කුහකකම. අපේ රට යන ගමන හොඳට පේන්න තිබෙනවා. අපේ ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. මීට මොහොතකට ඉස්සෙල්ලා IMF එකේ Second tranche එකට ඒගොල්ලන් එකඟ වෙලා තිබෙනවා. Executive Board එකට ගියාට පස්සේ IMF එකෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 33ක් ලංකාවේ ආණ්ඩුවට ලැබෙනවා කියන එක අද ස්ථිර වශයෙන් කියලා තිබෙනවා. නමුත් අද විපක්ෂය මොකක්ද මේ කරන්න හදන්නේ? මේ කුහක විපක්ෂයට ඕනෑ වෙලා තිබෙන්නේ ලංකාවේ news එක මේ කථානායකතුමා පැත්තට හරවලා ලංකාව තුළ විශාල වංචාවක්, දූෂණයක් වෙනවා කියන්නයි. වැටුණු රටක් නැඟිටිනවා කියන්න අකැමති කුහක සෙට් එකක් ඉන්න විපක්ෂයක් තමයි දැන් ඉන්නේ කියන එක මම මුලින්ම මතක් කරන්නට කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ලොරි ටෝක්" නේ දුන්නේ. ඒ කාලයේ මගේ බෑග් එක ඇතුළේ ටෝර්ච් එකකුත් තිබුණා මට මතකයි. අපි විපක්ෂයේ හිටපු කාලයේ පැය ගණනක් විදුලිය විසන්ධි කරලා තිබෙනකොට විපක්ෂයේ මන්ත්‍රීවරු ටෝර්ච් අරගෙන මේ පැත්තට එළිය ලබා දුන්නා. ඉන්ධන නැතිව ඉන්නකොට එදා හිටපු අපේ නායකයා කිව්වා, මට call එකක් දීලා නැව් තුනක් ගේන්න පුළුවන් කියලා. හැබැයි, නැව් තුනක් තියා, ලොරියක් තියා, ලීටර් 13,000ක බවුසරයක්වත් ගෙනෙනවා අපි දැක්කේ නැහැ. අපේ ගරු ජනාධිපතිතුමාට වාගේම කංචන විජේසේකර ඇමතිතුමාට අපි මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙන්න ඕනෑ. නැවතත් ලංකාවේ ඉන්ධන නැති වෙන තත්ත්වයක් උදා නොවෙන්න අද ලෝකයේ තිබෙන ප්‍රධාන ආයතනයක් වන ෂෙල් සමාගමේ පළමුවැනි නැව ලංකාවට එනවා. අද newsවලට මේ කිසි දෙයක් එන්නේ නැහැ. ෂෙල් සමාගමට අයත් නැව ආවාද, ඩොලරය කඩාගෙන වැටුණාද, IMF එක මුදල් දුන්නාද කියන ඒවා මේ අයට අදාළ නැහැ. මේ කුහක විපක්ෂයේ එකම දෙය මේ news එක මිනිස්සුන්ගේ හිත්වල plant කරන එකයි. එක මිටට දර ළිපට යන්න ආසාවක් තිබෙන කට්ටිය ගොඩක් ඉන්නවා. ඒ වාගේම පරණ වැරැද්ද නැවත වතාවක් කරලා, මේක දඩමීමා කරගන්න උත්සාහ කරන මිනිස්සු ගොඩක් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රට භාර ගන්න කිව්ව වෙලාවේ, "බුදු අම්මෝ, මට බැරියෝ!" කියලා කුස්සියේ හැංගිච්ච මිනිස්සු ටිකක් හිටපු විපක්ෂයක් මේක. මැරෙන්න ආසන්න ලෙඩෙකුට අන්තිම පණ ටිකේදී හිසරදයට බෙහෙත් දීලා, මෝචරියට තල්ලු කරලා හරියන්නේ නැහැ. ඒ ලෙඩාව බේරා ගන්නයි බෙහෙත් දෙන්න ඕනෑ. එහෙම බෙහෙත් දෙන්න එක්කෙනෙක්වත් හිටියේ නැහැ. හැබැයි, අද මේ රට වට්ටලා දමන්න, බොරු චෝදනා ගේන්න කටයුතු කරනවා.

අධිකරණ ඇමතිතුමා කිව්වා වාගේ ශ්‍රේෂ්ඨාධිකරණයට පටහැනි මොකක් හරි කරුණක් තිබෙනවා නම් ඇයි දෙවියනේ ඒවා පෙන්වන්න බැරි? ඇයි, ඔච්චර Online Safety Bill එකට භය? වෙන මොකුත් ඕනෑ නැහැ. ඒකට හොඳ උදාහරණයක් තිබෙනවා. කැනඩාවේ සමූහ ඝාතනයක් වුණා. ඒ පවුලේ මැරිච්ච අයගේ එක පින්තූරයයි ඒ රටේ මාධ්‍යවල පළ වුණේ. ඒ මිය ගිය දරුවන්ගේ; කාන්තාවගේ; පුරුෂයාගේ එක පින්තූරයක් අපි දැක්කේ නැහැ. මේ සිද්ධිය අපේ ලංකාවේ වුණා නම් මොන onlineද? ඒ අයගේ අම්මාගේ, අප්පාගේ පැටිකිරියේ ඉඳලා ඔක්කොම එළියට දමාවි. ලංකාවේ ගෙවල් අස්සේ දැනටම සොයාගෙන යනවා. මේවා හොඳ නැද්ද?

මම හැම දාම කියන කාරණයක් තිබෙනවා. ධනුෂ්ක ගුණතිලකගේ ප්‍රශ්නය වෙච්ච වෙලාවේ ධනුෂ්ක ගුණතිලකව මෙහේ හම්පට්ට ගැහුවා. හැබැයි, ධනුෂ්ක ගුණතිලක එක්ක ඔය ප්‍රශ්නය වුණා කියන ඒ කාන්තාවගේ මුහුණ ඕස්ට්‍රේලියාවේ මාධ්‍ය තුළින් අපි දැක්කාද? Online safety කියන්නේ ඒකයි. මේගොල්ලන්ට comments දමන හරක් පැටව් ටිකක් ඉන්නවා නේ. "නිවන් සුව" කියන එකවත් තේරෙන්නේ නැහැ. මේගොල්ලන් හිතනවා, නිවන් සුව කියන එක වැරදියි කියලා. බුදු අම්මෝ! "නිවන් සුව" නේ අපි ඔක්කොටම ප්‍රාර්ථනා කරන්නේ කියනවා. අවසානයේ සසර ගමන කෙළවර කර නිවනට යන්න නේ බලාගෙන ඉන්නේ.

ඒකවත් නොතේරෙන හරක් ටිකක් දාගෙන ඉන්නවා. ඒගොල්ලන්ම කියනවා නේ, ඒගොල්ලන්ගේ meetingsවල එක්කෙනෙක් හදන්න ෆේස්බුක් පිටු 10ක්, 20ක්, 30ක්වත් යනවා කියලා. දැන් මෙතැන රැස්වීමේ 1,000ක්, 2,000ක් ඉන්නවා නම්, අපි ළඟ Facebook pages 10,000යි කියලා කියනවා. නොදකින්! මේ වාගේ හරක්. Online safety කියන්නේ මිනිස්සුන්ගේ චරිත ඝාතනය කරන එක නොවෙයි. දැන් මෙතුමන්ලාගේ රැස්වීම්වලට ඉරිසියා කරන්න ඕනෑ නැහැ. මොකද, මෙතුමන්ලා හිතනවා, සෙනඟ ගෙනැල්ලා ඒකේ Facebook accounts ටිකක් හදා ගත්තාම, Facebookවලින් ඇති වෙනකම් ගහපුවාම අපට ප්‍රශ්නයක් කියලා. එහෙම ප්‍රශ්නයක් වෙයිද, නැද්ද කියන එක ඉස්සරහට බලා ගන්න පුළුවන්. එහෙම රැලි තිබුණු කාලයක් තිබුණා. හැබැයි, දැන් ගොඩක් මිනිස්සු දන්නවා, ෆේස්බුක් කියන්නේ මොකක්ද, ෆේස්බුක් එකේ ගහද්දී fake news එකක් කියන්නේ මොකක්ද, මේක හදපු එකක් කියන්නේ මොකක්ද, ඔහුගේ Facebook account එක block කරගෙන ගහනකොට ඔහු හොරෙක්ද, නැද්ද කියලා. ඒ ගැන දන්න මිනිස්සු දන්නවා, ඔහු කවුද කියලා. ඒ නිසා ඔය රැලි ඔය ගෙනෙන ප්‍රමාණයට ගෙනෙනවා නම් අපි ගොඩක් සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2024 අවුරුද්දේ ලෝකයේ සංචාරක ආකර්ෂණය දිනාගෙන තිබෙන හතරවැනි රට හැටියට "Forbes" සඟරාව අද ලංකාව නම් කරලා තිබෙනවා. ඒක හොඳ තත්ත්වයක් නොවෙයිද? මාස 18කට ඉස්සෙල්ලා අන්තිම සංචාරකයාත් මේ රටින් යන්න ගියා. නමුත්, මේ අවුරුද්දේ මුල් මාස දෙකහමාර තුළ අපේ රටට සංචාරකයන් 528,000කටත් වඩා වැඩි ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවා. නැව් ටිකෙන් ගෙනැල්ලා බස්සලා, ත්‍රී වීලර්වලින් ශ්‍රී ලංකා කොඩිය අරගෙන ඒ සුද්දෝ ටික ගංගාරාම පන්සල වටේ යනකොට උද්ඝෝෂණය කරපු විපක්ෂයේ සෙට් එක තමයි මේ ඉන්නේ කියලා අපට මතකයි. මෙන්න මේක තමයි කුහකකම; මේක තමයි අමූලික කුහකකම. ඒ කුහකකමේ කොටසක් හැටියට තමයි කථානායකතුමා අද බිල්ලට එන්නේ.

දේශබන්දු තෙන්නකෝන් මැතිතුමාට මමත් බැණලා තිබෙනවා. පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරය ගැන චෝදනාව තිබෙනකොට අපි ඒ චෝදනාව කළා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා දේශබන්දු තෙන්නකෝන් මැතිතුමාව පොලිස්පතිවරයා විධියට තමන්ගේ වුවමනාවට තනිවම පත් කළේ නැහැ. ව්‍යවස්ථානුකූලව කරන්න ඕනෑ ක්‍රමවේද අනුව, එතුමාගේ තිබෙන ජ්‍යෙෂ්ඨත්වය අනුව, එතුමාව acting තියලා නිවැරදි ක්‍රමවේදයට අනුවයි එතුමා පත් වුණේ. එතැනින් එහාට එතුමා වැරදිකාරයෙක් නම් උසාවි ගිහිල්ලා, එතුමා පොලිස්පති ධුරයට සුදුසු නැහැ කියලා ඔප්පු කරලා එතුමා අස් කරන්න. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. අපට කිසි කෙනෙක් රකින්න අවශ්‍ය නැහැ. ලෝකයේ මොන රටකද, කැබිනට් ඇමතිවරයෙක් හිරේ ගියේ? එහෙම නම් එතුමාවත් බේරා ගන්න තිබුණා නේ. විපක්ෂයේ එක්කෙනෙකුටවත් ඒවා ගැන කථා කරන්න බැරි ඇයි? එහෙම වුණා නම් කියාවි, රනිල් වික්‍රමසිංහ ඇප අරගෙන දුන්නා කියලා. මේ දේවල් ගැන දැන් එහෙම කථා කරන්න කැමති නැහැ. හරි දෙයක් වෙනවාට මේ අය කැමති නැහැ. එහෙම නම් අපිත් එක්ක හිටපු කෙනෙක් හිරේ ගිය එක වැරදියි කියලා අපි කොහොම හරි එතුමාව බේරා ගන්න එපායැ. මේ රට තුළ නීතියක් තිබෙන්න ඕනෑ. හෘදය සාක්ෂියට එකඟව කථා කරන්න. දේශපාලනය දඬමීමා කරගෙන පමණක් කථා කරන්න එපා. මේ රට බංකොලොත් - bankrupt - වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විශ්වාස කරනවාද, ලෝකයේ තිබෙන ප්‍රධානම ආයතනයක් - මම ඒ insurance ආයතනයේ නම කියන්නේ නැහැ මෙතැන - මෙච්චර කඩාගෙන වැටුණු රටක් මාස 18ක් ඇතුළත ගොඩ ආවේ කොහොමද කියලා ලංකාව ගැන case study එකක් කරන බව? සමහර මිනිස්සු පාකිස්තානය ගැන කථා කරනවා. පාකිස්තානය තවම නැඟිට ගන්න බැරිව ඉන්නවා; ලෙබනනයට තවම නැඟිට ගන්න බැරිව ඉන්නවා; ග්‍රීසියට තවම නැඟිට ගන්න බැරිව ඉන්නවා. හැබැයි, අපේ කටට එන්නේ නැහැ, අපේ රට හොඳයි කියන්න. පාර්ලිමේන්තුවෙ මන්ත්‍රීතුමා ...

ඒම්පික රණවක මන්ත්‍රීතුමා විතරක් පොඩ්ඩක් කියනවා මම අහගෙන හිටියා, "දැන් පොඩි කෙටි කාලීන ස්ථාවරත්වයක් ලබලා තිබුණාට" කියලා. ඒකත් හරි අමාරුවෙන් එතුමා ඇදලා කිව්වේ. ඇයි, කුහක? මේ වගකීම වෙන කෙනෙකුට අරගෙන කරන්න තිබුණා නේ. අඬගහලා දුන්නා නේ. අඬගහද්දී දිව්වේ නැහැ, පැනලා ගිහිල්ලා කැලේ හැංගුණා. අද එතුමා කිව්වා, දැන් මිනිස්සුන්ට අමාරුයි ලු කියලා. මිනිස්සුන්ට අමාරුයි නම් පොඩ්ඩක් සීගිරියට ගිහිල්ලා බලන්න, ලංකාවේ මිනිස්සු විතරක් කොච්චර සීගිරි ගල උඩට නඟිනවාද කියලා. මිනිස්සුන්ට අමාරුයි තමයි. ඒත් ලංකාවේ මිනිස්සුන්ට විශ්වාසයක් තිබෙනවා. අද මිනිස්සුන්ට බලාපොරොත්තුවක් තිබෙනවා. වෙන ඕනෑ නැහැ, මේ ගරු සභාවේ අපට ඉස්සරහ -විපක්ෂය පැත්තේ- ඉන්න එක්කෙනෙක් යාල කැලේට කොච්චර එනවාද? එතුමා වැඩියෙන්ම ඉන්නේ යාල කැලේ. ඇයි, ඒ? එතකොට එතුමාට අමාරු නැද්ද? මේ රටේ විපක්ෂයට ප්‍රශ්න නැද්ද? බලාපොරොත්තුවක්, විශ්වාසයක් තිබෙන නිසා වාගේම මේ රට ගොඩ ඇවිත් තිබෙනවා කියන නිසායි ඒ විධියට යන්නේ. මම ඒකයි කිව්වේ, ලංකාව බංකොලොත් නම්, ෂෙල් කියන ආයතනය බිස්නස් කරන්න ලංකාවට එන්නේ නැහැ කියන එක. ඒ විශ්වාසය අපේ රට කෙරෙහි තිබෙනවා.

මම ඔබතුමන්ලාට කියනවා, අපේ රට මේ යන විධියට ගියොත්, ලංකා ඉතිහාසයේ වැඩියෙන්ම සංචාරකයෝ එන අවුරුද්ද 2024 බවට පත් වෙනවාය කියලා. මාස දෙකහමාරට සංචාරකයෝ ලක්ෂ පහමාරක් විතර අපේ රටට එන්න පුළුවන් නම් - වැඩි කර ගන්න පුළුවන් නම් වැඩි කරලා බලන්න - එතකොට අවුරුද්දට සංචාරකයෝ කීයක් අපේ රටට එනවාද කියලා බලන්න. Tourist season එක එන්නේ ඊට පස්සේ. ඒ නිසා අපි විපක්ෂයට කියනවා, කුහක වෙන්න එපා කියලා. අද මිනිස්සුන්ට ඉඩම් ටික හම්බ වෙනවා. මම දැක්කා, ඉඩම් දෙන්නේ කැලෑවේ කියලා කියනවා. කැලෑවේ ඉඩම් දෙන්නේ නැහැ. ස්වර්ණ භූමි, රන් භූමි, ජය භූමි වැනි මිනිස්සුන්ට තිබුණු ඔප්පු, සින්නක්කරව ඔප්පු නොදීපු ලක්ෂ 20කට තමයි ඒ ඔප්පු දෙන්නේ. ඒක හොඳ නැද්ද? එතකොට තරුණ ව්‍යවසායකයෝ ලක්ෂ 10කට, රුපියල් ලක්ෂ 10 ගණනේ දෙන එක හොඳ නැද්ද? ඒ දේවල් නවත්වන්නද මේ උත්සාහ දරන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාව ගැනත් දැන් කථා කරනවා. කොහොම කොහොම හරි ක්‍රීඩාවත් දැන් හොඳ පැත්තකට හැරිගෙන යනකොට ඒකටත් මොකක් හෝ කථාවක් කියනවා. ඊයේ, පෙරේදා ලෝකයේ සිටින ප්‍රධාන ක්‍රීඩකයෝ ලංකාවට ඇවිල්ලා සෙල්ලම් කළා. මුළු නුවරම එක කාමරයක් ගන්න බැරි වෙන්න හෝටල්වල සංචාරකයින් පිරුණා. කලින් ඩොලර් 70ට, 60ට ලබා දුන් කාමරයක අවම මිල ඩොලර් 180-200 දක්වා ඉහළ ගියා. කාටද එහි වාසිය ලැබෙන්නේ?

කථානායකතුමාව දඬමීමා කරගෙන, කථානායකතුමාගේ දොස්තර පුතා කුමක් හෝ තනතුරකට පත් වුණාය කියන එක ගැන කථා කරන, මෙතැන ඉන්න සමහර අයගේ දරුවෝ ඉන්නේ එක එක තානාපති කාර්යාලවල. ඒවා නොදන්නවා වාගෙයි විපක්ෂයෙන් කථා කරන්නේ. එහෙම කථා කරමින් මේ කථානායකතුමාට අපහාස කරනවා. *[බාධා කිරීමක්]* නම කියන්න ඕනෑ නැහැ, ඉස්සරහා පේළිවල ඉන්න කට්ටිය කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මම කථාව අවසන් කරනවා. දැන් මගේ ආදරණීය මිත්‍ර විමල් වීරවංශ මැතිතුමා කිව්වා එතුමාට තිබුණු වෙලාව කැපුවාය කියලා. ඔබතුමාගේ වෙලාව කැපුවේ අපි නොවෙයි. ඔබතුමා දන්නවා කවුද ඒක කළේ කියලා. ඔබතුමන්ලා ඒක විසඳාගන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුව විහිළුවක් කරලා අවසානයි. ඒ නිසා මේ වාගේ කාලය නාස්ති කරන, බොරු දේශප්‍රේමී වැඩ පෙන්වන්න හදන්න එපා. හාල් මිටියක් කරේ තබාගෙන ගිහින්, එහෙම නැත්නම් බස් ටිකක් බෙදාගෙන ගිහින් කාලය වෙනස් කරගන්න. අපේ කාලය නාස්ති කරන්න එපා කියමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

[අ.භා. 3.59]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு செஹான் சேமசிங்க - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Finance)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම හරින් ප්‍රනාන්දු ඇමතිතුමා,- *[බාධා කිරීමක්]* ඔව්, විනාඩි දෙකයි. දෙන්න පුළුවන්ද තව ටිකක්? හරින් ප්‍රනාන්දු ඇමතිතුමා මතක් කරපු කාරණය පිළිබඳව කථා කරන්නයි මම නැඟිට්ටේ. විශේෂයෙන්ම මේ කථානායකතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒම නොවෙයි මෙතුමන්ලාගේ බලාපොරොත්තුව වුණේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දෙවැනි සමාලෝචනය සඳහා ඒ කණ්ඩායම ශ්‍රී ලංකාවේ සමාලෝචන කටයුතු කරද්දී ඒ සඳහා යම් අවිනිශ්චිතභාවයක් ඇති කිරීමේ අරමුණින් තමයි මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ. නමුත්, ඒක පරාජය කරන්න අපි රජයක් හැටියට කටයුතු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෛවයේ සරදම කියන්නේ මේ ආණ්ඩුවට මඩ ගහලා, ආණ්ඩුව පිළිබඳ වැරදි තොරතුරු සමාජගත කරන්න ගිහිල්ලා, සමාජ මාධ්‍ය මඟින් දිගින් දිගටම අසත්‍ය ප්‍රචාරය කරලා අවසානයේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳ අවිනිශ්චිතතාවක් ගොඩනඟන්න උත්සාහ කළාට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් ශ්‍රී ලංකාවත් අතර අද කාර්ය මණ්ඩල එකඟතාවකට පැමිණෙනවා. පළමු සමාලෝචනය සිදු වෙලා කාර්ය මණ්ඩල එකඟතාවකට එන්න අපට මාසයක පමණ කාලයක් ගත වුණා. එතකොට විපක්ෂය දිගින් දිගටම කිව්වා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මේ ජනාධිපතිතුමා සහ රජය පිළිගන්නේ නැහැ, ඒ නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය අපට ලැබෙන්නේ නැහැ කියලා. මාස 18කට පස්සේ මේ රටේ ජනතාව නැවත යහපත් ආර්ථිකයකට ගෙන යන්න ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත්, ජනාධිපතිතුමා සහ රජය ගෙන ගිය වැඩ පිළිවෙළ සමත් වුණා කියන එක අද ඔප්පු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේක වැදගත් වෙන්න තවත් හේතුවක් තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පෙන්වා දෙනවා, මේ රටේ ආර්ථිකය ගොඩනඟන්න රජයත්, ජනාධිපතිතුමාත් කැපවීමෙන් කටයුතු කළේ කොහොමද කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව මිනිත්තුවක කාලයක් ලබා දෙන්න.

මේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය අරගෙන යන්නේ කොහොමද කියන කාරණය පිළිබඳවත්, එතැනින් වෙනස් වුණොත්, නැවත මේ ආර්ථිකය 2022දී පැවති තත්ත්වයට වඩා බරපතළ තැනකට තල්ලු වන ආකාරය පිළිබඳවත් ඔවුන් පැහැදිලි කරනවා. මේක අපේ ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන තුළ අවසාන එකඟතාවකට එන්න මහත් රුකුලක් වෙනවා. මේ රටේ ආර්ථිකය පිළිබඳ තිබෙන අවිනිශ්චිතතා සියල්ල අදින් පසුව ඉවත් වෙනවා. මේ රටේ ආර්ථිකයේ ස්ථාවරත්වය වර්ධනය කරා ගෙනයන්න අපට ශක්තියක් වෙනවා. ඒ නිසා මේ අවස්ථාවේ අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලටත්, මේ වෙනුවෙන් ජනාධිපතිතුමා ලබා දීපු නායකත්වය වෙනුවෙන්, මේ පාර්ලිමේන්තුව ලබා දීපු නායකත්වය වෙනුවෙන්, මේ රටේ මහජනතාව ලබා දීපු සහයෝගය වෙනුවෙන් සහ මේ වෙනුවෙන් කටයුතු කරපු මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය ඇතුළු මේ හා සම්බන්ධ සියලු අමාත්‍යාංශවලටත් ස්තුතිය සහ ගෞරවය පුද කරමින්, යහපත් ආර්ථිකයකට නැවුම් බලාපොරොත්තු අද අපේ රටේ ජනතාවට තවදුරටත් ලැබුණා කියා ප්‍රකාශයට පත් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහහතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.02]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් කථානායකතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. හැබැයි, කථානායකතුමාට එරෙහිව ගෙනැල්ලා තිබෙන විශ්වාස භංග යෝජනාව සම්බන්ධව කවුරුවත් උත්තර බැන්දේ නම් නැහැ. ඒ වෙනුවට තෙල් පෝලිම් ගැන, ආර්ථිකය ගැන, තව නොයෙක් නොයෙක් කතන්දර ගැන, විපක්ෂ නායකතුමාට වෙන් වෙලා තිබෙන කාලය ගැන වාගේ කරුණු ගණනාවක් ගැන තමයි පැහැදිලි කළේ.

අපට මෙතැනදී කථානායකතුමාගේ පෞද්ගලික ජීවිතය ගැන වැඩක් නැහැ. එතුමාගේ මනුෂ්‍යත්වය පිළිබඳව, එතුමාගේ අංගෝපාංග පිළිබඳව, එතුමාගේ තිසේ කෙස්වල ප්‍රශ්න ගැන, අනෙකුත් ප්‍රශ්න ගැන වැඩක් නැහැ. අපට මෙතැනදී වැදගත් වෙන්නේ එතුමාගේ වගකීම, එතුමාගේ වගවීම. එතුමා මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225දෙනාගේම කථානායකවරයා විධියට පත් වුණාම, ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරු දෙදෙනෙක් දෙපැත්තෙන් අත අල්ලාගෙන ගිහින් තමයි එතුමාව

ඔය ආසනයේ වාඩි කරන්නේ. එතකොට ගෙවී ගිය කාලපරිච්ඡේදය තුළ ඒ ආසනයේ හරි මැද ඉඳගෙන දෙපැත්තට සමබරවද එතුමා කටයුතු කළේ කියන බරපතළ ප්‍රශ්නය තිබෙනවා. එතුමා ආණ්ඩුවට පක්ෂග්‍රාහීව කටයුතු කළ අවස්ථා ගණනාවක් අපි දැක තිබෙනවා. විශේෂයෙන්ම එතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවලට දක්වපු ප්‍රතිචාර පිළිබඳව අපි දිගින් දිගටම කථා කරලා තිබෙනවා. ඒ වාගේම සමහර මන්ත්‍රීවරු දිවුරුම් දෙනකොට එතුමා ඉඳගෙන ප්‍රතිචාර දක්වනවා, සමහර මන්ත්‍රීවරු දිවුරුම් දෙනකොට එතුමා හිටගෙන ප්‍රතිචාර, ගෞරව දක්වනවා. ඒකද කථානායකතුමාගෙන් විය යුතු වගකීම කියලා මම අහනවා. මෙතැන තිබෙන්නේ මේ කථානායකතුමාට විශ්වාස භංගයක් ගෙනෙන්න මූලික වුණු කාරණා පිළිබඳ ප්‍රශ්නයක්.

විශේෂයෙන්ම අපි දන්නවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේදී හතර දෙනෙක් "Yes" කියද්දී, දෙදෙනෙක් "No" කියද්දී, දෙදෙනෙක් "Abstain" කියනවා. පස්සේ එතුමා තීන්දු කරනවා, "Abstain" වෙච්ච අයගේ ඡන්ද කාටද වැටෙන්න ඕනෑ කියලා. අපේ විපක්ෂ නායකවරයා ඒකට හොඳ උදාහරණයක් කිව්වා. පසුගිය කාලයේ සම්මත කළ සමහර අණ පනත්වල "Abstain" හැටියට දුන් ඡන්ද විරුද්ධයි කියලා සැලකුවොත් මොකද වෙන්නේ කියලා. මෙතැන බොහොම පැහැදිලියි, කථානායකවරයා අද විධායකයේ අතකොළුවක් බවට පත් වෙලා තිබෙනවා කියන එක. ඒකට හේතු භූත වූ කාරණා ඕනෑ තරම් තිබෙනවා. පසුගිය කාලයේ එතුමාගේ වගකීම ඉෂ්ට නොකරන්න ඒක හේතු වුණා කියන එක බොහොම පැහැදිලියි.

ඒ වාගේම මට පොඩි සැකයක් තිබෙනවා, කොරෝනා කාලයේ එවකට සෞඛ්‍ය ඇමතිතුමිය වූ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය ධම්මික පැණිය test කරන්න ඉස්සෙල්ලාම දුන්නේ කථානායකතුමාට. ඒ වෙලාවේ එතුමාට දුන් ධම්මික පැණිය වසක් විසක් වෙලා පසුකාලීනව මේක බලපා තිබෙනවා ද කියලාත් මට වෙලාවකට හිතෙනවා. ඒ පිළිබඳවත් අපි හොයලා බලන්න ඕනෑ. මෙතැන වැදගත් වෙන්නේ මේ පාර්ලිමේන්තුවේ ගෞරවය රැකීමයි. මේ විවාදයේදී සමහර අය විපක්ෂ නායකවරයාට තමයි චෝදනා කළේ, එතුමා කාලය ලබා ගන්නවා වැඩියි කියලා. කාලය කළමනාකරණය කිරීම කථානායකතුමාගේ වගකීමක්. විපක්ෂයට හෝ විපක්ෂ නායකතුමාට කාලය වැඩියෙන් දෙනවාද නැද්ද කියන එක විපක්ෂ නායකතුමාගේ හෝ අපේ වගකීමක් නොවෙයි, ඒක කථානායකතුමාගේ වගකීමක්. ඒකත් ප්‍රශ්නයක් නම් කාට හෝ පුළුවන් ඒකත් මේ විශ්වාස භංගයේදී ප්‍රශ්නයක් විධියට යොමු කරන්න. අපි පැහැදිලිව නිශ්චිත කරුණු කාරණා ඇතිව තමයි මේ විශ්වාස භංග යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ. හොඳට මතක තබා ගන්න, අද සමහරු එතුමාට පක්ෂව ඡන්දය දෙයි. එදා සෞඛ්‍ය ඇමති වශයෙන් කටයුතු කළ කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනාපු වෙලාවේ සමහර අය අත් උඩ දාගෙන එතුමාට සහයෝගය දීලා, මේ මේස පැලෙන්න තට්ටු කරලා තමයි ජය සැමරුවේ. හැබැයි, මාස 3ක්, 4ක් යනකොට මේ රටේ සමස්ත ජනතාව ඉදිරියේ කෙහෙළිය රඹුක්වැල්ල හිටපු සෞඛ්‍ය ඇමතිවරයා වැරදිකරුවා බවට පත් වෙලා තිබෙනවා. අද එතුමා බන්ධනාගාරගත වෙලා ඉන්නවා. සමහර විට කියන්න පුළුවන්, එතුමාට තිබෙන චෝදනා තවම ඔප්පු වෙලා නැහැ කියලා. හැබැයි, රටේ ජනතාවගේ හෘදය සාක්ෂිය ඉදිරියේ කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිවරයා ඖෂධ මගඩියට වැරදිකරුවෙක් වෙලා තිබෙන්නේ. ඒක බොහොම පැහැදිලියි. මේක මගඩියක් කියන්න බැහැ, වංචාවක් කියන්න බැහැ. මගඩි, වංචා අපි දැකලා තිබෙනවා. මේක මිනී මැරුමක්. මේක රටේ මිනිස්සුන්ගේ ජීවිතත් එක්ක කරපු සෙල්ලමක්. එදා අත්පුඩි ගහලා, මේසවලට ගහලා සතුට සැමරුවා වාගේ කථානායකතුමාට එරෙහිව ගෙන ආ මේ විශ්වාස භංග යෝජනාවට අදාළ ඡන්දයෙන් පස්සේත් ඔබතුමන්ලා සතුට සමරයි. හැබැයි, මාස කිහිපයකින් ඒ සතුට ආපස්සට හැරෙන්න ඉඩ තිබෙනවා.

අපි දැක්කා නේ, COPE එකට සභාපතිවරයා පත් කරපු ආකාරය. ඒ ගැන කථානායකවරයාට විශේෂ වගකීමක් තිබෙනවා. පසුගිය කාලයේ මේ කාරක සභාවලට ස්වාධීනව කටයුතු කරන්න අවස්ථාව දුන්නා. අවස්ථා ගණනාවකදීම විපක්ෂයේ මන්ත්‍රීවරයකුට සභාපතිත්වය දුන්නා. හැබැයි, දැන් දීර්ඝ වශයෙන්ම මේවා ආණ්ඩුවට, විධායකයට ඕනෑ විධියට හසුරුවන්න ඉඩ දීලා කථානායකවරයා නිහඬව බලාගෙන ඉන්නවා. මෙවැනි ප්‍රශ්න ගණනාවක් හින්දා තමයි අද කථානායකවරයාට විරුද්ධව මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. සමහර විට අපට මේ සභාව ඇතුළේ මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කරන්න බැරි වෙන්න පුළුවන්. හැබැයි, හොඳට මතක තබා ගන්න, තව පොහොය තුනයි, හතරයි මේ ආණ්ඩුවට තිබෙන්නේ කියන එක. මේ පොහොය තුන හතර ඇතුළතදී මේ කථානායකවරයාගේ විතරක් නොවෙයි, විධායකයේ සහ මේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගේ ඒ ධුරවල ආයු කාලයත් අවසන් වෙන්න පුළුවන්. ඒකට වැඩි ඈතක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් පෝය තුනහතරයි තිබෙන්නේ. මේ රටේ ජනතාවට අද ඕනෑ වෙලා තිබෙන්නේ මේ අයගේ බයිලා අහන්න නොවෙයි. මහා සුරපුරයකට රට ගෙනිච්චා වාගේ තමයි මේ අය දැන් කථා කරන්නේ. හැබැයි, ගමේ ගෙදරකට යන්න ඕනෑ, නගරයේ ගෙදරකට යන්න ඕනෑ, ඒ මිනිස්සු කනවාද, බොනවාද කියා සොයා බලන්න. මිනිස්සු තම කන බොන දේවල්, ජීවත් වීම සඳහා වන අවම අවශ්‍යතා සපුරා ගැනීම සියයට 50කින් කපා හැරලායි තිබෙන්නේ. පෝලිම නැති එකේ නොවෙයි, ප්‍රශ්නය තිබෙන්නේ. දැන් පෝලිමේ ඉඳලාවත් තමන්ට භාණ්ඩයක් මිල දී ගැනීමට, තමන්ගේ දරුවාට අවශ්‍ය දෙයක් ලබා දීමට වුවමනා කරන මුදල් මිනිසුන්ගේ සාක්කුවේ නැහැ. පවුල් කීයක් නම් මේ මාස තුන ඇතුළත සිය දිවි නසා ගත්තා ද? පවුල් කීයක නම් මව්පියන් තමන්ගේ දරුවන් එක්ක තමන්ගේ ජීවිතයෙන් සමු ගන්න try කළා ද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අසත්‍ය කියන්න එපා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා ඇත්ත තොරතුරු. ඕනෑ නම් ආණ්ඩුව විධියට ඔබතුමන්ලාට පුළුවන්, මේ තොරතුරු සත්‍යය ද කියා පරීක්ෂා කර බලන්න. ඇත්ත වශයෙන්ම මිනිසුන්ට අද ජීවත් වෙන්න බැහැ. තමන්ට ප්‍රශ්න නැති නිසා ඔබතුමන්ලාට කියන්න පුළුවන්, "බොරු කියන්න එපා; බොරු කියන්න එපා" කියලා. හැබැයි, රටේ මිනිසුන්ට ප්‍රශ්න තිබෙනවා; ජීවත් වෙන්න විධියක් නැහැ; කන්න බොන්න විධියක් නැහැ; දරුවන්ට උගන්වන්න විධියක් නැහැ. *[බාධා කිරීම්]*

මෙතුමන්ලාගේ මුදල් රාජ්‍ය ඇමතිතුමා බොහොම ලස්සන වචන කිහිපයක් කියනවා අපි දැක්කා. මම මේ අවස්ථාවේ යෝජනාවක් කරනවා. එය බොහොම විවෘත යෝජනාවක්. ජනතා විමුක්ති පෙරමුණත් ආර්ථික කමිටුවේ තුන්දෙනෙක් හඳුන්වා දී තිබෙනවා අපි දැක්කා. ඒ, සුනිල් හඳුන්නෙත්ති මහත්මයාගේ සහ තවත් දෙදෙනෙකුගේ නම්. ආණ්ඩුවේ ඔබතුමන්ලාගේත් මුදල් රාජ්‍ය ඇමතිවරු දෙන්නෙක්ම ඉන්නවා. ඒ දෙදෙනා සහ මුදල් ඇමතිතුමා විධියට ජනාධිපතිතුමා වුණත් කමක් නැහැ. අපේත් මුදල් කමිටුවේ තුන්දෙනෙක් ඉන්නවා. එහි ආචාර්ය හර්ෂ ද සිල්වා මහත්මයා ඉන්නවා; ඉරාන් වික්‍රමරත්න මහත්මයා ඉන්නවා; කබීර් හෂීම් මහත්මයා ඉන්නවා. මේ තුන් කට්ටුව එක්ක රටේ ඕනෑම තැනක, ඕනෑම මාධ්‍යයක් ඉදිරියේ විවාදයකට එන්න. මම අවස්ථා

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ගණනකදී මේ අභියෝගය කළා. හැබැයි, තුන්වන පිල විධියට ආණ්ඩුවට අභියෝග කළේ අදයි. ජනතා විමුක්ති පෙරමුණට අවස්ථා ගණනාවකදී මම මේ අභියෝගය කළා. හැබැයි, ඒ ගොල්ලන් ඒ අභියෝගය භාර ගන්න සූදානම් නැහැ. ඒ ගොල්ලන් තැන් තැන්වල වේදිකා හදාගෙන කයියනායකලා විධියට රටට ලෝකයට බොරු කියනවා මිස සමගි ජන බලවේගයේ ආර්ථික කමිටුවත් එක්ක මුහුණට මුහුණ හැපෙන්න සූදානම් නැහැ. ඒ නිසා මම අද මේ පාර්ලිමේන්තුවේදී ප්‍රථම වතාවට ආණ්ඩුවටත් ඒ අභියෝගය කරනවා. අපේ සමගි ජන බලවේගයේ ආර්ථික කමිටුවත් එක්ක -ඒ තුන් කට්ටුව එක්ක- විවාදයකට එන්න කියලා ජනතා විමුක්ති පෙරමුණේ ආර්ථික කමිටුව යැයි කියා ගන්නා සුනිල් හඳුන්නෙත්ති මහත්මයා ඇතුළු අනික් දෙදෙනාට සහ ආණ්ඩුවේ ආර්ථික කමිටුවට මම අභියෝග කරනවා. අපි ඒ විවාදය සූදානම් කරමු. අපේ තුන්දෙනා ඒ කටයුත්තට ලැහැස්තියි. මේ රට ගෙන යන්න ඕනෑ නිවැරදි මාර්ගය මොකක්ද, මේ ආණ්ඩුව ගෙන තිබෙන වැරදි ප්‍රතිපත්ති මොනවාද, වැරදි ක්‍රියා මාර්ග මොනවාද කියන්න අපි ලෑස්තියි. විශේෂයෙන් IMF එකට වන්දනා කරමින් පොඩි මිනිහා පිට බදු පනවමින් ලොකු මිනිහාව ආරක්ෂා කරන්න, haircut එකක් කරන්න කිව්වාම EPF, ETF එකට බර පටවන්න, මහා පරිමාණ බැඳුම්කර හිමියන්ගේ අරමුදල් ආරක්ෂා කරන්න කටයුතු කරමින් තමයි ආණ්ඩුව අද මේ ගමන යන්නේ. ඒ ගොල්ලන් IMF එක සතුටු කරන්නේ තමන්ගේ පිල, තමන්ගේ කල්ලිය ආරක්ෂා කරමින් මේ රටේ අහිංසක දුගී දුප්පත් මිනිසුන් මත බදු පනවලායි. ඒක තමයි ඇත්ත කථාව. ඒ නිසා මේ ආණ්ඩුව හිතාගෙන ඉන්නවා නම්, මේ රටේ මිනිසුන් සතුටින් සුඛිත මුදිත වෙලා ඉන්නවා කියලා, ඡන්දයක් තියන්නකෝ. බැසිල් පිල වෙන්න පුළුවන්, රනිල් පිල වෙන්න පුළුවන්, මහින්ද පිල වෙන්න පුළුවන්, ඔය තුන් කට්ටුවම එකතු වෙලා හදන ජනාධිපති අපේක්ෂකයා කවුරු වුණත් අපට ප්‍රශ්නයක් නැහැ. මේ රටේ මිනිසුන්ගෙන් සියයට 10ක්වත් ඡන්දය දෙන්නේ නැහැ ඔය පිලට. මොකද, ගම්වල ඉන්න අය විධියට, නගරයේ ඉන්න අය විධියට අපි ඒ මිනිසුන්ගේ ආකල්ප දකිනවා. මහ පොළොවේ ඉන්න අය විධියට අපි ඒ මිනිසුන් ජීවත් වෙන විධිය දකිනවා. මේ ගොල්ලන් සුරපුරවල ඉඳන්, අහස් මාළිගාවල ඉඳන් අද රට මහා දියුණු තැනකට පත් වුණා කියලා පුරසාරම් දොඩනවා. හැබැයි, අර මිනිසුන්ගේ සාක්කුවේ සතේ නැහැ. කන්න, බොන්න, තමන්ගේ දරුවන් ජීවත් කරවන්න අවශ්‍ය මුදල සාක්කුවේ නැහැ. තමන්ගේ දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන්න, එහෙම නැත්නම් ටියුෂන්වලට අවශ්‍ය මුදල දී ගන්න විධියක් නැහැ; පොත පත අරගෙන දෙන්න විධියක් නැහැ. හැබැයි, මෙතුමන්ලාගේ පොර ටෝක් නම් තිබෙනවා.

අපි ආණ්ඩුවට පැහැදිලිවම කියනවා, මේ රටේ ජනතාව තමන්ගේ අවස්ථාව උදා වෙනතුරු බලාගෙන සිටින බව. මේ පම්පෝරි ගහන දේශපාලනඥයන්ට, මේ පම්පෝරි ගහන නායකයන්ට තමන්ට තිබෙන එකම වරමෙන්, එකම අවියෙන් උත්තර දෙන්න ජනතාව බලාගෙන ඉන්නවා. ඒ අයිතිය තමයි ජනතාවට තිබෙන ඡන්ද අයිතිය. ඒ ඡන්ද අයිතියෙන්, තමන්ගේ කතිරයෙන් උත්තර දෙන්න ජනතාව බලාගෙන ඉන්නවා. ආණ්ඩුව සල්ලි නැහැ කියලා පළාත් පාලන මැතිවරණය වැළැක්වූයේ ඇයි? තමන්ට ඡන්ද නැති නිසා. ඡන්ද නැති නිසා පළාත් පාලන මැතිවරණය වැළැක්වූවා. හැබැයි, ජනාධිපතිවරණය එහෙම වළක්වන්න බැහැ කියලා මුළු රටම දන්නවා. තව පෝය කීයද කියලා ගණන් කරලා බලන්න. 2024 උදා වෙලා දැන් මාර්තු මාසයත් ඉවර වෙන්න ළඟයි. මේ සාදය හමාර කරන්න තව තිබෙන්නේ පෝය කිහිපයයි. *[බාධා කිරීම්]* මේ රටේ මිනිස්සු තමන්ට ඒ අවස්ථාව උදා කරන තුරු මහ බලාගෙන ඉන්නේ; ඇඟිලි ගණන් කරමින් ඉන්නේ. ඒ නිසා ඔය ගොල්ලන්ගේ ඔය චූන් එක තියා ගන්න.

හැබැයි, මේ රටේ මිනිසුන් සැබැවින්ම හොඳින් ජීවත් වෙනවාද, එහෙම නැත්නම් මැරි මැරී ජීවත් වෙනවාද කියන ප්‍රශ්නය දිහා රටේ වග කිව යුතු විපක්ෂය විධියට වාගේම, ඊළඟට ආණ්ඩුව හදන පක්ෂය විධියට අපි වගකීමෙන් බලනවා; ඒ වාගේම ඒ ප්‍රශ්නයට උත්තරයත් හොයනවා. ඒ නිසා තමයි අපි පක්ෂයක් හැටියට මේ විධියට කටයුතු කරමින් ඉන්නේ.

විපක්ෂ නායකවරයා විධියට ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා විපක්ෂයේ ඉඳන් තමන්ට කරන්න පුළුවන් වැඩ කොටස - විශේෂයෙන්ම සෞඛ්‍යය සහ අධ්‍යාපනය වෙනුවෙන්- අද ඉටු කරනවා. පම්පෝරි ගහන්න ගොඩක් අයට පුළුවන්. හැබැයි, රටේ ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් වන සෞඛ්‍යය සහ අධ්‍යාපනය තෝරා ගෙන විපක්ෂයේ ඉඳිමින් ඒවා සම්බන්ධයෙන් දැවැන්ත වැඩ කොටසක් කරන්න පුළුවන් හයිය එතුමාට තිබෙනවා. එහෙම නම්, එතුමා මේ රටේ නායකයා බවට පත් වුණාට පසුව "භාණ්ඩාගාරයේ සල්ලි නැහැ, ඩොලර් නැහැ, IMF එකෙන් හම්බ වෙනකල් ඉන්න" කිය කියා ඉන්නේ නැහැ. එතුමා භාණ්ඩාගාරයට සල්ලි උපයා ගන්නත් දන්නවා; භාණ්ඩාගාරයේ සල්ලි මතම පදනම් නොවී මේ ලෝකයත් එක්ක බද්ධ වෙලා වැඩ කරන විධියත් දන්නවා. ඒකට ශක්තිය දෙන්න පුළුවන් කණ්ඩායමකුත් එතුමා එක්ක ඉන්නවා. ඒ නිසා අපි මේ රටේ ජනතාවට පැහැදිලිවම කියනවා, මේ රටේ ජනතාව හරි පාර හඳුනා ගන්න ඕනෑ බව.

දැන් සමහරු බෝඩ් ගහගෙන යනවා අපි දකිනවා, "මේ පාර මාලිමාවට" කියලා. මම ඒ එක්කෙනෙකුගෙන් ඇහුවා, උඹ ගිය පාර දුන්නේ මොකකටද කියලා. ගිය පාර දුන්නේ පොහොට්ටුවට ලු. එහෙම නම්, ලබන පාර දෙන්නේ මොකකටද? ඒ විධියට වරින් වර පාරවල් මාරු කර කර ගිහිල්ලා බැහැ. සමගිය තමයි හරි පාර. *[බාධා කිරීම්]* සමගිය තමයි හරි පාර. *[බාධා කිරීම්]* සමගිය තමයි හරි පාර. ගිය පාර පොහොට්ටුවට දීලා, මේ පාර මාලිමාවට දීලා, ඊළඟ පාර තව කොහේ හරි අපත පාරක යන්න නොවෙයි මේ රටේ මිනිසුන් බලාගෙන ඉන්නේ. *[බාධා කිරීම්]* "සමගිය තමයි හරි පාර" කියලා, නිවැරදි ආර්ථික වැඩ පිළිවෙළත් එක්ක නිවැරදි දිසාවට මේ රට අරගෙන ගිහිල්ලා මුලින්ම මේ රටේ මිනිසුන්ට ජීවත් වීමේ අයිතිය ලබා දීලා, ඊළඟට මේ රට දියුණු රටක් බවට පත් කරන ඒ දැවැන්ත ආර්ථික වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පුළුවන්කම තිබෙන කණ්ඩායමක් සමගි ජන බලවේගය තුළ ඉන්නවා කියන එක මම බය නැතිව කියනවා. ඒ නිසා සමහර කට්ටියට රිදෙන්න පුළුවන්. කථාවක් තිබෙනවා නේ, "මස් කඩේ අන්තිම හරකාගේ කථාව" කියලා. දැන් මේ ගොඩක් අය ඉන්නේ මස් කඩේ ඉන්න අන්තිම හරකා වාගේයි. මොකද, මස් කඩේ ඉන්න අන්තිම හරකාට no option; කොහොමත් ෂොට් එක වදිනවා. *[බාධා කිරීම්]* කොහොමත් ෂොට් එක වදිනවා. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද, හරකා?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඒ නිසා මස් කඩේ හරක් - *[බාධා කිරීම්]* තොප්පිය හරි කට්ටිය දමා ගත්තාට කමක් නැහැ. මස් කඩේ අන්තිම හරකාට වාගේ අන්තිම ෂොට් එක වැදෙන කට්ටිය තමයි දැන් මේ ගොඩක් කලබල වෙලා කෑ ගහන්නේ.

මේ රටේ මිනිස්සු පැහැදිලිවම හරි පාර තෝරා ගන්න ඕනෑ. ඒ හරි පාර වන්නේ සමගි ජන බලවේගයත් එක්ක ඉදිරියට යන කණ්ඩායම ගමන් කරන පාරයි. ඒ පාර තමයි හරි පාර. මේ රට නිවැරදි ආර්ථික වැඩ පිළිවෙළකට අනුව ගෙන යා හැකි, මේ රට ලෝකයත් එක්ක බද්ධ කරලා, ලෝකයත් එක්ක ගිවිසුම්ගත වෙලා, ලෝකයත් එක්ක සම්බන්ධ වෙලා මේ රටට ජයග්‍රහණ අත්පත් කර ගන්න පුළුවන් දිශාවට තමයි ඒ පාර විවර වෙලා

තිබෙන්නේ. ඒ නිසා, සමගි ජන බලවේගයත් එක්ක හරි පාරේ ගමන් කරන්න, සමගියේ මාර්ගයේ ගමන් කරන්න එකතු වෙන්න කියා මා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු ෂෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමගි ජන බලවේගය දැන් අපට අභියෝගයක් කළා. අපි ඒ අභියෝගය භාර ගන්න ඕනෑම වෙලාවක සූදානම්. ඕනෑම නාළිකාවක් සූදානම් කරන්න, අපි ඒ විවාදයට එන්න සූදානම්. *[බාධා කිරීම්]* හැබැයි, එක දෙයක් කියන්න ඕනෑ. පසුගිය අවුරුදු දෙකක කාලය තුළ අපි මේ පාර්ලිමේන්තු විවාදවලදී විකල්ප යෝජනා ඉල්ලුවා. හැබැයි, එදා මේ කාටවත් විකල්ප යෝජනාවක් දෙන්න බැරි වුණා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා ඉස්සෙල්ලාම ජනතා විමුක්ති පෙරමුණ එකඟ කරවා ගන්න. ඊට පසුව අපිත් ඒ විවාදයට එන්න සූදානම්. හැබැයි, මතක තබා ගන්න. ආර්ථික කවුන්සලයේ අයයි කියලා නලින් බණ්ඩාර වාගේ මන්ත්‍රීවරු එවන්න එපා. *[බාධා කිරීම්]*

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මුදල් රාජ්‍ය ඇමතිතුමා දැන් විකල්ප යෝජනා ගැන කිව්වා. ආර්ථික අර්බුදය ඇති වුණු වෙලාවේ අපි කමිටුවක් පත් කරලා පැහැදිලිව විකල්ප යෝජනා ලබා දුන්නා. මම දන්නේ නැහැ, එතුමන්ලා ඒ දවස්වල නිදාගෙන හිටියා ද කියලා. අපි විකල්ප යෝජනා දුන්නා. *[බාධා කිරීමක්]*

**ගරු ෂෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ඒ කාලයේ තමුන්නාන්සේලා- *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මේක විවාදයක් කර ගන්න එපා, ගරු රාජ්‍ය ඇමතිතුමා. *[බාධා කිරීම්]*

**ගරු ෂෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිව්වේ විකල්ප යෝජනා ලබා දීමක් ගැන නොවෙයි. පිළිගත හැකි විකල්ප යෝජනා ගැනයි මම කිව්වේ. අනෙක, සමගි ජන බලවේගය සහ ජනතා විමුක්ති පෙරමුණ කියන පක්ෂ දෙකම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මැදිහත් වීම වැදගත් කියලා දැන් වන විට පිළිගෙන තිබෙනවා. ඒ නිසා මෙච්චර කල් විවේචනය කළාට අද වන විට ඒ අය අපේ ඒ කටයුත්ත පිළිගෙන තිබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ටිරාන් අලස් අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு வசந்த யாப்பாபண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. WASANTHA YAPABANDARA left the Chair and DEPUTY SPEAKER took the Chair.*

[අ.භා. 4.17]

**ගරු ටිරාන් අලස් මහතා**
(மாண்புமிகு டிரான் அலஸ்)
(The Hon. Tiran Alles)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම විශ්වාස භංග යෝජනාවට පදනම් වෙලා තිබෙන්නේ, Online Safety Bill එක සහ පොලිස්පතිතුමා පත් කිරීම කියන කාරණාවයි. මම පළමුවෙන්ම කියන්න ඕනෑ, Online Safety Act එක ගැන. එම පනත කෙටුම්පත් කරන්න පටන් ගෙන තිබුණේ යහපාලන ආණ්ඩුව කාලයේ. 2018දී පටන් ගත් එම කටයුත්ත අමාත්‍යාංශ දෙකක් හරහා ඇවිල්ලා තමයි මගේ අමාත්‍යාංශයට භාර දුන්නේ. අපි පුළුවන් විධියට Online Safety Act එකට අදාළ පනත් කෙටුම්පත සකස් කළා. මොකද, අපට හැම දාම ගොඩක් පැමිණිලි එනවා. අම්මලා, ගැහැනු ළමයි telephone කරලා අඬමින් කියනවා Online Safety සම්බන්ධ Act එකක් ගෙනෙන්න කියලා. එහෙම කියන්නේ, ඒ අයට -ළමයින්ට, ගැහැනු අයට- social mediaවලින් සිදු වන හිරිහැර නිසායි. එම පනත් කෙටුම්පත පුළුවන් තරම් ඉක්මනට සම්මත කර ගන්න ඕනෑ කියලා මා තීරණය කළේ එවැනි කරුණු හින්දායි. ඒ අනුව, අපි මේ අවුරුද්දේ ජනවාරි 23 සහ 24 යන දෙදින මෙම පාර්ලිමේන්තුවේදී ඒ පනත් කෙටුම්පත පිළිබඳ විවාදය පැවැත්වූවා.

එසේ විවාදය පවත්වලා අපි එම පනත සම්මත කරගත්තා. ඒ වෙලාවේ මට මතකයි, මේ පනත් කෙටුම්පත සම්මත කරන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ observationsවලට අනුකූලව නොවෙයි කියලා සුමන්තිරන් මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් ඇති කරපු නිසා මේ සභාවේ ලොකු ගාලගෝට්ටියක් ඇති වුණා. ඒ වෙලාවේ සුමන්තිරන් මන්ත්‍රීතුමා මෙතැන තිබෙන Officials' Box එකට ගිහිල්ලා නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් එක්ක කථා කරගෙන ඊට පස්සේ කිව්වා ඔක්කෝම හරියි කියලා. එතුමා එළියට ඇවිල්ලා මටත් ඒ ගැන කිව්වාම මම කිව්වා, කරුණාකරලා ඔබතුමන්ලාගේ සියලු මන්ත්‍රීවරුන්ට මේ ගැන කියන්න කියලා. ඒ එක්කම නීතිපතිතුමාගේ ලිපියත් කථානායකතුමාට ලැබුණා. ඒ අනුව මේ පනත් කෙටුම්පත සම්මත වුණා. ඒ නිසා මට නම් තේරෙන්නේ නැහැ මේ ප්‍රශ්නය මොකක්ද කියලා. හරියට සම්මත වෙච්ච පනතක් ගැන මේ සභාවේ විටින් විට, දිගින් දිගටම කියනවා, මේ පනත් කෙටුම්පත හරියට සම්මත කළේ නැහැ කියලා.

ඊළඟට පොලිස්පතිතුමා පත් කිරීම පිළිබඳ කාරණය ගනිමු. ජනාධිපතිතුමා මුලින්ම පොලිස්පතිතුමාගේ නම එව්වේ වැඩ බලන පොලිස්පති හැටියට පත් කරන්නයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් පස්දෙනෙක් එයට පක්ෂව ඡන්දය පාවිච්චි කරලා එතුමාව වැඩ බලන පොලිස්පති හැටියට පත් කළා. ඊට පස්සේ අපි මාස තුනක් ඇතුළත දී ලොකු වැඩ කොටසක් කළා. අපි "යුක්තිය" මෙහෙයුම පටන් ගෙන අපේ ජීවිත පවා පරදුවට තබලා ලංකාව වටේම සිටින කුඩු විකුණන ජාලය නැති කරන්නත්, පාතාලය නැති කරන්නත් පටන් ගත්තා. නමුත්, අවාසනාවකට වාගේ මේ දේ කරන කොට අපට ගොඩක් බලපෑම් ආවා. නඩු දමන්න පටන් ගත්තා; පොලිස්පතිතුමාට විරුද්ධව නඩු දමන්න පටන් ගත්තා. එහෙම කළේ අපේ යුක්තිය මෙහෙයුම වැනි සියලු මෙහෙයුම් අඩාළ කරන්නයි. ඒ ඔක්කෝම නඩු දමන්නේ එකම එක කල්ලියක්. ඒ කල්ලිය නඩු දාලා බැලුවා, මේ මෙහෙයුම් නවත්වා ගන්නත්, එතුමා වැඩ බලන පොලිස්පති හැටියට ඉන්න කාලයේම එතුමාව එතැනින් අයින් කරගන්නත්. නමුත්, ජනාධිපතිතුමා මාස තුනකට පස්සේ පොලිස්පති හැටියට එතුමාගේ නම නිර්දේශ කළා. එතුමාව පොලිස්පති හැටියට පත් කරන්න අනුමැතිය දීම ගැන මම අර සාමාජිකයන් පස්දෙනාට මුලින්ම ස්තුතිවන්ත වෙනවා. නමුත්, එතුමාව පොලිස්පති හැටියට

[ගරු ටිරාන් අලස් මහතා]

පත් කරන්න අනුමැතිය ගන්න කොට එතැනදී සාමාජිකයන් හතරදෙනෙක් පක්ෂවත්, සාමාජිකයන් හතරදෙනෙක් විපක්ෂවත් හිටියා. ඒ මොකද, පක්ෂව ඡන්දය දුන්නේ නැහැ කියන්නේ අනික් හතරදෙනා විපක්ෂයි කියන එකයි. ඒ වෙලාවේදී තමයි කථානායකතුමා ජනාධිපතිතුමාට දන්වා සිටියේ හතරදෙනෙක් පක්ෂයි, හතරදෙනෙක් විපක්ෂයි, එම නිසා එතුමා එතුමාගේ ඡන්දය පක්ෂව දෙනවා කියලා. ඉතින්, ඡන්දය දුන්නේ කොහොමද, ලියුම එව්වේ කොහොමද, කොයි වෙලාවේද එව්වේ කියලා අපි මොන තර්කය කළත් අවසානයේදී එතුමාව පොලිස්පති ලෙස පත් කරන්න පස්දෙනෙක් එකඟ වෙලා තිබෙනවා. ඉතින්, මට තේරෙන්නේ නැහැ, ඇයි මෙහෙම කියන්නේ කියලා. විපක්ෂය එක එක හේතු දාලා මේ පත් කිරීම වැරැදියි කියලා සාමාන්‍ය ජනතාවට කියනවා. නමුත්, මම හිතන විධියට සියලුදෙනාටම පෙනෙනවා, මේක සම්මත වෙලා තිබෙන බවත්, සාමාජිකයන් පස්දෙනෙක් ඒ සඳහා එකඟ වෙලා තිබෙන බවත්.

විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ, මේ කාරණයත්. 2023 දෙසැම්බර් මස 31වැනි දිනැති අංක 2364/40 දරන ගැසට් නිවේදනයේ තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින්ම ගැසට් කරපු rules. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කර්තව්‍යය පිළිබඳ එහි මෙසේ සඳහන් වෙනවා:

> "4. (ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ධුරයක් සඳහා පත් කරනු ලැබිය යුතු තැනැත්තන් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් කරන ලද නිර්දේශ සලකා බැලීම සහ එම නිර්දේශ අනුමත කිරීම හෝ අනුමත නොකිරීම ; සහ ....."

එච්චරයි තිබෙන්නේ. එක්කෝ අනුමත කරනවා. නැත්නම් අනුමත නොකරනවා. මම කියන්නේ, දෙදෙනෙක් ඡන්දය පාවිච්චි නොකර හිටියේ එතැනත් කුමන්ත්‍රණයක් තිබුණු නිසායි.

හතර දෙනෙක් ඒ පත්වීම අනුමත කෙරුවත්, දෙන්නෙක් ඡන්දය දෙන්නේ නැතුව හිටියොත් කථානායකට ඔහුගේ ඡන්දය පාවිච්චි කරන්න බැරි වෙනවා කියලා හිතුවා. ඒකත් කුමන්ත්‍රණයක් කියලායි මම කියන්නේ. ඒ ගොල්ලන්ම ගහපු ගැසට් එකේ මෙච්චර පැහැදිලිව තිබෙද්දී ඒ සාමාජිකයන් දෙදෙනා මේ වාගේ හැසිරුණා නම්, එම සාමාජිකයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තව දුරටත් සිටිය යුතුද, නැද්ද කියන එක අපි බලන්න ඕනෑ. පොලිස්පති පත් කිරීම ගැනත් මට කියන්න තිබෙන්නේ ඒ ටිකයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව රැස්වුණු අවස්ථාවල Minutesවලත් ඒක තිබෙනවා. ඒකේ නම්න්ම ඒ ගොල්ලන් කියනවා, අපි මේ දේට එකඟ වෙනවා කියලා. මම වැඩිපුර ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. පොලිස්පති පත් කිරීමයි, Online Safety Bill එක සම්මත කිරීමයි හරි විධියට කෙරිලා තිබෙනවා කියලා මම බොහෝම පැහැදිලිව කියනවා. ඒ කාරණා දෙක මත කථානායකතුමාට විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න පුළුවන් කියලා මම හිතන්නේ නැහැ.

මේ විවාදය අතරතුර වැඩියෙන් කථා කරපු දෙයක් තමයි, නෙඩුන්කර්නි පොලිස් වසමේ වුණු සිදුවීම. කෝවිලක් වඳින්න ගිය නව දෙනෙකුව අත්අඩංගුවට ගත්තා කියලා මෙම විවාදය පටන් ගන්න දවසේම විපක්ෂයේ මන්ත්‍රීවරුන් මෙතැනට ඇවිල්ලා කෑ ගහලා විරෝධතා දැක්වූවා අපි දැක්කා. කෝවිලක් වඳින්න ගිය නව දෙනෙකු අත් අඩංගුවට ගැනීම වැරැදියි කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන් කියනවා මට ඇහුණා. නමුත් මම කියන්න ඕනෑ, එතැන කිසිම කෝවිලක් නැති බව. එතැන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයිති තැනක්. "අනුරාධපුර යුගයට අයත් බෞද්ධ විහාරයක නටබුන් ලෙස සැලකිය හැකි උළු, පැරණි වහල කොටස්, ගොඩනැඟිල්ලක් පැවති බවට හඳුනා ගත හැකි ගල් තලාව මත පිට කැපුම් සලකුණු ..." කියලා විස්තරයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් කියලා තිබෙනවා. මේක බෞද්ධ විහාරයක නටබුන් තිබෙන තැනක් කියලා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කියනවා. තව කට්ටියක් එතැනට ගිහිල්ලා, ඒක ඒ ගොල්ලන්ගේ වැඳුම් පිදුම් කරන තැනක් කියලා කියන්න උත්සාහ කරනවා. මේ ස්ථානය සම්බන්ධව අවුරුදු ගණනක් තිස්සේ නඩු තිබෙනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ලිපියේම තිබෙනවා, "මෙම ගොඩනැඟිලි පිහිටි ගල් තලාවේ අනවසරයෙන් 2023 වසරේ තැන්පත් කර ඇති ශිව ලිංගයට පුද පූජා පැවැත්වීමට සැරසෙනවා" කියලා. 2023 දී තමයි ශිව ලිංගයක් එතැන තියලා මේ ප්‍රශ්නය ඇති වුණේ. අපේ ස්වාමීන් වහන්සේලා ලැහැස්ති වුණා, බස්වල නැඟලා ගිහිල්ලා ඒකට විරෝධය ප්‍රකාශ කරන්න. පැති දෙකක සට්ටනයක් ඇති වෙන එක අපි බොහොම අමාරුවෙන් එය නවත්වා ගත්තා. ඊට පස්සේ සිදුවුණේ මෙයයි. මාර්තු 8වැනි දා මහා ශිව රාත්‍රී දිනයට පෙර ඒ ගොල්ලන් උසාවියට මෝසමක් ඉදිරිපත් කළා. මෝසම ඉදිරිපත් කළේ, මදිමුගරාසා නැමති පූජකවරයා. 4වැනි දා මෝසමක් ඉදිරිපත් කරලා උසාවියෙන් අවසර ඉල්ලුවා, එතැනට ගිහිල්ලා ඒ පූජාවන් පවත්වන්න. උසාවියෙන් ඒකට ඉඩ දුන්නේ නැහැ. වවුනියාවේ මහෙස්ත්‍රාත්, සුබ්‍රමනියම් ප්‍රීතිවී මහත්මිය ඒකට අවසර දුන්නේ නැහැ. ඊට පස්සේ 8වැනි දා 400දෙනෙක් විතර එතැනට ඇවිල්ලා දවල්වරුවේ පුද පූජා පවත්වන්න ගත්තා. උසාවිය ඊට කලින් දුන් නියෝගයක තිබෙනවා, හවස හයෙන් පස්සේ -කළුවර වැටුණාට පස්සේ- ඒ පැත්තට යන්න බැහැ කියලා.

එතැනට 400දෙනෙක් විතර ඇවිල්ලා සවස 6.00ට පමණ ටික දෙනෙක් එතැනින් පිටවෙලා ගිහිල්ලා 40දෙනෙක් පමණ නතරවෙලා තිබෙනවා. ඊට පස්සේ ඒ 40දෙනා රාත්‍රී 8.00ට විතර ලිප් පත්තු කරගෙන කෑම උයන්නත්, ජෙනරේටර් එකක් ගෙනැල්ලා බල්බ් දමන්නත් පටන්ගෙන තිබුණා. ඒ නිසා එතැන හිටපු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් සියලු දෙනාම පොලීසියට දන්වලා තිබෙනවා, ඒක වහාම නවත්වා දෙන්න කියලා. ඊට පස්සේ එතැන හිටපු අයගෙන් 8දෙනෙකු හෝ 9දෙනෙකු පමණ අත් අඩංගුවට ගන්න අපට සිදු වුණා. ඒ අයව අත් අඩංගුවට ගෙන උසාවියට ඉදිරිපත් කළාම ඒ ගොල්ලන්ව රිමාන්ඩ් කරන්න කියලා මහෙස්ත්‍රාත්තුමිය නියෝග කළා. දෙවැනි නඩු වාරයේදීත් ඒ අයව නැවත රිමාන්ඩ් කළා. මේ කරුණු සියල්ල ගැනම සලකා බැලුවොත් ඔබතුමන්ලාට පෙනේවි ඒ අය සම්පූර්ණයෙන්ම නීතිය කඩලා තිබෙන බව. බෞද්ධ ස්ථානයක් ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් හඳුන්වපු ස්ථානයක තමයි ඒ ප්‍රශ්නය ඇති වෙලා තිබුණේ. උතුරු, නැඟෙනහිර පළාත්වලින් අපට ඒ වාගේ ප්‍රශ්න සම්බන්ධයෙන් නිතරම පැමිණිලි ලැබෙනවා. අපට එවැනි දේවල්වලට ඉඩ දෙන්න බැහැ. බෞද්ධ ස්ථානවලට ගිහිල්ලා, කලබල ඇති කරලා බෞද්ධයන්ට ප්‍රශ්නයක් ඇති කරන්න ඉඩ දෙන්න බැහැ. ඒ නිසා, හෙටත් ඒ වාගේ දෙයක් කළොත් අපි හෙටත් අදාළ අයව අත් අඩංගුවට ගන්නවා කියලා මම කියනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ටිරාන් අලස් මහතා**
(மாண்புமிகு டிரான் அலஸ்)
(The Hon. Tiran Alles)
මට තව පොඩි කාලයක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඡන්දය විමසන වෙලාව හරි නිසා මිනිත්තුවකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ටිරාන් අලස් මහතා**
(மாண்புமிகு டிரான் அலஸ்)
(The Hon. Tiran Alles)
හින්දු ආගමික ස්ථානවලට ගිහිල්ලා කරදර කරන අයටත් අපි ඒ විධියටමයි සලකන්නේ. මොකද, නීතිය ඔක්කෝටම පොදුයි. ඒ නිසා මේ ප්‍රශ්නය බොරුවට තවදුරටත් ඇදගෙන යා යුතු නැහැ. මේක උසාවිය ඉදිරියේ තිබෙන ප්‍රශ්නයක්. ඒකට උසාවියෙන් නියෝගයක් දීලා තිබෙනවා. උසාවියේ නියෝගය කඩ කිරීම නිසා තමයි අපි අත් අඩංගුවට ගත්තේ. ඒක අපි දමපු එක charge එකක්. විපක්ෂයේ සමහර උදවිය කෑ ගැහුවා, කෝවිලක් වඳින්න ගිය තරුණයින්ව අත් අඩංගුවට ගත්තා කියලා. එතැන කිසිම කෝවිලක් නැහැ. එතැන තිබෙන්නේ කැලෑවක් විතරයි. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාම නිශ්ශබ්ද වෙන්න.

**ගරු ටිරාන් අලස් මහතා**
(மாண்புமிகு டிரான் அலஸ்)
(The Hon. Tiran Alles)
එතැන චෛත්‍යයක පාදමක් සහ ලෙන් වගයක් තිබෙනවා. ඒවා හැරෙන්න එතැන වෙනත් කිසිම දෙයක් නැහැ. ඒ නිසා බොරු තොරතුරු ගෙනැල්ලා, ඒවා මේ පාර්ලිමේන්තුවේ කියලා, ඒවා සමාජගත කරලා බොරුවට ප්‍රශ්න ඇති කළ යුතු නැහැ. මම විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා, උතුරුකරයේ ඡන්ද බලාගෙන මේ වාගේ බොරු දේවල් ප්‍රචාරණය කරන්න එපා කියලා. අපි හැමෝම ඡන්ද බලාගෙන වැඩ කරන්න ගියොත් කවදාවත් අපට විසඳාගන්න බැරි විධියට මෙවැනි ප්‍රශ්න දිගින් දිගටම ඇති වෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Online Safety Bill එක සම්මත කිරීමත්, පොලිස්පතිතුමා පත් කිරීමත් නීත්‍යානුකූලව සිදුවෙලා තිබෙනවා කියලා මම අවසාන වශයෙන් කියන්න කැමැතියි. ඒ සම්බන්ධයෙන් ගරු කථානායකතුමා වැරැද්දක් කරලා තිබෙනවා කියලා මම නම් හිතන්නේ නැහැ. ඒ නිසා ගරු කථානායකතුමාට එරෙහිව ගෙනෙන ලද විශ්වාස භංග යෝජනාවට විරුද්ධව අපි ඡන්දය දෙන බව සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාම නිශ්ශබ්ද වෙලා වාඩිවෙන්න.

කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට එරෙහිව ගෙන එන ලද විශ්වාස භංග යෝජනාවට සභාව එකඟද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
විරුද්ධයි.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Divide!

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the Division Bell -*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනා තමන්ගේ ආසනවල ඉඳගන්න. කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට එරෙහි විශ්වාස භංග යෝජනාව පිළිබඳ ඡන්ද විමසීම. *[බාධා කිරීම්]* නිශ්ශබ්ද වෙන්න.

දැන් ඡන්දය පාවිච්චි කිරීමේ අවස්ථාව.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි බලන්න. ගරු මන්ත්‍රීවරු සියලුදෙනා කරුණාකර වාඩිවෙන්න. නැත්නම් ඡන්දය දුන් සහ නොදුන් අය කවුද කියලා බලාගන්න අපහසුයි.

ආණ්ඩු පාර්ශ්වය පැත්තේ ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

**ගරු එච්. නන්දසේන මහතා**
(மாண்புமிகு எச். நந்தசேன)
(The Hon. H. Nandasena)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු එච්. නන්දසේන මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ කොයි ආකාරයෙන්ද?

**ගරු එච්. නන්දසේන මහතා**
(மாண்புமிகு எச். நந்தசேன)
(The Hon. H. Nandasena)
විපක්ෂයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ කොයි ආකාරයෙන්ද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
විපක්ෂයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විජිත බේරුගොඩ රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ කොයි ආකාරයෙන්ද?

**ගරු විජිත බේරුගොඩ මහතා (පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித பேருகொட - பிரிவெனாக் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. Vijitha Berugoda - State Minister of Piriven Education)
විපක්ෂයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ආණ්ඩු පාර්ශ්වය පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ තවත් ගරු මන්ත්‍රීවරු ඉන්නවාද?

කිසිවෙකු නැති බවයි පෙනෙන්නේ.

විරුද්ධ පාර්ශ්වය පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු ඉන්නවා නම් කරුණාකර නැඟී සිට දන්වන්න.

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඒ.එච්.එම්. ෆවුසි මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ කොයි ආකාරයෙන්ද?

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)
විපක්ෂයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාධාක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ කොයි ආකාරයෙන්ද?

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
පක්ෂයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
විරුද්ධ පාර්ශ්වය පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ තවත් ගරු මන්ත්‍රීවරු ඉන්නවාද?

කිසිවෙකු නැති බවයි පෙනෙන්නේ.

එසේ නම්, ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***
*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 74; විරුද්ධව 113; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 74; எதிராக 113; விலகியிருந்தோர் 0.*
*According to Electronic Voting, Parliament divided: Ayes 74; Noes 113; Abstain 0.*

| | |
|---|---|
| G 001. Pavithradevi Wanniarachchi | No |
| G 002. Nimal Siripala De Silva | No |
| G 003. Chamal Rajapaksa | No |
| G 004. Mahinda Rajapaksa | No |
| G 005. Prasanna Ranatunga | No |
| G 006. Susil Premajayantha | Not Voted |
| G 007. Dinesh Gunawardena | No |
| G 009. Douglas Devananda | No |
| G 010. Bandula Gunawardana | No |
| G 011. Mahinda Amaraweera | No |
| G 012. Wijeyadasa Rajapakshe | No |
| G 013. Harin Fernando | No |
| G 014. Ramesh Pathirana | No |
| G 015. M. U. M. Ali Sabry | No |
| G 016. Vidura Wickramanayaka | No |
| G 017. Kanchana Wijesekera | No |
| G 019. Tiran Alles | No |
| G 020. Nalin Fernando | No |
| G 022. Jeewan Thondaman | No |
| G 023. Ranjith Siyambalapitiya | No |
| G 024. Jagath Pushpakumara | No |
| G 025. Dilum Amunugama | No |
| G 026. Mohan Priyadarshana De Silva | No |
| G 027. Janaka Wakkumbura | No |
| G 028. Shehan Semasinghe | No |
| G 029. Kanaka Herath | No |
| G 030. Thenuka Vidanagamage | No |
| G 031. Pramitha Bandara Tennakoon | No |
| G 032. Lasantha Alagiyawanna | No |
| G 033. Rohana Dissanayaka | No |
| G 034. Premalal Jayasekara | No |
| G 035. Arundika Fernando | No |
| G 037. Lohan Ratwaththe | No |
| G 038. Tharaka Balasuriya | No |
| G 039. Indika Anuruddha Herath | No |
| G 040. Siripala Gamalath | No |
| G 041. Anuradha Jayaratne | No |
| G 042. S. Viyalanderan | No |
| G 043. D.V. Chanaka | No |
| G 044. Sisira Jayakody | No |
| G 045. Piyal Nishantha De Silva | No |
| G 046. Prasanna Ranaweera | No |
| G 047. D. B. Herath | No |
| G 048. Shasheendra Rajapaksa | No |
| G 049. Seetha Arambepola | No |
| G 051. K. Kadder Masthan | No |
| G 052. Asoka Priyantha | No |
| G 053. A. Aravindh Kumar | No |

| | |
|---|---|
| G 054. Geetha Samanmale Kumarasinghe | No |
| G 055. Suren Raghavan | No |
| G 056. Diana Gamage | No |
| G 057. Sivanesathurai Santhirakanthan | No |
| G 058. Chamara Sampath Dasanayake | No |
| G 059. Anupa Pasqual | No |
| G 060. Johnston Fernando | No |
| G 061. S. B. Dissanayake | No |
| G 062. Gamini Lokuge | No |
| G 063. Vajira Abeywardena | No |
| G 064. Janaka Bandara Tennakoon | No |
| G 065. C. B. Rathnayake | No |
| G 066. Keheliya Rambukwella | No |
| G 067. S. M. Chandrasena | No |
| G 068. Mahindananda Aluthgamage | No |
| G 069. Rohitha Abeygunawardana | No |
| G 071. Sarath Weerasekara | No |
| G 072. Wimalaweera Dissanayaka | No |
| G 075. Kapila Athukorala | No |
| G 076. Gayashan Nawananda | No |
| G 077. S. M. M. Muszhaaraff | No |
| G 078. S. C. Muthukumarana | No |
| G 079. Jayantha Ketagoda | No |
| G 080. Sampath Athukorala | No |
| G 081. Thisakutti Arachchi | No |
| G 082. U. K. Sumith Udukumbura | No |
| G 083. Pradeep Undugoda | No |
| G 084. Sanjeeva Edirimanna | No |
| G 085. Akila Ellawala | No |
| G 086. Jagath Kumara Sumithraarachchi | No |
| G 087. Karunadasa Kodithuwakku | No |
| G 088. Nalaka Bandara Kottegoda | No |
| G 089. Udayakantha Gunathilaka | No |
| G 090. Kokila Gunawardene | No |
| G 091. Milan Jayathilake | No |
| G 092. Kulasingam Dhileeban | No |
| G 093. Sudarshana Denipitiya | No |
| G 094. Isuru Dodangoda | No |
| G 095. Premnath C. Dolawatte | No |
| G 097. Muditha Prishanthi | No |
| G 098. Sudath Manjula | No |
| G 099. Mayadunna Chinthaka Amal | No |
| G 100. Nipuna Ranawaka | No |
| G 101. Kumarasiri Rathnayaka | No |
| G 102. Gunathilaka Rajapaksha | No |
| G 103. Upul Mahendra Rajapaksha | No |
| G 104. M. Rameshwaran | No |
| G 105. Rajika Wickramasinghe | No |
| G 106. M. W. D. Sahan Pradeep Withana | No |
| G 107. Madhura Withanage | No |
| G 108. D. Weerasingha | No |
| G 109. Samanpriya Herath | No |
| G 110. Sagara Kariyawasam | No |
| G 111. Yadamini Gunawardena | No |
| G 112. Manjula Dissanayake | No |
| G 113. Ranjith Bandara | No |
| G 114. Jayantha Weerasinghe | No |
| G 115. Marjan Faleel | No |
| G 116. Lalith Varna Kumara | No |
| O 001. Rishad Bathiudeen | Yes |
| O 002. Rajitha Senarathne | Yes |
| O 003. Imthiaz Bakeer Markar | Yes |
| O 004. Tissa Attanayake | Yes |
| O 005. Rauff Hakeem | Yes |
| O 006. Gayantha Karunatilleka | Yes |
| O 007. Lakshman Kiriella | Yes |
| O 008. Sajith Premadasa | Yes |
| O 010. Patali Champika Ranawaka | Yes |
| O 011. Palany Thigambaram | Yes |
| O 012. Mano Ganesan | Yes |
| O 015. G.L. Peiris | Yes |
| O 017. A. L. M. Athaullah | No |
| O 022. Kabir Hashim | Yes |
| O 023. Thalatha Athukorala | Yes |
| O 025. Sarath Fonseka | Yes |
| O 026. Harsha De Silva | Yes |
| O 028. R. M. Ranjith Madduma Bandara | Yes |
| O 029. Dilip Wedaarachchi | Yes |
| O 030. Niroshan Perera | Yes |
| O 031. Eran Wickramaratne | Yes |
| O 032. J. C. Alawathuwala | Yes |
| O 033. John Seneviratne | No |
| O 037. Vijitha Herath | Yes |
| O 038. Selvarajah Kajendren | Yes |
| O 041. Angajan Ramanathan | No |
| O 042. Vadivel Suresh | No |
| O 044. Ashok Abeysinghe | Yes |
| O 047. Ajith Mannapperuma | Yes |
| O 048. Buddhika Pathirana | Yes |
| O 049. M. S. Thowfeek | Yes |
| O 050. Nalin Bandara Jayamaha | Yes |
| O 051. Hector Appuhamy | Yes |
| O 052. Thushara Indunil Amarasena | Yes |
| O 053. Dilan Perera | Yes |
| O 054. Wimal Weerawansa | Yes |
| O 055. Piyankara Jayaratne | No |
| O 056. Vasudeva Nanayakkara | Yes |
| O 057. Harini Amarasuriya | Yes |
| O 058. Govindan Karunakaram | Yes |
| O 061. Velu Kumar | Yes |
| O 062. Kavinda Heshan Jayawardhana | Yes |
| O 063. Mayantha Dissanayake | Yes |
| O 064. K. Sujith Sanjaya Perera | Yes |
| O 065. S. M. Marikkar | Yes |
| O 066. Imran Maharoof | Yes |
| O 068. Harshana Rajakaruna | Yes |
| O 069. Rohini Kumari Wijerathna | Yes |
| O 070. Hesha Withanage | Yes |
| O 071. Waruna Liyanage | Yes |
| O 072. M. Udayakumar | Yes |
| O 073. Jayarathna Herath | Yes |
| O 075. Chandima Weerakkody | Yes |
| O 076. Dayasiri Jayasekara | Yes |
| O 077. Sivagnanam Shritharan | Yes |
| O 078. M. A. Sumanthiran | Yes |
| O 079. Charles Nirmalanathan | Yes |
| O 080. S. Rajaputhiran Rasamanickam | Yes |
| O 081. W. H. M. Dharmasena | Yes |
| O 082. Kins Nelson | Yes |
| O 083. Rohana Bandara | Yes |
| O 084. Nayana Wasalathilaka | Yes |
| O 085. Udaya Gammanpila | Yes |
| O 086. Nalaka Godahewa | Yes |
| O 087. Channa Jayasumana | Yes |
| O 089. Nimal Lanza | No |
| O 090. Jayantha Samaraweera | Yes |
| O 091. B. Y. G. Rathnasekara | Yes |
| O 092. Sarathie Dushmantha | Yes |
| O 094. Lalith Ellawala | Yes |
| O 096. K. P. S. Kumarasiri | Yes |
| O 097. Upul Galappaththi | Yes |
| O 098. Shan Vijayalal De Silva | Yes |
| O 100. Thavaraja Kalai Arasan | Yes |
| O 101. S. Jagath Samarawickrama | No |
| O 106. Wasantha Yapabandara | Yes |
| O 107. Thilak Rajapakshe | Yes |

O 108. Gamini Waleboda Yes
O 109. Weerasumana Weerasinghe Yes
O 110. Gevindu Cumaratunga Yes
O 111. Charitha Herath Yes

Electronic Voting Results:
Participants:
Present 188
Not Voted 1

**Votes:**
Yes 74
No 113
Abstain 0

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 74යි; විරුද්ධව 113යි.

නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 01යි. ඒ අනුව, පක්ෂව ඡන්දය දුන් මුළු සංඛ්‍යාව 75යි.

නැඟී සිට විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 04යි. ඒ අනුව, විරුද්ධව ඡන්දය දුන් මුළු සංඛ්‍යාව 117යි.

ඒ අනුව, කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට එරෙහි විශ්වාස භංග යෝජනාව වැඩි ඡන්ද 42කින් පරාජයට පත් වී ඇති බව ගරු සභාවට දැන්වීමට කැමැත්තෙමි.

මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] took the Chair.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ප්‍රථමයෙන්ම දින තුනක් පුරාවට විවාදයට ගත් විශ්වාස භංග යෝජනාවේ විවාදයට සම්බන්ධ වීම ගැනත්, පක්ෂව හා විපක්ෂව ඡන්දය ලබා දුන් හා ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි සියලුදෙනාටත් මාගේ ස්තුතිය පළ කරනු කැමැත්තෙමි. "කථානායක" ලෙස ධුරය නම් කළද, පාර්ලිමේන්තුව තුළ කථානායකවරයෙකුට විවාදවලට සම්බන්ධ වීමට හෝ අදහස් දැක්වීමට පාර්ලිමේන්තු සම්ප්‍රදාය තුළ ඉඩක් නොමැත. මා හමුවීමට පැමිණෙන බොහෝ ජනතාව මගෙන් නිරන්තරයෙන් විමසන්නේ, පාර්ලිමේන්තුවේදී මා වෙත එල්ල කරන ලද චෝදනාවලට පිළිතුරු නොදී නිහඬව සිටින්නේ ඇයිද යන්නයි.

කථානායකවරයාගේ කාර්යභාරය වනුයේ මන්ත්‍රීවරුන්ට නිදහසේ තම අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ ලබා දීම මිස ඔවුන් සමඟ ප්‍රතිතර්ක කිරීම නොවන බව මා ඔවුන්ට පැහැදිලි කර දී ඇත. එසේම, මෙම විශ්වාස භංග යෝජනාව සහ එහි අන්තර්ගතය සම්බන්ධව ජනතාව වෙත පැහැදිලි කිරීම සඳහා යෝග්‍යම මොහොත මෙය බව මාගේ තේරුම් ගැනීමයි.

මෙය ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ කථානායකවරයෙකු වෙත එල්ල වූ ප්‍රථම විශ්වාස භංග යෝජනාව නොවේ. මීට පූර්වයෙන් සිව්වරක් කථානායකවරුන්හට විරුද්ධව විශ්වාස භංග යෝජනා ඉදිරිපත්ව ඇති බවට අපගේ පාර්ලිමේන්තු ඉතිහාසය සාක්ෂි දරයි. ජනතාවගේ හා මාධ්‍ය ආයතනවල දැනගැනීම සඳහා ඒ සම්බන්ධ විස්තර ඇතුළත් ඇමුණුම 01 මම මේ අවස්ථාවේදී **සභාගත*** කරමි.

පොදුවේ පක්ෂග්‍රාහීව කටයුතු කිරීම හා ස්ථාවර නියෝග උල්ලංඝනය කිරීම වැනි චෝදනා සියලුම කථානායකවරුන්හට එල්ල වුවත්, ප්‍රථම වරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට වන නව චෝදනාවක් මා වෙත එල්ලකොට ඇත. කෙසේ නමුත් එල්ල වූ මෙම චෝදනා සියල්ලටම පිළිතුරු දීම මාගේ වගකීම වේ.

ප්‍රථමයෙන් මා පොලිස්පතිවරයා පත් කිරීම සම්බන්ධයෙන් වන චෝදනාවට පිළිතුරු දීමට කැමැත්තෙමි. ඕනෑම රටක පොලිස්පතිවරයා, ත්‍රිවිධ හමුදාපතිවරු, ආරක්ෂක ලේකම් වැනි තනතුරු සෘජුවම එම රටේ ජාතික ආරක්ෂාව සමඟ බැඳී පවතී. මෙකී තනතුරුවල භාවිතාව හා වගකීමේ බාරදූර ස්වරූපය ගැන ශ්‍රී ලංකාවේ අපට පූර්වාදර්ශ පවතී.

මීට ආසන්නතම සිදුවීම වන 2019 වසරේදී එල්ල වූ පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන ඔබට අමතක විය නොහැක. මේ සම්බන්ධයෙන් රටේ ඉහළම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් ජාතික ආරක්ෂාවේ වගකීම නිසි ලෙස දැරීම සම්බන්ධයෙන් වූ අධිකරණ තීන්දුවද ඔබේ අවධානයට මා යොමු කරමි. එය කියවා බැලීමට මා සියලුදෙනාට ආරාධනා කරන අතර එමඟින් සිද්ධියක් ඇතිවීමට ප්‍රථම තීරණ ගැනීම, එම තීරණ ක්‍රියාත්මක කිරීම, වගකීම හා රාජකාරිය නියම ආකාරයෙන් සිදු නොකිරීම බරපතළ ප්‍රතිවිපාක ගෙන දීමට හේතු වී ඇති බව අනාවරණයකොට ඇත. කරුණු මෙසේ පෙළ ගැසී ඇති අවස්ථාවක ජාතික ආරක්ෂාවට සෘජුව බලපාන ප්‍රධාන සාධකයක් වන බව ඔබ මා හා එකඟ වනු ඇත.

ව්‍යවස්ථාදායක සභාව යනු එය පිහිටුවීමේ මුඛ්‍ය පරමාර්ථයෙන්ම තීරණ ගැනීමේ ආයතනයකි. ජනාධිපතිවරයා සතුව තිබූ තීරණ ගැනීමේ අධිකාරි බලය වඩා යහපත් ප්‍රජාතන්ත්‍රවාදයක් උදෙසා ව්‍යවස්ථාදායක සභාව වැනි උත්තරීතර සාමූහික ආයතනයක් වෙත පවරා ඇත. එවැනි ආයතනයක්, මෙවැනි අවස්ථාවක අතීරණාත්මකව සහ මතයක් නොමැතිව කටයුතු කිරීම ජාතික ආරක්ෂාව හිතාමතාම අනතුරේ හෙළීමක් යයි මාගේ හැඟීමයි.

කෙසේ නමුත් මේ සම්බන්ධව මා ජනාධිපතිවරයා වෙත යවන ලද ලිපියේ යම් යම් කොටස් උපුටා දක්වමින් ජනතාව නොමඟ යවන සුළු ප්‍රකාශ හා මාධ්‍ය වාර්තා පළ වූ බැවින්, එම දුර්මත දුරු කිරීම සඳහා එම සම්පූර්ණ ලිපිය ඇමුණුම 02 වශයෙන් මම **සභාගත*** කරමි.

එම ලිපියේ සඳහන් පහත කරුණු කෙරෙහි ජනතාවගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ඉ) වගන්තිය යටතේ ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන්හට ඡන්දය ලබා දීමෙන් වැළකී සිටීමේ විධිවිධාන සලසා නොමැති වීම.
2. එසේ ප්‍රතිපාදන සලසා නොමැති අවස්ථාවක ඡන්දය දීමෙන් වැළකී සිටීම විරුද්ධවීමක් ලෙස සලකනු ලබන්නේ නම් හා
3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඉ. (5) වගන්තිය ප්‍රකාරව එය සම සමව ඡන්දය ලබා දී ඇති අවස්ථාවක් ලෙස සලකන්නේද නම් මාගේ තීරක ඡන්දය මීට ලබා දෙන බවයි.

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

මීට අමතරව ව්‍යවස්ථාදායක සභාව රැස් වූ පෙබරවාරි මස 26වන දින, රැස්වීම ආරම්භයේදී මා ස්ථිර පොලිස්පතිවරයෙකු පත් කිරීමේ අවශ්‍යතාව හා වැදගත්කම සභාවට අවධාරණය කළෙමි. ඒ බව ව්‍යවස්ථාදායක සභාවේ කාර්ය සටහන් අංක 7 යටතේ සඳහන්ව ඇත. ඒ සම්බන්ධයෙන් මාගේ ස්ථාවරය ඉන් ගම්‍ය වනු ඇත. මේ අනුව නීති දැනුම කෙසේ වෙතත්, අල්ප හෝ භාෂා දැනුමක් ඇති අයෙකුට එම ලිපියෙන් මා කිසිසේත් ව්‍යවස්ථාව උල්ලංඝනය කර නොමැති බවත්, කිසිදු නීති අර්ථ නිරූපණයක්ද මා විසින් කර නොමැති බවත් පසක් වනු ඇත. මා එම අවස්ථාවේ ඡන්දය නොදී පසුව ඡන්දය ප්‍රකාශ කළේ යැයි කීම සත්‍ය විකෘති කිරීමකි. එම අවස්ථාවේ ඡන්දය ප්‍රකාශ කළ හැක්කේ ඡන්දය දීමෙන් වැළකී සිටි දෙදෙනාද විපක්ෂ වීමක් ලෙස අර්ථ නිරූපණය වන්නේ නම් පමණි. එවන් අර්ථ නිරූපණයක් කිරීමට කථානායකවරයා වශයෙන් මට බලයක් නැත.

එබැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නොවන තීරණයක් ඇතැම් සාමාජිකයන් දැරීම, විරුද්ධවීමක් ලෙස අර්ථ නිරූපණය කරන්නේ නම්, මාගේ පූර්ණ අයිතිය වන තීරක ඡන්දය ඊට පක්ෂව ලබා දෙන බව පමණක් මා ජනාධිපතිවරයා වෙත දන්වා යවා ඇත. එලෙස දන්වා යැව්වේ ඕනෑම අවස්ථාවක ශ්‍රේෂ්ඨාධිකරණයෙන් හෝ නීතිපතිවරයාගෙන් නීතිය විවරණය කරවා ගැනීමට ඔහුට විශේෂ බලයක් ඇති බැවිනි. එබැවින් මෙම චෝදනාව පදනම් විරහිත වේ. මෙය අධිකරණය ඉදිරියේ ඇති ප්‍රශ්නයක් බැවින් මම තවදුරටත් එය පැහැදිලි නොකරමි. දෙවනුව මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පතට අදාළව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද නිර්දේශවලට පටහැනිව සම්මත කළේය යන චෝදනාවට අදාළව, මා ජනතාවගෙන් හා මාධ්‍ය ආයතනවලින් ඉල්ලා සිටිනුයේ 2024 ජනවාරි මස 24 වන දින සවස 5.20 සිට 6.45 දක්වා වූ පාර්ලිමේන්තු සජීවී විකාශයේ පටිගත කළ දර්ශන පාර්ලිමේන්තු වෙබ් අඩවිය හරහා නරඹන ලෙසයි.

මා විපක්ෂයේ මන්ත්‍රීවරුන්හට අදහස් හා විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දුන් ආකාරයත්, ඔවුන්ගේ ඉල්ලීම්වලට ඉඩ දෙමින් ඡන්දයකට යාමට අවස්ථාව දුන් ආකාරයත් එහි පැහැදිලිව ඇත. තවද විපක්ෂය විසින් යම් වගන්ති ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයට පටහැනි බව කී අවස්ථාවේ, ඊටද අවධානය යොමු කළ ආකාරයත්, ආණ්ඩු පක්ෂය එම චෝදනා ප්‍රතික්ෂේප කරමින් නීතිපතිවරයාගේ අනුමැතිය සභාවට යොමු කිරීමත්, අදාළ සංශෝධන පිළිබඳ ගැටලුවක් ඇත්නම් වහාම නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් රැඳී සිටි කුටිය පෙන්වමින් අවශ්‍ය නම් ඔවුන් හා සාකච්ඡා කිරීමටත් මා ප්‍රකාශ කළ ආකාරය එම දර්ශනවල පටිගත වී ඇත. අනතුරුව පනත තුන්වන වර කියවා සම්මත කළ පසු නැවත විපක්ෂය විසින් ඡන්දයක් ඉල්ලූ ආකාරයත් පැහැදිලිව වීඩියෝ පටවල අන්තර්ගතව ඇත.

පාර්ලිමේන්තු පනතක් සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කිරීමට, පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට කථානායකවරයෙකුට කිසිදු බලයක් ව්‍යවස්ථාවෙන් ලබා දී නැත. එය සම්පූර්ණයෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සතු බලයක්ම වන්නේය. කරුණු එසේ වුවද, මෙම පනත සම්මත වීමෙන් පසු පනතේ වගන්ති ව්‍යවස්ථාව උල්ලංඝනය නොවන ආකාරයට කෙටුම්පත් කර ඇති බවට වන විශේෂ සහතිකයක්ද මා නීතිපතිවරයාගෙන් ලබා ගත් අතර මා විසින් එම පනතට අත්සන් තබන ලද්දේ ඉන් අනතුරුවයි. එම ලිපියද ජනතාවගේ හා මාධ්‍යවේදීන්ගේ දැනගැනීම සඳහා මා ඇමුණුම 3 වශයෙන් **සභාගත*** කරමි.

එවන් සහතිකයක් ලද කළ, පනතකට අත්සන් කිරීම ප්‍රමාද කිරීමට මාහට කිසිදු ප්‍රතිපාදනයක් ව්‍යවස්ථාවෙන් සලසා නොමැති බවද අවධාරණය කරමි.

මෙම විශ්වාස භංග යෝජනාවට අදාළ නොවූවත් මා වෙත එල්ල කරන ලද තවත් චෝදනාවක් නම්, රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරය මා විසින් ස්ථාවර නියෝග උල්ලංඝනය කොට ආණ්ඩු පක්ෂයට ලබා දුන් බවයි. මා නැවතත් සියලු ජනතාවගෙන් හා මාධ්‍යයෙන් ඉල්ලා සිටිනුයේ මෙකී කරුණට පදනම් වූ 2020 අගෝස්තු මස 27 වන දින උදෑසන 9.30 සිට 10.30 අතර පාර්ලිමේන්තු විවාදයට අදාළ පටිගත කළ දර්ශන නරඹන ලෙසයි. මෙම පත් කිරීම සම්බන්ධයෙන් 2020 ඔක්තෝබර් මස 23 වන දින ස්ථාවර නියෝග අත්හිටුවීමේ යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත්කොට ආණ්ඩු පක්ෂය විසින් සම්මත කර ගන්නා ලදී. එම විවාදයට අදාළ උදෑසන 10.00 සිට 11.00 අතර පාර්ලිමේන්තු විවාදයේ දර්ශනද නරඹන ලෙස මා ඉල්ලා සිටිමි. එහිදී එම යෝජනාවට පක්ෂව ආණ්ඩු පක්ෂයෙන් මන්ත්‍රීවරු 87ක්ද, ඊට විරුද්ධව විපක්ෂයෙන් මන්ත්‍රීවරු 17දෙනෙක් පමණක්ද ඡන්දය පාවිච්චි කරන ලදී. එම තනතුර ස්ථාවර නියෝග ප්‍රකාරව විපක්ෂයට හිමි විය යුතු වුවද, පාර්ලිමේන්තු බහුතර ඡන්දයකින් ස්ථාවර නියෝග අත්හිටුවා කටයුතු කිරීමට ගත් තීරණය බල රහිත කිරීමට කථානායකවරයා ලෙස මා හට කිසිදු ප්‍රතිපාදනයක් ව්‍යවස්ථාවෙන් හෝ ස්ථාවර නියෝගවලින් ලබා දී නොමැත.

මගේ මේ ප්‍රකාශය අවසන් වනතුරු මට කාලය ලබා දීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එසේම එම යෝජනාව හදිසියේ ගෙන ආ යෝජනාවක් නොවෙයි. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සාකච්ඡාකොට විපක්ෂයේද අනුදැනුම ඇතිව, කල් වේලාසනින් න්‍යාය පුස්තකයට ඇතුළත් කළ බවද දන්වනු කැමැත්තෙමි. අවම වශයෙන් විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ගේ ඡන්දයවත් ඊට විරුද්ධව ලබා ගැනීමට අපොහොසත් වූ කල, විපක්ෂය විසින් එම වරදද කථානායකවරයා මත පැවරීම හාස්‍යජනකය.

මා වැලිගම සංවර්ධන කමිටු සභාපති ධුරය දරන බවට කරන චෝදනාවද අර්ධ සත්‍යයකි. මා වැලිගම, වැලිපිටිය, මුලටියන හා තිහගොඩ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතරේම සභාපතිවරයා වන අතර, මාතර දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේද සාමාජිකයෙකි.

සංවර්ධන කමිටු යනු ප්‍රදේශයේ මහා මාර්ග, වාරිමාර්ග, යටිතල පහසුකම් හා සුබසාධන කාර්යයන් සලසන යන්ත්‍රණය වේ. මා කුමන තනතුරේ කටයුතු කළද මාහට ඡන්දය දුන් ජනතාව කිසි දිනෙක අමතක කර නැත. ඔවුන්ට ඉටු විය යුතු යුතුකම් මා සැම විටම ඉටුකොට ඇති අතර, එය ඡන්දය දිනූ පසු ජනතාවගෙන් ඈත් වන දේශපාලකයන්ට අරුමයක් වුවද, එය මාගේ සමාන්‍ය භාවිතාවයි. එය කිසිසේත් දේශපාලනයක් නොවන බව මා දන්වනු කැමැත්තෙමි.

කථානායකවරයා යනු මහ ජනතාවගෙන් ඈත් කර තැබිය යුතු චරිතයක් යැයි මා නොසිතමි. මා, මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය දරනා අවසාන දිනය දක්වාම මෙම සේවය මගෙන් ඉටු වනු ඇත. පසුගිය දුෂ්කර කාල වකවානුවේ වුවද මාතර දිස්ත්‍රික්කයේ සංවර්ධනය හා ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් මාහට කළ හැකි වූ සේවය ගැන මා නිහතමානීව සතුටු වෙමි.

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු කථානායකතුමා]

මාතර දිස්ත්‍රික් ජනතාවට පමණක් නොව රටේ ජනතාවට හා ශ්‍රී ලංකා ජන රජයේ යහ පැවැත්ම වෙනුවෙන් මාහට කළ හැකි උපරිම සේවාවන් මා දැරූ අමාත්‍යාංශ තුළින් හා කථානායකවරයා ලෙස මා ඉටුකොට ඇත. කථානායකවරයෙකු ලෙස මාගේ සෘජු වගකීම්වලට වැඩිමනත් වශයෙන් මා කටයුතු කර ඇති ආකාරය හා ඒ සම්බන්ධව මා කර ඇති යෝජනා මහ ජනතාවගේ හා මාධ්‍යවේදීන්ගේ දැන ගැනීම සඳහා ඇමුණුම් 4, 5, 6, 7, 8 සහ 9 ලෙස **සභාගත*** කරමි. ඉන් සමහරක් යෝජනා දැනටමත් ක්‍රියාත්මක කර තිබීම සම්බන්ධයෙන් මා පෞද්ගලිකව සතුටු වෙමි.

මාගේ වර්තමාන දේශපාලන භාවිතය මෙසේ පවසන අතරම, මාගේ අතීත දේශපාලනයේදීද මා කටයුතු කළේ කිසිදු වෙනසකින් තොරවයි.

1987 වර්ෂයේදී දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කරන ලද්දේ උතුර මෙන්ම දකුණද ගිනි ගැනීමට ඉතා ආසන්නව තිබූ අවස්ථාවකයි. එවකට ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මෙකී පනත ආණ්ඩු පක්ෂ මන්ත්‍රී කණ්ඩායම් රැස්වීමේදී ඉදිරිපත් කරන ලද අතර එම අවස්ථාවේ මා ඊට දැඩි ලෙස විරුද්ධ විය. එදා මා ගත් ස්ථාවරය මත සිටි ගාමිණී ජයසූරිය හා චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන යන මැතිතුමන්ලාද එදා මෙම ගරු සභාවේදී පනතට විරුද්ධව ඡන්දය භාවිත කරමින් අපගේ මන්ත්‍රී ධුර දැන දැනම අහිමි කර ගත්තෙමු.

එදා 1987 වසරේදී මට මුහුණ දීමට සිදු වූයේ සාහසික දේශපාලන ප්‍රචණ්ඩත්වයේ අතිශය කර්කශ අත්දැකීමකටය. මාහට අයත් නිවසනය, වාහනය ඇතුළු මහන්සියෙන් ගොඩනඟා ගත් සියල්ල ප්‍රචණ්ඩකාරීහු විසින් ගිනිබත් කරන ලදී. මටද, මගේ පවුලටද ඉතිරි වූයේ ඇඳිවත පමණි. අප හිතවත් අසල්වාසීන් නොවන්නට එදා මටද අත්වනුයේ අති භයානක ඉරණමකි. මා සහ බිරිය, අතදරුවකු සමඟ දරුවන් හතර දෙනෙකු අතිශය අවාසනාවන්ත පරිදි මහ මගට ඇද දැමුවද, මම මගේ හෘදය සාක්ෂිය මරා නොදැමුයෙමි. එමෙන්ම සියල්ල අත හැර සැහැල්ලු සිතින් මහ මගට වන් මට කථානායක ධුරය අත හැරීම මහා භාරදූර කටයුත්තක් නොවේ.

පසුව, 1993 දී මා දකුණු පළාත් සභාවේ සභාපති ධුරය දරන අවස්ථාවේදී, මහ ඇමති අමරසිරි දොඩන්ගොඩ ධුරයෙන් පහ කර බලය ලබා ගැනීමේ කුමන්ත්‍රණයේදීද මා පෙනී සිටියේ යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් පමණි. මේ සම්බන්ධයෙන් ඉතා වැදගත් තොරතුරුවලට මේ සභාවේ දැනට සිටින හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා සාක්ෂි දරනවා ඇති. මෙබඳු දේශපාලන කුමන්ත්‍රණවලින් අවසානයේ සිදු වන්නේ දේශපාලන පක්ෂ බිඳ වැටීම සහ මහජනයා දේශපාලනයෙන් ඈත්වීම බව මගේ පෞද්ගලික කියවීමයි. එහෙයින්, එදා පටන් වර්තමානය දක්වා මම ප්‍රතිපත්තියක් ලෙස කිසිදු දේශපාලන කුමන්ත්‍රණයක කොටස්කරුවකු නොවූයෙමි. ඉදිරියටත් එසේම වනු ඇත.

මා පෞද්ගලිකව සිතනා ආකාරයට මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව සහ හෘදය සාක්ෂියට අවංකව කටයුතු කිරීමේදී මෑතකදී මුහුණ දුන් අභියෝගාත්මකම සිදුවීම වූයේ 2022 වසරේ උද්ගත වූ අර්බුදකාරී අරගල තත්ත්වයයි.

විශේෂයෙන් අපේ තරුණ පරපුර ඇතුළු ඔබ සියලුදෙනාට පසුගිය වසරේදී මෙරට කථානායකවරයා ලෙස මා සංකීර්ණ අභියෝග රැසකට මුහුණ දුන් ආකාරය අමතක නැතැයි මම සිතමි.

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

පුරවැසියන් තමන්ට දරාගත නොහැකි දුෂ්කර සමාජ, ආර්ථික තත්ත්වයන් නිසා නැවත වරක් අරගළයක් දක්වා ගමන් කළ අතර, රට අරාජිකත්වයට පත්වුණු මොහොතකදී මම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරමින් කථානායකවරයා ලෙස අපේ පාර්ලිමේන්තුව ආරක්ෂා කර ගැනීමට දිවි හිමියෙන් කැප වූයෙමි. කරුණු එසේ තිබියදී ඉකුත් අරගළ සමයේ මාහට විටින් විට දුරකථන ඇමතුම් ලබා දෙමින් ව්‍යවස්ථාව උල්ලංඝනය කොට හෝ මාගේ ප්‍රධානත්වයෙන් රජයක් පිහිටුවීමට බලපෑම් කළ අයද මෙම විශ්වාස භංග යෝජනාවට අත්සන් තබා තිබීම මට පුදුමය ගෙන දෙන්නකි.

වගකිවයුතු කථානායකවරයකු ලෙස මෙතුවක් කල් නිහඬව සිට රටේ මහජනතාව වෙත අනාවරණය නොකළ සිද්ධියක් මම අද ඔබට ප්‍රකාශ කරනු කැමැත්තෙමි. රාජ්‍ය විරෝධී හා ව්‍යවස්ථා විරෝධී ලෙස ඉකුත් අරගළ සමයේ රජයක් පිහිටුවීමට බලපෑම් කරන ලද පිරිස අතර විවිධ ශක්තිමත් බලවේග තිබුණු බව මා සඳහන් කරන්නේ ඉතාමත් කනස්සල්ලෙනි. ඔවුන් අතර සිටි සමහර අයගේ අරමුණ වූයේ උද්ගතව ඇති ගැටලුව සමනය කිරීම හෝ රට ආරක්ෂා කිරීම නොව මා හරහා නීතිවිරෝධී රජයක් පිහිටුවා අප රට ලිබියාවක් හෝ ඇෆ්ගනිස්ථානයක් බවට පත් කිරීමේ කුට උපායයි. ඒ අවස්ථාවේ සමහර උදවිය පසුගිය කාල වකවානුව තුළ වසර 30ක පමණ කාලයක අපේ රටේ කරගත නොහැකිව තිබුණු යම් යම් අරමුණු ඉටු කර ගැනීමට ඉදිරිපත් වූ බවත් මේ අවස්ථාවේ මම ප්‍රකාශ කරනවා. එහි ප්‍රතිඵලය වූයේ මෙරට ජනාධිපති ධුරය හිස් වූ අවස්ථාවේ ජනාධිපති ධුරය සඳහා මට ආරාධනා ලැබීමයි. එනමුත් එදා පවා මා කළේ දේශීය වශයෙන් ලැබුණු ඇරයුම් පමණක් නොව, විදේශීය වශයෙන් ලද ඇරයුම්ද එක හෙළා ප්‍රතික්ෂේප කරමින් උත්තරීතර වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමට හදවතට එකඟව මට තිබුණු තදබල අවශ්‍යතාව සියල්ලන්ටම කාරුණිකව අවධාරණය කිරීමයි.

මාගේ මතය වෙනස් කිරීමට නොහැකි වූ කළ ප්‍රචණ්ඩ වූ සමහරුන් මාගේ නිවස වට කොට මගේ ජීවිතයද අනතුරේ හෙළනා බවට තර්ජනය කිරීමට පවා සාහසික වූහ. ඔවුන් අතරේ ජනප්‍රිය භික්ෂූන් වහන්සේලා මෙන්ම වෙනත් ආගමික නායකයන්ද සිටීම ගැන මම අදද අවංකව කම්පා වෙමි. මෙකී තර්ජන මැද මා ඇමතූ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මා වෙත බලය ලබාදීමේ ක්‍රියාවලිය ගැන අදහස් විමසා සිටියේය. රජයේ අත්‍යවශ්‍ය කටයුතු ඉටු කිරීමට අග්‍රාමාත්‍යවරයෙකුද, කැබිනට් මණ්ඩලයක්ද ව්‍යවස්ථාවෙන් හා මා වෙත පැවරුණු බලයක්ද නොමැතිව කටයුතු කිරීමට නොහැකිව මාසයක් තුළ නව ජනාධිපතිවරයෙකුද පත් කර ගැනීමට නොහැකි වුවහොත් සමස්ත රටම නීතියක් නොමැතිව පාලනය කිරීමට නොහැකිව තැන තැන කුඩා කල්ලි කණ්ඩායම් ප්‍රාදේශීය පාලනය අතට ගන්නා තැනට රට පත්විය හැකි අවදානම මා හොඳින් දැන සිටියා. ඒ අවස්ථාවේ සමහර කොටස් රටේ යම් යම් කොටස්වලින් කෑලි කඩාගන්න බලාගෙන ඉන්න වෙලාවේ ඒ ගැන හොඳ අවබෝධයක් මට තිබුණා.

ජූලි 13 වන දින අවසාන පක්ෂ නායක රැස්වීමේදී පාර්ලිමේන්තු මන්දිරය අවට තිබූ අවදානම් තත්ත්වය හා ඇතැම් පිරිස් පාර්ලිමේන්තුව විනාශ කිරීමට ඉතා ආසන්නයට පැමිණිය හෙයින් පක්ෂ නායකයන් එම භූමියෙන් කඩිනමින් ඉවත් වුවත්, මා පමණක් මේ ගොඩනැඟිල්ල තුළ අවසාන මොහොත දක්වා රැඳී සිටියෙමි. රටේ ජනතාවගේ වාසනාවට එය වළක්වා මහා විනාශයක් නවත්වා ගැනීමට මා හට හැකි විය. ලාංකීය ප්‍රජාතන්ත්‍රවාදයේ මෙම අඳුරු පරිච්ඡේදයේ මාගේ එකම අධිෂ්ඨානය වූයේ අපේ රටේ ව්‍යවස්ථාව හා රාජ්‍යය කෙසේ හෝ මතු පරපුර වෙනුවෙන් ආරක්ෂිතව පවත්වාගෙන යෑමයි.

ඒ අර්බුදකාරී අවස්ථාවේ පාර්ලිමේන්තු මහලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලය හා වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා දුන් සහයෝගය මට අමතක කළ නොහැකිය. තව මොහොතකින් ගිනි තබා විනාශ කිරීමේ අවදානමක් හමුවේ ගත යුතු ප්‍රධාන පියවර වූයේ ජාතියේ සහ පාර්ලිමේන්තුවේ සංකේතය වූ සෙංකෝලය ආරක්ෂා කිරීමයි. එම නිසා අවශ්‍ය වුවහොත් එය හැකි ඉක්මනින් පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලෙන් ඉවත් කිරීමට කටයුතු සූදානම් කර තිබුණි. වේත්‍රධාරීතුමාගේද, මහලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ සහ පොලිස් නිලධාරින් ඇතුළු ආරක්ෂක අංශවල ජීවිත අවදානම ගැනවත් නොසලකා එම අවස්ථාවේ ඔවුන් කටයුතු කළ බව සඳහන් කරනුයේ ඉතාමත් සංවේදීවය.

මෙලෙස රාජ්‍යය අකර්මණ්‍ය කිරීමට තිබූ සැලැස්ම මාගේ නොවෙනස් වන ස්ථාවරය හමුවේ අරාජිකත්වයේ අඳුරු වලාවන් **ලෙස** ව්‍යර්ථ වී ගිය බව දන්වනු කැමැත්තෙමි. එසේ නොවන්නට අද විශ්වාස භංගයක් ගෙන ඒමට ඔබද, ඊට මුහුණ දීමට මමද, එය ඉදිරිපත් කිරීමට මෙම පාර්ලිමේන්තුවද, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ද නොතිබීමට ඇති ඉඩකඩ ගැන අවධාරණය කරමි. අප පසු කළේ එවන් අවදානම් කාල වකවානුවක් බව වැඩිදුරටත් සිහිපත් කරමි. එසේම රටක ගිනි තැබීම්, මිනී මැරීම් හා රාජ්‍ය මෙන්ම පෞද්ගලික දේපළ විනාශ කිරීමට දායක වුණු කිසිවෙක් මේ රට නැවත ගොඩනැඟීමට කටයුතු කළ බවක් ලෝක ඉතිහාසයේ සඳහන්ව නොමැති බව අපි සියලුදෙනාම මතක තබා ගත යුතුය.

ඔබ ඒකමතිකව මා කථානායක ධුරයට පත් කළ දින සිට පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය හා ශ්‍රී ලංකා ජන රජයේ පැවැත්ම වෙනුවෙන් මාගේ උපරිම ශක්ති ප්‍රමාණයෙන් හා හෘදය සාක්ෂියට එකඟව කටයුතු කර ඇත්තෙමි.

මාගේ දේශපාලන පක්ෂය මේ රටේ ජනතාවයි. මා කථානායකවරයා ලෙස තුනෙන් දෙකක ජන වරමකින් පත්ව ආ පාර්ලිමේන්තුවේ කාල කළමනාකරණයේදී එතෙක් පැවති සම්ප්‍රදාය වන ආණ්ඩු පක්ෂයට සියයට 80ක් සහ විපක්ෂයට සියයට 20ක් යන්න වෙනස් කර 2020 සිට විපක්ෂයට අමතරව සියයට 20ක්, එනම් සියයට 40ක කාලයක් අතිරේකව ලබා දුන්නෙමි.

එලෙස තම නියෝජිත ප්‍රතිශතයටත් වඩා කාලය ලබා දුන් වෙනත් පාර්ලිමේන්තුවක් ලොව ඇත්දැයි මම නොදනිමි. ආණ්ඩු පක්ෂයෙන් ආ විරෝධතා පවා මැඩගනිමින් එදා මා ඒ තීරණය ගත්තේ, ශ්‍රී ලංකා ජනරජයේ යහ පැවැත්මට අත්‍යවශ්‍ය ශක්තිමත් ආණ්ඩුවක් ඇති විට ඒ සඳහා විපක්ෂයේ කාර්යභාරයෙන් යහපතක් වනු ඇතැයි යන විශ්වාසයෙනි. මා එසේ වැඩිපුර කාලය දුන් බව, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙක් කාලය පිළිබඳ ප්‍රශ්නය මතු කිරීමෙන් සනාථ වන බව ද සඳහන් කරමි. එහෙත් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට වැඩිපුර වෙන් වූ කාලය ඔවුන් අතර සාධාරණ ලෙස බෙදී නොයන බවත්, විපක්ෂයේම නායකයින් කිහිප දෙනෙකු රිසි සේ එම කාලය භාවිත කරන බවත් එම මන්ත්‍රීවරුම මාගේ නිල කාමරයට පැමිණ නිතර පැමිණිලි කරති. එවන් අවස්ථාවල එම මන්ත්‍රීවරුන්ට ද විශේෂ කාල අවස්ථා මා විසින් ලබා දුන් බව ද සිහිපත් කරමි. එහිදී මා අවධානය යොමු කරන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ස්ථාවර නියෝග ප්‍රකාරව යමින් පුරවැසියන් විසින් පාර්ලිමේන්තුව කෙරෙහි පළ කළා වූ අපරිමිත මහජන විශ්වාසය අඛණ්ඩව සුරැකීම කෙරෙහි ය. ඒ නමුත් දිනපතා අනවශ්‍ය රීති ප්‍රශ්න මතු කිරීම් හා මාතෘකාවට අදාළ නොවන ප්‍රකාශ නිසා සිදු වන්නේ, පාර්ලිමේන්තුවේ වැදගත්කම කෙලෙසී යෑමයි. යම් යම් කඩාකප්පල්කාරී ක්‍රියා සදාචාරාත්මක ලෙස පාලනය කිරීමේදී කථානායකවරයා ලෙස මාහට ද සීමා තිබේ.

මා මෙම තීරණය ගත්තේ රටේ විධායකයේ ප්‍රධානියා විසින් මා වෙත කරන ලද බලපෑම් හමුවේ බව ඇතැමුන් නිරන්තරයෙන් චෝදනා කරනු මම දැක ඇත්තෙමි. අතිගරු ජනාධිපතිතුමා මාගේ දීර්ඝ කාලීන මිතුරෙකු බව සැබෑවකි. එනමුත්, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අරබයා අප දෙදෙනා දැරුවේ සපුරා වෙනස් ස්ථාවරයන් දෙකකි. රනිල් වික්‍රමසිංහ මහතා මාගේ මිතුරෙකු වුව ද, අප එක්ව රට වෙනුවෙන් යම් වැඩ කොටසක් ඉෂ්ට කළ ද, එතුමා රටේ විධායකය ලෙස පත්වූ පසු ව්‍යවස්ථාදායකයේ මුලසුන දරන මා වෙත කුමන අවස්ථාවකදීවත් බලපෑම් එල්ල නොකළ බව සිහිපත් කරනුයේ එතුමාට ගෞරවයක් වශයෙනි. ඒ, අතිගරු ජනාධිපතිතුමා ඇතුළු සියලුදෙනා, පසුගිය වසර 40 පුරා මහින්ද යාපා අබේවර්ධන නම් පුද්ගලයා ප්‍රතිපත්ති මත මිස කිසිවකුගේ දේශපාලන අතකොළුවක් නොවූ බව මැනවින් වටහාගත් නිසා යැයි මම විශ්වාස කරමි.

එනමුත් මගේ කනස්සල්ලට එකම හේතුව, බදු බරින් හා ජීවන බරින් පීඩා විඳින පුරවැසියන්ගේ අභිලාෂ මුදුන් පැමිණවීම සඳහා තෝරා පත් කරගත් නියෝජිතයන් විසින් අතිශය වැදගත් පාර්ලිමේන්තු රැස්වීම් දින තුනකට වැය කරන රුපියල් මිලියන 45කට ආසන්න පිරිවැය නිකරුණේ මෙම විශ්වාස භංගයට යට කිරීමයි. එය අප වැනි රටකට කොහෙත්ම දැරිය හැක්කක් නොවේ.

එසේම මෙම විශ්වාස භංගයට අත්සන් කළ ඇතැම් මන්ත්‍රීවරු ද පෞද්ගලිකව පැමිණ ඔවුන්ගේ අත්සන යෙදීමට සිදු වීම ගැන මා වෙත කනගාටුව ප්‍රකාශ කළ බව ද දන්වමි. මා ගැන හොඳින් දන්නා විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම එයට අත්සන් කිරීමෙන් මෙන්ම කථා පැවැත්වීමෙන් ද වැළකී ඇති බව මා සඳහන් කරන්නේ ඔවුනට ගෞරවයක් වශයෙනි.

කෙනෙකු ජීවත්ව සිටින කාලය තුළම තමන්ගේ හොඳ හෝ නරක ඇසීමට ලැබීම විරල භාග්‍යයක් ලෙස මම සලකමි. පාර්ලිමේන්තුවේ සිටින 225 දෙනාම සොරුන් යැයි චෝදනා කරන යුගයක පක්ෂ විපක්ෂ ඔබ කිසිවෙකු මෙම විවාදයේදී මා වෙත එවැනි චෝදනාවක් එල්ල නොකිරීම මාගේ දශක 4කට අධික දේශපාලන දිවියේ මා ලද විශාලම ගෞරවය ලෙස සලකමි. එය මාගේ දරුවන් වෙනුවෙන් මා ගොඩ නඟා ඇති විශාල ධනස්කන්ධය බව ද ප්‍රකාශ කරමි. එසේම එවැනි තවත් මන්ත්‍රීවරුන් මෙම පාර්ලිමේන්තුවේ සිටින බව ජනතාවට ප්‍රකාශ කරනු කැමැත්තෙමි. මෙවන් ගෞරවනීය දේශපාලන ගමනක යෙදීමට මාහට ආශීර්වාදයක් වුණු මාගේ මියගිය දෙමාපියන්, ගුරුවරුන්, බිරිඳ, දරුවන්, සහෝදර සහෝදරියන්, ඥාති හිත මිතුරන්, රාජ්‍ය නිලධාරින් සහ මාතර දිස්ත්‍රික්කයේ ජනතාව වෙත මාගේ හෘදයංගම ස්තුතිය පිරිනමනු කැමැත්තෙමි. ඔබ සියලුදෙනා මා වෙත තැබූ එම විශ්වාසය ඉදිරියටත් සුරකින බව මම ප්‍රකාශ කරමි.

අවසාන වශයෙන්, මට සහාය දුන් සැමටත්, මා නිර්දය ලෙස විවේචනය කළ සැමටත්, මා සදාකල්හිම නියෝජනය කරන අහිංසක ජනතාවටත් කිසිදු වෙනසක් නොමැතිව මාගේ කථානායක කාමරයේ දොර කවදත් එක ලෙසින් විවෘතව ඇති බව දන්වනු කැමැත්තෙමි.

ස්තුතියි.

තෙරුවන් සරණයි!

***සභාමේසය මත තබන ලද ලේඛන:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள்:*
*Documents tabled:*

ඇමුණුම 1

## කථානායකවරයාට විරුද්ධව ඉදිරිපත් කරන ලද

## විශ්වාසභංග යෝජනා

**1. 1963 නොවැම්බර් 22 - ගරු කථානායක ආර්. එස්. පැල්පොල මහතා කෙරෙහි විශ්වාසභංග යෝජනාව**

විශ්වාස භංග යෝජනාව ගෙන ඒමට හේතුව: කථානායකතුමා ස්වකීය නිලයට අදාල රාජකාරි කාර්යක්ෂම ලෙස හා අපක්ෂපාතිව කිරීමට අ...හොසත් වීම; විශේෂයෙන් පුවත්පත් පරීක්ෂණ කොමිසමට විරෝධය පළ කරන යෝජනාව අවස්ථාවේ ක්‍රියා කල ආකාරය

මෙම විශ්වාස භංග යෝජනාව ජේ.ආර්. ජයවර්ධන මහතා ඇතුළු 24 දෙනෙකුගේ අත්සනින් යුතුව භාර දෙන ලදි. යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද්දේ විපක්ෂයේ මන්ත්‍රී ජේ. ආර්. ජයවර්ධන මහතා විසිනි.

යෝජනාව විවාදයට ගන්නා ලද අවස්ථාවේ මුලසුන දරන ලද්දේ කථානායකවරයා විසින්ම වන අතර අවසන් ඡන්දය විමසන අවස්ථාව වන තෙක්ම කථානායකවරයා මුලසුන දරයි.

යෝජනාවට විරුද්ධව 68 ක් සහ පක්ෂව 61 ලෙස බෙදීමෙන් යෝජනාව නිෂ්ප්‍රභ විය.

**2. 1980 දෙසැම්බර් මස 23 දින - ගරු කථානායක එම්.ඒ. බාකීර් මාකර් මහතා කෙරෙහි විශ්වාස භංග යෝජනාව**

විශ්වාස භංග යෝජනාව ගෙන ඒමට හේතුව: කලවාන මන්ත්‍රී ලෙස අබේරත්න බන්ඩාර හේරත් පිලපිටිය පත්වීම පාර්ලිමේන්තුව පිළිගැනීම සම්බන්ධයෙන්

මෙම විශ්වාස භංග යෝජනාව විපක්ෂ නායක අමිර්තලිංගම් මහතා ඇතුළු මන්ත්‍රීවරු 22 දෙනෙකුගේ අත්සනින් යුතුව භාර දෙන ලදී.

යෝජනාව විපක්ෂය විසින් ගෙන එන ලද නමුත් යෝජනාව ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු විශ්වාස භංගය සභාවට ඉදිරිපත් කරන දිනය පිළිබඳව තම අප්‍රසාදය පළ කිරීමක් වශයෙන් එදින විවාදයට සහභාගී වූයේ නැත.

එබැවින් ආණ්ඩු පක්ෂය විසින් (ආරියරත්න ජයතිලක මහතා -දිවුලපිටිය) එම විශ්වාස භංග යෝජනාව සංශෝධනය කර සභාවට ඉදිරිපත් කරන ලදී.

විශ්වාස භංග යෝජනාව විවාදයට ගැනීමට ප්‍රථම කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා (නෝමන් වෛද්‍යරත්න මහතා) මූලාසනය හොබවයි.

විශ්වාස භංගය යෝජනාවට පක්ෂව ඡන්ද 0 ක් සහ විරුද්ධව ඡන්ද 126 ක් පමණක් ලබමින් නිෂ්ප්‍රභ විය.

**3. 1991 ඔක්තෝබර් මස 10 දින - ගරු කථානායක එම්.එච්. මොහොමඩ් මහතා කෙරෙහි විශ්වාස භංග යෝජනාව**

විශ්වාස භංග යෝජනාව ගෙන ඒමට හේතුව: ජනාධිපතිවරයාට එරෙහිව ඉදිරිපත් කරන ලද දෝෂාභියෝග යෝජනාව පිළිබඳව කථානායකතුමා විසින් කරන ලද ප්‍රකාශයෙන් අනතුරුව කථානායකවරයා කෙරෙහි විශ්වාස භංග යෝජනාවක් වහාම ගෙන ආ යුතු බවට ඒකාබද්ධ විපක්ෂ කණ්ඩායම තීරණය කරයි.

විශ්වාස භංග යෝජනාව විපක්ෂ නායක සිරිමා බණ්ඩාරනායක මැතිණිය විසින් පාර්ලිමේන්තුවේ මහලේකම් නිහාල් සෙනවිරත්න මහතා වෙත භාර දෙන ලදී.

